261 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 261- இல. 4
Volume 261 - No. 4

2018 ජූනි 19වන අඟහරුවාදා
2018 யூன் 19, செவ்வாய்க்கிழமை
Tuesday, 19th June, 2018

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන :**
භාණ්ඩාගාර බැඳුම්කර විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ මුදා නොහළ කොටස්ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ ) (සංශෝධන) පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
කථානායකතුමාගේ සහතිකය

**විගණකාධිපතිවරයාගේ  වාර්තාව**

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ජාතිය ගොඩනැඟීමේ බදු  (සංශෝධන) පනත් කෙටුම්පත :**
පළමු වන වර කියවන ලදී

**කල් තැබීමේ යෝජනාව:**
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ඉදිරිපත් කළ වාර්තාවල නිර්දේශ

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
திறைசேரி பிணைமுறி விசாரணை ஆணைக்குழு அறிக்கையின் வெளியிடப்படாத பகுதிகள்
காணி  பராதீனப்படுத்தல் மீதான மட்டுப்பாடுகள்  (திருத்தம்) சட்டமூலம்: உயர்நீதிமன்றத் தீர்ப்பு
சபாநாயகரது சான்றுரை

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**
அரசாங்கக் கணக்குகள் பற்றிய குழு சமர்ப்பித்த அறிக்கைகளின் சிபாரிசுகள்

---

# PRINCIPAL  CONTENTS

ANNOUNCEMENTS:

Unreleased Sections of the Bond Commission Report
Land (Restrictions on Alienation) (Amendment) Bill: Determination of the Supreme Court
Speaker's Certificate

AUDDITOR-GENERAL'S REPORT

REPORT OF COMMITTEE ON PUBLIC ACCOUNTS

ORAL ANSWERS TO QUESTIONS

NATION BUILDING TAX (AMENDMENT) BILL:
Read the First time

ADJOURNMENT MOTION:
Recommendations Made in Reports Presented by Committee on Public Accounts

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2018 ජූනි 19වන අඟහරුවාදා***
*2018 யூன் 19, செவ்வாய்க்கிழமை*
*Tuesday, 19th June, 2018*

**අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA]
in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### භාණ්ඩාගාර බැඳුම්කර විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ මුදා නොහළ කොටස්
### திறைசேரி பிணைமுறி விசாரணை ஆணைக்குழு அறிக்கையின் வெளியிடப்படாத பகுதிகள்
### UNRELEASED SECTIONS OF THE BOND COMMISSION REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ C-350 - C-360 ලෙස 'සලකුණු කර ඇති වෙළුම් තුනකින් සමන්විත ලේඛන' පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳව 2018 ජූනි මස 05වන දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී සාකච්ඡා කර තීරණය කළ පරිදි, එකී ලේඛන වාර්තාවේ කොටසක් පමණක් වන හෙයින් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර C-1 - C-349 දක්වා වූ 'සලකුණු කර ඇති ලේඛන' ද, 'සලකුණු කර ඇති වෙනත් ලේඛන' වෙතොත් ඒවාද ඇතුළුව කොටස් වශයෙන් නොවන සම්පූර්ණ 'සලකුණු කර ඇති ලේඛන' සියල්ලම පාර්ලිමේන්තුවට නොපමාව ඉදිරිපත් කළ යුතු බව දන්වමින් 2018 ජූනි මස 12වන දින ජනාධිපති ලේකම්වරයාට ලිපියක් යවන ලදී.

ඊට පිළිතුරු වශයෙන්, එකී භාණ්ඩාගාර බැඳුම්කර විමර්ශන කොමිෂන් සභා වාර්තාවට අදාළ සියලු ලේඛන පාර්ලිමේන්තුවට මුදා හැරීම සම්බන්ධයෙන් මේ වන විට නීතිපතිවරයාගේ උපදෙස් පතා ඇති බවත්, නීතිපතිවරයාගේ උපදෙස් සහ එකඟතාව ලද වහාම ඒ උපදෙස් අනුව ක්‍රියා කරන බවත් ජනාධිපති ලේකම්වරයා විසින් 2018 ජූනි මස18වන සඳුදා, එනම් ඊයේ දින පාර්ලිමේන්තුවට ලිඛිතව දන්වා ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

මෙම බැඳුම්කර සිද්ධියට අදාළ සියලුම ලිපිලේඛන නීත්‍යානුකූලව ජනාධිපති කාර්යාලයෙන් මා වෙත ලැබෙන තෙක්, මාධ්‍ය හරහා එකිනෙකාට චෝදනා කරමින් පාර්ලිමේන්තුවේ කීර්ති නාමයටත්, ගරු මන්ත්‍රීවරුන් හා සිවිල් පුරවැසියන්ගේ අභිමානයටත්, අප දේශයේ ගෞරවයටත් හානි වන ආකාරයේ චෝදනා හා ප්‍රකාශ නිකුත් කිරීමෙන් වළකින ලෙස සියලු ගරු මන්ත්‍රීවරුන්ගෙන් හා මාධ්‍යයෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

## II

### ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
### காணி (பராதீனப்படுத்தல் மீதான மட்டுப்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்: உயர்நீதிமன்றத் தீர்ப்பு
### LAND (RESTRICTIONS ON ALIENATION) (AMENDMENT) BILL: DETERMINATION OF THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව "ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ඉදිරිපත් කරන ලද පෙත්සම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දැනුම් දීමට කැමැත්තෙමි.

මෙම පනත් කෙටුම්පතෙහි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතුයැයි මම නියෝග කරමි.

***ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය:***
*உயர் நீதிமன்றத் தீர்ப்பு:*
*Determination of the Supreme Court*

**IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

In the matter of the ordinary exercise of jurisdiction of the Supreme Court under Article 121 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka read with Rule 63 of the Supreme Court Rules of 1978 against the Bill titled "Land (Restriction on Alienation) (Amendment)"

SC SD 15/2018

Polpagoda Gamage Salochana Vincent
No.35, Kohilakotuwa Road,
Maharagama.

Vs

Hon. Attorney General
Attorney General's Department,
Colombo 12.

Before:

| | |
|---|---|
| Sisira J de Abrew | Judge of the Supreme Court |
| Prasanna Jayawardena PC | Judge of the Supreme Court |
| Murdu N.B.Fernando PC | Judge of the Supreme Court |

Counsel: Kanishka Witharana for the Petitioner.
Dr. Avanthi Perera SSC with Suren Gnanaraj SC for the Attorney General

The Court assembled for the hearing at 10.00 a.m. on 4.6.2018.

[ගරු කථානායකතුමා ]

**Determination**

A Bill titled "Land (Restrictions on Alienation) (Amendment)" was published in the Gazette of the Democratic Socialist Republic of Sri Lanka on 12th April 2018 and placed on the Order Paper of Parliament on 22nd May 2018.

The long title of the Bill reads as 'An Act to amend the 'Land (Restrictions on Alienation) Act No.38 of 2014.'

The jurisdiction of this Court to determine the constitutionality of the said Bill has been invoked in terms of Article 121(1) of the Constitution by a petition presented to the Court by the Petitioner.

The Petition to this Court was filed on 28.5.2018, within one week of the Bill being placed on the Order Paper of Parliament as required by Article 121(1).

When the said Petition was taken up for consideration, learned Counsel appearing for the Petitioner and the learned Senior State Counsel made submissions. The Petitioner, in his Petition has stated that Clauses 2 and 3 of the Bill are inconsistent with Articles 3,4,12(1),12(2),75 and 154G of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka. But learned Counsel did not make submissions as to how the Bill would violate Articles 3,4,12(1),12(2) and 75 of the Constitution.

Clause 2 of the Bill reads as follows.

"Section 3 of the Land (Restrictions on Alienation) Act No.38 of 2014(hereinafter referred to as the Principal enactment) is hereby amended in subsection (1):-

(a) by the repeal of paragraph (b) of that subsection and the substitution therefor of the following paragraph:-

"(b) a condominium parcel specified under the Apartment Ownership Law:

Provided that, the entire value shall be paid upfront through an inward foreign remittance prior to execution of the relevant deed of transfer."

(b) in paragraph (h) of that subsection by the substitution for the words "transfer of such land" of the words "transfer of such lands; and";

(c) immediately after paragraph (h) of that subsection by the addition of the following new paragraph:-

"(i) any land, the title of which is transferred on or after April 1, 2018 to a company referred to in paragraph (b) of subsection (1) of section 2, listed in the Colombo Stock Exchange."

Clause 3 of the Bill reads as follows.

"Section 5A of the Principal enactment is hereby amended:-

(a) by the substitution for the words and figures 'January 8, 2017' of the words and figures 'January 1, 2016.';

(b) in the marginal note thereof, by the substitution for the words and figures 'January 8, 2017' of the words and figures 'January 1, 2016.'

Learned counsel for the Petitioner contended that the Bill deals with the subject of land; that the subject of land is in Provincial Council List of the Constitution; and that it should be referred to every Provincial Council by His Excellency the President in terms of Article 154G(3) of the Constitution before the Bill is enacted by the Parliament.

Article 154 G(3) of the Constitution reads as follows.

"(3) No Bill in respect of any matter set out in the Provincial Council List shall become law unless such Bill has been referred by the President, after its publication in the Gazette and before it is placed on the Order Paper of Parliament, to every Provincial Council for the expression of its views thereon within such period as may be specified in the reference, and-

(a) where every such Council agrees to the passing of the Bill, such Bill is passed by a majority of the Members of Parliament present and voting ; or

(b) where one or more Councils do not agree to the passing of the Bill, such Bill is passed by the special majority required by Article 82 :

Provided that where on such reference, some but not all the Provincial Councils agree to passing of a Bill, such Bill shall become law applicable only to the Provinces for which the Provincial Councils agreeing to the Bill have been established, upon such Bill being passed by a majority of the Members of Parliament present and voting."

The Bill seeks to amend section 3 and 5 of the 'Land (Restrictions on Alienation)'Act No.38 of 2014. The preamble of Act No.38 of 2014 reads as follows.

"WHEREAS in furtherance of the development policies being promoted by the Government in the backdrop of a globally integrated environment, it is deemed expedient and necessary to ensure the prudent use of land which is a limited resource, in a manner that preserves the national interest:

AND WHEREAS it is the National Policy to regulate the use of lands, in a sustainable manner, having imposed restrictions on the alienation of lands to foreigners, foreign companies and certain institutions with foreign shareholding and having granted concessions to citizens of Sri Lanka for certain development projects, as specified in this Act:"

Therefore it appears that the subject of Act No.38 of 2014 is with regard to 'National Policy and not 'land'. Thus the subject of the Bill is also 'National Policy' and not 'land'. The subject of National Policy is not a subject in the Provincial Council List. It is a subject in the Reserved List.

Article 154G(7) reads as follows.

"A Provincial Council shall have no power to make statutes on any matter set out in List II of the Ninth Schedule (hereinafter referred to as "the Reserved List")."

Therefore it is seen that a Provincial Council shall have no power to make statutes in respect of the subjects set out in the Reserved List.

When we consider the above matters we hold the view that compliance under Article 154G(3) of the Constitution is not required before placing the Bill in the order paper of the Parliament. For the above reasons, we hold that the contention of learned counsel for the Petitioner that the subject of the Bill being the subject of land and therefore Article 154G(3) of the Constitution should be complied with cannot be accepted is hereby rejected. We have examined the provisions of the Bill and in our opinion they do not violate the Constitution. For the above reasons, we make determination that the Bill titled "Land (Restrictions on Alienation) (Amendment)" is not inconsistent with the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

Sisira J de Abrew
Judge of the Supreme Court

Prasanna Jayawardena PC
Judge of the Supreme Court

Murdu N.B.Fernando PC
Judge of the Supreme Court

*[මෙම ලේඛනය පුස්තකාලයේ ද තබා ඇත.]*
*[இந்த ஆவணம் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This document is also placed in the Library.]*

## III

## කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2018 ජූනි 18වන දින මවිසින් පහත සඳහන් පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන)

සූතිකාධාර (සංශෝධන)

## IV

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම සහ තේරීම් කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம் மற்றும் தெரிவுக்குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS AND MEETING OF COMMITTEE OF SELECTION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2018 ජූනි මස 19වන අඟහරුවාදා, එනම් අද දින අපර භාග 2.00ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලුදෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම අවසන් වූ වහාම තේරීම් කාරක සභාවේ රැස්වීමක් පැවැත්වෙන බවත් දන්වනු කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XVI සහ XVII කොටස් සහ තෙවැනි කාණ්ඩයේ VIII කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා, පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන සහ නියමයන් ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව;

(iii) 2017 අංක 30 දරන විසර්ජන පනතේ 6 (1) වගන්තිය යටතේ 2018.04.01 සිට 2018.05.31 දක්වා ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන;

(iv) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන්

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 පෙබරවාරි 15 දිනැති අංක 2058/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(v) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 පෙබරවාරි 15 දිනැති අංක 2058/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම වාර්තා, පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන සහ නියමයන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්; සහ

(ii) 2017 වර්ෂය සඳහා වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්.

එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා සීමාසහිත මිල්කො (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියමයන් ඉදිරිපත් කරමි.

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ "හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 11 දිනැති අංක 2053/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

( ii ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ කලම්බු ඉන්ටනැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 11 දිනැති අංක 2053/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

( iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 24 දිනැති අංක 2055/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ කලම්බු ඉන්ටනැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 19 දිනැති අංක 2067/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 19 දිනැති අංක 2067/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(vi) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 19 දිනැති අංක 2067/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කාරක සභා වාර්තාව පිළිගැන්වීම. අටවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව, එම කාරක සභාවේ සභාපති ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා විසින් පිළිගැන්වීම.

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF COMMITTEE ON PUBLIC ACCOUNTS

**ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්ය සාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2016 මුදල් වර්ෂය සම්බන්ධයෙන් අටවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ල)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය (ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன் - சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran - State Minister of Child Affairs)

கௌரவ சபாநாயகர் அவர்களே, இல.38, மார்கட் வீதி, நீர்கொழும்பு எனும் முகவரியில் வதியும் திரு.ஏ. திருநாவுக்கரசு என்பவரிடமிருந்து கிடைத்த மனுவை நான் சமர்ப்பிக் கின்றேன்.

**ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) නුගේගොඩ, උඩහමුල්ල, පරණ කොට්ටාව පාර, අංක 510/ ඒ දරන ස්ථානයෙහි පදිංචි සී.ඩී.ආටිගල මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අතුරුගිරිය, පෝරේ, ධම්මදීප ද්විභාෂා මූලික පිරිවෙණෙහි වාසය කරන පූජ්‍ය රුක්මලේ ධම්මකිත්ති නායක ස්වාමීන් වහන්සේගෙන් ලැබුණු පෙත්සම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ටී.බී. ඒකනායක මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே )
(The Hon. Susantha Punchinilame )

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කැලණිය, ගෝනවල, උදය මාවත, අංක 735/5 දරන ස්ථානයෙහි පදිංචි එච්.කේ.සී. අසේල කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කොළඹගෙ ආර, 94 කණුව යන ස්ථානයෙහි පදිංචි කේ. එම්. ශාන්ත නිමල්සිරි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) ත්‍රිකුණාමලය, ජමාලියාපුර, අංක 66/17 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඩී. රපායිදීන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, වලපනේ, වතුමුල්ල, අංක 98/D දරන ස්ථානයෙහි පදිංචි උපාලි දයානන්ද අපෝන්සු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මුජිබුර් රහුමාන් මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -18/'18 - (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 - 38/'18 - (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ලග්ගල මැතිවරණ කොට්ඨාසයේ අවතැන් වූ පවුල්: ඉඩම් ගැටලු
## லக்கல தேர்தல் தொகுதியில் இடம்பெயர்ந்த குடும்பங்கள்: காணிப் பிரச்சினை
## DISPLACED FAMILIES IN LAGGALA ELECTORATE : LAND ISSUES

132/'18

**3. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කළු ගඟ, මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල මැතිවරණ කොට්ඨාසයේ අවතැන් වූ පවුල්, ලග්ගල මැතිවරණ කොට්ඨාසය තුළම පදිංචි කිරීමට පියවර ගෙන තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, අවතැන් වූ පවුල් සංඛ්‍යාව සහ ලබාදුන් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ ලබාදුන් ඉඩම් ප්‍රමාණය වත්මන් පරපුරට ප්‍රමාණවත් වුවද, ඊළඟ පරම්පරා සඳහා ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් නැවත පදිංචි කරන ලද පවුල් මුහුණ දෙන ඉඩම් ගැටලු හා ඔවුන්ගේ ඊළඟ පරම්පරාවට මුහුණ දීමට සිදුවන ඉඩම් ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) களுகங்கை, மொரகஹகந்த கருத்திட்டம் காரணமாக மாத்தளை மாவட்டத்தில், லக்கல தேர்தல் தொகுதியில் இடம்பெயர்ந்த குடும்பங் களை, லக்கல தேர்தல் தொகுதியிலேயே குடியமர்த்துவதற்கு நடவடிக்கை மேற்கொள்ளப் பட்டுள்ளது என்பதை அறிவாரா;

(ii) ஆமெனில், இடம்பெயர்ந்த குடும்பங்களின் எண்ணிக்கை மற்றும் வழங்கப்பட்ட காணிகளின் பரப்பளவு எவ்வளவு;

(iii) அவ்வாறு வழங்கப்பட்ட காணிகள், தற்போதைய சந்ததியினருக்கு போதியதாக இருப்பினும், அடுத்த சந்ததியினருக்கு போதியதாக இல்லை என்பதை ஏற்றுக்கொள்வாரா;

(iv) ஆமெனில், மொரகஹகந்த கருத்திட்டம் காரணமாக மீள குடியமர்த்தப்பட்ட குடும்பங்கள் எதிர்கொள்ளும் காணிப் பிரச்சினைகள் மற்றும் அவர்களின் அடுத்த சந்ததியினர் எதிர்கொள்வ தற்கு நேரிடுகின்ற காணிப் பிரச்சினைகளை தீர்ப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக் கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) whether he is aware that steps have been taken to resettle the families of the Laggala Electorate of the Matale District who got displaced owing to the Moragahakanda Project of the Kalu Ganga, within the Laggala Electorate itself;

(ii) if so, the number of families that got displaced and the extent of lands provided;

(iii) whether it is admitted that although the lands thus provided are adequate for the present generation, but those would not suffice for the next generations; and

(iv) if so, the steps that will be taken by the Ministry to solve the land issues faced by the families resettled as a result of the Moragahakanda Project and the land issues that will be encountered by their future generation?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ලග්ගල මැතිවරණ කොට්ඨාසයේ අවතැන් වූ සියලුම පවුල් එම කොට්ඨාසය තුළම පදිංචි කර නොමැත. මොරගහකන්ද-කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් නැවත පදිංචි කිරීමට සිදු වූ පවුල් සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| ව්‍යාපෘති ප්‍රදේශය | පවුල් සංඛ්‍යාව |
|---|---|
| මොරගහකන්ද | 1,703 |
| කළුගඟ | 1,051 |
| එකතුව | 2,754 |

මෙම පවුල් 2,754න් පවුල් 1,973ක් සඳහා ගොඩ හා වාරි ඉඩම් ලබා දී ඇති අතර, ඉන් පවුල් 1,965ක් මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල මැතිවරණ කොට්ඨාසය තුළ පදිංචි කර තිබේ. අනෙක් පවුල් 08 ඔවුන්ගේ කැමැත්ත පරිදි පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි කර ඇත. මුළු පවුල් 2,754න් ඉඩම් ලබා දුන් පවුල් 1,965 හැර අනෙක් පවුල් 781 තම කැමැත්ත පරිදි ව්‍යාපෘතිය මඟින් ලබා දෙන ගොඩ හා වාරි ඉඩම් වෙනුවට රුපියල් ලක්ෂ 16ක මුදල ලබාගෙන තම අභිමතය පරිදි තෝරාගත් ස්ථානවල පදිංචි වී ඇත.

(ii)

| | |
|---|---|
| නැවත පදිංචි කළ යුතු පවුල් ගණන | 2,754 |
| ඉඩම් ලබා දුන් පවුල් ගණන | 1,973 |
| ඉඩම් වෙනුවට රුපියල් ලක්ෂ 16ක මුදල ලබා දුන් පවුල් ගණන | 781 |

ඉඩම් ලබා දීමේදී සෑම පවුලක් සඳහාම නේවාසික ඉඩම් අක්කර 1/2ක් සහ වාරි පහසුකම් සහිතව වගා ඉඩම් අක්කර 1 1/2ක් බැගින් ලබා දී ඇත.

(iii) මොරගහකන්ද-කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රජාව නැවත පදිංචි කිරීමේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අවස්ථාවේදී පදිංචියට බලපෑම් සිදු වන පවුල් පිළිබඳ සලකා බලන අතර, ඊළඟ පරම්පරා සඳහා ඉඩම් ලබා දීම පිළිබඳ සලකා බැලීමේ හැකියාවක් නොමැත.

(iv) ව්‍යාපෘතිය යටතේ ජලාශ ඉදිකිරීම නිසා බලපෑමට ලක්වන සෑම පවුලක් සඳහාම එනම්, 2015.12.31 දින වන විට විවාහ වූ පවුල් සඳහා ගොඩ හා වාරි ඉඩම් ලබා දීම හෝ අදාළ පවුල්වල කැමැත්ත මත ගොඩ හා වාරි ඉඩම් වෙනුවට රුපියල් ලක්ෂ 16ක මුදලක් ලබා දී ඇත. අනාගත පරපුර සඳහා ගොඩ ඉඩම් හා වාරි ඉඩම් ව්‍යාපෘති ප්‍රදේශයේ වෙන් කිරීමේ හැකියාවක් නොපවතී.

(ආ) පැන නොනඟී.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට ඉඩම් ඇමතිතුමාම පිළිතුරු දීපු එක හොඳයි කියා මම හිතනවා. මෙතැනදී වසම් 19ක අවතැන් වුණු සියලු ජනතාව ලග්ගල, පල්ලේගම ප්‍රාදේශීය

[රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ලේකම් කොට්ඨාසයේ තමයි පදිංචි කර තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ප්‍රශ්නයේ (අ)(i) කොටසට උත්තරය දුන්නා, "ආසනයෙන් පිට පදිංචි කරලා තිබෙනවා" කියලා. ගරු ඇමතිතුමනි, ඒ බොහොම අතළොස්සක්. මෙතැනදී අලුත් ප්‍රශ්නයක් පැන නැඟුණා. ඒ තමයි ලග්ගල, පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුල් පදිංචිකරුවන්ගෙන් ඉඩම් අක්කර 7,500ක් -හෙක්ටෙයාර් 3,000ක්- විතර ප්‍රමාණයක් අරගෙන තිබීම. ඒ අයට මේ වන කොටත් ඉඩමක් දීලා නැහැ. නමුත්, ඒකට මහවැලිය වගකීමක් ගන්නේත් නැහැ. එතකොට මේකට මොකක් හෝ ක්‍රමයක් හදන්න අපට සිද්ධ වෙනවා. ගරු ඇමතිතුමනි, මේ නිසා ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වසම් 37ක මුල් පදිංචිකරුවන් ලොකු ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. ඉදිරියේදී ඒ අයට බෙදා ගන්න තිබුණු ඉඩම් අක්කර 7,500ක් තමයි මහවැලියට අත්පත් කර ගත්තේ. ඒ නිසා ගරු ඉඩම් ඇමතිතුමා හැටියට ඔබතුමා මේ ප්‍රශ්නයට පිළිතුර දීපු එක ගැන මා සතුටු වන අතර, මේ ජනතාවගේ ඉඩම් ගැටලුව වෙනුවෙන් ඔබතුමා ඉදිරියේදී ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද කියලා අහන්න කැමැතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඔබතුමිය කිව්වා වාගේ ලග්ගල මැතිවරණ කොට්ඨාසය හැර මෙම ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන් වූ පවුල් 08ක් පොළොන්නරුවේ පදිංචි වෙලා ඉන්නවා. ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නය අදාළ වන්නේ මහවැලි සංවර්ධන අමාත්‍යාංශයට. ඉඩම් අමාත්‍යාංශය හැටියට අපි මහවැලි සංවර්ධන අමාත්‍යාංශය සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා ඔබතුමියට ඒ තොරතුරු ලබා දෙන්නම්.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ඒක අතිවිශාල ගැටලුවක් නිසා ප්‍රතිපත්තියක් විධියටම මෙය හැදෙනවා නම් හොඳයි කියලා මා හිතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 4, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අසනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා සතුව තිබෙනවා. නමුත්, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා දැනුම් දුන්නා, දෙවෙනි වටයේදී හරි එතුමා මෙම ප්‍රශ්නයට පිළිතුර ලබාදෙනවා කියලා. එතුමා පාර්ලිමේන්තුවට එන අතර තුර පාර්ලිමේන්තුව ආසන්නයේ ඉන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි සාමාන්‍යයෙන් දෙවෙනි වටයේදී ප්‍රශ්නයට අදාළ පිළිතුර කියවන්නේ නැහැ, පිළිතුර සභාගත කරනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

එහෙම නම්, එම පිළිතුර මා ඉදිරිපත් කරන්නද? එතුමා දැනුම් දුන්නා, එතුමා පාර්ලිමේන්තුව ආසන්නයේ ඉන්නේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පළමු වටය අවසාන වන විට එතුමා පැමිණෙයිද කියලා අපි බලමු. පළමු වටය අවසන් වන්න පෙර එතුමා පැමිණියොත් පළමු වටයේ අවසාන ප්‍රශ්නය විධියට මේ ප්‍රශ්නය ගනිමු.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

හොඳයි, ගරු කථානායකතුමනි.

## එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල වාර්ෂික සැසිය : ශ්‍රී ලංකා නියෝජිත පිරිස
## ஐக்கிய நாடுகள் பொதுச் சபையின் வருடாந்த அமர்வு: இலங்கைத் தூதுக் குழு
## ANNUAL SESSION OF GENERAL ASSEMBLY OF UNITED NATIONS : DELEGATION FROM SRI LANKA

196/'18

**5. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2016 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩල වාර්ෂික සැසිය සඳහා ජනාධිපතිතුමාගේ සංචාරයට සහභාගි වූ දූත පිරිස කොපමණද;

(ii) උක්ත සංචාරයට සහභාගි වූ පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් දූත පිරිසට ඇතුළත් වූ පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සංචාරය සඳහා රජය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම් විසින් දැරූ සම්පූර්ණ පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2016 ஆம் ஆண்டில் ஐக்கிய நாடுகள் அமைப்பின் பொதுச் சபையின் வருடாந்த அமர்வுக்கான சனாதிபதி அவர்களின் விஜயத்தின்போது கலந்து கொண்ட தூதுக் குழுவினர் எத்தனை பேர்;

(ii) மேற்படி விஜயத்தில் கலந்து கொண்ட ஆட்களின் பெயர்கள் மற்றும் இவர்கள் தூதுக் குழுவில் உள்ளடங்கிய அடிப்படை வெவ்வேறாக யாவை;

(iii) மேற்படி விஜயத்துக்காக அரசு, அரச கூட்டுத் தாபனங்கள், நியதிச்சட்ட சபைகள் மற்றும் அரச கம்பனிகளில் ஏற்றுக்கொள்ளப்பட்ட மொத்தச் செலவுகள் எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the number of persons included in the delegation that joined the President to participate in the annual session of the General Assembly of the United Nations in 2016;

(ii) the names of the persons who joined the above tour and the basis on which they were included in the delegation, separately; and

(iii) the total cost which the tour incurred on the Government, public corporations, statutory boards and public companies?

(b) If not, why?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබාදෙනවා.

(අ) (i) 60කි.

(ii) ඇමුණුම 01හි ඒ සම්බන්ධ තොරතුරු ඇතුළත් වනවා. ඇමුණුම 01 **සභාගත*** කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, එම ඇමුණුම කියවන්න ඕනෑද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

එම ප්‍රශ්නයට පිළිතුර මොකක්ද කියලා දන්නේ නැතිව මට අතුරු ප්‍රශ්න ඇසිය නොහැකි වනවා. එම නිසා ඔය ඇමුණුමෙහි සඳහන් අවසාන නම් 10වත් මට කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වේලාව පිළිබඳ අවධානය යොමු කරන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, අන්තිමටම තිබෙන්නේ ආරක්ෂක නිලධාරින්ගේ නම්. මම ඒ නම් කියන්නම්.

එච්.පී.එස්.කේ. විමලසිරි මහතා - පොලිස් කොස්තාපල්

ඩබ්ලිව්.ඒ.එන් සෙනෙවිරත්න මහතා - පොලිස් කොස්තාපල්

ඩී.එල්.කේ. රුද්‍රිගු මහතා - පොලිස් සැරයන්

එස්.එල්.ගයාන් සේනාරත්න මහතා - ආරක්ෂක නිලධාරි

ජී.එම්.ජී.ඩබ්. අමරකෝන් මහතා - ආරක්ෂක නිලධාරි

ටී. එම්. ජී. තෙන්නකෝන් මහතා - උප පොලිස් පරීක්ෂක

කේ.ආර්.එම්. සුමනවර්ධන මහතා- පොලිස් අධිකාරි

එස්.ජී.ආර්.පී. ජයතිලක මහතා - ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි

එස්.එම්. වික්‍රමසිංහ මහතා -ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති

එම්.පී.එල්.මුණසිංහ මහතා -රියැදුරු

ලහිරු අනුරාධ රූපසිංහ මහතා - විශේෂ සහායක

(iii) රුපියල් 124,512,970.39යි. ඇමුණුම 02 **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, පෙර ජනාධිපතිවරුන් විදේශ සංචාරවලට විශාල පිරිස් රැගෙන යමින් මහජන මුදල් කෝටි ගණනින් නාස්ති කළ බව පසුගිය ජනාධිපතිවරණයේදී දිගින් දිගටම විවේචනය කර, සරල ජනාධිපතිවරයෙක් පිළිබඳ ප්‍රතිරූපයක් මවමින් බලයට ආපු ජනාධිපතිතුමන් රුපියල් දොළොස්කෝටි හතලිස් නවලක්ෂයක් එක් සංචාරයකට වැය කරමින් 60දෙනෙක් වැනි විශාල පිරිසක් සමඟ විදෙස් සංචාරයක යෙදීම පසුගිය ජනාධිපතිවරණයේදී ලබා දුන් පොරොන්දුවලට පටහැනිව, ජනතාව රැවටීමක් කියා ඔබතුමා පිළිගන්නවාද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, මේ සංචාරයට සහභාගි වුණු 60දෙනා සම්බන්ධයෙන් තමයි කරුණු ඉදිරිපත් කරලා තිබෙන්නේ. ජනාධිපති කාර්යාලයෙන් එවා තිබෙන මේ ඇමුණුම මඟින් ඒ ගොල්ලන් සහභාගි වුණු පදනම ඉතාම පැහැදිලිව සඳහන් කර තිබෙනවා. ඒ පදනම ගැන මට මෙතැන ප්‍රශ්න කරන්න බැහැ. ඒක ජනාධිපති කාර්යාලයෙන් තීරණය කරන දෙයක්. නමුත්, පසුගිය කාලයේ හිටපු ජනාධිපතිවරු මීට වඩා දූත පිරිස් අරගෙන එක් එක් විදෙස් සංචාරවලට සහභාගි වූ ආකාරය අපි දැක්කා. ඒ සංචාරවලට සහභාගි වූ දූත පිරිස්වලට වඩා අඩුවෙන් තමයි මේ සංචාරයට දූත පිරිස සහභාගි වෙලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විදෙස් සංචාරවලට 40ක, 50ක දූත පිරිස් අරගෙන යෑම වැරැදියි කියලා විවේචනය කරමින්, 50ක, 60ක දූත පිරිසක් අරගෙන යෑම තමයි මෙතැන ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමා දැන් කියනවා, "පදනම ප්‍රකාශ කරන්න බැහැ" කියලා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම අහන්නේ මෙවැනි දූත පිරිසක් අරගෙන යෑම පසුගිය ජනාධිපතිවරණයේදී දුන් පොරොන්දුවට පටහැනිද, නැද්ද කියන එක විතරයි. කලින් ජනාධිපතිවරු මේ විධියට දූත පිරිස් අරගෙන ගිය එක වැරැදියි කියලානේ තමුන්නාන්සේලා බලය ගත්තේ. මම අහන්නේ, මේ කරලා තිබෙන වැඩේ දුන් පොරොන්දුවට පටහැනිද, නැද්ද කියන එක විතරයි.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, මේ පිරිස අරගෙන ගිය පදනම මට පැහැදිලිවම කියන්න පුළුවන්. ඒ පදනම මේ පළමුවෙනි ඇමුණුමේ තිබෙනවා. නමුත් එතුමා ඇහුවේ අන්තිම 10 දෙනා ගැන. ඒ අන්තිම 10 දෙනා ආරක්ෂක නිලධාරින්, රියැදුරන් ආදී පුද්ගලයන් බව මම පැහැදිලිවම කිව්වා. දිගින් දිගටම මේ ගැන අහනවා නම් මම අනෙක් අය ගිය පදනමත් කියන්නම්. ඒ 60 දෙනාම ගියේ කොහොමද කියන සියලු විස්තර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, උත්තරය table කළාම මදිද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මේ 60 දෙනාම ඒ සංචාරයට ගෙන යන්න ඕනෑද නැද්ද කියන එක මට දැන් මේ සභාවේදී කියන්න බැහැනේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම කියන්න අමාරුයි නේ, නේද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, එතුමා කියන දේ බොහොම හොඳයි. එතුමා කියන්නේ මේ 60 දෙනා යෑම සාධාරණයි කියලානේ. ඒ අනුව, එතුමන්ලා එදා කළ විවේචනය වැරැදියි කියලා පිළිගන්නවා. ඒකට බොහෝම ස්තුතියි ගරු රාජ්‍ය ඇමතිතුමනි.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, පසුගිය කාලයේ planes පිටින් ගිය එක හරි, ඒ planes එහේ නවත්වාගෙන හිටිය එක හරි, ඒ පිරිස් ඒ සංචාරවලට ගිය පදනමවත් අද වෙනතුරු මේ පාර්ලිමේන්තුවට නොකියපු එක හරි කියලා එතුමා කියනවා නම්, ඉතින් අපි-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන වාද විවාදවලට යන්නේ නැතිව ඊළඟ ප්‍රශ්නයට යමු.

## කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ මිරිදිය ධීවරයන්: සහන
### கிளிநொச்சி மாவட்ட நன்னீர் மீனவர்கள்: நிவாரணம்
### FRESHWATER FISHERMEN IN KILINOCHCHI DISTRICT: RELIEF

217/'18

**6. ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙන වැව් 11ක් ආශ්‍රිතව පවුල් 750ක් පමණ මිරිදිය මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන බවත්;

(ii) මෑතක සිට පවතින දැඩි නියඟය හේතුවෙන් මෙම පවුල්වල ජීවනෝපාය මුළුමනින්ම පාහේ අහිමි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ජනතාවගේ ජීවනෝපාය පිළිබඳ අවධානය යොමු කර, යම් වන්දියක් ලබා දීමට හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, ලබා දිය හැකි සහනය කවරේද

(iii) එම සහනය ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிளிநொச்சி மாவட்டத்தில் அமைந்துள்ள 11 குளங்களைச் சார்ந்ததாக ஏறக்குறைய 750 குடும்பங்கள் நன்னீர் மீன்பிடிக் கைத்தொழிலில் ஈடுபட்டுள்ளனரென்பதையும்;

(ii) அண்மையிலிருந்து நிலவிவருகின்ற கடும் வறட்சி காரணமாக இந்த குடும்பங்களின் வாழ்வாதாரம் முற்றாகவே இழக்கப்பட்டுள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இந்த மக்களின் வாழ்வாதாரம் பற்றிக் கவனம்செலுத்தி ஏதேனும் நட்டஈட்டினை வழங்கக்கூடிய இயலுமை உள்ளதா;

(ii) ஆமெனில் வழங்கக்கூடிய நிவாரணம் யாது

(iii) அந்த நிவாரணம் வழங்கப்படும் திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs:

(a) Is he aware that -

(i) approximately, 750 families are engaging in fresh water fishing industry associated to 11 lakes in Kilinochchi District; and

(ii) aforesaid families have been completely deprived of their livelihood owing to recent drought situation?

(b) Will he inform this House -

(i) whether there is any possibility of providing them with some relief measure with respect to their livelihood;

(ii) if so, aforesaid relief measure; and

(iii) the date on which aforesaid relief can be granted?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. කිළිනොච්චි දිස්ත්‍රික්කයේ නිත්‍ය ජලාශ 11ක් හා කාලීන ජලාශ 20කට වඩා වැඩි ප්‍රමාණයක් තිබෙන අතර මේ ආශ්‍රිතව පවුල් 750ක් පමණ ධීවර කර්මාන්තයේ නියුක්ත වේ.

(ii) පසුගිය කාලයේ පැවති දැඩි නියඟය හේතුවෙන් ධීවර කර්මාන්තයටද බලපෑම් ඇති විය. මෙහිදී කෘෂි කර්මාන්තයේ නියුක්ත වූ අර්ධ කාලීන ධීවර කාර්මිකයින්ට කෘෂි කාර්මික වන්දි ලබා ගැනීමට හැකි විය. නමුත් පූර්ණ කාලීන ධීවරයන්ට වන්දි ලැබී නොමැත.

(ආ) (i) ඔව්.

(ii) දිවයිනට බලපා ඇති දැඩි වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා 2017 වර්ෂයේදී අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළ අංක PS/CP27/2017 අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලැබුණු අංක අමප/17/1702/701/026 දරන අමාත්‍ය මණ්ඩල තීරණය (ඇමුණුම I) මගින් ඉදිරිපත් කරන ලද යෝජනා සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

ඇමුණුම 1 **සභාගත*** කරමි.

ඒ අනුව දැඩි නියඟය හේතුවෙන් ජීවනෝපාය අඩාලවූවන් සඳහා 2017.08.01 දින සිට මසකට රුපියල් 5,000ක වටිනාකමකින් යුතු වියළි සලාක සහනාධාරයක් ලබා දීමේ වැඩසටහනක් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද අතර මිරිදිය ධීවර කාර්මිකයන්ද එම වැඩසටහනට ඇතුළත්ය.

"දැඩි වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා 2017 වියළි සලාක සහනාධාර සහ 2018 නියං සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම" මැයෙන් 2018.03.16 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී. එය ඇමුණුම් IIහි ඇත. එය **සභාගත*** කරමි.

එමඟින් වියළි කාලගුණය හේතුවෙන් ජීවනෝපායමාර්ග අහිමි වූ මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන පවුල් 25,000කට මාස හතරක් සඳහා වියළි සලාක ලබාදීමට අවශ්‍ය වන මුදල රුපියල් මිලියන 500ක් පමණ වෙතැයි ඇස්තමේන්තුගත කර ඇත. එම යෝජනා සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යතුමා සහ කෘෂිකර්ම අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව එකඟවනු ලබන කරුණු අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට යෝජනා වී ඇත.

(iii) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நன்றி.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 - 233/'18 - (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රත්නපුර දිස්ත්‍රික්කයේ සමෘද්ධිලාභීන්: විස්තර
## இரத்தினபுரி மாவட்ட சமுர்த்தி பெறுநர்: விபரம்
## SAMURDHI BENEFICIARIES IN RATNAPURA DISTRICT: DETAILS

241/'18

**8. ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ සමෘද්ධි සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව, එක් එක් මැතිවරණ කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සමෘද්ධි ව්‍යාපාරයට අලුතින් පවුල් ඇතුළත් කරගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු හේෂාන් විතානගේ මහතා]

சமூக வலுவூட்டல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில் சமுர்த்தி நிவாரணங்கள் பெறுகின்ற குடும்பங்களின் எண்ணிக்கை ஒவ்வொரு தேர்தல் தொகுதிக் கமைய வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) சமுர்த்தி திட்டத்துக்கு புதிதாக குடும்பங்களைச் சேர்த்துக்கொள்வதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Social Empowerment:

(a) Will he inform this House-

(i) separately on per electorate basis, the number of families that receive the Samurdhi assistance in the Ratnapura District; and

(ii) the steps that would be taken by the Ministry to include new families for the Samurdhi Programme?

(b) If not, why?

**ගරු පී. හැරිසන් මහතා (සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - சமூக வலுவூட்டல்கள் அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Social Empowerment)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයෙන් එතුමා අසා තිබෙන්නේ, රත්නපුරය දිස්ත්‍රික්කයේ සමෘද්ධි සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව, එක් එක් මැතිවරණ කොට්ඨාස මට්ටමින්. අප ළඟ තොරතුරු තිබෙන්නේ මැතිවරණ කොට්ඨාස මට්ටමින් නොවෙයි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්.

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මා ඔබතුමාට පිළිතුර ඉදිරිපත් කරන්නම්.

(අ) (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සකස් කරන ලද එකී තොරතුරු පහත දැක්වේ.

| **අනු අංකය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **සමෘද්ධි සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව** |
|---|---|---|
| 01. | ඇහැලියගොඩ | 5,648 |
| 02. | කුරුවිට | 9,158 |
| 03. | කිරිඇල්ල | 3,906 |
| 04. | රත්නපුර | 8,576 |
| 05. | ඉඹුල්පේ | 6,213 |
| 06. | බලංගොඩ | 6,241 |
| 07. | ඕපනායක | 2,900 |
| 08. | පැල්මඩුල්ල | 9,644 |
| 09. | ඇලපාත | 4,748 |
| 10. | අයගම | 4,014 |
| 11. | කලවාන | 4,061 |
| 12. | නිවිතිගල | 6,123 |
| 13. | කහවත්ත | 4,948 |
| 14. | ගොඩකවෙල | 8,654 |
| 15. | වැලිගෙපොල | 3,712 |
| 16. | ඇඹිලිපිටිය | 11,177 |
| 17. | කොළොන්න | 5,164 |
| | **එකතුව** | **104,887** |

(ii) ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍ය මඟින් ජනතාව ඒ ගැන දැනුවත් කර තිබෙනවා. දැනට ප්‍රාදේශීය ලේකම්, සමෘද්ධි නිලධාරින්, සංවර්ධන නිලධාරින් හරහා ලැබී ඇති අයදුම් පත් පරීක්ෂා කර බලා, ඒ අනුව සහනාධාර ලබා දීමට කටයුතු කරන බව මතක් කරන්න කැමැතියි.

(ආ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

මෙම ප්‍රශ්නයට විස්තර සහිතව උත්තරයක් ලබා දීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. සමෘද්ධි ව්‍යාපාරය අපේ රටේ අහිංසක දුප්පත් මනුස්සයා සමෘද්ධිමත් කරන්න, ශක්තිමත් කරන්න විශාල පිටිවහලක් වෙනවාය කියන කාරණාව අපි කවුරුත් පිළිගන්නවා. ගරු ඇමතිතුමනි, නමුත් පසු ගිය අවුරුදු ගණනාවක සිට මේ සමෘද්ධි ව්‍යාපාරය දේශපාලනීකරණය වීම නිසා චෝදනාවට, දෝෂදර්ශනයට ලක් වන බව මම විතරක් නොවෙයි, මේ රටේ ඕනෑම කෙනෙක් දන්නවා. ගරු කථානායකතුමනි, අපේ මහජන දිනවලදී පැමිණෙන ජනතාවගෙන් වැඩි දෙනෙකුගේ ඉල්ලීම වන්නේ සමෘද්ධි සහනාධාරය ලබා ගැනීමයි. එක්සත් ජාතික පාක්ෂිකයන් වීම තුළ සමෘද්ධි සහනාධාරය අහිමි වුණු විශාල පිරිසක් ඉන්නවා. ගරු කථානායකතුමනි, ඒ නිසා පාට, පක්ෂ ගැන හිතන්නේ නැතිව මේ සමාජයට සාධාරණයක් ඉෂ්ට කළ යුතු බවයි මම කියන්නේ. මොකද, මේ ක්ෂේත්‍රය තුළ වැඩ කරන නිලධාරින් විශාල පිරිසක් මේ රටේ ඉන්නවා. ග්‍රාම නිලධාරින්, ආර්ථික සංවර්ධන නිලධාරින්, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින් ඉන්නවා. හැබැයි, "සමෘද්ධි නිලධාරියා" කියන තනතුරේ සිටින බහුතරයක් මේ චෝදනාවට ලක් වීම නිසා, මෙය දේශපාලනීකරණය වීමක් බවට සමාජය තුළ කථාවක් යනවා. ඒ නිසා මම අපේ අභිනව ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, මේ සමෘද්ධි සහනාධාරය ලැබිය යුතු හැම කෙනකුටම එය දේශපාලන භේදයකින් තොරව ලබා දීම සඳහා ගන්නා වූ ක්‍රියා මාර්ගය කුමක්ද කියා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, 1995 වර්ෂයේ මේ සමෘද්ධි ව්‍යාපාරය පටන් ගන්න කොට සමෘද්ධි නිලධාරින් හැටියට බඳවා ගත්තේ දේශපාලනය කරපු ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්; එහෙම නැත්නම් ඒ අයගේ දරුවන්. ඒ වාගේම සමෘද්ධිලාභීන් තෝරා ගැනීමේදී බොහෝ වෙලාවට ඒ අය සලකා බැලුවේ ඔවුන්ගේ දේශපාලන පාක්ෂිකත්වය විතරයි. ඒ නිසා තමයි මෙතුමා කියපු ප්‍රශ්නය මතු වුණේ. එහෙත් අනාගතයේ දී අපි එහෙම කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. පාට, පක්ෂ කණ්ණාඩි දාලා බලන්නේ නැතිව, සමෘද්ධි නිලධාරි මහතාගෙන්, ග්‍රාම නිලධාරි මහතාගෙන්, සංවර්ධන නිලධාරි මහතාගෙන් සහ ප්‍රාදේශීය ලේකම්ගෙන් සැදුම්ලත් කමිටුවකින් නියමිත සුදුස්සෝ කවුද කියන එක තෝරලා සමෘද්ධිය ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට ලබාදුන් පිළිතුර වෙනුවෙන් ස්තුතිවන්ත වනවා. ගරු ඇමතිතුමාගේ පිළිතුරෙන් මතු වුණු කාරණයක් පිළිබඳව පැහැදිලි කර ගැනීමක් කරන්න කැමැතියි. ඒ විධියේ දේශපාලන පදනමකින් තෝරාගත් නිලධාරින් හරහා සමෘද්ධි ව්‍යාපාරය දේශපාලනීකරණය වෙලා තිබෙන බවත්, අනාගතයේ දී එය නිර්දේශපාලනීකරණය සඳහා කටයුතු කරන බවත් ඔබතුමා සඳහන් කළා. පසු ගිය අවුරුදු තුනහමාර තුළ මේ රටේ අහිංසක මිනිස්සුන්ට සමෘද්ධි සහනාධාරය ලබා දෙන්න අපට පුළුවන්කමක් ලැබුණේ නැහැ. මම මුලින් කියපු කණ්ඩායම අවුරුදු 20ක් තිස්සේ සමෘද්ධිය නොමැතිව ඉඳලා, මේ අවුරුදු තුනහමාරත් එක්ක සමෘද්ධිය අහිමි වෙලා දැනට අවුරුදු 24කට ආසන්න කාලයක් ගතවෙලා තිබෙනවා. එම නිසා ඔබතුමාගෙන් මා ඉල්ලීමක් කරන්න කැමැතියි. සමෘද්ධිය ලබා නොදිය යුතු විශාල පිරිසක් සමෘද්ධිය භුක්ති විඳිනවා. ස්වාධීන පරීක්ෂණයක් කරලා අන්න ඒ පිරිසත් හඳුනාගෙන, සමෘද්ධිය ලැබිය යුතු සියලු දෙනා වෙත සමෘද්ධිය ලබා දීමට ගරු අමාත්‍යවරයා විධියට ඔබතුමා පියවර ගෙන තිබෙන බව මම දන්නවා. අමාත්‍යාංශය විධියට එම වැඩ පිළිවෙළ කඩිනම්ව ක්‍රියාත්මක කිරීමට පුළුවන් වෙන්නේ කුමන දින වකවානුවලද කියන එක ගැන ජනතාවට බලාපොරොත්තුවක් දෙන්න පුළුවන්ද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, අපි දැනට කරගෙන යන වැඩ සටහන් අනුව අගෝස්තු මාසයට පෙර අලුතින් පවුල් ලක්ෂ දෙකකට ආසන්න ප්‍රමාණයකට සමෘද්ධි සහනාධාරය ලබා දීමට අවශ්‍ය කටයුතු කරගෙන යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 9 -311/'18- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම අද මගේ අන්තිම ප්‍රශ්නය අහනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, 8වැනි පාර්ලිමේන්තුවේ වැඩියෙන්ම ප්‍රශ්න අසන මන්ත්‍රීවරයාගේ අවසන් ප්‍රශ්නයට පිළිතුරු දීමට නොහැකි වීම පිළිබඳව විශේෂයෙන්ම මම කනගාටු වෙනවා. මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්න ඇසීම වෙනුවෙන් එතුමාට අද සවස නියෝජ්‍ය අමාත්‍ය ධුරයක් ලැබෙන්නට නියමිතයි කියා මට දැනගන්න ලැබී තිබෙනවා. මෙම ප්‍රශ්නයට අද දිනයේ පිළිතුරු ලබා දීමට නොහැකිවීම සම්බන්ධයෙන් කනගාටු වන අතර, ඉදිරියේ දී උත්තර ලබා දෙන්නට මම බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, අද උදේ මට දිවුරුම් දෙන්න එන්න කියලා තිබියදීත් ඒ සඳහා නොගියේ මේ ප්‍රශ්නය අහන්නම වුවමනා නිසායි. මෙය ඉතා වැදගත් ප්‍රශ්නයක් බව ඔබතුමාටත් වැටහෙනවා ඇති. ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමාත් මේ ගැන දන්නවා ඇති. අපේ පළාත්වලට එන බස්රථවලින් දිගට හරහට කප්පම් ගන්නවා. මෙය ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නය අද අහන්න වුවමනා නිසාම තමයි මම දිවුරුම් දෙන එකත් පැය ගණනක් ප්‍රමාද කළේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, ඔබතුමා අද හවස් වරුවේ දිවුරුම් දෙන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න කල් ගත්තාම මට උත්තරය ලැබෙන්නේ නැහැ නේ.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා ඉක්මනට දිවුරුම් දෙන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අද උදේ මට දිවුරුම් දෙන්න එන්න කියලා තිබුණත්,මේ ප්‍රශ්නයට පිළිතුරක් බලාපොරොත්තු වූ නිසාමයි මම දිවුරුම් දීම සවසට යොදා ගත්තේ. එහෙම නැත්නම් මට උදේ දිවුරුම් දෙන්න තිබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පිළිතුර දෙනවාද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මේ ප්‍රශ්නයට මට මොකක් හරි උත්තරයක් ඕනෑ.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු කථානායකතුමනි, මෙවැනි ප්‍රශ්නයක් තිබෙන බව අපට දැනගන්නට ලැබී තිබෙනවා. ඒ පිළිබඳව සොයා බැලීමේ කටයුත්ත අපි පොලීසියට භාර දීලා තිබෙනවා. එතුමා නියෝජ්‍ය ඇමතිවරයකු විධියට දිවුරුම් දුන්නාට කමක් නැහැ, මම මේ ප්‍රශ්නයට ඉදිරියේ දී පිළිතුරු සපයන්නට බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වතු කම්කරුවන්ගේ නිවාස ප්‍රශ්නය : විසඳුම්
## தோட்டத் தொழிலாளர்களது வீட்டுப் பிரச்சினை: தீர்வு
## ESTATE WORKERS' HOUSING PROBLEM: SOLUTIONS

383/'18

**10. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වතුකරයේ පදිංචි ද්‍රවිඩ කම්කරුවන් පවුල් ලක්ෂ 08ක් පමණ මේ දක්වා අඩි 10x12 ලයින් කාමරවල ජීවත්වන බව පිළිගන්නේද;

(ii) ඔවුන්ට නිවාස ලබාදීම සඳහා පසුගිය රජය විසින් ආරම්භ කළ වැඩපිළිවෙළට අනුව 2014.12.31 දින වනවිට ඉදිකර තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් නිවාස ඉදිකර ඇති වතු සහ දිස්ත්‍රික්ක කවරේද;

(iv) 2015, 2016 සහ 2017 වර්ෂවලදී මෙම ව්‍යාපෘතියට වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(v) 2015, 2016 සහ 2017 වර්ෂවලදී ඉදිකළ නිවාස සංඛ්‍යාව, එක් එක් වර්ෂය සහ දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) වතුකරයේ ජීවත්වන ජනතාවට පැවති රජයන් විසින් ලබා දී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(vii) මෙම නිවාස ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳීමට ගතවන කාලය කොපමණද;

(viii) එම වැඩපිළිවෙළ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பெருந்தோட்டங்களில் வசிக்கின்ற சுமார் 08 இலட்சம் தமிழ் தொழிலாளர் குடும்பங்கள் இற்றைவரை 10x12 அடிகளைக் கொண்ட லயன் அறைகளில் வாழ்கின்றனரென்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(ii) இவர்களுக்கு வீடுகளை வழங்குவதற்காக கடந்த அரசாங்கத்தினால் ஆரம்பிக்கப்பட்ட வேலைத் திட்டத்திற்கமைய 2014.12.31 ஆம் திகதியளவில் நிர்மாணிக்கப்பட்டிருந்த வீடுகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) மேற்படி (ii) இல் குறிப்பிட்டுள்ள வீடுகள் நிர்மாணிக்கப்பட்டுள்ள பெருந்தோட்டங்கள் மற்றும் மாவட்டங்கள் யாவையென்பதையும்;

(iv) 2015, 2016 மற்றும் 2017 ஆம் ஆண்டுகளில் இக் கருத்திட்டத்திற்காக ஒதுக்கப்பட்ட நிதி ஏற்பாட்டுத் தொகை எவ்வளவென்பதையும்;

(v) 2015, 2016 மற்றும் 2017 ஆம் ஆண்டுகளில் நிர்மாணிக்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை, ஒவ்வொரு ஆண்டு மற்றும் மாவட்டத்துக்கமைய தனித்தனியாக எவ்வளவென்பதையும்;

(vi) பெருந்தோட்டங்களில் வாழ்கின்ற மக்களுக்கு முன்னைய அரசாங்கங்களால் வழங்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிகை யாதென்பதையும்;

(vii) மேற்படி வீட்டுப் பிரச்சினையை முழுமையாக தீர்த்துவைப்பதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

(viii) மேற்படி வேலைத்திட்டம் பற்றிய தகவல்களை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Hill Country New Villages, Infrastructure and Community Development:

(a) Will he inform this House-

(i) whether he admits that nearly 08 lakhs of Tamil workers residing in the estates have been living in 10x12 feet line rooms up to now;

(ii) the number of houses that had been built by 31.12.2014 under the programme commenced by the previous government to provide housing for them;

(iii) the estates and the districts where the houses mentioned in (ii) above have been built;

(iv) the provisions allocated for this project in 2015, 2016 and 2017;

(v) the number of houses constructed in 2015, 2016 and 2017 separately, as per each year and district;

(vi) the number of houses provided to the people in the estate sector by the previous governments;

(vii) the time required to fully solve this housing problem; and

(viii) whether information on that arrangement will be submitted?

(b) If not, why?

**ගරු ලකී ජයවර්ධන මහතා (කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்கி ஜயவர்தன - மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Lucky Jayawardana - State Minister of Hill Country New Villages, Infrastructure and Community Development)

ගරු කථානායකතුමනි, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) පිළිගන්නෙමි.

කම්කරු හා කම්කරු නොවන මිලියනයකට ආසන්න ද්‍රවිඩ වැවිලි ප්‍රජාවක් වතුකරය තුළ ජීවත් වේ.

(ii) වර්ෂ 2004 හා 2014 අතර කාලය තුළ ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යාංශය හා පශු සම්පත් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මඟින් නිවාස 5,214ක් ඉදිකර ඇත.

(iii) ඇමුණුම 1හි දක්වා ඇත.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඇමුණුම 1ට අදාළව මට ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ඒකේ ලැයිස්තුවක් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. එය සභාගත කළාට පසුව ඔබතුමාට කියවන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, පිළිතුර කියවා අවසන් කළාම අපි කාටත් ලෙහෙසියි.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

(iv) 2015 වර්ෂය සඳහා රුපියල් මිලියන 350ක්, 2016 වර්ෂය සඳහා රුපියල් මිලියන 1,200ක් හා 2017 වර්ෂය සඳහා රුපියල් මිලියන 2,000කි.

(v) 2015 - නව ජීවන සහ හරිත රන් නිවාස වැඩසටහන් යටතේ නිවාස 385කි. (ඇමුණුම - II)

2016 - නව ජීවන සහ හරිත රන් නිවාස වැඩසටහන් යටතේ නිවාස 1,688 (ඇමුණුම - III)

ඉන්දියානු අරමුදල් ප්‍රදාන වැඩසටහන යටතේ නිවාස 1,134 (ඇමුණුම - IV)

2017 - නව ජීවන සහ හරිත රන් නිවාස ඉදිකිරීම් වැඩසටහන් යටතේ නිවාස 2,576 (ඇමුණුම - V)

ඉන්දියානු අරමුදල් ප්‍රදාන වැඩසටන යටතේ නිවාස 2,866 (ඇමුණුම - VI)

(vi) වර්ෂ 1993-2013 අතර කාලය තුළ නිවාස ඉදිකිරීම් වතු යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන, ඒකාබද්ධ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන වැඩසටහන, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, වතු සංවර්ධන සහායක වැඩසටහන හා සමාජ සුබසාධන වැඩසටහන II යටතේ නිවාස 26,391ක් ඉදිකර ඇත. 2004 හා 2014 අතර කාලය තුළ ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යාංශය හා පශු සම්පත් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මඟින් නිවාස 5,214ක් ඉදිකර ඇත.

ඒ අනුව පෙර පැවති රජයන් විසින් ඉදිකර ඇති මුළු නිවාස සංඛ්‍යාව 31,605කි.

(vii) අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය රජයෙන් සපයා දෙන්නේ නම් ඊළඟ වසර 05 තුළ සම්පූර්ණ කළ හැකිය.

(viii) ඉදිරිපත් කරමි. වැවිලි ප්‍රජාව සඳහා සකසන ලද ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016-2020) මේ සමඟ අමුණා ඇත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, ගරු රාජ්‍ය අමාත්‍යතුමා ඇමුණුම් සභාගත කළ නිසා අතුරු ප්‍රශ්න අහන්න කලින් ඒ ගැන පැහැදිලි කර ගන්න මට අවස්ථාවක් දෙන්න.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඇමුණුම් මා ළඟ නැති නිසායි මම මේ කාරණය අහන්නේ. නිවාස අධිකාරිය මඟින් හදන නිවාස, හරිත ගම්මාන මේකට පටලවා ගන්න එපා. ඉන්දියානු රජයේ ආධාර යටතේ කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය 2015, 2016 හා 2017 කියන වර්ෂ තුන තුළ ගෙවල් කීයක් හදා තිබෙනවාද කියා ඔබතුමා මට කියන්න.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ඒක තමයි මම මුලදී කිව්වේ. 2015දී "නව ජීවන" සහ "හරිත රන් නිවාස" වැඩසටහන් යටතේ නිවාස 385ක් හදා තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඔය "හරිත නිවාස" කියන්නේ මොකක්ද?

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

"හරිත රන් නිවාස" කියන්නේ නිවාස වැඩසටහනක්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඒ නිවාස හදා තිබෙන්නේ කොහේද?

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
වතුවලමම තමයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ වත්තේ නම මොකක්ද?

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
වතුවල ලැයිස්තුව ඇමුණුමේ සඳහන් කර තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාව අපහසුතාවට පත් කරන්න නොවෙයි මේ කාරණය ඇහුවේ. නිවාස හැදුවා නම්, ඒක ලොකු දෙයක්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔය කියන project එක වතුවල නොවෙයි, ගමේ තමයි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. මම ඔබතුමාගෙන් අහන්නේ, වතුකරයේ ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් හදපු නිවාස ගැනයි. ඔබතුමා උත්තර දෙනවා, සජිත් ප්‍රේමදාස මහත්තයා නිවාස අධිකාරියෙන් හදන නිවාස ගැන. මම අහන ප්‍රශ්නය ඒක නොවෙයි. මගේ ප්‍රශ්නය, වතුකරයේ- [බාධා කිරීමක්]

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
මේ නිවාස සියල්ලම හැදුවේ වතුකරයේයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, "හරිත නිවාස" කියන වැඩසටහන වතුකරයේ ක්‍රියාත්මක වුණු එකක් නොවෙයි.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ඒකත් වතුකරයේම එකක් තමයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා මට වත්තේ නම කියන්න කෝ. ඇමුණුම බලලා, ඔය නිවාස 385 හදලා තිබෙන එක වත්තක නමක් කියන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම මීට මාසයකට පමණ පෙර අපේ දිගම්බරම් ඇමතිතුමා එක්ක ලෙවලන්ඩ් වත්තට ගියා. ලෙවලන්ඩ් වත්තේ ගෙවල් 100ක් හැදුවා. ගරු සජිත් ප්‍රේමදාස ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ නොවෙයි, දිගම්බරම් ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් ඒ නිවාස හැදුවේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
පසුගිය සතියේ ගාල්ලේ වතු ආශ්‍රිතව හදපු ගෙවල් 25කට වඩා විවෘත කළා.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
මාතලේ පිටකන්ද වත්තෙත් ගෙවල් 50ක් හදා තිබෙනවාය කියා අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ අතුරු ප්‍රශ්නය මේකයි. වතුකරයේ මිලියනයක පමණ ජනතාවක් අඩි 10යි 10 ලයින් කාමරවල ජීවත් වෙනවා. ඒ මිනිසුන් අවුරුදු 100කට වැඩි කාලයක සිට ඒ ලයින් කාමරවල ජීවත් වනවා. මුලදී අම්මයි, තාත්තයි වත්තේ වැඩ කළේ. දැන් පවුල් 4ක් බවට පත් වෙලා තිබෙනවා. මේ අඩි 10යි 10 කාමරයේ පවුල් 4ක් ජීවත් වනවා. එයට විසඳුමක් හැටියට තමයි අපි වතුකරයෙන් පර්චස් 7ක් දීලා නිවාස හදා දෙන්න තීරණය කළේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය යටතේ 2004දී ඒ වැඩ පිළිවෙළ පටන්ගෙන, දැන් ඔබතුමා කියූ සංඛ්‍යා ලේඛන අනුව නිවාස 5,214ක් හැදුවා.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
2004 - 2014 කාලය තුළ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔව්. අපි ඒ කාලයේ නිවාස පන්දහස් දෙසිය ගණනක් හදා තිබෙනවා.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ඒ අවුරුදු දහය තුළ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔව්, ඒ අවුරුදු දහයක කාලය තුළ අපි ඒ නිවාස හදලා තිබෙනවා. මම අහන්නේ, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ගත වූ අවුරුදු තුන තුළ හැදූ නිවාස ගැනයි. ඔබතුමන්ලා පළමුවැනි අවුරුද්දේ ගෙවල් 316යි හදා තිබෙන්නේ.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
පළමුවැනි මාස තුනේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ගෙවල් ගණනාවක් හැදුවාය කියා ඔබතුමා කියනවා. කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මේ පිළිබඳව ලොකු උනන්දුවක් දක්වන බව මම දන්නවා. මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ දැන් ඉන්නවා. වතුකරයේ ජනතාවගේ මෙම නිවාස ප්‍රශ්නයේදී එතුමා මට උදවු කරාවි කියා මා හිතනවා. මම කියන්නේ මේ කාරණයයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, පවුල් ලක්ෂ 20ක්, 25ක් පමණ වන මෙම පිරිසට තමුන්නාන්සේලාගේ ආණ්ඩුව මේ ව්‍යාපෘතිය යටතේ මේ අවුරුදු තුන තුළදී ගෙවල් 1,500ක් හදා දීලා නැහැ.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
අපි ගෙවල් හදලා තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ, රාජ්‍ය ඇමතිතුමනි. ඔබතුමා සජිත් ප්‍රේමදාස ඇමතිතුමාගේ, - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු ලකී ජයවර්ධන රාජ්‍ය ඇමතිතුමා අලුතින් අමාත්‍යාංශයට පැමිණි නිසා මේ ගැන දන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඒක වතුකරයේ හදපු ගෙවල්වල ලැයිස්තුව තමයි. ඒ නිවාස ව්‍යාපෘතියේ නම තමයි, "හරිත රන් නිවාස" කියලා කියන්නේ.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගෙවල් හදලා තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හරි, හරි. පොඩ්ඩක් ඉන්න, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමනි.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
නාවලපිටිය ආසනයේ විතරක් ගෙවල් 300ක් හදා තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කොහේද?

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
නාවලපිටිය ආසනයේ. ඔබතුමා ගිහින් ඒවා බලන්න ඕනෑ. ඔබතුමා කොළඹ නේ, ඉන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමනි, ඔබතුමා අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. ඔබතුමාට වඩා මම නාවලපිටිය ගැන දන්නවා. ඔබතුමන්ලා කොහේද, ගෙවල් 300ක් හදලා තිබෙන්නේ? Barcaple Estate එකේ ගෙවල් 10ක් හදා තිබෙනවා. ගලමුදුන වත්තේ ගෙවල් 7ක් හදලා තිබෙනවා. නාවලපිටියේ හදලා තිබෙන්නේ ගෙවල් 17යි. [බාධා කිරීමක්] Barcaple Estate එකේ හදලා තිබෙන්නේ ගෙවල් 10යි, ගරු මන්ත්‍රීතුමනි. අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. ඔබතුමා බලාගෙන ඉන්න, ඒ අය ඔබතුමාට ඡන්දය දෙයි. ගෙවල් 17ක් හදලා, "ගෙවල් 300ක් හැදුවා" කියනවා. [බාධා කිරීමක්] වේලු කුමාර් මන්ත්‍රීතුමනි, මිනිසුන්ට අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. තමුන්නාන්සේ වතුකරයේ ජනතාවගේ ඡන්දය අරගෙන මෙතැනට ඇවිත් අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. [බාධා කිරීම්]

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ මෙහි පිළිතුර - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පැහැදිලි කරන්න. I cannot allow a prolonged debate on this. [බාධා කිරීම්]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු මන්ත්‍රීතුමනි, [බාධා කිරීම්] අපි open කරනවා. ඔබතුමාත් එන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කොහේද?

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
අපි මේ ඔබතුමාට ආරාධනාවක් කරන්නේ.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
නාවලපිටියට ගිහින් බලන්න. [බාධා කිරීමක්] ගෙවල් 300ක් හදා තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නාවලපිටියේ ගෙවල් 300ක් හදලා තිබෙනවා නම්,- [බාධා කිරීමක්] මම මන්ත්‍රීකමින් අයින් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, challenge එකක් තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පැහැදිලි කරනවාද? We have to finish this.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් අහගන්න. අමාත්‍යවරයෙක් මේ ගරු සභාවේදී යම්කිසි පිළිතුරක් ලබා දුන්නාම, එම පිළිතුර නිවැරදියි කියා අපි විශ්වාස කරනවා. ඒ ගැන argue කරන එකෙන් වැඩක් වෙන්නේ නැහැ. එහෙම නැත්නම් අපිට ඒ ගැන සොයා බලන්න පුළුවන්.

හොඳයි, දැන් ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය ගැන අහපු ප්‍රශ්නයකදී ගරු ජෝන් අමරතුංග ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී මට පිළිතුරක් ලබා දුන්නා. නමුත් ඒ පිළිතුර අසත්‍යයක්; වැරැදියි. මේ උත්තරයත් වැරැදියි. වැරැදි උත්තර දෙනකොට අපිට ඒක පිළිගන්න කියාද කියන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ පිළිතුර වැරැදියි නම් මම ඒ ගැන දැනුවත් කර, සොයා බලන්නම්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම වරදින්නේ කොහොමද, මේ පාර්ලිමේන්තුවේදී? අමාත්‍යවරුන් පාර්ලිමේන්තුවටත් බොරු කියනවා නම්, - [බාධා කිරීමක්] අහන්නේ දැන ගන්න. [බාධා කිරීමක්] **අම්මෝ! ඇමතිකම හම්බ වුණාම, කුක්කු පැටියා.**

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
දැන් නම් කථා කරනවා. ගරු ලකී ජයවර්ධන මැතිතුමනි, ඔබතුමා මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන රාජ්‍ය අමාත්‍යවරයෙක්. මම බොහොම ගරු කරන අමාත්‍යවරයෙක් ඔබතුමා. පහු වෙලා හෝ ඔබතුමාට ලැබුණු ඇමතිකම හොඳයි. හැබැයි වැඩක් නැහැ. ඔබතුමා වාගේ කෙනකුට, -[බාධා කිරීමක්] ඒක වෙනයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ගෙවල් මිලියන දෙකක අවශ්‍යතාව සපුරාලන්න වතුකරයේ සියලු ජනතාව ඔබතුමන්ලාට ඡන්දය දුන්නා. 2015, 2016 හා 2017 අවුරුදු තුනම බැලුවත්, තවම ගෙවල් 4,000ක් හදලා නැහැ.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගෙවල් 6,000ක් හදලා තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාගේ සංඛ්‍යා ලේඛන අනුව ගෙවල් 6,000ක් හැදුවාය කියනවා. මා එය පිළිගන්නම්කෝ. අවුරුදු 5කින් ලක්ෂ 20කට ගෙවල් දෙනවාය කියලා කිව්වා. නමුත් හදලා තිබෙන්නේ ගෙවල් 6,000යි. ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, මා ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. දිගම්බරම් ඇමතිතුමාට වැඩ කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. කරුණාකරලා එතුමාට සල්ලි දෙන්න. රුපියල් මිලියන 350ක් දීලා මොනවා කරන්නද? අමාත්‍යාංශයට රුපියල් මිලියන 350ක් දෙනවා. ඒ මුදල මොනවා කරන්නද? අද වතුකරයේ ගෙවල්වල ජීවත් වෙන්න බැහැ. වේලුකුමාර් මන්ත්‍රීතුමන්ලාට මිනිසුන් ඡන්දය නොවෙයි දෙන්න ඕනෑ. අපි ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ හදන ගෙවල් ඔබතුමා දැක්කාද? මා ඉතාම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, වතුකරයේ ජනතාවට හදන ගෙවල් දිහා බලන්නය කියලා. එක කණුවක උස ප්‍රමාණය බලන්න. ඒ ගෙදර මිනිහෙකුට ඉඳගන්න බැහැ. ඒකට ගෙපළ කපන්න සල්ලි දෙන්න ඕනෑ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙය ඉතාම අසාධාරණයි. ඒ නිසා මා ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඉල්ලීම කරන්න.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order? මේ සම්බන්ධයෙන් විවාදයක් ගෙන යන්න අමාරුයි. අද දවසේ වැඩ කටයුතු කරන්න තිබෙනවා.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
එතුමා මගේ නම කිව්වා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නාවලපිටිය ආසනයේ ඉන්නකොට ගෙවල් කීයක් හදලා තිබෙනවාද? එක ගෙයක් හදලා නැහැ. වත්තේ එක ගෙයක් හදලා නැහැ. මේ කෙටි කාලය තුළදී අපි ගෙවල් 300ක් හදලා තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ list එක පස්සේ දෙන්න. ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න ඇසීම අවසන් කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමනි, "සාර්ක් ගම්මානය" නමින් මහින්දානන්ද අලුත්ගමගේ උලපනේ ගෙවල් 1,000ක් හදලා තිබෙනවා. ඔබතුමා ගිහින් බලන්න. Craighead Estate එකේ ගෙවල් 200ක් හදලා තිබෙනවා. ඔබතුමා ගිහින් බලන්න. මල්ගොල්ල වත්තේ ගෙවල් 500ක් හදලා තිබෙනවා. මා

ආණ්ඩුවේ හිටපු කාලයේ ගෙවල් එක්දහස් ගණනක් හදලා තිබෙනවා. හදලා නැහැ කියනවා නම් ඔබතුමා ගිහින් බලන්න. මට ඔබතුමාත් සමඟ අමනාපයක් නැහැ. වේලු කුමාර් මන්ත්‍රීතුමනි, මගේ ප්‍රශ්නය මෙයයි.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

වතුකරයේ කීයෙන් කීදෙනකුට ගෙවල් දීලා තිබෙනවාද කියලා අපි දන්නවා නේ. [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, නාවලපිටිය ආසනයේ පවුල් 25,000ක් ඉන්නකොට ගෙවල් 17ක් හදලා මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. මෙය මගේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. ලකී ජයවර්ධන රාජ්‍ය ඇමතිතුමනි, මා කියන්නේ ඔබතුමා මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්න කියලායි. වතුකරයේ මිනිසුන්ට ගෙවල් හදන එක ගැන මා කථා කරනවාට වේලු කුමාර් මන්ත්‍රීතුමා විරුද්ධයි. මට කරන්න දෙයක් නැහැ. මා කියන්නේ මේ සඳහා ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නැහැ කියලායි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, අවශ්‍යතාව ගෙවල් මිලියන දෙකයි. ඔබතුමන්ලාට තවම පුළුවන්වෙලා තිබෙන්නේ ගෙවල් 6,000ක් හදන්නයි. ඒ නිසා පිළිගන්න, මේ අමාත්‍යාංශය අසාර්ථකයි කියලා. දිගම්බරම් ඇමතිතුමාට වැඩ කරන්න ආණ්ඩුවෙන් සල්ලි දෙන්න කියන්න. එතුමාට වැඩ කරන්න කියන්න. අපි කියන්නේ ඇමතිතුමාට වැඩ කරන්න සල්ලි දෙන්න කියායි. මොකද, මේ අමාත්‍යාංශයට සල්ලි නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ලකී ජයවර්ධන රාජ්‍ය ඇමතිතුමා මේ කාරණය ගැන අවධානය යොමු කරන්න.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

මේ අවුරුදු තුනේදී පසු ගිය අවුරුදු දහයට වඩා මේ ආණ්ඩුවෙන් ගෙවල් හදලා තිබෙනවා.

## 2017දී ඇති වූ ආපදා: අවතැන්වීම් සඳහා වන්දි
### 2017இல் இடம்பெற்ற அனர்த்தங்கள்: இடம்பெயர்ந்தோருக்கு நட்டஈடு
### DISASTERS IN 2017: COMPENSATION FOR DISPLACED

392/'18

**11.ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2017 වර්ෂය තුළ සිදු වූ හදිසි ආපදා තත්ත්වයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආපදාවලින් අවතැන් වූ සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(iii) දේපළ හානි සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(iv) අවතැන් වූවන් සඳහා වන්දි ලබා දීමට වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017 ஆம் ஆண்டில் இடம்பெற்ற திடீர் அனர்த்த நிலைமைகளின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி அனர்த்தங்களால் இடம்பெயர்ந்தவர்களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டத்தின்படி எவ்வளவு;

(iii) சொத்துச் சேதங்களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டத்தின்படி எவ்வளவு;

(iv) இடம்பெயர்ந்தவர்களுக்கு நட்டஈடு செலுத்துவதற்காக ஒதுக்கப்பட்டுள்ள நிதியேற்பாடுகளின் அளவு யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources and Disaster Management:

(a) Will he inform this House-

(i) the number of emergency disasters that toccurred in 2017;

(ii) the number of persons who got displaced owing to those disaster situations in relation to each district;

(iii) the number of instances of damage to property in relation to each district; and

(iv) the amount of money allocated to pay compensation for the displaced people?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2017 වර්ෂයේ දිවයිනට බලපෑ ප්‍රධාන ආපදා, 2017 මැයි මස ඇති වූ ගංවතුර හා නාය යෑමේ ආපදා තත්ත්වය, 2017 අප්‍රේල් මස ඇති වූ මීතොටමුල්ල ආපදා තත්ත්වය, 2016 ජූලි මස සිට ඇති වූ නියඟ ආපදා තත්ත්වය හා 2017 නොවැම්බර් මස ඇති වූ සුළි සුළං ආපදා තත්ත්වයන් වන අතර, ඊට අමතරව ප්‍රාදේශීය මට්ටමින් ආපදා රාශියක් සිදු වී ඇත. 2017 වර්ෂයේ දිවයිනේ සමස්ත ආපදා තත්ත්වය පිළිබඳ වාර්තාව ඇමුණුම (I)හි දැක්වේ.

(ii) ඇමුණුම (I)හි දැක්වේ.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) ඇමුණුම (II)හි දැක්වේ.

(iv) ඇමුණුම (III)හි දැක්වේ.

(ආ) පැන නොනඟී.

ඇමුණුම් **සභාගත*** කරමි..

මේ පිළිතුර ලබා දීලා තිබෙන්නේ කෙළින් උත්තර ලබා දෙන්න පුළුවන් විධියට නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. ඇමුණුම් හැටියට තමයි මෙහි තොරතුරු තිබෙන්නේ. දීර්ඝ වගුවක් තිබෙන්නේ. ඔබතුමාට ඒ ඇමුණුම් බැලුවොත් තේරෙයි. ඇමුණුම I අවසානයෙහි සටහන් කරලා තිබෙනවා, "මීතොටමුල්ල ආපදා තත්ත්වය නිසා විපතට පත් පවුල් සංඛ්‍යාව 275ක් වන අතර, පුද්ගල සංඛ්‍යාව 1,389ක් වේ." කියලා. ඇමුණුම (II) අවසානයේ සඳහන් කරලා තිබෙනවා, "මීතොටමුල්ල ආපදා තත්ත්වය නිසා පූර්ණ නිවාස හානි 75ක්ද, අර්ධ නිවාස හානි 35ක්ද සිදු විණි" කියලා. අනික් ඔක්කොම තොරතුරු වගුවක් හැටියටයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා. කියන්න තරම් ඒ පිළිතුර පැහැදිලි නැහැ. ඔබතුමාට මේ ඇමුණුම් එව්වොත් තේරුම් ගන්න පුළුවන් වේවි කියා මා හිතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම ඇමුණුම් බලලා අතුරු ප්‍රශ්න අහනවාද, ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා?

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මා මගේ අතුරු ප්‍රශ්න දෙක අහන්නම්, ගරු කථානායකතුමනි. ගරු ඇමතිතුමා, "අවතැන්වූවන් සඳහා වන්දි ලබා දීමට වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද" කියායි මා (අ) (iv) යටතේ විමසුවේ. ඔබතුමාට ඒ සම්බන්ධව පිළිතුරක් ලබා දෙන්න පුළුවන්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
පිළිතුර සම්බන්ධයෙන් මට සෑහීමකට පත් වෙන්න බැහැ. ඔබතුමා අහපු ප්‍රශ්නයට සාර්ථක පිළිතුරක් නොවෙයි මෙහි තිබෙන්නේ. නැවත එම පිළිතුර සකස් කරලා දෙන්න කියා මා ගරු ඇමතිතුමාට කියන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම හොඳයි නේද, ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා?

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මා අහනවා. විශේෂයෙන්ම මා මේ ප්‍රශ්නය අහන්නේ ආපදාවට ලක් වන දිස්ත්‍රික්කයක් වන රත්නපුර දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයෙකු හැටියටයි. රත්නපුර දිස්ත්‍රික්කයේ බරපතළ ආපදා තත්ත්වයක් ඇති වුණා. ඒ ආපදා තත්ත්වය නිසා රත්නපුර දිස්ත්‍රික්කයේ ගම්මාන සහ මැතිවරණ කොට්ඨාස ගණනාවක මිනිසුන් පණ පිටින් එහෙමම වැළලිලා ගියා. රත්නපුර දිස්ත්‍රික්කයේ ආපදාවට ලක් වෙච්ච සියලු දෙනාට රජය විසින් නියම කරන ලද වන්දි මුදල් මේ වනකොට ගෙවා අවසන් කර තිබෙනවාද කියන ප්‍රශ්නයටත් ඔබතුමාට පිළිතුරක් ලබා දෙන්න පුළුවන්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අද අපේ ගරු ඇමතිතුමා පිළිතුරු ලබා දෙන්න මේ ගරු සභාවට ඇවිල්ලාත් නැහැ. අපි හරියටම තොරතුරු දැනගෙන පිළිතුර ලබා දෙන්නම්. හැබැයි, අපේ දිස්ත්‍රික්කවල නම් නියමිත වේලාවට එම වන්දි මුදල්වලින් සෑහෙන ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. ඉතිහාසයේ කවදාවත් නොලැබුණු තරම් වන්දි මුදල් ප්‍රමාණයක් මෙවර ලැබුණා කියලා මිනිසුන් කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 12 - 410/'18 - (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 13- 424/'18 - (1), ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය. ප්‍රශ්න අංක 1 -18/'18 - (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු ආනන්ද අලුත්ගමගේ මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 - 159/'18 - (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමනි, දෙවන වටය නිසා පිළිතුර සභාගත කරන්න වෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ඇමතිතුමා ඇවිල්ලා ඉන්නවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)
ගරු කථානායකතුමනි, පිළිතුර ලබාදෙන්න විනාඩි දෙකකට වඩා ගත වන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ, ගරු ඇමතිතුමා. දෙවන වටයේදී අනුගමනය කරන ප්‍රතිපත්තියක් තිබෙනවා. ප්‍රතිපත්තිය කැඩුවොත් ඒක දිගටම යනවා. ඒ නිසා සභාගත කරමු.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, එතුමා පැමිණියහොත් උත්තර දෙන්න අවස්ථාව දෙනවා කියා ඔබතුමා පොරොන්දු වුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුර වාර්තා වෙනවා නේ. එම නිසා ගරු මන්ත්‍රීතුමනි, අමනාප වෙන්න එපා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඔබතුමා පොරොන්දු වුණා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මට පිළිතුරු දෙන්න පුළුවන්. නමුත් කාල වේලාවේ ප්‍රශ්නය තමයි තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාලවේලාව සම්බන්ධ ප්‍රශ්නයක් තමයි තිබෙන්නේ. ගරු ඇමතිතුමා පිළිතුර සභාගත කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, එහෙම නම් මම පිළිතුර සභාගත කරන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා ඉස්සෙල්ලා පිළිතුරු දෙන්න හැදුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි. හරි. මෙතැන වැරදීමක් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා ප්‍රමාද වූ නිසා මෙතුමාගේ ප්‍රශ්නය ගත්තේ නැහැ.

ඇමතිතුමා පැමිණියාට පසුව ගන්නම් කියලා මම කිව්වා. You are correct. මම අවස්ථාව දෙන්නම් කියලා කිව්වා. ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්න.

## උපාධි ප්‍රදානය කරනු ලබන ආයතන: විස්තර
### பட்டமளிப்பு நிறுவனங்கள்: விபரம்
### DEGREE AWARDING INSTITUTIONS : DETAILS

159/'18

**4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන උපාධි ප්‍රදානය කරනු ලබන ආයතන සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම එක් එක් ආයතනයේ,

(i) ලිපිනය;

(ii) උපාධි ප්‍රදානය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමතිය ලබාගෙන ඇති දිනය;

(iii) පිරිනමනු ලබන උපාධි;

(iv) ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව;

(v) එක් එක් උපාධි පාඨමාලාව සඳහා අයකරනු ලබන මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உயர்கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) தற்போது இலங்கையில் இயங்கிவருகின்ற பட்ட மளிக்கும் நிறுவனங்களின் எண்ணிக்கை யாது என்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) மேற்படி ஒவ்வொரு நிறுவனத்தினதும்,

(i) முகவரி;

(ii) பட்டமளிப்பதற்காக பல்கலைக்கழக மானிய ஆணைக்குழுவின் அங்கீகாரம் பெற்றுக் கொள்ளப்பட்ட திகதி;

(iii) அளிக்கப்படுகின்ற பட்டங்கள்;

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(iv) கல்வி பயிலும் மாணவர்களின் எண்ணிக்கை;

(v) ஒவ்வொரு பட்டப் பாடநெறிக்கும் அறவிடப்படுகின்ற பணத் தொகை;

தனித்தனியாக யாது என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education & Cultural Affairs:

(a) Will he inform this House of the number of degree awarding institutions in Sri Lanka at present?

(b) Will he also inform this House separately of -

(i) the address;

(ii) the date on which approval has been obtained from the University Grants Commission to award degrees;

(iii) the degrees awarded;

(iv) the number of undergraduates in them; and

(v) the fee charged for each degree course;

with respect to each of the said institutions?

(c) If not, why?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ආයතන සංඛ්‍යාව 19කි.

(ආ) (i) ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් උපාධි ප්‍රදානය කරනු ලබන ආයතන සඳහා උපාධි ප්‍රදාන තත්ත්වය ලබා දීමේ ක්‍රියාවලිය 2012.02.21 දින දක්වා සිදු කරන ලදී.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ සහ 70 ආ වගන්තිවල විධිවිධාන පරිදි සහ 2012.02.22 දිනැති අංක 1746/11 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා නිසි බලධාරියා ලෙස පත් කරන ලද අතර එතැන් සිට රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන උපාධි ප්‍රදාන ආයතන ලෙස පිළිගැනීම සහ ප්‍රතීතනය උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් සිදු කරන ලදී. ආයතන හා උපාධි ප්‍රදානය අනුමත කරනු ලැබූ දිනයන් ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත.

(iv) 2017.12.31 දිනට අදාළ ආයතන මඟින් සපයා ඇති තොරතුරු අනුව පිළිගත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි අධ්‍යාපනය හදාරන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 21,500කි. මෙය දැනට අධ්‍යාපනය ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ එකතුව වේ.

(v) රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන මඟින් උපාධි පාඨමාලා සඳහා අයකරනු ලබන ගාස්තු පිළිබඳ සංඛ්‍යා ලේඛන අමාත්‍යාංශය විසින් රැස් කරනු නොලැබේ.

(ඇ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය මෙසේයි.

බොහෝ උපාධි ලබාදීමේදී අනුකූලතා සහතිකයක් - compliance certificate එකක්- ආයතනයෙන් ඉල්ලා සිටිනවා. මේ උපාධි ප්‍රදානය කරන ආයතන සියල්ල එම සහතිකය ලබාගෙන තිබෙනවා කියා ඔබතුමාට සහතික කර කියන්න පුළුවන් ද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ ගැන තොරතුරු ලබාගෙන තමයි මට උත්තරයක් දෙන්න වෙන්නේ. එහෙම නැතුව මේ අවස්ථාවේදී ඒ ගැන කියන්න අපහසුයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එය පළමු වටයේ අහපු ප්‍රශ්නයක් විධියටයි record වෙන්න ඕනෑ; දෙවන වටයේ අහපු ප්‍රශ්නයක් විධියට නොවෙයි. නැත්නම් precedence එකක් වෙනවා.

දෙවන වටය, ප්‍රශ්න අංක 12.

## මන්නාරම දිස්ත්‍රික්කය තුළ විදුලි සැපයුම: විස්තර
## மன்னார் மாவட்ட மின்சாரம் விநியோகம்: விபரம்
## PROVISION OF ELECTRICITY IN MANNAR DISTRICT : DETAILS

410/'18

**12.ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக )
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 1983 වර්ෂය වනවිට මන්නාරම දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983 ஆம் ஆண்டளவில் மன்னார் மாவட்டத்தில் இலங்கை மின்சார சபையினால் மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென்பதையும்;

(ii) தற்போதைக்கு மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென் பதையும்;

(iii) 1984 முதல் 2009 ஆம் ஆண்டு வரை மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத் தொகை ஆண்டு வாரியாக எவ்வளவென் பதையும்;

(iv) 2009 ஆம் ஆண்டில் யுத்த நிலவரம் முடிவடைந்த பின்னர் 2015 ஆம் ஆண்டு வரை மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

(v) மேற்படி (iv) இல் குறிப்பிடப்பட்டுள்ள கால கட்டத்தில் மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House -

(i) of the number of houses in the Mannar District that had been provided with electricity supply by the Ceylon Electricity Board by year 1983;

(ii) of the total number of houses which have been provided with electricity supply by now;

(iii) of the amount allocated annually from year 1984 to 2009 for the supply of electricity on per year basis;

(iv) of the number of houses that have been provided with electricity supply up to year 2015 after the end of war situation in year 2009 on per year basis; and

(v) of the amount of money allocated for the supply of electricity during the period mentioned in (iv) above on per year basis?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කිසිවක් නැත. බෙදාහැරීම සිදු කරනු ලැබුවේ පළාත් පාලන ආයතනයෙනි.

(ii) මේ වන විට විදුලි සම්බන්ධතා 36,649ක් සපයා ඇත.

2015 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරීවරුන් මඟින් සිදු කරන ලද සංගණනය අනුව මන්නාරම දිස්ත්‍රික්කය තුළ විදුලි සේවාව ලබාගෙන නොමැති නිවාස ඒකක ගණන 4,331ක් බව වාර්තා වූ අතර, ඔවුනට විදුලි සේවාව ලබා ගැනීමට තිබූ ප්‍රධානතම බාධාව වූයේ විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස තනැඳුම් කිරීමට අවශ්‍ය මූලික පිරිවැය දැරීමට තිබූ නොහැකියාවයි.

ඒ අනුව 2015 වර්ෂයේ නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලද "රටම එළියයි අඳුර දුරලයි - ජාතික විදුලි සත්කාරය" ණය යෝජනා ක්‍රමය යටතේ මෙම පවුල් සඳහා විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස තනැඳුම් කිරීමට රු.45,000ක උපරිමයක් දක්වා ණය මුදලක් ලබා දුන් අතර, එම වැඩසටහන 2016 වර්ෂය අවසානය දක්වා ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වූ අතර, එම වැඩසටහන යටතේ 2016 වර්ෂයේදී නිවාස ඒකක 3,269ක් සඳහා විදුලි සේවාව ලබා දී ඇත.

2017 වර්ෂය තුළ මන්නාරම දිස්ත්‍රික්කයේ හඳුනාගත් නිවාස ඒකක අතරින් නිවාස ඒකක 1,049ක් සඳහා විදුලි සේවාව ලබා දී ඇත.

2018 වර්ෂයේ අප්‍රේල් මස අවසන් වන විට මන්නාරම දිස්ත්‍රික්කයේ හඳුනාගත් නිවාස ඒකක අතරින් නිවාස ඒකක 707ක් සඳහා විදුලි සේවාව ලබා දී ඇත.

(iii) 1984 වර්ෂයේ සිට 2009 දක්වා මන්නාරම දිස්ත්‍රික්කයේ විදුලි සැපයුම් සඳහා වෙන් කරන ලද මුදල් පහත සඳහන් වේ.

| වර්ෂය | වෙන් කරන ලද මුදල (රු.මිලියන) |
|---|---|
| 1984 | - |
| 1985 | - |
| 1986 | - |
| 1987 | - |
| 1988 | - |
| 1989 | 11.5 |
| 1990 | 0.25 |
| 1991 | - |
| 1992 | 4.97 |

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

| | |
|---|---|
| 1993 | 0.57 |
| 1994 | - |
| 1995 | - |
| 1996 | - |
| 1997 | - |
| 1998 | 8.48 |
| 1999 | - |
| 2000 | - |
| 2001 | - |
| 2002 | 2.17 |
| 2003 | 14.24 |
| 2004 | 18.68 |
| 2005 | 42.43 |
| 2006 | 21.78 |
| 2007 | 41.01 |
| 2008 | 90.58 |
| 2009 | 198.42 |

(iv) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විදුලි සැපයුම් ලබාදුන් නිවාස සංඛ්‍යාව පහත පරිදි වේ.

| වර්ෂය | අදාළ වර්ෂය තුළදී ලබාදුන් නව සබඳතා සංඛ්‍යාව | වර්ෂය අවසාන වන විට විදුලිය පරිභෝජනය කරනු ලබන සම්පූර්ණ නිවාස සංඛ්‍යාව |
|---|---|---|
| 2009.01.01 - 2009.12.31 | 198 | 8,331 |
| 2010.01.01 - 2010.12.31 | 876 | 9,207 |
| 2011.01.01 - 2011.12.31 | 3,299 | 12,506 |
| 2012.01.01 - 2012.12.31 | 3,504 | 16,010 |
| 2013.01.01 - 2013.12.31 | 5,577 | 21,587 |
| 2014.01.01 - 2014.12.31 | 3,079 | 24,666 |
| 2015.01.01 - 2015.12.31 | 2,971 | 27,637 |

(v) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විදුලි සැපයුම් සඳහා වෙන් කරන ලද මුදල පහත පරිදි වේ.

| වර්ෂය | වෙන් කරන ලද මුදල (රු.මිලියන) |
|---|---|
| 2009 | 134 |
| 2010 | 93 |
| 2011 | 112 |
| 2012 | 22 |
| 2013 | 55 |
| 2014 | 156 |
| 2015 | 254 |

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13 - 424/'18 - (1), ගරු ඉෂාක් රහුමාන් මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේ දී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම, ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත
### நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்
### NATION BUILDING TAX (AMENDMENT) BILL

"2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.***

***2018 ජූලි 03 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர் சார்பில் மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2018 யூலை 03, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Finance and Mass Media; to be read a Second time upon Tuesday, 03rd July, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order No. 8 of the Parliament, the hours of sittings of Parliament on this day shall be 1.00 p.m. to 6.30 p.m.. At 2.00 p.m. Standing Order No. 8(5) of the Parliament shall operate. At 6.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, ඔබතුමා යම් කාරණයක් ඉදිරිපත් කිරීම සඳහා විනාඩි කිහිපයක් ඉල්ලුවා. දැන් ඒ සඳහා අවස්ථාව තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද මුළු රටේම තැපැල් සේවය අඩපණ වී තිබෙනවා. තැපැල් සේවකයින් 26,000කට අධික සංඛ්‍යාවක් වැඩ වර්ජනයක යෙදී ඉන්නවා. ඊට අදාළව, ස්ථාවර නියෝග 19 යටතේයි මා මේ ප්‍රශ්නය අහන්නේ. තැපැල් සේවකයින්ගේ ඉල්ලීමට විසඳුමක් ලබා දීම සඳහා දීර්ඝ කාලයක් කටයුතු නොකර කල් දමන ලද සේවා ව්‍යවස්ථාව අලුතෙන් ඇති කිරීමට, එමඟින් 2006 ව්‍යවස්ථා සංශෝධනය කිරීමට ආණ්ඩුව එකඟ වුවද, එසේ කටයුතු කර නැති හෙයින් එය ඉටු කර ගැනීමට යළිත් අරඹා ඇති තැපැල් සේවක වැඩ වර්ජනය විසඳීමට රජයට පියවර ගත හැකිව තිබියදීත් එසේ කටයුතු නොකොට තැපැල් සේවාව අඩපණ වීමට ඉඩ දී ඇති බව පිළිගන්නේද?

26,000කට අධික තැපැල් සේවක වර්ජනය නිසා තැපැල් ලිපි බෙදීම රට පුරා නැවතී, එමඟින් සේවාවන් අඩපණ වී ඇත. මේ වන විට කටුනායක ගුවන් තොටුපොළේ විදේශ තැපැල් ලිපි දහස් ගණන් හිර වී තිබෙනවා. හැම තැපැල් කාර්යාලයකම ලිපි හිර වී තිබෙනවා. මේ බරපතළ ප්‍රශ්නය විසඳන්නට පුළුවන්කම තිබෙනවා. ගරු ඇමතිතුමා කරපු ප්‍රකාශය 2018 ජුනි 17 දින "ද සන්ඩේ ටයිම්ස්" පුවත් පතෙහි සඳහන් වනවා. මා එය කියවන්නම්:

"Minister of Posts & Postal Services, Abdul Haleem told “the Sunday Times”, the long term plan to settle the matter is by making the Postal Services a ‘Closed Department’,.."

- which had been agreed many months ago, but it has not been implemented -

"..wherein, salaries and matters regarding to recruitment can be decided independently. Hence, the Cabinet has appointed a Committee to resolve matters."

නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ වුවමනාවෙන්ම මේ ප්‍රශ්නය විසඳන්නට ක්‍රියා මාර්ග නොගෙන සිටීමයි. විසිහයදහසකට අධික තැපැල් සේවක වර්ජනය නිසා, තැපැල් බෙදීම රට පුරා නැවතී එමඟින් සේවාවන් අඩපණ වී තිබෙනවා. එම සාධාරණ සේවක ඉල්ලීමට එකඟ වී එය ක්‍රියාත්මක නොකර, වර්ජනයේ සිටින සේවකයන් සේවයෙන් ඉවත් කරන බවට තැපැල්පති කළ ප්‍රකාශය අපි හෙළා දකිනවා. තැපැල්පතිගේ එම ප්‍රකාශය ඉල්ලා අස්කර ගෙන, වහා ඉටු කළ හැකිව තිබෙන තැපැල් සේවක ඉල්ලීම් ඉටු කරන්නේ කවදා ද කියලයි අපි මේ අවස්ථාවේ රජයෙන් අහන්නේ. තැපැල් ලිපි ලක්ෂ දෙකහමාරක් හිරවී තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් අද කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා වුණා. ගරු තැපැල් ඇමතිතුමා ඒ අවස්ථාවේ පොරොන්දු වුණා, අද දවස ඇතුළත මේ ප්‍රශ්නය විසඳනවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කොහොම හරි විසඳනවා කියලා- [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අද කැබිනට් මණ්ඩලයේදී මේ කාරණය සාකච්ඡා වුණා. අද මේක විසඳනවා කියලා පොරොන්දු වුණා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කිසිවකු අස් කරන්නේ නැහැ කියලා-[බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒවා එහෙම කියන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද හැන්දෑ වනතුරු බලන්න.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, මේ කාරණාව සම්බන්ධයෙන්ද?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
නැහැ, ගරු කථානායකතුමනි. අපි මැයි 22 වැනිදා -එනම්, හරියටම මීට දින 27කට පෙර- ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් පිරිසක් අත්සන් කරලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා, දින නියමයක් නැතිව කල් යන පළාත් සභා මැතිවරණය පිළිබඳව මේ ගරු සභාවේ විවාදයක් අවශ්‍යයි කියලා. ගරු කථානායකතුමනි, පළාත් සභා මැතිවරණය කල් දමා මාස නවයක් වනවා, තව දවස් තුනකින්. දැන් මේ මොහොතේ මේ රටේ අතිගරු ජනාධිපතිතුමාට, ගරු අගමැතිතුමාට, ඔබතුමාට, විෂයභාර ඇමතිතුමාට කියන මේ කිසි කෙනකුට මේ මැතිවරණය පවත්වන දිනයක්, මාසයක් කියන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම දැනටමත් බ්‍රහස්පතින්දා දිනයේ අපේ පක්ෂ නායක රැස්වීමට විෂය භාර අමාත්‍යතුමා කැඳවා තිබෙනවා. එදින මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර පක්ෂ නායකයන් දැනුවත් කරනවා. ඊට පස්සේ මම ඔබතුමන්ලාට අවස්ථාව දෙන්නම්.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් විවාදයට දිනයක් දීමට එය බාධාවක් වන්නේ කෙසේද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එදාට අපි මේ සම්බන්ධයෙන් තීරණය කරනවා. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න බ්‍රහස්පතින්දා අපි හම්බ වෙනවා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඊළඟ සභා වාරයේදී අපට ඒ සඳහා දිනයක් ලැබෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම වෙන්න ඇති. බ්‍රහස්පතින්දාට ඇමතිතුමා කැඳවා තිබෙනවා. එතුමා ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් හම්බ වෙලා මේ සම්බන්ධයෙන් කථා කර ස්ථිර තීරණයක් අපට දෙන්න ඕනෑ. මොකද, එහෙම වුණේ නැත්නම් මටත් පත් කිරීමට සිදු වෙලා තිබෙනවා. එම නිසා ඔබතුමන්ලා තව දවස් තුනක් ඉන්න.

සභාව කල් තැබීම, ගරු සභානායකතුමා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ඊට ප්‍රථම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති. තව සුළු මොහොතකින් පක්ෂ නායකයින්ගේ රැස්වීම පැවැත්වෙන බවත් මේ අවස්ථාවේදී මා මතක් කරන්න කැමැතියි.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ඉදිරිපත් කළ වාර්තාවල නිර්දේශ
## அரசாங்கக் கணக்குகள் பற்றிய குழு சமர்ப்பித்த அறிக்கைகளின் சிபாரிசுகள்
## RECOMMENDATIONS MADE IN REPORTS PRESENTED BY COMMITTEE ON PUBLIC ACCOUNTS

[අ.භා. 2.03]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

> "රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය තුළ ඉදිරිපත් කරන ලද සියලුම වාර්තා පාර්ලිමේන්තුවේ අවධානයට ලක් විය යුතු නිසාත්, ඉදිරි ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී මෙම වාර්තාවලින් නිර්දේශිත කරුණු පිළිබඳව නිසි

> අවධානය යොමු කළ යුතු නිසාත්, මෙම වාර්තාවල අන්තර්ගතයන් පිළිබඳව පුළුල්ව සලකා බැලීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අටවැනි පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇතුළු ආයතන ගණනාවක් පිළිබඳව වන වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. එක් පැත්තකින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙකු හැටියටත්, මේ ගරු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු හැටියටත් මම කල්පනා කළා, ජනතාවට දැනගැනීම සඳහා මේ වාර්තාවේ අන්තර්ගතය පිළිබඳව අවධානය යොමු කරවන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව මඟින් රටේ මූල්‍ය පාලනය පිළිබඳ වගකීම පැවරෙන්නේ පාර්ලිමේන්තුවට. ඒ අනුව මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු 225දෙනාම මේ රටේ ජනතාවගේ බදු මුදල් පාලනය පිළිබඳව වග විය යුතු වනවා. ඒ වගවීම සමස්ත පාර්ලිමේන්තුවටම යම් වගකීමක් සහිතව ඉටු කිරීම සඳහා ඓතිහාසිකවම මෙම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා ඇති කරලා තිබෙනවා. එම කාරක සභා අපේ රටේ ඉතිහාසයක් පුරා තිබිලා 1972 ඔක්තෝබර් 26 වෙනිදා ජාතික රාජ්‍ය සභාව තුළින් මෙම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා පැන නැඟුණා. ඒ වාගේම ඊට පසු කාලයක පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වෙනම පැන නැඟුණා. මෙම අටවෙනි පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙත් සාමාජිකයෙක් හැටියට මම කටයුතු කරනකොට, වෙනදාට වඩා මේ කාරක සභා දෙකම තමන්ට පැවරුණු කාර්ය භාරය ඉටු කිරීම සඳහා විශාල මැදිහත්වීමක් කරනවා අපි දැක්කා. එක පැත්තකින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තමන්ට පැවරිලා තිබෙන ආයතන 837ක තිබෙන මූල්‍ය පාලනය පිළිබඳ විමර්ශන කටයුතු වේගවත් කිරීම සඳහා සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් මැදිහත් වුණා. ඒ වාගේම එතුමාගේ විශේෂ උනන්දුව යටතේම මෙම ආයතන සඳහා යම් කිසි ආකාරයක දියුණු තාක්ෂණය මුල් කරගෙන තොරතුරු තාක්ෂණ පද්ධති යනාදිය ජාලගත කිරීම සඳහා සැලැස්මක් දියත් වුණා. මේ කාරක සභාවේ මන්ත්‍රීවරු හැටියට ඉදිරි පියවර කිහිපයක් තියන්න පුළුවන්කම ලැබීම පිළිබඳ අපි සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී ආයතන එකින් එක ගෙන විමර්ශනය කරනවාට අමතරව, රටේ පැන නැඟුණු ප්‍රශ්න -මහ බැංකු බැඳුම්කර ගනුදෙනුව, ඒ වාගේම පසුගිය පාර්ලිමේන්තු සමයෙත් මේ පාර්ලිමේන්තු සමය දක්වා දික් වුණු සහල් ගනුදෙනුව, සමුපකාර අමාත්‍යාංශයේ මුදල් ගනුදෙනු, SAITM ආයතනය- සම්බන්ධව විශේෂ උනන්දුවක් ඇති කරන්නත්, එවැනි විශේෂ කාරණා වෙනම අරගෙන විමර්ශනය කරන්නත් අපට හැකි වුණා. ඒ සම්බන්ධයෙන් අනු වාර්තා අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මූල්‍ය පාලනය පිළිබඳව මෙම කාරක සභාවලට පැවරිලා තිබෙන වගකීම තවත් ඉස්සරහට අරගෙන යන්න ඕනෑ කියලා මම හිතනවා.

මම දැක්කා, මෙම කාරක සභා වාර්තා සම්බන්ධයෙන්ම පැවතුණු වැඩමුළුවකදී අපේ විගණකාධිපතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා, "අපේ රටේ සමහර නිලධාරින් හැසිරෙන විධිය අනුව ගත්තාම ලලිත් වීරතුංග මහත්මයා වාගේම මේ රටේ නිලධාරින්ගෙන් සියයට 50ක්ම ඉන්න ඕනෑ හිරේ"ය කියලා. ඒකෙන් එතුමා කියන්න අදහස් කරන්න ඇත්තේ මේ රටේ ජනතාවගෙන් බදු මුදල් වියදම් කිරීමේදී තවමත් අපට ඒ ආකාරයටම ජනතාවට වග වෙන්නට හැකියාවක් ලැබිලා නැහැ කියන එකයි. ඒ නිසා තමයි විගණකාධිපතිවරයා කියා තිබෙන්නේ, ඒ ඒ අමාත්‍යාංශවල ප්‍රධාන ගණන්දීම් නිලධාරින් හැටියට කටයුතු කරන රාජ්‍ය නිලධාරින්ගෙන් සියයට 50කට වඩා වැඩි ප්‍රමාණයක් හිරේ යන විධියට තමයි කටයුතු කරලා තිබෙන්නේ කියලා. එයින් අදහස් වෙන්නේ, රාජ්‍ය මූල්‍ය පාලනයේ වගකීම අපි එතරම් ශිෂ්ටසම්පන්න ආකාරයට සිද්ධ කරලා නැහැ කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මෙතැන තවත් ගැටලුවක් තිබෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ COPE එක වෙනුවෙන් අපි බොහෝ කාල වේලාවක් මිඩංගු කරලා මෙවැනි වාර්තා සකස් කළාට, මේ වාර්තාවලින් කරන්න පුළුවන් දේවල් මොනවාද? ඒක පාර්ලිමේන්තුවක් හැටියට අපි බරපතළ වශයෙන් සාකච්ඡාවට ගත යුතුයි. රාජ්‍ය මූල්‍ය පාලනයේ වගකීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට පැවරිලා තිබෙනවා. ඒ වගකීම ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවෙන් කාරක සභා දෙකක් පත් කළාටම, එයින් සියල්ල සිද්ධ වුණාය කියලා අත පිසදාගන්න අපට අයිතියක් ලැබෙන්නේ නැහැ; අවස්ථාවක් ලැබෙන්නේ නැහැ; හැකියාවක් ලැබෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාර්තා පරිශීලනය කරනකොට මතු වුණු ප්‍රධාන ප්‍රශ්න කීපයක් සම්බන්ධයෙන් මම මේ පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කරවන්න කැමැතියි. එකක් තමයි, අපි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කරලා ජනතාවගේ බදු මුදල් වග වීමකින් තොරව වියදම් කිරීම සම්බන්ධයෙන් යම් අනතුරු ඇඟවීමක් කළාට පස්සේ එයට ඇහුම්කන් දෙන්නට ඒ අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු එකඟතාවක් පළ කරනවා ද කියන එක. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිටින විවිධ පක්ෂවලට අයිති මන්ත්‍රීවරු ඒ කාරණය සම්බන්ධයෙන් තමන්ගේ පක්ෂයේ තිබෙන ප්‍රතිපත්තියට වඩා, ජනතාවගේ මුදල් සම්බන්ධ වගකීම කරට අරගෙන කටයුතු කරපු නිසා අපට පුළුවන්කම ලැබුණා එවැනි අවස්ථා කීපයක් පෙන්වා දෙන්න. උදාහරණයක් හැටියට අපි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාවේ 98වැනි පිටුවේ දක්වා තිබෙනවා, ආන්දෝලනයකට තුඩු දීපු කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගොඩනැඟිල්ල සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අදහස මොකක්ද කියන එක. පාර්ලිමේන්තුවේත් අපි විටින් විට මේ කාරණය සම්බන්ධයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. 2016 ජනවාරි පළමුවැනි දා සිට අප්‍රේල් 07වැනි දා දක්වා කාලය තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව කැඳවන ලද ආයතන අතර, 2016 අප්‍රේල් මස 07වැනි දා කෘෂිකර්ම අමාත්‍යාංශයත් කැඳවා තිබෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාවේ 98වැනි පිටුවේ මෙන්න මෙහෙම සඳහන්ව තිබෙනවා:

> "කෘෂිකර්ම අමාත්‍යාංශයේ දැනට පවත්වාගෙන යන ගොවිජන මන්දිර ගොඩනැඟිල්ල පාර්ලිමේන්තුවට පවරා ගැනීම හේතුවෙන් එම අමාත්‍යාංශය පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත නව ගොඩනැඟිල්ලක් තෝරා ගැනීමේදී එහි මිල, මිල කමිටුවකින් තීරණය කිරීම හෝ තරගකාරී මිල ගණන් කැඳවීමකින් තොරව වර්ෂ 5ක් සඳහා රුපියල් මිලියන 958ක පමණ කුලියක් ගෙවීමට ගනු ලැබූ තීරණය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව ඇති බත්තරමුල්ලේ හෙක්ටෙයාරයක පමණ ඉඩම මේ සඳහා සුදුසු ගොඩනැඟිල්ල ඉදි කිරීමට අවධානය යොමු නොකිරීම."

මෙතැන කාරණා දෙකක් තිබෙනවා. තරගකාරී මිල ගණන් කැඳවීමකින් තොරව අවුරුදු 5කට රුපියල් මිලියන 958ක් කුලී ගෙවන්නට ගත්ත තීරණය සහ කෘෂිකර්ම අමාත්‍යාංශයටම අයිති බත්තරමුල්ලේ තිබෙන හෙක්ටෙයාරයක පමණ ඉඩම ගොඩනැඟිල්ලක් හදන්නට යොදා නොගැනීම කියන කාරණා

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

දෙක කාරක සභාවේ අවධානයට අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. කාරක සභාව බොහොම පැහැදිලිව නිර්දේශ කරලා තිබෙනවා, "මෙම ගිවිසුම අත්සන් කිරීම සිදු නොකරන ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නියෝග නොකරන නමුත්, - මොකද, අපට අයිතියක් නැහැ ආණ්ඩුව ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තාට පසුව ඒකට අභියෝග කරන්නට.- ගිවිසුමට කාරක සභාවේ අනුමැතිය හිමි නොවන බව කාරක සභාව විසින් අවධාරණය කරන ලදී." කියලා. එසේම තිබෙනවා, "විගණකාධිපතිවරයා විසින් මේ සම්බන්ධයෙන් ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම්වලදී කාරක සභාවේ බලතල ප්‍රකාරව කටයුතු කිරීමට සිදු වන බව කාරක සභාව විසින් අවධාරණය කරන ලදී" කියලා.

අපේ රටේ මෑත කාලයේ ජනතාවගේ බදු මුදල් නිකරුණේ වියදම් කිරීම සම්බන්ධයෙන් තිබුණු හොඳම උදාහරණය වුණු කෘෂිකර්ම අමාත්‍යාංශයට ගොඩනැඟිල්ලක් කුලියට ගැනීම සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව අවධානය යොමු කරලා තිබෙනවා. ගිණුම් කාරක සභාවට තමන්ගේ සීමාව තුළ ඉඳිමින්, -අපට දේශපාලන විවේචනයක් තිබෙනවා අගමැතිවරයා කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධයෙන්. ඒ, දේශපාලන ප්‍රතිපත්තිමය විවේචනයක්.- රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වපසරිය තුළ ඒ ප්‍රතිපත්තිමය තීන්දුව අභියෝගයට ලක් කරන්නට බැරි වුණත්, ගිණුම් කාරක සභාව බොහොම පැහැදිලිව කියලා තිබෙනවා එම ගිවිසුමට කාරක සභාවේ අනුමැතිය හිමි නොවනවා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් තිබෙන ප්‍රශ්නය තමයි, මෙවැනි බරපතළ ගනු දෙනුවක් පිළිබඳව කාරක සභාව හැටියට අපි පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරලා තිබියදී අදාළ අමාත්‍යාංශයේ කෘෂිකර්ම අමාත්‍යවරයා හෝ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන ලද අගමැතිවරයා ඒ පිළිබඳව දක්වන ලද අවධානය කුමක්ද කියන එක. එතකොට මේ කාරක සභාව වාර්තාවක් ඉදිරිපත් කරලා ඇති ඵලය මොකක්ද? අපි සාකච්ඡා කරලා, ඉදිරිපත් කරන නිර්දේශයන් පිළිබඳව ආණ්ඩුව සැලකිල්ලට ගන්නේ නැත්නම්, ජනතාවගේ බදු මුදල් පිළිබඳව ව්‍යවස්ථාවෙන් අපට බලය පවරලා තිබුණාට ආණ්ඩුවේ අගමැතිවරයා සහ ඊට අදාළ ඇමතිවරු ඒ තීන්දු ගන්නේ හිතුමතේ නම්, "මොකක්ද කාරක සභාවට තිබෙන වග වීම" කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළමුවැනි කාරණය වන්නේ, ජනතාවගේ බදු මුදල් කිසිදු වග වීමකින් තොරව නිස්කාරණයේ වියදම් කරන එක වළක්වා ගන්න අපේ කාරක සභා සමත් වෙලා තිබෙනවාද කියන එකයි. දැන් මේ උදාහරණයෙන් පෙනෙනවා, අපි ඒකෙන් අසමත් වෙලා තිබෙනවා කියන එක. දෙවැනි කාරණය වන්නේ, ජනතාවගේ බදු මුදල් කිසිදු හිරිකිතයකින් තොරව මෙහෙම අවභාවිතයේ යොදවන කොට යම් කිසි හෝ නීතිමය ක්‍රියාමාර්ගයක් ගන්නට මේ කාරක සභාවන්ට පුළුවන්ද කියන එකයි. ඒකයි තිබෙන ඊළඟ ප්‍රශ්නය. යම් කිසි හෝ අවම වශයෙන් හෝ නීතිමය ක්‍රියාමාර්ග ගන්න පුළුවන්ද? බැහැ.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත් දත් නැති කටක් වාගේ තමයි. විලිස්ස - විලිස්සා ඉන්න පුළුවන්. ඒකෙන් මොකුත් හපන්න බැහැ. ඒ නිසා වෙලා තිබෙන්නේ මොකක්ද? රටේ සිදුවන මහා බරපතළ වංචා හෙළිදරව් කළාට එතැනින් එහාට අපට ගන්න පුළුවන් ක්‍රියාමාර්ගයක් නැහැ. මම මේ කියන්නේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ 2017 ජනවාරි 24 සිට මැයි 24 දක්වා ඉදිරිපත් කරන ලද සිව්වන වාර්තාව ගැනයි. එහි 86වැනි පිටුවේ 2014 මාර්තු 24වැනි දා සේවක අර්ථසාධක අරමුදල පිළිබඳව අපි කරපු විමර්ශනය පිළිබඳව විස්තරය තිබෙනවා. එහි ඉදිරිපත් වෙච්ච ප්‍රධාන කරුණක් වන්නේ මෙයයි:

> "2010 ජූලි මාසයේ ගුවන් සමාගමක කරන ලද රු. 500,000,000/- ආයෝජනයක් වෙනුවෙන් ද, 2010 මැයි මස 31 දින වන විට හෝටල් සමාගමක කොටස් මිලදී ගැනීමට සිදු කළ රු. 810,321,610/-ක ආයෝජනයක් වෙනුවෙන් සහ නව හෝටල් සංකීර්ණයකට 2013 වර්ෂ අවසානයේ සිදු කළ රු. 5,000,000,000/- ආයෝජන සඳහා අරමුදලට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබීම හා එම මුදල් මූල්‍ය ප්‍රකාශනවල හානිකරන අලාභයන් ලෙස කපා හැර තිබීම."

ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. රුපියල් මිලියන 6,310ක සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ව්‍යාපෘති තුනක ආයෝජනය කරලා තිබෙනවා. අරමුදලට කිසිදු ප්‍රතිලාභයක් ලැබිලා නැහැ. මේක පැහැදිලිවම රටේ ජනතාවගේ බදු මුදල් අවභාවිතා කිරීමක්. හැබැයි, මෙහෙම බරපතළ අවභාවිතාවක් වෙලා තිබියදීත් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ගන්න පුළුවන් නීතිමය ක්‍රියාමාර්ගයක් නැහැ. ඒ පිළිබඳව අපි සාකච්ඡා කරන්න ඕනෑ.

ස්ථාවර නියෝගවලින් හෝ පාර්ලිමේන්තුවේ වෙනත් අණ පනත්වලින් හෝ අඩු තරමින් මෙතැනින් එක දශමයක් හෝ එහාට යන්නේ කොහොමද, මේවාට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සඳහා යම් උත්තේජනයක් සපයන්නේ කොහොමද කියන එක ගැන සාකච්ඡා කරන්න ඕනෑ. මොකද, අපි හොඳටම දන්නවා මේ සිද්ධ වන දේ. අපි සෑහෙන කාලයක් මිඩංගු කරලා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මහ බැංකුවේ බැඳුම්කර වංචාව විමර්ශනයට ලක් කළාට, ඒ සම්බන්ධයෙන් footnotes ඇතිව හෝ නැතිව යම්කිසි ආකාරයක සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කළාට, "ඒක මම නීතිපති දෙපාර්තමේන්තුවට යවනවා" කියලා අගමැතිතුමා නැඟිටලා ගරු කථානායකතුමා කියන්නත් කලින් කිව්වාට අවුරුද්දක් යන කල් මොකුත් කළේ නැහැ. ඊට පසුව ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව හරහා තමයි එය නීතිපති දෙපාර්තමේන්තුවට ගියේ. මේ විදියට, සේවක අර්ථසාධක අරමුදලේ රුපියල් මිලියන හයදහස් ගණනක මුදලක් -රුපියල් බිලියන 6ක්- කිසිදු ප්‍රතිලාභයක් නොමැතිව ආයෝජනය කර අවභාවිත කර තිබෙන විටත් අපට ගන්න පුළුවන් ක්‍රියා මාර්ගයක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා තුන්වනුව අවධානය යොමු කරවනවා, මේ වාර්තා විසින් අදාළ අමාත්‍යවරුන් යම් සදාචාරමය බැඳීමකට හෝ ලක් කරනු ලබනවාද කියන ප්‍රශ්නයට. ඒකයි ඊළඟ ප්‍රශ්නය. නීතිමය ක්‍රියා මාර්ග ගන්න බැරි නම්, ජනතාවගේ බදු මුදල් පිළිබඳව වග වීමට සහතික වෙලා ඉන්න අපට -පාර්ලිමේන්තුවට- පුළුවන්කමක් තිබෙනවාද, ඒ අදාළ අමාත්‍යවරුන් අඩු තරමින් යම් සදාචාරමය බැඳීමකටවත් ලක් කරන්න?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හතරවන වාර්තාවේ 120වන පිටුවට. ඒ පිටුවේ වාර්තා වෙනවා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන්. මේ තමයි අපි 2017 මැයි 24වන දා නිකුත් කරපු වාර්තාව. මේ වාර්තාවේ 120 පිටුවේ සඳහන් වෙනවා, 2014 වර්ෂයේදී එවකට හිටපු උසස් අධ්‍යාපන අමාත්‍යවරයාට වාර්ෂිකව හිමි ගෙවල් කුලී දීමනා වෙනුවට එම සීමාව ඉක්මවා විදුලි හා ජල බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම කර තිබූ නමුත් ඒ සඳහා වැඩිපුර ගෙවූ රුපියල් 833,460ක මුදල ආපසු අය කර ගන්න කටයුතු කරගෙන නැහැ කියලා. රුපියල් 833,460ක් වැඩිපුර ගෙවා තිබෙනවා. ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා -උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා- රජයේ ගිණුම් පිළිබඳ

කාරක සභාවට මේ ප්‍රශ්නයට උත්තර බඳින්නේ කොහොමද? ඒ මෙහෙමයි. ඔහු මේ විධියට උත්තර දෙනවා.

"2009 මාර්තු 05 දිනැති 10/2007(1) දරන චක්‍රලේඛයට අනුව අමාත්‍යවරයෙකුට හිමි රු. 50,000/- ගෙවල් කුලී දීමනාව ගෙවමින් සිටියදී, එකල විශ්වවිද්‍යාලවල මතු වූ ගැටලු නිරාකරණය කිරීම සඳහා නිතිපතා විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සමඟ රැස්වීම් පැවැත්වීමට සිදු වූ බවත්, වියදම අඩුකර ගනු වස් ඒවා පැවැත්වූයේ අමාත්‍යවරයාගේ නිල නිවසේ බැවින්, ගෙවල් කුලී දීමනාව අනවශ්‍ය බව පැවසූ අමාත්‍යවරයා අදාල කාලයේ විදුලි හා ජල බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම ප්‍රමාණවත් බව දැන්වූ බවත්..."

යනාදි වශයෙන්.

ඒ කරුණු පෙන්වලා අමාත්‍යාංශය ජල, විදුලි බිල්පත් සඳහා රුපියල් 8,33,460ක් වැඩිපුර ගෙවා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තටම මේ ගැන සොයා බලන්න ඕනෑ. රුපියල් 50,000 බැගින් ගෙවල් කුලී ගෙව්වා නම් වැය වන්නේ රුපියල් ලක්ෂ 6යි. නමුත් "ගෙවල් කුලී එපා ඒ වැඩ කර ගන්නම්" කියලා, ඒ ගෙදර ලයිට් බිල්, වතුර බිල් සඳහා රුපියල් ලක්ෂ 8 1/2කට ආසන්න මුදලක් ගෙවාගෙන තිබෙනවා. ඒ කාරණය පැත්තකින් තියමු කෝ. හැබැයි, "විශ්වවිද්‍යාල උප කුලපතිවරු ඇතුළු ආචාර්ය මණ්ඩලය සමඟ ඇමතිවරයාගේ ගෙදරදී දිගින් දිගට සාකච්ඡා කරන්න සිද්ධ වුණා, ඒ නිසා තමයි මේ ලයිට් බිල් වතුර බිල් ගියේ" කියලා තමන්ගේ අමාත්‍යවරයා වෙනුවෙන් උත්තර දෙන්න ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාට සිද්ධ වෙනවා. මේ කරුණු රාජ්‍ය ගිණුම් කාරක සභාවේ විමර්ශනයට ලක් කරන බව දන්නා ඇමතිවරයා අඩු තරමින් සදාචාරමය බැඳීමකට යටත් කර ගන්නවත් අපේ කාරක සභාවේ විමර්ශන සමත්වෙලා නැහැ.

ඒ විතරක් නොවෙයි, මෙම වාර්තාවේ ඒ අමාත්‍යාංශයටම අදාළව මේ චෝදනාවත් තිබෙනවා.

"2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 3(1) හා 4(1) ඡේදය අනුව අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් උපරිම නිල වාහන සංඛ්‍යාව 3ක් වුවද, 2014 වසරේදී එම සීමාව ඉක්මවා වාහන 7ක් අමාත්‍යවරයා වෙත ලබා දී තිබුණු අතර, මාසිකව හිමි ඉන්ධන ප්‍රමාණය ඉක්මවා රුපියල් 1,029,380/-ක ඉන්ධන ප්‍රතිපූරණය කර තිබුණු අතර එම මුදල අදාළ පාර්ශ්වවලින් අය කර නොතිබීම."

ඊකට අමාත්‍යාංශයේ ලේකම්වරයා ලබා දෙන පිළිතුර මේකයි.

"මෙම කාල වකවානුවේ ඇති වූ ගැටලුකාරී වාතාවරණය හමුවේ අදාළ අමාත්‍යවරයාගේ ආරක්ෂාව තර කිරීමට සිදු වූ බවද, පාර්ලිමේන්තුව විසින් අසනු ලබන නොයෙකුත් ව්‍යාපෘතිවලට අදාළ ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා අදාළ කාර්ය මණ්ඩලවලට අනුයුක්ත නිලධාරින්ගේ රාජකාරි කටයුතු සඳහා නිල රථ ලබා දීම සිදු වූ බවද...."

ඒ හේතුව නිසා මේ විධියට වැඩිපුර වාහන සංඛ්‍යාවක් ගත් බව කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි -කවුරු හරි මන්ත්‍රීවරයෙක්- පාර්ලිමේන්තුවේ ප්‍රශ්න අහන එකත් දඩමීමා කරගෙන තමන්ට හිමි වාහන ප්‍රමාණයට වඩා වැඩිපුර වාහන පාවිච්චි කර තිබෙනවා; ඒවාට වැඩිපුර ඉන්ධන ලබාගෙන තිබෙනවා. මෙවැනි පිළිතුරක් රාජ්‍ය ගිණුම් කාරක සභාවට එව්වේමදී ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා අසරණ වෙන්න ඇති කියලා මම දන්නවා. කාලයක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරු තමයි මේ අමාත්‍යාංශ භාරගෙන තිබෙන්නේ. ඒ කාලයේ හිටපු උසස් අධ්‍යාපන අමාත්‍යවරයාත් එහෙමයි. නමුත් මෙවැනි ආකාරයේ පිළිතුරු එවලා පාර්ලිමේන්තුව හැල්ලු කර තිබෙනවා. ඒ නිසා අඩු ගණනේ අමාත්‍යවරුන්ට තිබෙන වග කීමට ඒ අමාත්‍යවරුන් සදාචාරමය වශයෙන්වත් බැඳ ගන්න රාජ්‍ය ගිණුම් කාරක සභාවට -අපට- බැරිවෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි ගිණුම් කාරක සභාව හමුවේ අපි විටින් විට හෙළිදරව් කරන කරුණු තිබෙනවා. ඒ කරුණු මේ රටේ මතු ආරක්ෂාව වෙනුවෙන් හෝ එහෙම නැත්නම් අනාගතයේදී අකටයුතු දේවල් සිද්ධ නොවීම සඳහා භාවිත කර තිබෙනවාද කියන බරපතළ ප්‍රශ්නයක් පැන නඟිනවා. මොකද, ඒ කරුණු පිළිබඳව කොච්චර සාකච්ඡා කළත් වැඩක් වෙලා නැති නිසා. අතීත වැරදි වෙනුවෙන් දඬුවම් කරන්නත් බැරි නම්, නීතිමය වශයෙන් වැරදිකරුවන්ට යම් දඬුවමක් කරන්නත් බැරි නම්, ඒ පුද්ගලයන් සදාචාරමය වශයෙන් බන්ධනය කරන්නත් බැරි නම් අනාගතය වෙනුවෙන් හෝ යමක් කරන තැනකට රාජ්‍ය ගිණුම් කාරක සභා වාර්තා පත්වෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ 4වැනි වාර්තාවේම 10වැනි පිටුවට මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් කළ විමර්ශනයක් ගැන එහි සඳහන් වෙනවා. ඔබතුමා දන්නවා, 2012 අවුරුද්දේ ජාතික කෞතුකාගාරයේ,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාට වෙන් වී තිබෙන කාලයෙන් කොටසක් මම ගන්නවා.

2012 අවුරුද්දේ ජාතික කෞතුකාගාරයේ බරපතළ වංචාවක් සිද්ධ වුණා. ජාතික කෞතුකාගාරයේ තිබෙන භාණ්ඩ නැති වුණොත්, ඒවා ප්‍රතිනිෂ්පාදනය කරන්න බැහැ. රටකට ඓතිහාසිකව උරුම වුණු කෞතුක වටිනාකමක් තිබෙන භාණ්ඩ ආරක්ෂා කරගන්න රටක් හැටියට අපි එදා අසමත් වුණා. ඒ සොරකම පිළිබඳව 2017දී විමර්ශනය කරන අවස්ථාවේ, මේ කරුණු අනාවරණ වුණා.

"සොරකමෙන් පසු වසර 5ක් ගත වී තිබුණද නිසි පරිදි ආරක්ෂක කැමරා පද්ධතියන් ස්ථාපිත කිරීමට මේ දක්වා කටයුතු කර නොමැත. රාත්‍රී කාලයේ දර්ශන ලබා ගැනීමට නොහැකි වීම වැනි දුර්වලතා රාශියක් දැනට පවත්නා කැමරා පද්ධතියේ පවත්නා බවත්, සොරකම සිදු වන අවස්ථාව වන විට පවතින සීසීටීවී කැමරා පද්ධතිය අක්‍රිය වී පැවතුණු බවත් අනාවරණය විය. මේ වන තුරු පද්ධතිය නිසි ලෙස ස්ථාපිත කර නොමැත."

මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. 2012දී හොරකම සිද්ධ වුණා හා සමානවම බරපතළයි, අවුරුදු 5ක් ගත වෙලාත් "සීසීටීවී කැමරා පද්ධතිය තවමත් හරියට ස්ථාපිත කරලා නැහැ කියලා" රාජ්‍ය ගිණුම් කාරක සභා වාර්තාවෙන් අපට කියන්න සිද්ධ වෙනවා නම්. ඒ කියන්නේ මේ සොරකමින් පස්සේ අපි පාඩමක් ඉගෙනගෙන නැහැ කියන එකයි.

ඒ වාගේම, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව පිළිබඳව අපි තවත් කරුණක් දක්වනවා.

16වැනි සාක් සමුළුවේ කොළඹ ප්‍රඥප්තියට අනුව සහ 2008 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් අරගෙන තිබෙනවා, සහල්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මෙට්‍රික්ටොන් ලක්ෂයක ආහාර සංචිතයක් පවත්වාගෙන යන්න. රටක නියඟයක්, ගංවතුරක්, ඕනෑම ස්වාභාවික ආපදාවක් ඇති වුණොත්, මෙට්‍රික්ටොන් ලක්ෂයක ආහාර සංචිතයක් පවත්වාගෙන යන එක ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා වැදගත් වෙනවා. හැබැයි, ඒ විධියේ අමාත්‍ය මණ්ඩල තීරණයක් අරගෙන තිබියදීත් එවැනි ආහාර සංචිතයක් පවත්වාගෙන ගියේ නැති බව කාරක සභාව හඳුනාගෙන තිබෙනවා. එතකොට, අනාගතය සඳහා අනතුරු අවම කිරීමේ අරමුණින් අපි ඉදිරිපත් කර තිබෙන යෝජනා ක්‍රියාත්මක කරන්නටවත්, අදාළ ආයතන කටයුතු කරලා නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාර්තා පාර්ලිමේන්තුවේ පුස්තකාලයට ගියාට පමණක් ප්‍රමාණවත් නැහැ. ඒ සම්බන්ධයෙන් වග වෙන; වග වීම පරීක්ෂා වන යන්ත්‍රණයක් අවශ්‍යයි. මේ නිර්දේශ, නියෝග ඉදිරිපත් කළාට පසුව, අඩුම තරමින් යම් නිශ්චිත කාල සීමාවක් තුළ ඒවා ඉටු කළාය කියලා මේ නිලධාරින් සියලුදෙනා පාර්ලිමේන්තුවට සහතික වෙන්නට ඕනෑ. එහෙම නැති වුණොත්, මේ කාරක සභා අපි කොතරම් ඉහළින් වර්ණනා කළත්, එහි ප්‍රතිඵලය ජනතාවට අත් පත් වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මෙම කරුණ පිළිබඳව මා ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. පාර්ලිමේන්තුවෙන් යම් කිසි මුදල් ප්‍රතිපාදනයක් ඒ, ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට වෙන් කර දුන් පසුව එම මුදලට වඩා වැඩිපුර වියදම් කරන එකත් වැරැදියි, අඩුවෙන් වියදම් කරන එකත් වැරැදියි කියා විගණකාධිපතිතුමා කියා තිබෙනවා මා දැක්කා. අපි සැහෙන වාර ප්‍රමාණයක් පාර්ලිමේන්තුවේ දී සාකච්ඡා කරලා තමයි ජනතාවගේ අවශ්‍යතාවන් වෙනුවෙන් එවැනි මුදල් ප්‍රතිපාදනයන් වෙන් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2015-2016 වර්ෂවල වකුගඩු රෝගීන් වෙනුවෙන් වෙන් කළ මුදල් කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. 2015 වර්ෂයේ රුපියල් මිලියන 353ක්, 2016 වර්ෂයේ රුපියල් මිලියන 667ක් වකුගඩු රෝගීන් සඳහා ආධාර ලෙස බෙදන්න කියා වෙන් කළා. ඒ විධියට වෙන් කළාට, 2015 වකුගඩු ආධාර ලෙස බෙදා තිබුණේ එයින් සියයට 62යි. 2016 බෙදා තිබුණේ සියයට 70යි. අපේ රටේ මේ ආධාර ලබන්න ඕනෑ, ඒ ආධාර නොලැබීම නිසාම තමන්ගේ පවුල් ජීවිත පවත්වා ගෙන යන්න බැරි වෙන; ඒ නිසාම තමන්ගේ දරුවන් පාසල් යවා ගන්න බැරි වෙන රෝගී ජනතාවක් රජරට ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වෙනවා. ඒ අවශ්‍යතාව සලකා බලා තමයි පාර්ලිමේන්තුව එවැනි මුදල් ප්‍රමාණයක් වෙන් කළේ. තාක්ෂණික ප්‍රශ්න පසෙක තබා, අඩු ගණනේ ඒ මුදලින් සියයට 90ක්, 95ක් වෙන් කරන්න බැරි වෙනවා නම්, ඒක බරපතළ ප්‍රශ්නයක්. මේක ජනතාවගේ ජීවිත පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා මේ පිළිබඳවත් කාරක සභාවේ අවධානය යොමු කර තිබෙනවා.

ඊළඟට, පසුගිය කාලයේ යම් ආන්දෝලනයකට තුඩු දුන් වැඩිහිටි දීමනාව සම්බන්ධයෙනුත් සඳහන් කළ යුතුයි. රුපියල් 2,000ක් වැඩිහිටියන්ට ලබා දෙන්නට 2015දී අය වැය යෝජනාවක් තිබුණා. එයින් රුපියල් 100ක් ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයෙන් කපා ගත්තා. ඒ අනුව 2016 අවුරුද්දේ රුපියල් මිලියන 389ක් එකතු වුණා. රුපියල් මිලියන 443ක් ඒ ගිණුමේ තිබෙනවා. වැඩිහිටියන්ට දෙන ආධාරයෙනුත් රුපියල් 100ක් කපා ගැනීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කරුණ මතු කරන්න උත්සාහ කරන්නේ මේ හේතුව නිසායි. අපි විශාල සංවාදයක් මේ වෙනුවෙන් කළා. ජනතාවගේ බදු මුදල් වෙන් කරන්නට යම් තීන්දුවක් ගත්තාට පසුව ඒක ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, ඒ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ බලයක් අපට නැහැ. ඒ නිසා, ගිණුම් කාරක සභාවේ මන්ත්‍රීවරුන් වන අප මැදිහත් වෙලා කරන මේ ව්‍යායාමය සාර්ථක වෙන්න නම්, එක්කෝ අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන මේකට නීතිමය වශයෙන් බැඳෙන්නට ඕනෑ. නීතිමය බැඳීමට එහා ගිය සදාචාරාත්මක බැඳීමකුත් වුවමනා කරනවා. මේ දෙකම නැත්නම් අපි කොතරම් තදින් උත්සාහ කළත්, ඒක ප්‍රතිඵල විරහිත වෙනවා. අපට ජනතාවට කියන්න පුළුවන්. නමුත් පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාවෙන් හිමි මුල්‍ය පාලනයේ වගකීම නිසියාකාරව ක්‍රියාත්මක වීමට නම්, එවැනි වගකීමකට බැඳීමට අවශ්‍ය කරන විධියේ නීතිමය ප්‍රතිපාදන ප්‍රමාණයක්, යන්ත්‍රණයක් මේ කාරක සභාවලට වුවමනායි කියන අදහස යෝජනා කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
යෝජනාව ස්ථිර කිරීම, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is Hon. Niroshan Perera. Before he starts, will an Hon. Member propose the Hon. Shehan Semasinghe to the Chair?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)
I propose that the Hon. Shehan Semasinghe do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஷெஹான் சேமசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SHEHAN SEMASINGHE *took the Chair.*

[අ.භා.2.30]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කර තිබෙන යෝජනාවට අදාළව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාවල අන්තර්ගතයන් පිළිබඳව සාකච්ඡා කරන මෙම විවාදයට සහභාගි වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙම පාර්ලිමේන්තුවට පැවරී තිබෙන රටේ මූල්‍ය පාලනය පිළිබඳ වගකීම ඉටු කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මඟින් දායකත්වය සැපයූ එහි සභාපති, නියෝජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීතුමන්ලාට මා ස්තුතිවන්ත වෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත් වෙනදාට වඩා සක්‍රිය මට්ටමින් අදාළ ආයතන පිළිබඳව විමර්ශනය කරලා, එම වාර්තා නිසි කලට, නිසි ලෙසට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබෙනවා. ඒ බව විපක්ෂය වුණත් පිළිගන්නවා ඇති. මේ රටේ දේශපාලන ඉතිහාසය ගත්තාම මේකත් ලොකු ජයග්‍රහණයක් වෙනවා. මොකද, සමහර වේලාවට අපි මේ කාරක සභාවල වැඩ කටයුතු ආරම්භ කළාම අවුරුදු ගණනාවක් ප්‍රමාද වුණු වාර්තා තමයි ඉස්සෙල්ලාම ලැබෙන්නේ. එම නිසා මේ කාරක සභාව තුළින් වර්තමානයේ සිදු වෙන දේවල් වර්තමානයේම පරීක්ෂා කර නිසි ලෙස පාර්ලිමේන්තුවට වාර්තා කිරීම දේශපාලන ඉතිහාසයේ ඉතා විශේෂ ජයග්‍රහණයක් ලෙස තමයි අපි සලකන්නේ. ඇත්තටම මේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට මදි. මේ වාර්තා තුළින් පැන නැඟෙන කරුණු තව දුරටත් විමර්ශනයට ලක් වෙලා අධිකරණ කටයුතු දක්වා යන පැහැදිලි ගමන් මඟක් තිබිය යුතුයි කියන කරුණ ඔබ සියලු දෙනාම පිළිගන්නවා ඇති. එවැනි පැහැදිලි ගමන් මඟක් තිබුණොත්, මේ රටේ සිදු වන වංචා හා දූෂණ විශාල ප්‍රමාණයක් අපට වළක්වා ගැනීමට හැකියාව තිබෙන බව මේ සභාව පිළිගනී කියා මා විශ්වාස කරනවා.

2016 වර්ෂය වන විට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විවිධ ආයතන 837ක් විමර්ශනයට ලක් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ කාරක සභාවකින් අමාත්‍යාංශ ඇතුළු ආයතන 837ක් පරීක්ෂා කරන එක එතරම් ලෙහෙසි පහසු කටයුත්තක් නොවෙයි කියන එක ඔබතුමාත් දන්නවා ඇති. අපට තිබෙන්නේ ඉතාම සීමිත කාලයක්. සමහර වේලාවට මේ ආයතන තුළ පරීක්ෂණයට ලක් කළ යුතු කාරණා එකකට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. එම නිසා අපේ කාරක සභාවේ සභාපති, ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා සහ අප සියලු දෙනාම කාරක සභාවට අදාළ සියලු දේවල් පරිගණකගත කරලා, අමාත්‍යාංශ සහ ඒ යටතේ ඇති ආයතන ඇගයීමකට ලක් කරන්නට විශේෂයෙන්ම කටයුතු කළා. 2015 සහ 2016 ඇගයීම් වාර්තා මා ළඟ තිබෙනවා. එහිදී අනාවරණය වුණු සුවිශේෂී ලක්ෂණයක් සඳහන් කරන්න මට අවසර දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරීක්ෂණයට ලක් කරපු ආයතනවල ඇගයීම් ලකුණු 2015ට වඩා 2016 වන කොට විශාල ලෙස වැඩි වෙලා තිබෙනවා. 2015 ඇගයීම් ප්‍රතිඵල අනුව ලකුණු 90ට වැඩි ආයතන 60ක් තිබුණා. එම ප්‍රමාණය 2016 වනකොට 73 දක්වා වැඩි කරන්නට විශේෂයෙන්ම අපේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවත්, ඒ ආයතනත් විශේෂයෙන්ම කටයුතු කර තිබෙනවා කියලා මම මේ අවස්ථාවේදී කියනවා. ඒ වාගේම 2015දී ලකුණු 70 - 90 අතර ආයතන 282ක් තිබුණා. එම ප්‍රමාණය 2016 වන කොට 447 දක්වා වැඩි කරන්නට කටයුතු කර තිබෙනවා. 2015දී ලකුණු 50 - 70 අතර ආයතන 386ක් තිබුණා. එම ප්‍රමාණය 295 දක්වා අඩු කරන්නට කටයුතු කර තිබෙනවා. 2015දී ආයතන 104ක් ලකුණු 50ට අඩුවෙන් තිබුණා. එම ආයතන ප්‍රමාණය 2016 වනකොට 22 දක්වා අඩු කරන්නට අපි කටයුතු කර තිබෙනවා. මම හිතන හැටියට මේක ඉතාම සුවිශේෂී කාරණයක්. ආයතනවලින් නිසි වේලාවට ගිණුම් ඉදිරිපත් වීමෙන්, විගණකාධිපතිතුමාගේ නිරීක්ෂණ, අපේ කාරක සභාවේ නිරීක්ෂණ තුළින් කලට වේලාවට වාර්තා සැපයීමට හැකි වීමෙන් මේ අවුරුදු තුන තුළ අපි ඉතාම හොඳ ප්‍රගතියක් ලබා තිබෙනවා කියලා මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, what is your point of Order?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අද අරලියගහ මන්දිරයේ ඉඳලා පාර්ලිමේන්තුවට එන්න පැයකුත් මිනිත්තු 20ක් විතර කාලයක් ගතවුණා. මොකද, පාර්ලිමේන්තුවට එන මාර්ගය වහලා. මොන වාගේ ප්‍රජාතන්ත්‍රවාදයක්ද මේ තිබෙන්නේ? පාර්ලිමේන්තුවට එන්න තිබෙන මාර්ගයේ බාධාවක් තිබෙනවා; පාර වහන්නට කටයුතු සිදු වෙලා තිබෙනවා; පොලීසිය බලාගෙන සිටිනවා. කරුණාකරලා පොලීසිය මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය ගැන ගරු කථානායකතුමා විධිමත් උපදෙසක් ලබා දෙන්න. මෙවැනි ක්‍රියාවක් සිදු වුණු පළමුවැනි වතාව මෙය නොවෙයි. පාර්ලිමේන්තුව රැස් නොවන දවස්වලත් barricades තිබෙනවා. මේ වාගේ දෙයක් නිසා පාර්ලිමේන්තු මාර්ගය අවහිර කරලා තිබෙනවා. මේ අවහිරය හැම දෙනාටම බලපාන්නට ඇති කියලා මා හිතනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ පාර්ලිමේන්තු පිවිසුම් මාර්ගයේ අවහිරතාවක් පිළිබඳවද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කොළඹ පැත්තේ සිට පාර්ලිමේන්තුවට එන මාර්ගය වහලා. පොලීසිය බලාගෙන ඉන්නවා. එතැන meeting එකක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, එම කාරණය අපි ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරවන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේක ප්‍රජාතන්ත්‍රවාදයද? අපට වරමක් දීලා තිබෙන්නේ රට හදන්න මිසක් බෝඩ් ලෑලිවලට භය වෙලා යටපත් වෙන්න නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට පාර්ලිමේන්තුවට ඇතුළුවීමේ දී බාධාවක් ඇති වුණාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට එන්න බැරි වුණා. මම අරලියගහ මන්දිරයෙන් පිටත් වුණේ පස් වරු 1.10ට. මම කෘෂිකර්ම අමාත්‍යාංශය පිහිටි ස්ථානය හරහා මෙතැනට ආවේ පස් වරු 2.10ට. දැන් කවුරු හෝ එතැනට යැව්වොත් බලාගන්න පුළුවන්. පාර්ලිමේන්තු පොලීසියත් සිටිනවා නේ. බලන්න, පාර්ලිමේන්තුවට එන්න පුළුවන්ද, බැරිද කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේ පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරලා, ඒ සම්බන්ධයෙන් පොලිස්පතිතුමාට දැනුම් දෙන්න කටයුතු කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ විතරක් මදි. කොතරම් වෙලාවක් පාර වසා අවහිර කර තිබුණාද කියලා පොලීසියට වාර්තා කරන්න කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නම්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට බාධාවකින් තොරව, නිදහසේ සභා ගර්භයට පැමිණීමේ අයිතිය තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කටයුතු කරලා නැහැ කියලා අපි කථානායකතුමාට දැනුම් දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අහන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න තිබෙන පාර්ලිමේන්තුවට පැමිණෙන මාර්ගයත් අවහිර වෙලා තිබෙනවා නම් මොකක්ද කරන්නේ? කාගේ ප්‍රජාතන්ත්‍රවාදයද අපි ආරක්ෂා කරන්න හදන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒ සම්බන්ධව ගරු කථානායකතුමා දැනුවත් කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතුමා දැනුවත් කරලා විතරක් මදි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පොලිස්පතිතුමාගෙන් ඒ සම්බන්ධයෙන් විමසීමකුත් කරන්නම්. උද්ඝෝෂණ හෝ යම් කටයුත්තක් එතැන සිදුවෙනවාය කියා වාර්තා වෙනවා. අපි ඒ සම්බන්ධයෙනුත් කටයුතු කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරුණ තරුණියන්ගේ ජීවිත ආරක්ෂා කිරීමේ වගකීම අපටත් තිබෙනවා. නමුත් මෙහෙම එනකොට, ඒක වල්බුරු නිදහසක් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. අපි ඒ ගැන කටයුතු කරන්නම්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මටත් කාරණයක් කියන්න තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, කියන්න ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ යම් කරුණක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න මා කැමැතියි. වරක් මේ පාර්ලිමේන්තුවට එන්න බැරිවන විධියට හමුදාවත්, පොලීසියත් යොදවා පාර්ලිමේන්තුවම වට කරලා තිබුණා. මම ඒ වෙලාවේ ඇවිත්, අපේ ගරු කථානායකතුමාගෙන් ඇසුවා, "ඔබතුමාගේ අනුදැනුම නැතුව පොලීසියට හෝ හමුදාවට මේ පාර්ලිමේන්තුව වට කරන්න පුළුවන්ද, පාර්ලිමේන්තුවට එන මාර්ග අවහිර කරන්න පුළුවන්ද?" කියා. එතුමා ඒ වේලාවේ මට උත්තරයක් දුන්නා. ඒ උත්තරය මොකක්ද කියා මේ වෙලාවේ කියන්න මම කැමැති නැහැ. නමුත් මෙහෙම වෙලා තිබෙන පළමුවැනි වතාව මෙය නොවෙයි. උද්ඝෝෂකයන් නිසා සිදුවන බාධා කිරීම් වැළැක්වීමේදී වේවා, උද්ඝෝෂකයන් මර්දනය කිරීම උදෙසා ගනු ලබන ක්‍රියා මාර්ගවලදී වේවා, මන්ත්‍රීවරුන්ට නිදහසේ එන්න යන්න තිබෙන අයිතිය ආරක්ෂා වන ආකාරයෙන් කටයුතු කළ යුතුයි. එම කාරණයේදී ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාත්, මමත් එකම අදහසේ ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් සොයා බලා ඔබතුමන්ලාට පිළිතුරක් ලබා දීමට කටයුතු කරන්නම්. ඒ වාගේම ජනතාවටත් කරදරයකින්, හිරිහැරයකින් තොරව ගමන් බිමන් යෑමේ පහසුව පොලීසිය සපයා දිය යුතුයි. එම කාරණය මම ගරු කථානායකතුමාට දැනුම් දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර වසා තිබෙන්නේ ඇයි කියා පොලීසිය විශේෂයෙන්ම අපට කියන්න අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, එම කාරණය ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරලා, ඔබතුමාට පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මටත් කරදරයක් නොවෙන්න මට ලබා දී තිබෙන වෙලාව අඩු කරන්න එපාය කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ඔබතුමා කථා කරන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින් සඳහන් කළ පරිදි විශේෂයෙන්ම අපි මේ ඇගයීම් තුළින් ඒ ආයතන 837ටම විවිධ ලකුණු දීලා, වසරින් වසර ඒවායේ ප්‍රගතිය බලා, එම ප්‍රගතිය සාධාරණ ලෙස සුබදායක මට්ටමකට ගෙනෙන්න කටයුතු කළා. එසේ කටයුතු කරන්න හැකිවීම ගැන විශේෂයෙන්ම අපි සතුටු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, තව විනාඩි දෙකකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)\
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජනතාවට මුහුණ දෙන්න සිදුවන අපහසුතා වළක්වන්න වාගේම, සිදුවන වංචා හා දූෂණ අවම කිරීමට මේ තොරතුරු තාක්ෂණය භාවිත කරලා කටයුතු කරන්න කියා වංචා හා දූෂණ වැඩිපුරම සිදුවන අපේ සමහර ප්‍රසිද්ධ ආයතනවලට -මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, රේගුව වැනි ඒවාට- අපි නියම කර තිබෙනවා. මේ වනවිට මේ රටේ ප්‍රසිද්ධ කාරණය මහ බැංකු බැඳුම්කර සිද්ධිය බව මා දන්නවා. මහ බැංකුවේ මේ බැඳුම්කර සිද්ධිය තුළින් පසුගිය කාලයේ සිදුවුණු සියලුම වංචා හා දූෂණ සියලුදෙනාටම අමතක කරවා තිබෙනවා. JVP එකේ අපේ ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාත් උදාහරණයකට ගත්තේ මහ බැංකු බැඳුම්කරයේ සිදුවුණු දූෂණ හා වංචාව පිළිබඳ සිද්ධියයි. නමුත් එතුමාට අනික් ඒවා හරියට කියා ගන්නත් බැරුව ගියා. මේ රටේ සිදුවෙලා තිබෙන වංචාව හා දූෂණය ඒක විතරයි කියා මාධ්‍ය විසින් එච්චරටම එය ජනතාවට කා වද්දා තිබෙනවා.

අපි දැනට "කෝප්" එකෙන් නිර්දේශ ලබා දීලා තිබෙනවා. ජනාධිපති කමිටුවකින් එය විමර්ශනය කර තිබෙනවා. ඒ පිළිබඳව අධිකරණ ක්‍රියා මාර්ගයකට ගිහිල්ලාත් තිබෙනවා. නමුත් අනික් වංචා හා දූෂණ මේ නිසා යටපත් කරන්න, ඒවා අමතක කරන්න ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. පසුගිය කාලයේ සිද්ධ වුණු සියලුම වංචා හා දූෂණ සම්බන්ධව මේ වාර්තා තුළින් පැන නැඟුණු කරුණු කුණු බක්කියට දමන්නේ නැතුව, ඒ තොරතුරු මේ පාර්ලිමේන්තුවේ කොහේ හෝ කොනක මකුළු දැල් බැඳිලා විනාශ වෙන්න දෙන්නේ නැතුව, ඒ සම්බන්ධව ක්‍රියා මාර්ගයක් ගැනීම සඳහා අපි විශේෂයෙන්ම අවධානය යොමු කළ යුතුයි කියන කාරණය මම මතක් කරනවා. ඒ සඳහා පාර්ලිමේන්තුවට තිබෙන වගකීම නිසි ලෙස තේරුම් ගෙන, පාර්ලිමේන්තුවට ඒ සඳහා තිබෙන බලතල මේ රටේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ඒවා නිසි ලෙස ශක්තිමත් කරලා, අපි ඉදිරියට යන්න ඕනෑය කියන කාරණය මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.43]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් සාමාජිකයකු වශයෙන් සිටින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව සම්බන්ධයෙන් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ලෙස කෙරෙන මෙම විවාදයට මටත් සම්බන්ධ වෙන්න අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නිලධාරින් සමඟ කරන සංවාද තුළින් බොහෝ දේවල් නිරාකරණය කර ගන්නවා. නිලධාරින් කැඳවා, ඔවුන්ගෙන් විමසා, ඔවුන් ඒවාට දෙන පිළිතුරු අනුව තවදුරටත් කළ යුතු කාර්යයන්ට ඔවුන් යොමු කරලා, අවසානයේ සමහර විට අපි කියනවා, මාසයකින් හෝ ඔවුන්ට එකඟ විය හැකි කාල සීමාවක් දීලා වාර්තාවක් ඉදිරිපත් කරන්නය කියලා. ඊට පස්සේ පසු විපරමක් කරනවා, ඒ කාල සීමාව තුළ ඒ වාර්තාව ලැබුණාද කියලා. ඊළඟට ඒ වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සියලුම සාමාජිකයන් අතර බෙදා හැරීමක් සිද්ධ වෙනවා. මේ අතින් බැලුවාම අපේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සාර්ථකව ඉදිරියට යමින් තිබෙන බව මම සතුටින් කියන්න ඕනෑ.

ඊළඟට, යම් කරුණු නිරාකරණය නොවූ විටක එය පාර්ලිමේන්තුවට වාර්තා කිරීම තමයි ස්ථාවර නියෝග අනුවත් අපට කරන්න තිබෙන කාර්යය වන්නේ. අලුත් ස්ථාවර නියෝග අනුව අපි පාර්ලිමේන්තුවට වාර්තා කරන කරුණු අදාළ වන ඇමතිවරයා ඒ කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු වෙනවා. එය සැක නැතුවම ලේඛනයක් විය යුතු බව කීමත් අනවශ්‍යයි. එසේ ඉදිරිපත් කරනු ලබන ලේඛනය මේ පාර්ලිමේන්තු සභාව තුළ සභාගත කිරීමට ඒ අදාළ ඇමතිවරුන්ට න්‍යාය පත්‍රයේ එක් අවස්ථාවක් ලබාදිය යුතුයි. එම අවස්ථාවේදී එම ලේඛනවල ඇමතිතුමා සඳහන් කරන පිළිතුරු ගැන යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වූ විටක, ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේද කියන භේදයකින් තොරව මන්ත්‍රීවරුන්ට ඒ ඇමතිතුමාගෙන් කරුණු විමසා දැන ගැනීමටත්, ඇමතිවරයාගේ වැඩිදුර අවධානය යොමු කරවීමටත් අපේ මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් ලබාදිය යුතුයි කියා මා විශ්වාස කරනවා.

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහෝ ආයතනවල ප්‍රාග්ධන වියදම් ඌන වියදමක් හැටියට සඳහන් වන බව අපි නිරීක්ෂණය කර තිබෙනවා. එක් අවස්ථාවක, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට JICA එකෙන් ලබා දුන් අරමුදලකින් නිලධාරින් පුහුණු කිරීමේ ව්‍යාපෘතියක් සූදානම් කර තිබුණා. ඒ මුළු මුදලම වැය කරලා තිබුණේ නැහැ. ඒ ව්‍යාපෘතිය ආරම්භවෙලා තිබුණේත් නැහැ. ඒ නිසා ඒ වර්ෂයේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට වෙන් කළ මුදල මුළුමනින්ම වියදම් නොවූ මුදලක් හැටියට ඉතිරිවෙලා තිබෙනවා. ප්‍රාග්ධන මුළු ඉතිරිවීම් රුපියල් විසිපන් මිලියනයක්. මෙය සියයට 100ක ප්‍රාග්ධන ඉතිරි වීමක් බවට පත් වී තිබුණු බවටත් අපි නිරීක්ෂණය කර තිබෙනවා. මෙය මේ අමාත්‍යාංශයට පමණක් සීමා වුණු දෙයක් නොවෙයි. බොහෝ අමාත්‍යාංශවල වියදම්වල ඌන වියදමක් විගණකාධිපති පරීක්ෂණ තුළින් වාර්තා වෙනවා. විගණකාධිපතිතුමා ඉතා විශිෂ්ට මෙහෙවරක් කරමින් සිටිනවා. නොයෙකුත් නොයෙකුත් පස්සට ඇදීම් නිසාත්, බලපෑම් නිසාත් ජාතික විගණන පනත් කෙටුම්පත තවමත් මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න මේ ආණ්ඩුවට නොහැකි වීම ගැන මට කනගාටුයි. ජාතික විගණන පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ගෙනැවිත්, වුවමනා කරන පහසුකම් හා කාර්ය මණ්ඩලවලින් මේ විගණන බලය තවත් ජව ගැන්වෙන්නට පුළුවන් වෙනවා නම්, විගණකාධිපති දෙපාර්තමේන්තුවට මීටත් වඩා විශාල මෙහෙවරක් කරන්න පුළුවන් වෙනවාය කියා මා විශ්වාස කරනවා.

විගණකාධිපතිතුමා කියපු එක කාරණයක් අද පුවත් පතක සඳහන් වෙලා තිබෙනවා මා දැක්කා. එතුමා කියා තිබුණා, "රජයේ නිලධාරින්ගෙන් භාගයක් ඉන්න ඕනෑ හිරේ. රජයේ නිලධාරින්ගෙන් භාගයකට සිරගත වෙන්නට වෙනවා." කියා. කුමක් වුණොත් ද? ලලිත් වීරතුංග මහතාට තිබුණු චෝදනාව අනුව දඬුවම් කරලා එතුමාව සිරගත කරනු ලැබුවා. ඒ අවභාවිතාව හේතුව හැටියට ගත්තොත් ඒ වාගේ සිදුවීම් රජයේ නිලධාරින් භාගයකට වඩා වැඩි දෙනෙකු අතින් සිදු වෙනවා. එහෙම නම් රජයේ නිලධාරින් භාගයකට වඩා ඉන්න ඕනෑ සිරගෙවල් ඇතුළේය කියා විගණකාධිපතිතුමා පෙන්නුම් කර තිබුණා. මෙයින් අපි අධිකරණයේ නඩු තීන්දුව කිසිසේත් අගෞරවයට ලක් කරනවා නොවෙයි. අපි එතැනදී පෙන්නුම් කරන්නේ රජයේ මුදල් අවභාවිතාව කියන එක බොහොම බහුලව වෙනවා කියන එකයි. ඒකයි මේ කියන්නේ. එය විගණකාධිපතිතුමාගේ කාර්යාලයෙන් කරන විමර්ශනවලින් හා එතුමාගේ විමර්ශන පදනම් කර ගෙන අපේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව කරන විමර්ශනවලදී අපට හෙළිදරව් වන ආකාරයට පරීක්ෂණ කර ගන්නට බැරිව බොහෝ සිදු වීම් තිබෙනවා. දැන් මේ ඉදිරිපත් කරපු වාර්තාවලත් තිබෙනවා. මා ඒ වාර්තා වෙන වෙනම උපුටා දක්වන්නට යන්නේ නැහැ. "ෆයිල්ස්" නැති වෙලා. ලිපිගොනුව නැති වුණාම පරීක්ෂණ කල් යනවා. එම නිසා පරීක්ෂණ බොහෝ සෙයින් කල් ගිහින් තිබෙනවා. නැත්නම් පරීක්ෂණ කරන්නට බැරි වී තිබෙනවා. මෙවැනි තත්ත්වයකට පත් වුණාම ඒ ලිපිගොනු අස්ථානගත වීමට වග කිවයුතු කවුරු හෝ කෙනෙක් ඉන්න එපායැ. අවසාන වශයෙන් වග කීම දැරිය යුතු පුද්ගලයා පිළිබඳවත් ක්‍රියා මාර්ගයක් ගැනෙන්නට ඕනෑ. එසේ නැත්නම් අපි මේ කරන ව්‍යායාමයේ කිසිම තේරුමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ කටයුතු අමාත්‍යාංශය ගැනත් විගණකාධිපතිතුමා පෙන්නුම් කර තිබුණා, විශාල වැරදි වියදම් වෙලා තිබෙන බව. ඒ වියදම් ගැන ඒ කාලයේ සිටි නිලධාරියා ඒවා කළාය කියා එතැනින් ඉවර කරන්නට බැහැ. ඒ කාලයේ සිටි තානාපතිවරයාත් ඒ ගැන වග කිව යුතුය කියා විගණකාධිපතිවරයා කියනවා. ඒ ආකාරයට මේක මුදුනටම ගෙන ගිහින් වග කීම් දාමය- දැන් ඔය විධානයක වග කීම් දාමය ගැන අලුතෙන් ගෙනෙන නීතිවල තිබෙනවා.- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනත, බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ සම්මුතිය අනුව අපි ගෙනා පනතට අනුව වරද කරන කෙනා විතරක් නොවෙයි, ඒ වරද කිරීම පිළිබඳව සොයා බැලිය යුතු අවසාන බලධාරියා දක්වා ඒ වග කීමට හසු කර තිබෙනවා. මෙන්න මේ වග වීම අපේ රෙගුලාසිවල තිබෙනවා ප්‍රමාණවත් මදි. අපේ මුදල් රෙගුලාසිවල මේ කියන වග වීම ප්‍රමාණවත් ලෙස අපි නිර්ණය කර ගෙන, ප්‍රසාරණය කර ගෙන සියලුම දෙනා වගවීමට අයිති වෙන විධියට හසුකර ගන්නට අපට පුළුවන් වෙලා නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අවසාන වශයෙන් මට කියන්නට තිබෙනවා, රාජ්‍ය සේවය එලදායිව තබා ගැනීම සඳහාත් රජයේ රැකියා අවස්ථා පිරවීම සඳහාත් පුරෝකථනයක් කරන්න අවශ්‍ය බව. මෙපමණ සංඛ්‍යාවක් විශ්‍රාම යනවා. මේ මේ ශ්‍රේණිවල නිලධාරින් මේ කාලය වෙනකොට විශ්‍රාම යනවා. මේ ශ්‍රේණින්වල ඇබෑර්තු එනවා. මේ පුරෝකථනය අනුව බඳවා ගැනීම් සැලසුම් කරන්නට පුළුවන්. එසේ නැත්නම් උසස් කිරීමේ සැලසුම. මේ අනුව අපේ රාජ්‍ය සේවයේ හිස් තැන් නැතිව රාජ්‍ය සේවය කර ගෙන යන්නට පුළුවන්කමක් ලැබෙනවා.

අවසාන වශයෙන් කියනවා නම්, මහා බැංකු හොරකම දැන් ලෝක ප්‍රසිද්ධයි. අපේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, " හැම කාලයේම හොරකම් වෙලා තිබෙනවා. මේ හොරකම ගැනම විතරක් ඇයි කථා කරන්නේ" කියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මා මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. I think, my Hon. Friend, this robbery is the mother of all robberies. මේ කාරණය ඉංග්‍රීසි භාෂාවෙන් කිව්වාම තමයි එය අර්ථවත් වෙන්නේ. මේ හොරකම සියලුම හොරකම්වල මාතෘත්වය දරන බවයි අපි කියන්නේ. මේවාට සම්බන්ධකම් තිබෙන බවට සැකයට භාජනය වෙච්ච මන්ත්‍රීවරු ඉන්නවා නම් ඒ මන්ත්‍රීවරු සිය කැමැත්තෙන් මේ කාරක සභාවලින් ඉවත් වෙන්නට ඕනෑ. එසේ ඉවත් වුණේ නැත්නම් ඒ මන්ත්‍රීවරු කැඳවලා, එම උපදේශය ලබා දෙන්න අපේ කථානායකතුමාට පුළුවන්. කථානායකතුමා ඒ කටයුත්ත කරයි කියන බලාපොරොත්තුවෙන් මා නිහඬ වනවා. විගණකාධිපතිතුමාටත්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු ලසන්ත අලගියවන්න මැතිතුමාටත් මා ස්තුතිවන්ත වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා නියෝජ්‍ය ඇමතිතුමා.

[பி.ப. 2.55]

**ගරු සෙයියිඩ් අලී සාහීර් මවුලානා මහතා (ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா - தேசிய ஒருமைப்பாடு, நல்லிணக்கம் மற்றும் அரச கரும மொழிகள் பிரதி அமைச்சர்)
(The Hon. Seyed Ali Zahir Moulana - Deputy Minister of National Integration, Reconciliation and Official Languages)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ லசந்த அலகியவன்ன அவர்களைத் தவிசாளராகக் கொண்டுள்ள அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கைகள் குறித்து கௌரவ நளிந்த ஜயதிஸ்ஸ அவர்களால் கொண்டுவரப்பட்ட ஒத்திவைப்புவேளைப் பிரேரணைமீதான விவாதத்தில் கலந்துகொள்வதில் நான் மட்டற்ற மகிழ்ச்சி யடைகின்றேன்.

"அரசாங்க கணக்குகள் பற்றிய குழுவினால் எட்டாவது பாராளுமன்றத்தின் முதலாவது கூட்டத்தொடரின்போது சமர்ப்பிக்கப்பட்டுள்ள சகல அறிக்கைகள்மீது பாராளு மன்றத்தின் கவனம் செலுத்தப்பட வேண்டுமென்பதாலும், எதிர்காலத்தில் கொள்கை ரீதியான தீர்மானங்களை மேற்கொள்கையில் இந்த அறிக்கைகளில் விதப்புரை செய்யப் பட்டுள்ள விடயங்கள்மீது கவனம் செலுத்தப்பட வேண்டுமென்பதாலும், இந்த அறிக்கைகளின் உள்ளடக்கம் குறித்துப் பரந்தளவில் ஆராய்ந்து பார்த்தல் உகந்தது" எனக் குறித்த பிரேரணையில் குறிப்பிடப்பட்டுள்ளது. இந்தக் குழுவின் ஓர் உறுப்பினராக இருந்து பல முக்கியமான விஷயங்கள் குறித்து நானும் ஆராய்ந்திருக்கின்றேன். அதேநேரம் கணக்குகள் சம்பந்தமாக எங்களால் கொடுக்கப் படுகின்ற அறிக்கைகள் சரியான முறையில் வழிநடாத்தப்பட வேண்டும் என்பதில் நாங்கள் பல முயற்சிகளை மேற்கொண்டிருக்கின்றோம்.

பொதுக் கணக்குகள் பற்றி குழு அதன் வரலாற்றில் முதல் தடவையாக, அந்தக் குழுவின் மேற்பார்வையின்கீழ் வருகின்ற மொத்தம் 842 எண்ணிக்கையான நிறுவனங்களை உள்ளடக் கிய 2015ஆம் ஆண்டின் கணக்குகளை அடிப்படையாகக் கொண்டு, கணனி வலையமைப்பு மதிப்பீடு ஒன்றின்மூலம் பெற்றுக் கொள்ளப்பட்ட பெறுபேறுகள் தொடர்பில் குழுவின் கருத்துக்கள் அறிக்கையிடப்பட்டுள்ளன. கணனி வலைய மைப்பு முறைமையொன்றின்மூலம் தொடர்புறச் செய்து, உரிய சகல வகைகூறும் உத்தியோகத்தர்களினதும் பிரதான வகைகூறும் உத்தியோகத்தர்களினதும் மேற்பார்வையுடன், கணக்காய்வாளர் அதிபதியினதும் மற்றும் அவரது பதவியணியினரினதும் முழுமையான கண்காணிப்பு மற்றும் சான்றுபடுத்தல் ஆகியவற்றின் அடிப்படையில், 2016ஆம் ஆண்டின் கணக்குகளை அடிப்படையாகக் கொண்டு, கண்காணிப்புக்கு உட்படுத்தப்பட வேண்டிய சகல நிறுவனங்களும் உள்ளடங்கும் வகையில், மேற்கொள்ளப்பட்ட மதிப்பீட்டு நிகழ்ச்சித்திட்டங்களின் அவதானிப்புகள் மற்றும் சிபாரிசுகள் என்பவற்றைக் குறிப்பிடுகின்ற அறிக்கையைச் சமர்ப்பித்துள்ளதையிட்டு எமது தவிசாளர் அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த சில மாதங்களுக்கு முன் சில உள்ளூராட்சிச் சபைகளில், குறிப்பாக, "கிழக்கு மாகாணத்திலுள்ள காத்தான்குடி நகர சபை, ஏறாவூர் நகர சபை போன்ற உள்ளூராட்சிச் சபைகளின் அறிக்கைகளில் பல முரண்பாடுகள் காணப்படுவது பற்றி நாங்கள் ஆராய்ந்தபோது - அது தொடர்பில் விசாரணை செய்யுமாறு எமது தவிசாளர் அவர்கள் என்னிடம் சொன்னார் - நாங்கள் Auditor-General அவர்களது observation அடிப் படையிலே கொண்டுவரப்பட்ட பல விஷயங்களை விசாரித்த பொழுது, பாராளுமன்றத்தினால் ஒதுக்கப்பட்ட பணம் ஒட்டுமொத்தமாகக் கையாடப்பட்டிருப்பது தெரியவந்தது. அப்போதிருந்த முதலமைச்சரது வழிநடத்தலால் இவ்வாறான விளைவுகள் ஏற்பட்டுவிட்டதாகக் கிழக்கு மாகாண சபையின் பிரதம செயலாளர், கிழக்கு மாகாண உள்ளூராட்சி அமைச்சின் செயலாளர் உட்படப் பலர் சொன்னார்கள். கௌரவ உறுப்பினர் வாசுதேவ நாணாயக்கார அவர்கள் சொல்லியபடி, இன்று முதலமைச்சர் அங்கு இல்லாவிட்டாலும் அதுபற்றி விசாரிக்கப்படல் வேண்டும். ஏனெனில், அவற்றுக்கு வழங்கப்பட்ட நிதிகள் அரசியல் தலையீட்டால்தான் முறையாகச் செலவழிக்கப்படவில்லை என்பதை அந்த நேரத்திலிருந்த அதிகாரிகளே ஏற்றுக் கொண்டார்கள். ஏறாவூர் நகர சபையை எடுத்துக்கொண்டால், அங்கு அன்றாட வேலைகளைச் செய்வதற்குக்கூடப் பணமில்லாமல் இருக்கின்ற நிலையில், இந்த உள்ளூராட்சிச் சபையின் பணம் முதலமைச்சரின் அரசியல் சார்பான தமாஷாக்களுக்காக மிகவும் மோசமான முறையில் வீண் விரயம் செய்யப்பட்டிருப்பதை நாங்கள் காணக்கூடியதாக இருந்தது. எனவே, எங்களுடைய குழு அதன் அன்றைய செயலாளரிடம் இதுபற்றிய அவருடைய அறிக்கையை ஒரு மாதத்திற்குள் சமர்ப்பிக்குமாறு கேட்டுக் கொண்டபோதிலும், அந்த அறிக்கை எமது COPA க்கு இன்று வரை அனுப்பிவைக்கப்படவில்லை. எனவே, இந்த விடயத்திலே கவனம் செலுத்தப்பட வேண்டும்.

அதுமாத்திரமல்ல, Engineer ஒருவராலும் அங்கு கையாடல்கள் இடம்பெற்றிருக்கின்றன. இது சம்பந்தமாக Auditor-General அவர்களால் விரிவாகச் சொல்லப்பட்டுள்ளது. The observation of the Auditor-General has very clearly said, that the engineer who was assigned by the former Chief Minister has already mishandled the funds being given for certain projects. Even now they are retaining the same engineer, protected by certain officials, who are encouraging this kind of activities. So this is totally unacceptable. எனவே, இந்தக் கணக்குகள் சம்பந்தமான விசாரணைகள் தொடர்பில் உரியவர்கள் வகைசொல்லக்கூடிய வகையில் பாராளுமன்றம் சிபாரிசு செய்ய வேண்டும் என்பதையும் இந்த நேரத்தில் தெரிவித்து, சந்தர்ப்பத்திற்கு நன்றி கூறி, விடைபெறு கின்றேன். நன்றி.

[අ.භා.3.01]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අටවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය සඳහා වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පසුව, අටවන පාර්ලිමේන්තුවේ පළමුවෙනි සැසිවාරය තුළ ඉදිරිපත් කරන ලද සියලුම වාර්තා පිළිබඳව පැවතෙන මේ විවාදයේදී ඒ සම්බන්ධයෙන් අදහස් කීපයක් ප්‍රකාශ කරන්න මම බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවගේ මුදල්වලට වග කියන ආයතනය පාර්ලිමේන්තුව බව අපි කවුරුත් දන්නා කාරණයක්. මේ රටේ ජනතාව මේ රටට ගෙවන බදු, රාජ්‍ය ආදායම් සහ වියදම්, රාජ්‍ය ආයතනවල කරන ක්‍රියාකාරකම් ආදී

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

වශයෙන් මුදල් හා සම්බන්ධ සියලු දෙයට වග කියන ආයතනය තමයි පාර්ලිමේන්තුව. මේ පාර්ලිමේන්තුවේ මුදල් පිළිබඳව නිරීක්ෂණය කරන ආයතන දෙකක් තිබෙනවා. ඒ ආයතන දෙක තමයි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සංස්ථා සහ මණ්ඩල නිරීක්ෂණය කරන අතර, මගේ මිත්‍ර -සමා වෙන්න, මගේ මිත්‍ර නොවෙයි. ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමාගේ මිත්‍ර - ලසන්ත අලගියවන්න මැතිතුමා සභාපති ධුරය දරන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව රාජ්‍ය දෙපාර්තමේන්තු නිරීක්ෂණය කරනවා. මේ රටේ කරපු ඕනෑම ගනුදෙනුවක් පිළිබඳව අධීක්ෂණය කරලා, ඒ නිලධාරින් කැඳවලා, ඒ පිළිබඳව හොයා බලන්න මේ ආයතන දෙකට පුළුවන්. එමෙන්ම ඒවායේ තිබෙන අඩුපාඩුකම් සියල්ල මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ අඩුපාඩු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පස්සේ, මේ පාර්ලිමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශයටත්, අදාළ අමාත්‍යාංශයටත් ඒ අඩුපාඩුකම් පිළිබඳව දන්වලා යවනවා. ඒ අනුව ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කරලා, ඉදිරි කටයුතු කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතන දෙක තමයි, මේ රටේ ජනතාවගේ මුදල් සම්බන්ධයෙන් වග කිව යුතු ආයතන දෙක. ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමනි, මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියටත් කටයුතු කළා. ඒ නිසා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයෙකු හැටියට මොන තරම් කාර්ය භාරයක් කරන්න පුළුවන්ද කියලා මම දන්නවා.

නියෝජ්‍ය ඇමතිතුමනි, අපි ඒ දවස්වල රාජ්‍ය ආයතනවලට ගිහිල්ලා පැන්නා. අපි රාජ්‍ය ආයතනවලට පැනලා, ඒවා නිරීක්ෂණය කළා; ඒවායේ තිබෙන වැරැදි හොයලා බැලුවා; වැරැදිකරුවන් ඇල්ලුවා; ඒ අයට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කළා. ඒ නිසා මේ ආයතනය විශාල බලයක් සහිත, පුළුල් ආයතනයක් කියන එක අපි කවුරුත් දන්නා දෙයක්. මම කියාගෙන ආවේ මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ මුදල්වලට වග කිව යුතු ආයතනය පාර්ලිමේන්තුව නම්, ඒ මුදල් ගැන සොයා බලන ආයතනය "කෝප්" කමිටුව නම්, මේ "කෝප්" කමිටුව කෙරෙහි රටේ ජනතාව තුළ විශ්වාසයක් තිබෙන්න ඕනෑ. වර්තමාන "කෝප්" කමිටුව පිළිබඳව මේ රටේ ජනතාවගේ තිබෙන අවිශ්වාසය තමයි මට තිබෙන ප්‍රශ්නය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි මාසයේ 08 වැනිදායින් පස්සේ හොරකම නවත්වනවා කියලා බලයට පත් වෙච්ච මේ ආණ්ඩුව යටතේ මහා බැඳුම්කර මංකොල්ලය පිළිබඳව ඩිව් ගුණසේකර මැතිතුමා විසින් පරීක්ෂණයක් කළා. කෝප් කමිටුව විසින් පරීක්ෂණය කරලා, මේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කලින්, හොරකම හෙළි වෙයි කියලා වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. 2015 අගෝස්තු මාසයෙන් පස්සේ "කෝප්" කමිටුව නැවත පත් කළා. "කෝප්" කමිටුව නැවත පත් කරනකොට කලින් හිටපු වෙලු කුමාර් මන්ත්‍රීතුමා ඉවත් කරලා, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා පත් කළා. එතුමා තමයි "බැඳුම්කරයේ ඇත්ත නැත්ත" කියන පොත ලිව්වේ. පසුගිය දා ජනාධිපතිතුමා විසින් මේ පාර්ලිමේන්තුවේ සභාවාරය නැවත ආරම්භ කළාට පසුව "කෝප්" කමිටුවට නැවත සාමාජිකයන් පිරිසක් පත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ හැම කෙනෙක්ම කථා කරන දෙයක් තමයි, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු පිළිබඳව; පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබුණු ගෞරවය පිළිබඳව. වර්තමාන පාර්ලිමේන්තුව තරම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා අපහසුතාවකට පත් කරපු තැනක් තවත් නැහැ. මන්ත්‍රීවරයාට තිබුණු ගරුත්වය මේ තරම් නැති වුණු අවස්ථාවක් ලංකා ඉතිහාසයේ කවදාවත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෝප් කමිටුවට පසුගිය දා සාමාජිකයන් පිරිසක් පත් කළා. මේ පත් කරපු සාමාජිකයන්ගෙන් දෙන්නෙක් බැඳුම්කර වංචාවට සම්බන්ධ අර්ජුන් ඇලෝසියස් මහතාගෙන් මුදල් ගත්ත බව මේ වෙනකොට ඔප්පු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවගේ මුදල්වලට වග කියන ආයතනය පාර්ලිමේන්තුවයි. ඒ මුදල් අධීක්ෂණය කරන්නේ "කෝප්" කමිටුව. "කෝප්" කමිටුවට පත් කරලා ඉන්න සමහර සාමාජිකයන් ඒ කමිටුව විසින් පරීක්ෂා කරන ලද ගනු දෙනුවකට සම්බන්ධ චූදිතයෙකුගෙන් මුදල් අරගෙන තිබෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපති ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමාට මතක ඇති, බැඳුම්කර වංචාව පිළිබඳව "කෝප්" කමිටුවේ සාකච්ඡා කරපු වෙලාවේ "කෝප්" කමිටුවේ හිටපු ඔය සල්ලි ගත්ත මිනිස්සු විගණකාධිපතිතුමාට ඇඟිල්ල දිගු කරලා තර්ජනය කළ හැටි. ඔවුන් විගණකාධිපතිතුමාට ප්‍රශ්න කරන්න දුන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "කෝප්" කමිටුව තීරණය කළා, මහ බැංකු අධිපතිවරයා පාර්ලිමේන්තුවට කැඳවන්න ඕනෑ කියලා. මහ බැංකු අධිපතිවරයා පාර්ලිමේන්තුවට කැඳවන්න ඕනෑ කියනකොට "කෝප්" කමිටුවේ සභාපතිවරයාව කථානායකතුමාගේ කාමරයට ගෙනැල්ලා ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත් එක්ක කිව්වා, පුළුවන් නම් මේක නවත්වන්න කියලා. සුනිල් හඳුන්නෙත්ති සභාපතිතුමා "නැහැ, මම එතුමා ගෙන්වනවා" කියපු නිසා තමයි මේ බැඳුම්කර වංචාව එළියට ආවේ. ඒ වනතුරු මහ බැංකුව කිසිම තොරතුරක් දුන්නේ නැහැ. එදා මහ බැංකු අධිපතිවරයා කෝප් කමිටුවට ගෙන්වන එක නවත්වන්න මේ පාර්ලිමේන්තුව කටයුතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවගේ මුදල්වලට වග කියන ආයතනය හොරකමක් ගැන හොයනකොට ආණ්ඩුව මැදිහත්වෙලා ඒ චූදිතයන් කෝප් කමිටුවට කැඳවන එක නවත්වනවා නම්, තව මොනවාද කථා කරන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනකොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙදෙනෙක් කෝප් කමිටුව පරීක්ෂා කළ ගනු දෙනුවකට සම්බන්ධ ඒ චූදිතයාගෙන් මුදල් ගත්තා කියා ඔප්පු වෙලා තිබෙනවා. ඒ වාගේම තව සාමාජිකයන් තුන්දෙනෙක් මුදල් ගත්තා කියා ඔප්පු වෙලා තිබෙනවා. මම නම් කියලා ඒ අය අපහසුතාවට පත් කරන්න කැමැති නැහැ. කළුතර දිස්ත්‍රික්කයේ ඇමතිවරයෙක්, ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් සහ පුත්තලම දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් මුදල් අරගෙන තිබෙනවා කියලා මේ වෙනකොට ඔප්පු වෙලා ඉවරයි. හෙට අනිද්දා වෙනකොට ඒ නම් ටික එළියට එනවා. කොළඹ වර්තමාන නගරාධිපතිතුමිය රෝසි සේනානායක මහත්මියයි. බැඳුම්කර කොමිසමේ සාක්ෂි විභාග කරනකොට ඒ තොරතුරු එළියට ගියා කියලා පසුගිය දවස්වල පත්තර වල පළ වුණා. ඒ තොරතුරු එළියට ගියේ එතුමිය මඟින් කියලා කිව්වා. දැන් හෙළිවෙලා තිබෙනවා එතුමියගේ පුතාත් මුදල් ගත්තා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ සහ කෝප් කමිටුවේ සාමාජිකයන් පස් දෙනෙක් මුදල් අරගෙන තිබෙනවා කියා මේ වෙනකොට ඔප්පු වෙලා ඉවරයි. තව දෙන්නෙක් හෙට අනිද්දා වෙනකොට එළියට එනවා. මේ ප්‍රශ්නය නිසාම මමත්, අපේ කළුතර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත සමරවීර මැතිතුමාත් දිවුරුම් ප්‍රකාශ දුන්නා. කෝප් කමිටුවට තිබෙන ගෞරවය නැති කරන්න එපා, කෝප් කමිටුවේ සාමාජිකයන් අර්ජුන් ඇලෝසියස්ගෙන් සල්ලි අරගෙන නැත්නම් වහාම දිවුරුම් ප්‍රකාශයක් දීලා "අපි මුදල් අරගෙන නැහැ" කියලා කියන්න කියලා අපි කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තමයි තිබෙන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මට විනාඩි කීයක්ද තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තිබුණේ විනාඩි 10යි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපේ පැත්තෙන් කථා කරන වෙන මන්ත්‍රීවරයෙකුගේ කාලය ලබා දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමාගේ කාලය තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ඔබතුමා කථා කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියාගෙන ආවේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු පස්දෙනෙක් ඒ වුදිතයාගෙන් මුදල් අරගෙන තිබෙන බව මේ වෙනකොට ඔප්පු වෙලා තිබෙන බවයි. අපි ගරු කථානායකතුමාට කිව්වා, මුදල් අරගෙන නැත්නම් "කෝප්" කමිටුවේ සියලු සාමාජිකයන්ගෙන් දිවුරුම් ප්‍රකාශ ලබාගන්න කියලා. පාර්ලිමේන්තුවේ කළුතර දිස්ත්‍රික් මන්ත්‍රී ජයන්ත සමරවීර මැතිතුමා සහ මම විතරයි කෝප් කමිටුවේ සාමාජිකයන් හැටියට තවම දිවුරුම් ප්‍රකාශ දීලා තිබෙන්නේ. අනික් කවුරුවත් දිවුරුම් ප්‍රකාශ දුන්නේ නැහැ. ඔක්කෝම දැන් ඇටි කෙහෙල් කාපු රිලව් වාගෙයි. දැන් කවුරුවත් කතා කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෝප් කමිටු සාමාජිකයන්ට සල්ලි දීලා විතරක් නොවෙයි, මේ වෙනකොට මෙන්ඩිස් අරක්කු සමාගමේ දිස්ත්‍රික් නියෝජිත තනතුරු ගත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු පස්දෙනෙක් ඉන්නවා. වයඹ පළාතේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා; සබරගමුව පළාතේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා; මධ්‍යම පළාතේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා. ලජ්ජා නැතුව ඊයේ-පෙරේදා නියෝජ්‍ය ඇමතිකම් ගත්තා. ඇලෝසියස්ගේ අරක්කු විකුණනවා; බෙදනවා. ඒජන්සි අරගෙන, අර්ජුන් ඇලෝසියස්ගේ අරක්කු බෙදනවා. දැන් ලජ්ජා නැතුව කථා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකක්ද මේ පාර්ලිමේන්තුවට වෙලා තිබෙන්නේ?

අපි ඊයේ පත්තරේ දැක්කා, හාරදහස් පන්සියයකට මුදල් බෙදලා කියලා. හාරදහස් පන්සියයකට මුදල් බෙදලා; සිරිකොතේ වැඩ කරන මිනිස්සුන්ට සල්ලි ගෙවලා; මහ බැංකුවේ නිලධාරින්ට සල්ලි ගෙවලා; පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට සල්ලි ගෙවලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද මේ වෙලා තිබෙන්නේ? මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ, ජනතාවගේ මුදල්වලට වග කියන ආයතනයේ සාමාජිකයන් පරීක්ෂණයට ලක්වන ප්‍රධාන වුදිතයාගෙන් මුදල් අරගෙන තිබෙනවා නම්, අද වෙනකල් මේ ආණ්ඩුවේ නීති කෝ? ලක්ෂ දහයට-පහළොවට අපිට නඩු පවරලා හිරේ දමනවා. රවි කරුණානායක හිටපු මුදල් ඇමතිතුමා බැඳුම්කර කොමිසමට ආවා. එහිදී එතුමා අර්ජුන් ඇලෝසියස් මහත්මයාගෙන් නිවසක් ගත්තාය කියලා ඔප්පු වුණා. ඒ චෝදනා පත්‍රය නීතිපතිතුමාට යවලා මාස හතරක් වෙනවා. අද වෙනකල් කිසි ප්‍රතිචාරයක් නැහැ. මහින්දානන්ද අලුත්ගමගේලාට විරුද්ධව මාස තුනෙන් අධි චෝදනා භාර දෙනවා. මහෙස්ත්‍රාත් අධිකරණයේ 2012 වසරේ කථා කළ නඩුවල අධි චෝදනා තවම භාර දීලා නැහැ. අවුරුදු හතක් පරක්කුයි, මහෙස්ත්‍රාත් අධිකරණවල කථා කරන නඩුවලට අදාළව මහාධිකරණවලට අධි චෝදනා භාර දීම. හැබැයි මේ ආණ්ඩුවට විරුද්ධව කථා කරනවාට ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට විරුද්ධව අධි චෝදනා භාර දීලා නඩු අහනවා.

රවි කරුණානායක මහත්මයාට විරුද්ධව අද වෙනකල් අධි චෝදනා භාර දුන්නාද? FCID එකට කැඳවලා කටඋත්තරයක් ගත්තාද? දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ගෙන්වලා කටඋත්තරයක් ගත්තා. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා FCID එකට ගෙන්වලා කටඋත්තරයක් ගත්තා. අනෙකුත් මන්ත්‍රීවරුන්ගෙන් කටඋත්තර ගන්නවාද? කළුතර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ඇමතිවරයෙක්ගේ මස්සිනා ගිහිල්ලා තමයි cheque එක මාරු කළේ. දූෂණය නැවැත්වීම ගැන කථා කරනවා. විගණකාධිපතිට ඇඟිල්ල දික් කරලා තර්ජනය කළා. විගණකාධිපතිවරයා හරි කලකිරීමෙනුයි එදා කථා කළේ. රටේ මුදල්වලට වග කියන විගණකාධිපති බැඳුම්කර කොමිසම ගැන කථා කරනකොට, එක එක්කෙනාගේ කොන්ත්‍රාත් කරන්න එපාය කියලා විගණකාධිපතිට කිව්වා; විගණකාධිපතිවරයාට තර්ජනය කළා. විගණකාධිපතිවරයා මහ බැංකුවට ගිහිල්ලා අදාළ තොරතුරු ඉල්ලනකොට විගණකාධිපතිවරයාට තොරතුරු නොදී හිටියා. පාර්ලිමේන්තුවේ footnotes දැමූ සියලු දෙනාගේ වත්කම් හෙළි කරන්න කියලා ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු විධියට අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගිහිල්ලා පැමිණිලි කළා. අද වෙනකල් එක මන්ත්‍රීවරයෙක් ගෙන්වලා තිබෙනවාද?

රුපියල් බිලියන 131ක් හොරකම් කළාය කියලා මේ මන්ත්‍රීතුමන්ලා ගිහිල්ලා මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කළා. පැමිණිලි කරලා දැන් අවුරුදු එකහමාරයි. අද වෙනකල් අල්ලස් කොමිසමට එක මන්ත්‍රීවරයෙක් කැඳවා තිබෙනවාද? එක මන්ත්‍රීවරයෙක්වත් අල්ලස් කොමිසමට කැඳවා නැහැ. ඒ නිසා ඒ පැමිණිල්ල ඉදිරිපත් කළ මන්ත්‍රීතුමන්ලා දසදෙනා අල්ලස් කොමිසමේ සභාපතිතුමාට ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා. රජයේ අමාත්‍යවරු සහ නිලධාරින් ඇතුළු දොළොස්දෙනෙකුට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි ඉදිරිපත් කළා. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා, ගරු නිරෝෂන් ප්‍රේමරත්න මන්ත්‍රීතුමා, ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා, ගරු කනක හේරත් මන්ත්‍රීතුමා, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා, ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා, ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා, ගරු විදුර වික්‍රමනායක මන්ත්‍රීතුමා යන මන්ත්‍රීවරු දසදෙනා මේ ආණ්ඩුවේ ඇමතිවරු රුපියල් බිලියන 131ක් -මිලියන 131,000ක් - මහ දවල් හොරකම් කළා කියලා පැමිණිලි ඉදිරිපත් කරලා තිබෙනවා. කෝ, ඒවාට විභාග? මොකක්ද, මේ රටේ නීතිය? මේ

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

රටේ නීතිය තිබෙන්නේ ඒකාබද්ධ විපක්ෂයට විතරද? එක දිගට දින දමලා ප්‍රසන්න රණතුංගගේ නඩු අහනවා. බැසිල් රාජපක්ෂ මහත්මයාගේ නඩු එක දිගට දින දමලා අහනවා. මහින්දානන්ද අලුත්ගමගේගේ නඩු අහනවා. දවසෙන් දවස ඒ නඩු අහනවා. හැබැයි මහ දවල් මංකොල්ල කාපු කට්ටියගේ නඩු පිළිබඳව විභාගයකුත් නැහැ; මොකක්වත් නැහැ. එහෙම නේද, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි? මොකක්වත් නැහැ. මේවා ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ.

අපි දැක්කා, අපේ නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා ඊයේ-පෙරේදා පොලිසිය භාර නියෝජ්‍ය ඇමතිකම භාර ගත්තා. අද නියෝජ්‍ය ඇමතිකම භාර ගත්තා, හෙට උදේ FCID එකට ගියා; හිටපු ආරක්ෂක ලේකම්තුමාට විරුද්ධව කටඋත්තරයක් දෙන්න. මාර ඇමතිකම්! ඇමතිකම දුන්න ගමන් ගිහිල්ලා කටඋත්තර දෙනවා. ඊට කලින් කටඋත්තර දෙන්න බැහැ. ඇමතිකම දීලා තිබෙන්නේ, කටඋත්තරයක් දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ගරු කථානායකතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, මේ පාර්ලිමේන්තුවේ කෝප් එකේ ඉන්න, මුදල් ගත්ත සාමාජිකයින් ටික වහාම ඉවත් කරන්න කියලා. මේ වන කොට ඒ පස්දෙනකුගේ නම් ඔප්පු වෙලා තිබෙනවා. ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමනි,

'ෆුට්නෝට් කල්ලිය' කෝප් කමිටුවේ හැසිරුණු ආකාරය ඔබතුමාට මතකද? ඔබතුමාට මතක ඇති, ෆුට්නෝට් කල්ලිය හැසිරුණු ආකාරය. බුදු අම්මේ! කෝප් කමිටුවේ සාකච්ඡාව යන ගමනුත් සමහරු "Okay, okay" කිය කියා කථා කරනවා. අපි හිතුවා, මළ ගෙයක් ගැන කියලා ගෙදරින් කථා කරනවා කියලා. පස්සේ බැලුවාම අර්ජුන් ඇලෝසියස් එක්කයි කථා කරලා තිබෙන්නේ! මේ රටේ ලොකුම මූල්‍ය වංචාව සිදුවීම පිළිබඳව පාර්ලිමේන්තුවේ කෝප් කමිටුවේ පරීක්ෂණය පැවැත්වෙන අතරේ, එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරු අර්ජුන් ඇලෝසියස් එක්ක දුරකථනයෙන් කථා කර ගන්නවා, මේ ප්‍රශ්නවලට දෙන උත්තර මොනවාද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොනවාද මේ වෙන්නේ? කොහේටද මේ අය මේ රට ගෙන යන්නේ? ජනවාරි මාසයේ 08වැනි දා මේ රටේ ජනතාව මේ ගොල්ලන්ට ඡන්දය දුන්නේ මොනවාටද? බැංකු කඩන්නද? ජනාධිපතිතුමා අහලා තිබුණානේ, "ජන වරම දුන්නේ මහ බැංකුව කඩන්නද" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් වන කෝප් කමිටු වාර්තාව අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. හරි විධියට නම් ඒක එදාම අදාළ ආයතනවලට යවන්න ඕනෑ. නමුත්, අද වනතුරු ඒක යවලා තිබෙනවාද? අද වනතුරු ඒක පාර්ලිමේන්තුවෙන් මුදල් අමාත්‍යාංශයට එහෙම නැත්නම් අදාළ ආයතනවලට යවලා නැහැ. ඒ නිසා පාර්ලිමේන්තුවත් වරදක් කරලා තිබෙනවා. ඒ මොකක්ද? මේ කරුණු වහන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. " දිව්රුම් ප්‍රකාශයක් දුන්නා" කියලා එදා මම කිව්වාම, කළුතර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ඇමතිවරයෙක් කිව්වා, "අපට විරුද්ධවත් නඩු තිබෙනවා" කියලා. අපට විරුද්ධව තිබෙන නඩු දැන් විභාග කරනවා නේ. දැන් දිගින් දිගට ඒවා අහනවානේ. ඒ නඩු තීන්දු ආවාම චෝදනා එන්නේ කාටද, මොනවාද වෙන්නේ කියලා බලා ගන්න පුළුවන්. අපි අත්අඩංගුවට ගත්තා; ඒ ඔක්කෝම කළා නේ. අධිකරණයේ නඩු තීන්දුව ආවාම බලා ගන්න පුළුවන්, කවුද හොරු, කවුද නිවැරදිකාරයන් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේගොල්ලන් හොරකම නවත්වන්න කියලා බලයට පත් වෙලා මාසයක් යන කොට මේ රටේ මහ බැංකුවේ මුදල් හොරකම් කර තිබෙනවා. ඒ හොරකමට සම්බන්ධ මහ එකාගේ ඉඳලා සියලුදෙනා අද අහු වෙලා තිබෙනවා. පසුගිය පාර්ලිමේන්තු මැතිවරණය වෙලාවේ එක්සත් ජාතික පක්ෂයේ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සල්ලි දුන්නා, එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්තුමා. අපේක්ෂකයෙකුට ලක්ෂ 50, 100, 150 දුන්නා. ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, සල්ලි දුන්නා නේද?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම නම් "දුන්නේ නැහැ" කියලා දිවුරුම් ප්‍රකාශයක් දෙන්න. සිරිකොතේ ලයිට් බිල් ගෙවා ගන්න බැරිව හිටපු තමුන්නාන්සේලා එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මැතිවරණයට ලක්ෂ 50, 100 බෙදුවා. මම ඒ අයගේ නම් කියන්න කැමැති නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
බැසිල් රාජපක්ෂ මහත්මයා බෙදුවේ?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බැසිල් රාජපක්ෂ මහත්මයා බෙදුවා නම් තමුන්නාන්සේ ඒක ඔප්පු කරන්නකෝ. බැසිල් රාජපක්ෂ මහත්මයාට චෝදනාවක් නැහැ. තමුන්නාන්සේලාටයි චෝදනාව තිබෙන්නේ, මහ බැංකුව කොල්ල කෑවායි කියලා. [බාධා කිරීම්] හරි, පොඩ්ඩක් ඉන්නකෝ. ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, ඔබතුමා බොහොම ගෞරවනීය මන්ත්‍රීතුමෙක්නේ. ඔබතුමා කමිටුවේ සාමාජිකයෙක් නේද?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඔව්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා අර්ජුන් ඇලෝසියස්ගෙන් සල්ලි ගත්තා ද?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳයි, එහෙම නම් ඔබතුමා කෝප් කමිටුවට දිවුරුම් ප්‍රකාශයක් දෙන්න. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට චෝදනාවක් තිබෙනවා සල්ලි ගත්තා කියලා. ඔබතුමා ගත්තේ නැත්නම් දිවුරුම් ප්‍රකාශයක් දෙන්න. [බාධා කිරීම්] මූලාසනාරූඪ

ගරු මන්ත්‍රීතුමනි, පෙනෙනවා නේද මොකද වෙන්නේ කියලා? [බාධා කිරීම්] ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, ඔබතුමා එක්ක තිබෙන පෞද්ගලික ප්‍රශ්නයක් නිසා නොවෙයි මම මෙහෙම කියන්නේ. ඒ විධියට රටේ මතයක් හැදිලා තිබෙනවා. ඔබතුමාට මතකද, සමහර අය කෝප් කමිටුවේ හැසිරුණු හැටි? විගණකාධිපතිතුමාට තර්ජනය කරපු හැටි මතකද? තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ කණ්ඩායම අර්ජුන් ඇලෝසියස් වෙනුවෙන් කඩේ ගිය හැටි මතකද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අර්ජුන් ඇලෝසියස්ගෙන් මුදල් ගත්ත සියලුදෙනා විතරක් නොවෙයි, මෙන්ඩිස් සමාගමේ ඒජන්සි ගත්ත පාර්ලිමේන්තුවේ ඉන්න පස්දෙනා කවුද කියලාත් කියන්න. තමුන්නාන්සේලාගේ පස්දෙනකු ඉන්නවා. මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ඉදිරිපත් කරපු පැමිණිල්ල මම **සභාගත*** කරනවා.

මෙයට සම්බන්ධ ඌව පළාතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ඉන්නවා; මධ්‍යම පළාතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ඉන්නවා; සබරගමුව පළාත නියෝජනය කරන තමුන්නාන්සේලාගේ පසුපෙළ මන්ත්‍රීවරයකුත් ඉන්නවා; වයඹ පළාතේ මන්ත්‍රීවරයකුත් ඉන්නවා. ඒ අය තමයි අර්ජුන් ඇලෝසියස්ගේ අරක්කු බෙදන කට්ටිය. පාර්ලිමේන්තුවේ දැන් අරක්කු බෙදන මන්ත්‍රීවරුත් ඉන්නවා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඒ නම් ටික කියන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
පොඩ්ඩක් ඉන්නකෝ. ඒ නම් ටික හෙට අනිද්දා එළියට එනවා. කලබල වෙන්න එපා. මම දැන් කිව්වානේ. ගම්පහ දිස්ත්‍රික්කයේ එක්කෙනකුගේ නමක් තිබෙනවා; කළුතර එක්කෙනකුගේ නමක් තිබෙනවා; හලාවත එක් කෙනකුගේ නමකුත් තිබෙනවා. දැන් ඒවා හසු වෙලා තිබෙනවා. ඒ නම් ටික එළියට එනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උත්තරීතර පාර්ලිමේන්තුව තමයි මේ රටේ ජනතාවගේ මුදල්වලට වග කියන ආයතනය. ඒ කටයුතු නිරීක්ෂණය කරන ආයතනය කෝප් කමිටුව නම්, ඒ කමිටුවේ සාමාජිකයන් මේ රටේ මහා මං කොල්ලය කළ මං කොල්ලකරුවාගෙන් සල්ලි අරගෙන තිබෙනවා නම්, කරුණාකර ඒ සාමාජිකයන් ඉවත් කර වෙනත් සාමාජිකයන් පත් කරලා, ඒ ගෞරවනීය අවස්ථාව එතුමන්ලාට ලබා දෙන්න කියන ඉල්ලීම පමණයි මා ඔබතුමාගෙන් කරන්නේ. බොහොම ස්තුතියි.

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[අ.භා.3.20]

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පිළිබඳව කථා කරන මේ මොහොතේ ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන්න මට ලැබී තිබෙන්නේ ඉතාම කෙටි කාලයක් නිසා, අවශ්‍යම කාරණා පමණක් කථා කරන්න මා බලාපොරොත්තු වනවා.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් දෙවෙනි වතාවටත් මා තෝරා ගැනීම පිළිබඳව විශේෂයෙන්ම මා සතුටු වනවා. මීට කලින් තිබුණු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සහ වර්තමාන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වන ලසන්ත අලගියවන්න මැතිතුමාටත් මා ස්තුතිවන්ත වන්න ඕනෑ. එතුමාත් එක්ක, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිටින මන්ත්‍රීතුමන්ලාත් එක්ක, ඒ නිලධාරින් එක්ක වැඩ කර ගෙන යනකොට ඇත්තටම නවක මන්ත්‍රීවරියක විධියට මටත් ගොඩක් දේවල් ඉගෙන ගන්න පුළුවන් වුණා. නවක මන්ත්‍රීවරියක විධියට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තිබෙන වටිනාකම පිළිබඳව මට කොපමණ දේවල් ඉගෙන ගන්න තිබෙනවාද කියලා එහිදී මට තේරුම් ගියා. රාජ්‍ය දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ ඇතුළේ ගනුදෙනු සිද්ධ වන්නේ කොහොමද, ඒවායේ අය වැය සකස් කරන්නේ කොහොමද, ඒ මුදල් පරිහරණය වන්නේ කොහොමද, ඒ මුදල් යම් යම් කටයුතුවලට යොදවන්නේ කොහොමද කියන ඒ සෑම දෙයක් පිළිබඳවම යමක් ඉගෙන ගන්න තිබෙන හොඳම ස්ථානය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තමයි කියලා මට උපදෙස් දුන්නේ අපේ ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමායි. ඒ නිසා මේ වෙලාවේ මම කෘතඥතාපූර්වකව එතුමාත් මතක් කරන්න ඕනෑ. එතුමාගේ බල කිරීම මත, පුළුවන් සෑම අවස්ථාවකම වාගේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මම ගියා. ඒ ගිය සෑම අවස්ථාවකදීම මට ඉගෙන ගන්න දෙයක් තිබුණා. එහිදී අපේ දැනුමට යමක් එකතු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට නිතරම සහභාගි වුණු කෙනකු විධියට මම අධ්‍යයනය කරපු පළමුවෙනි කාරණාව තමයි, 2015 වසරට කලින් අවුරුදු ගණනාවක් තිස්සේ පැවැති ආණ්ඩු යටතේත් ඇහැ ගැටුණේ නැති අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන තිබෙන බව. ඒ ආයතන ඇතුළේ සිදු වුණු මුදල් පිළිබඳ යම් යම් අකටයුතුකම් අවුරුදු ගණනාවක් තිස්සේ ඇදී ගෙන ඇවිත් තිබෙනවා, මෙතෙක් කථා නොකර. 2015දී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරය ලසන්ත අලගියවන්න මැතිතුමාට ලැබුණාට පස්සේ එතුමා කිසිම විධියකින් කිසිම පැත්තකට ගැති වන්නේ නැතිව ඉතාම අපක්ෂපාතීව, සෑම නිලධාරියෙකුම කාරක සභාව ඉස්සරහට ගෙන්වාගෙන ඒ හැම කාරණාවක්ම මුල සිට අග දක්වා අපේ අවධානයට යොමු කළා. ඒ විධියට එතුමා කටයුතු කළ නිසා අපි දැන ගත් කරුණු තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට ටික වෙලාවකට කලින් මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කිව්වා, පසුගිය ආණ්ඩු කාලයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හරි ප්‍රබල ආයතනයක්, ප්‍රබල තැනක්, ප්‍රබල කොමිටියක් කියලා. මේ කාරක සභාවෙන් එක පාරටම ගිහින් රාජ්‍ය ආයතනවලට පනිනවා කියලාත් එතුමා කිව්වා. එතුමා කියන විධියට ඒ තරම් තදබල ලෙස ඒ වැඩ කටයුතු කළා නම්, මේ ආණ්ඩු බලය ගත් අපට 2015 වසරේ සිට අද වන තෙක් පසුගිය ආණ්ඩු කාලයේ සිදු වූ මුලා අකටයුතුකම් ගැන සොයා බලන්න වුණේ මොකද? අද සමහර රජයේ ආයතනවලට සිදු වෙලා තිබෙන දේවල් ගැන බලන කොට

[ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය]

-දේශපාලනය පැත්තක තියන්න කෝ- රටේ පුරවැසියකු විධියට ඇත්තටම මට පුදුමාකාර කලකිරීමක් ඇති වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කීප වතාවක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ උදවිය මේ කාරක සභාවට ගෙන්වූවා. අපි හිතමු, ලංකාවේ දූෂිත රාජ්‍ය ආයතන 10ක් තිබෙනවා කියලා. මේ ආයතන 10න් ප්‍රමුඛ ස්ථානය ලැබෙන්නේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට. මේ ආයතනය තරම් සල්ලි හම්බ කරන්න පුළුවන්, අත යට කොමිස් ගහන්න පුළුවන් ආයතනයක් මේ රටේ කොහේවත් නැහැ. මේ ආයතනයේ නිලධාරින්ගෙන් අපේ සභාපතිතුමා ප්‍රශ්න අහන කොට, පිටුපස ආසනයක හිටපු රාජ්‍ය නිලධාරිනියක් නිදි කිරනවා. මම එතුමියගෙන් ඇහුවා, මෙම ආයතනයේ නිලධාරින් පාර්ලිමේන්තුවට ගෙන්වා සභාපතිතුමා ප්‍රශ්න කරන කොට ඔබතුමිය නිදාගෙන ඉන්නවා නම්, ආයතනය ඇතුළේත් මේකම නේද වෙනවා ඇත්තේ කියලා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලිපි අවුරුදු ගණනාවක් තිස්සේ -අද වනකොටත්- අස්ථානගතයි. මේ පිළිබඳව අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. අපි ඔවුන්ට දන්වා තිබෙනවා, ඊළඟ වතාවේ පැමිණෙනකොට අස්ථානගත වුණු ලිපිගොනු සියල්ලක්ම අප අතට පත් කරන්න කියලා. රාජ්‍ය ආයතනයක ලිපි අස්ථාන ගත වෙනවා කියලා කියන්නේ දඬුවම් ලැබිය යුතු වරදක්. අපේ මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කිව්වා, එතුමන්ලාගේ කාලයේ මේ ආයතන පිළිබඳව සොයා බැලුවා, එම ආයතන ශක්තිමත්ව වැඩ කටයුතු කළා කියලා. ඒ විධියට වැඩ කටයුතු කළා නම් අද මේ වාගේ තත්ත්වයක් ඇති වෙන්න විධියක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රත්මලාන මගේ ආසනය නිසා තවත් විශේෂ දෙයක් කියන්න තිබෙනවා. පසුගිය ආණ්ඩු කාලයේ මේ මුළු ලංකාවේම මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා අතරින් තිබුණු දූෂිතම මහ නගර සභාව තමයි දෙහිවල-ගල්කිස්ස මහනගර සභාව. එවකට නගරාධිපති විධියට හිටියේ ධනසිරි කියලා මහත්මයෙක්. දැන් එතුමා නැහැ. ධනසිරි මහත්මයා නගරාධිපති විධියට කටයුතු කරගෙන යනකොට 2012 වසරේ හිඟ වරිපනම් ආදායමෙන් රුපියල් මිලියන 31ක් කපා හැරලා තිබෙනවා. එතුමා පෞද්ගලිකවම හඳුනන "නගින්දාස්" කියන ආයතනයකින් වරිපනම් මුදල් රුපියල් ලක්ෂ 29ක් අය විය යුතුව තිබෙනවා. අපි මේ වෙනකොට ඔවුන්ට දැනුම් දීලා තිබෙනවා, මේ හිඟ ආදායම් අය කර ගත යුතුයි කියලා. මේ වන විට හිඟ වරිපනම්වලින් රුපියල් මිලියන 100ක් අය කරගෙන තිබෙනවා කියලා ගණන්දීමේ නිලධාරියා කියලා තිබෙනවා. මෙවර නගරාධිපති වෙලා තිබෙන්නේ, පොහොට්ටුව පක්ෂය නියෝජනය කරන ස්ටැන්ලි ඩයස් මහත්මයායි. බොරු කියන්න ඕනෑ නැහැ, හිටපු නගරාධිපතිතුමාත් එක්ක බලද්දි එතුමා ඇත්තටම යූඑන්පී අය ද, ශ්‍රී ලංකා අය ද කියලා බලන්නේ නැතිව, පක්ෂ, පාට භේදයකින් තොරව හැම කෙනා එක්කම ඉතාමත් සුහදව වැඩ කටයුතු කරනවා. හැබැයි, ඉතාමත් වග කීමෙන් යුතුව මෙය කියන්න ඕනෑ. ඒ දවස්වල ධනසිරි කියන මහත්මයාත් එක්ක හිටපු හොරු ටික ඉන්නවා නේ. දැන් ටික ටික ස්ටැන්ලි ඩයස් නගරාධිපති මහත්මයා ළඟට ඒ අය ළං වෙනවා. එහෙම ළං වෙලා ඒ පුද්ගලයාවත් සවුත්තු කරන්න, හොරකම් කරන්න පුරුදු කරන්න ටික ටික ලැහැස්ති වෙනවා. ස්ටැන්ලි ඩයස් කියන නගරාධිපතිතුමා "හොරෙක්" විධියට නම කැත කර ගත්ත කෙනෙක් නොවෙයි කියලා මට විශ්වාසයක් තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම පාර්ලිමේන්තුව ඇතුළේ දී එතුමාට මේ ටික කියනවා. එතුමාට මේ කථාව කොහෙන් හරි තැනකින් ආරංචි වෙයි නේ. "හොරුන්ගෙන් ආරක්ෂා වෙලා ඉන්න, නැත්නම් හිටපු නගරාධිපතිතුමා වාගේ නිකම් නම කැත කර ගන්නයි වෙන්නේ" කියලා, මා එතුමාට කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කාලයකට පසුව අද තමයි කථාවක් කරන්න අවස්ථාව ලබා ගත්තේ. මේ පාර්ලිමේන්තුවේ තිබෙන ප්‍රධානතම කොමිටියක් වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිටින ලාබාලතම සාමාජිකාව; මේ පාර්ලිමේන්තුවේම සිටින ලාබාලතම මන්ත්‍රීවරිය මම. මාව එම කොමිටියට පත් කරපු ගරු අගමැතිතුමාට, ගරු කථානායකතුමාට මේ වෙලාවේ මා ස්තුතිවන්ත වෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හිටපු ගරු සභාපතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. අවසාන වශයෙන් මේ කාරණාව පිළිබඳවත් මා සඳහන් කරන්නට ඕනෑ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිලධාරිනියක් මට පැවසුවා, "මෙතෙක් කාලයක් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හිටපු එක සභාපතිවරයකුටවත් අවස්ථාවක් ලැබුණේ නැහැ; අවස්ථාවක් කර ගත්තේ නැහැ, බිම් මට්ටමේ තිබෙන ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා මේ රාජ්‍ය ගිණුම් කාරක සභාවට ගෙන්වා ප්‍රශ්න කරන්න. මේ තමයි ප්‍රථම වතාව" කියලා. ඒ අවස්ථාව සලසා ගත්තේ අපේ ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා විතරයි. මම එතුමාට ස්තුතිවන්ත වනවා. අද ඩෙංගු මදුරුවන්ට දුම ගැසීමේ ඉඳන්, කැළි කසළ අයින් කරන එක දක්වා, පොඩි තැනක ඉඳලා ඉහළම රාජ්‍ය ආයතනය දක්වා, මම හිතන විධියට මේ වෙනකොට රාජ්‍ය නිලධාරින් 813ක්, - නේද ගරු සභාපතිතුමනි?

**ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)

The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)

820ක්.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**

(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)

(The Hon. (Mrs.) Hirunika Premachandra)

- රාජ්‍ය නිලධාරින් 820ක් මේ පාර්ලිමේන්තුවේ පැවැත්වෙන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපති ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා ඉදිරියට; අප ඉදිරියට ප්‍රශ්න කරන්නට ගෙන්වා තිබෙනවා. ඒ පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වනවා, ඒ වාගේම මා ඒ ගැන සතුටු වනවා. මේ රටේ ප්‍රධානම මූල්‍ය කළමනාකරණය සිදු වන තැන තමයි පාර්ලිමේන්තුව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තවත් මිනිත්තු දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**

(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)

(The Hon. (Mrs.) Hirunika Premachandra)

විනාඩි දෙකක කාලයක් යන එකක් නැහැ. මට එච්චර දෙයක් කියන්න නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ මූල්‍ය කළමනාකරණය කරන තැන තමයි පාර්ලිමේන්තුව. මේ සෑම ආයතනයක්ම පාර්ලිමේන්තුවට ගෙන්වලා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දී ඔවුන්ගෙන් ප්‍රශ්න කරලා, ඉදිරියේ දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම පිළිබඳව එම කාරක සභාවේ සාමාජිකාවක් හැටියට මා අද ඇත්තටම සතුටු වනවා. මේ ආයතනවල සමහර දූෂිත නිලධාරින් සිටිනවා තමයි. හැබැයි, ඒ හැම කෙනාම දූෂිතයි කියලා මම කියන්නේ නැහැ. රාජ්‍ය සේවය කියලා කියන්නේ ඕනෑම රටක කශේරුකාව. එය බිඳ වැටුණොත් රටේ ගමන් මඟ සම්පූර්ණයෙන්ම අඩාල වෙන බව රාජ්‍ය සේවකයන්ට විශේෂයෙන්ම කිව යුතුයි. ඒ කාලයේ

දූෂිත වැඩ කරන්න හරි ලේසියි. මොකද, උඩ සිට පහළ දක්වාම සිටියේ දූෂිතයන් නිසා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මේ කාලයේ දූෂණයට අත පොවන්න එච්චර හැකියාවක් නැහැ. මොකද, කවුරු කොහොම කිව්වත් අඩු තරමින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා හරි කෙළින් ඉන්නවා. ඒ වාගේම, මට තවත් දෙයක් ගැන කියන්න තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
COPE එකේ සාමාජිකයින් විධියට හිටපු කීප දෙනෙක් මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් අද දින මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කථා කළා. එම සල්ලි ගත්තාය කියන 118 දෙනාගේ ලැයිස්තුවට මම ඇතුළත් නැහැ කියන එක මම ඉතාමත් ආඩම්බරයෙන්, ඉතාමත් සංතෝෂයෙන් ප්‍රකාශ කරනවා. ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. The next speaker is the Hon. Douglas Devananda. You have ten minutes.

[பி.ப. 3.30]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவினது அறிக்கை தொடர்பிலான ஒத்திவைப்புவேளை விவாதத்தில் கலந்துகொண்டு, எனது கருத்துக்களையும் பதிவு செய்வதற்கு வாய்ப்பு வழங்கியமை குறித்து எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இந்த நாட்டின் வரவு செலவுத்திட்டத்திற்கு ஒரு பாரிய சுமையினைக் கொடுத்துக் கொண்டிருக்கின்ற அரச நிறுவனங்களின் நட்டங்கள் என்பது, இந்த நாட்டின் பொருளாதாரத் துறையில் மிக அதீதமான அழுத்தங்களைப் பிரயோகித்து வருவதாகவே தொடர்ந்தும் காணப்படுகின்றன. குறிப்பாக, அரசுக்கும் வர்த்தக செயற்பாடுகளுக்கும் ஒத்துவராது என்ற நிலையினை உருவாக்கி வருகின்ற மேற்படி நிறுவனங்கள் காரணமாக பல்வேறு வரிச் சுமைகளால் பொதுமக்கள் பாதிக்கப்படுகின்ற நிலைமைகளே காணப்படுகின்றன. ஒரு பக்கத்தில் மேற்படி அரச நிறுவனங்களில் பணியாற்றுகின்ற பணியாளர்களுடைய வாழ்வாதாரங்கள் குறித்தும் யோசிக்க வேண்டியுள்ள அதேநேரம், மேற்படி அரச நிறுவனங்கள் தொடர்ந்தும் நட்டத்தில் செயற்பட்டு வருகின்ற நிலையில், அந்த நட்டத்தினை ஈடுசெய்கின்ற வகையில் பெறப்படுகின்ற பொதுமக்களின் நிதி காரணமாக பொதுமக்கள் அடைகின்ற பாதிப்புகள் குறித்தும் யோசிக்க வேண்டும்.

அரச நிறுவனங்கள் தொடர்பிலான பல்வேறு முறைப்பாடுகளையே நாம் கடந்த பல காலங்களாகக் கேள்வியுற்று வருகின்றோம். ஒரு நிறுவனத்தைச் சிறந்த முறையில் இயக்கி, அதன் மூலமான போதிய பயன்களை ஈட்டுவதற்குப் பதிலாக, அந்நிறுவனத்தின் மூலமாகத் தத்தமது தனிப்பட்ட அபிலாஷைகளைப் பூர்த்தி செய்து கொள்வதற்கு முனைகின்ற நபர்கள் அத்தகைய நிறுவனங்களின் பிரதானிகளாக நியமனம் பெறுகின்ற நிலைகளிலேயே இத்தகைய தவறுகள், முறைகேடுகள், ஊழல் மோசடிகள் இடம்பெறுவதாகத் தெரிய வருகின்றது. எனவே, அரச நிறுவனங்கள் உயரிய பயனை, அதாவது அவற்றின் உரிய இலக்குகளை எட்ட வேண்டுமெனில் அவற்றுக்கென நியமிக்கப்படுகின்ற பிரதானிகளில் அதிக கவனம் செலுத்துவது அவசியமாகின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු වේලු කුමාර් මහතාගේ නම යෝජනා කරන්න.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය (කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Chandrani Bandara - Minister of Women and Child Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு ஷெஹான் சேமசிங்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SHEHAN SEMASINGHE *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ டக்ளஸ் தேவானந்தா அவர்களே, உங்களது உரையைத் தொடரலாம்.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
அந்தந்த நிறுவனங்களின் ஏனைய பதவிகளுக்கெனக் கல்வி, திறமை மற்றும் தகுதி அடிப்படையில் நபர்கள் தெரிவு செய்யப்படுகின்ற நிலையில், அவற்றின் பிரதானிகள் அரசியல் நியமனங்களாக இருக்கின்ற நிலையில், அந்த அரசியல் நியமனங்களும் அந்தந்தத் துறைகள் சார்ந்த அனுபவங்களுடன்

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

கூடிய ஏனைய தகுதிகளையும் அடிப்படையாகக் கொண்டவைகளாக இருத்தலே அவசிமாகின்றது.

நட்டமேற்படுகின்ற அரச நிறுவனங்களைக் கட்டியெழுப்புவதற்காகவெனக் கூறப்பட்டு, அரச தொழில்முயற்சிகள் அமைச்சு உருவாக்கப்பட்டது. எனினும், அந்த அமைச்சு அரச நிறுவனங்களை விற்கின்ற அமைச்சாகக் காணப்படுகின்றதே அன்றி, அரச நிறுவனங்களைக் கட்டியெழுப்புவதாகத் தெரியவரவில்லை. ஒரு சில அரச மற்றும் தனிப்பட்ட ஆய்வு ரீதியிலான அறிக்கைகளைப் பார்க்கின்றபொழுது, இந்த நாட்டைப் பொறுத்தவரையில் அரசாங்கமானது வர்த்தக முயற்சிகளில் ஈடுபடுவது சாத்தியமானதாக இல்லையென்ற விடயம் வலியுறுத்தப்பட்டு வருவதை நாம் காணக்கூடியதாக இருக்கின்றது. இந்த இடத்தில் அரசியல் தலையீடுகள், அடிப்படை செயற்றிறன் இன்மை, இயலாமை - முயலாமை போன்ற காரணிகளை நாம் முதன்மைப் படுத்த வேண்டியுள்ளது.

எனவே, இந்த நிலையிலிருந்து நாங்கள் மேற்படி அரச நிறுவனங்கள் தொடர்பில் அவதானம் செலுத்த வேண்டுமேயன்றி, அவற்றினை உடனடியாக விற்றுவிட முயற்சிப்பதை மாத்திரமே குறியாகக் கொள்ளல் நல்லதல்ல. ஏனெனில், இங்கு அரச நிறுவனங்களில் வேலைவாய்ப்பு பெற்றிருப்போரது வாழ்வாதாரம் தொடர்பிலும் சிந்திக்க வேண்டியுள்ளது. அதேநேரம், எமது பகுதிகளில் ஏற்கெனவே செயற்பட்டிருந்த அரச நிறுவனங்களையும் தற்போதைய தேவைகளுக்கேற்ப மறுசீரமைக்கப்படவேண்டிய தேவைகளும் இருப்பதோடு, ஏனைய வளங்களைப் பயன்படுத்தியதான புதிய தொழில்முயற்சிகளின் உருவாக்கங்களும் தேவைப்படுகின்றன. அந்த வகையில் மேற்படி அரச நிறுவனங்களை முன்னெடுப்பது தொடர்பில் நீண்ட காலத்திற்குரிய செயற்றிறன் கொண்ட கொள்கை வகுப்புக்கள் அவசியமாகின்றன.

பொதுப் படுகடன் பெறுதலானது கட்டுப்பாட்டுக்குள் கொண்டு வரப்பட வேண்டும் எனும் கொள்கை உறுதியில், இந்த அரசு தொடர்ந்து செயற்படுகின்ற நிலையில், அரச சொத்துக்களை விற்கின்ற ஒரு நிலைக்கும் தள்ளப்படலாம். ஆனால், விற்பனை மூலமாகப் பெறப்படுகின்ற வருமானமானது வரி வருமானத்தினைப் போலன்றி, ஒரு முறை மாத்திரமே கிடைக்கப் பெறக்கூடிய வருமானமாகும் என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். அத்துடன், விற்பனை என வருமிடத்து, நட்டமேற்பட்டுள்ள அரச நிறுவனங்களையன்றி, இலாபம் ஈட்டக்கூடிய அரச நிறுவனங்களுக்கே சந்தையில் கேள்விகள் இருக்கும் என்பதுதான் யதார்த்தமாகும். அந்த வகையில், அரசின் இலாபம் ஈட்டுகின்ற நிறுவனங்களின் பங்குகளை விற்பதன் மூலமாக இதனைச் சாத்தியமாக்கலாமென முயற்சித்தாலும், நாளடைவில் அரசின் பங்குகளின் வீதம் குறைந்து, அரசின் செலவினங்களை ஈடுசெய்து கொள்வதற்குப் பயன்பட்ட சொத்துக்கள் அனைத்தும் இறுதியில் தனியார்வசமாகிவிடும் நிலை ஏற்பட்டு விடும்.

அதேநேரம், பங்குச் சந்தை ஊடான விற்பனையின்போது, பங்குகளின் மதிப்பானது அவற்றின் உண்மையான மதிப்பில் நிர்ணயம் பெறாமல், சந்தை நிலையில் காணப்படுக்கின்ற பல்வேறு சக்திகளின் தாக்கங்களின் அடிப்படையிலேயே அவை நிர்ணயிக்கப்படுகின்ற நிலைமைகளே காணப்படுகின்றன. எனவே, அரச நிறுவனங்கள் - அரச தனியார்மயப்படுத்தலுக்கு உட்படுத்தப்படுமானால், அவற்றின் செயற்றிறனையும் பாதுகாப்பினையும் உறுதி செய்துகொள்ள இயலுமாக இருக்குமென எண்ணுகின்றேன். எனவே, இவ்விடயம் தொடர்பில் சம்பந்தப்பட்டவர்கள் அவதானமெடுக்க வேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

மேலும் அமைச்சுக்கள், மாகாண சபைகள், அரச திணைக்களங்கள், ஆணைக்குழுக்கள், உள்ளூராட்சி மன்றங்கள், மாவட்ட செயலகங்கள் தொடர்பிலான நிதி நிர்வாகம் மற்றும் செயலாற்றுகை தொடர்பிலும் அரசாங்க கணக்குகள் தொடர்பிலான குழுவின் மூன்றாவது அறிக்கை எடுத்துரைக்கின்றது. பொதுவாகவே மேற்படி அனைத்துத் துறைகள் சார்ந்தும் பார்க்கின்றபோது, நிதி விதிகள் மற்றும் செயற்றிறன் விதிகள் பின்பற்றலான விகிதாசார நிலைமைகளை இங்கே காணக்கூடியதாக இருக்கின்றது. உள்ளூராட்சி மன்றங்களுக்கான தேர்தலை இலகுபடுத்தும் வகையில் எனக் கூறப்பட்டு, கொண்டு வரப்பட்ட புதிய தேர்தல் முறைமையின் பிரதிபலன்களை நாம் இப்போது அனுபவித்துக் கொண்டிருப்பதை இங்கே சுட்டிக்காட்ட வேண்டும்.

வேட்பாளர்களுக்கு அதிக செலவுகளை ஏற்படுத்துகின்ற விருப்பு வாக்கு முறைமை ஒழிக்கப்பட்டு, இன்று வேட்பாளர்களுக்குச் செலவினைக் குறைத்து, அரசுக்குப் பாரிய செலவினை ஏற்படுத்தும் வகையில் அதிகரித்த உறுப்பினர்களைக் கொண்டதாகவே இந்த உள்ளூராட்சி மன்றங்கள் உருவாகியிருக்கின்றன. அதேநேரம், பணமுள்ளவர்கள் வட்டாரங்களில் வெற்றி பெறக்கூடிய நிலைமையினையும் இது ஏற்படுத்தியிருக்கின்றது. 60 வீதம் வட்டார முறைமையிலும் 40 வீதம் விகிதாசார முறைமையிலும் எனக் கூறப்பட்டாலும், இன்று நடைமுறையில் 100 வீதம் விகிதாசார முறையிலேயே இந்தத் தேர்தல் முறைமை செயற்படுத்தப்பட்டு வருகின்றதாகவே உணர முடிகின்றது. அந்த வகையில், வட்டாரங்களில் வெற்றி பெற்ற கட்சிகளின் வெற்றியானது முடங்கிப் போய், தோல்விகண்ட கட்சிகளின் பலமான எதிர்க்கட்சிகள் உருவாக்கம் பெற்றுள்ள நிலையில், வெற்றியாளர்களால் மக்களுக்கு ஆற்ற வேண்டிய பொறுப்புகள் தொடர்பிலான தீர்மானங்கள் போதிய பெரும்பான்மை இன்றிய நிலையில் பலம்வாய்ந்த எதிர்க்கட்சிகளின் எதிர்ப்புகளுக்கு முகங்கொடுக்க வேண்டிய சிக்கலான நிலைமைகள் தோற்றுவிக்கப்பட்டுள்ளன.

மாகாண சபைகளைப் பொறுத்தவரையில், நிதி விதிகள் தொடர்பிலான முறைமைகள் பின்பற்றப்படாத நிலை பொதுவாகவே அவதானிப்புப் பெறுகின்ற நிலையில், இது பல்வேறு ஊழல், மோசடிகளுக்கு வழியேற்படுத்தும் நிலையாகவே தென்படுகின்றது. இந்தச் சபையில் நான் ஏற்கனவே பல தடவைகள் சுட்டிக்காட்டியுள்ள வகையில் வடக்கு மாகாண சபையில் எற்கனவே நியமனம் பெற்றிருந்த அமைச்சர்களுக்கு எதிராக ஊழல், மோசடிக் குற்றச்சாட்டுகள் வடக்கு மாகாண சபையின் ஆளுந்தரப்பினராலேயே முன்வைக்கப்பட்டு, அது தொடர்பில் வடக்கு மாகாண முதலமைச்சரால் ஒரு விசாரணைக் குழுவும் நியமிக்கப்பட்டு, விசாரணைகள் மேற்கொள்ளப்பட்டு வருவதாகக் கூறப்பட்டு, அந்த நான்கு அமைச்சர்களும் பதவி நீக்கஞ் செய்யப்பட்டனர்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, இன்னும் ஒரு நிமிடம் இருக்கின்றது.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

ஆனால், அவர்கள் தொடர்பில் வேறு சட்ட நடவடிக்கைகள் எதுவும் இதுவரையில் மேற்கொள்ளப்படவில்லை. அதே நேரம், மேற்படி நான்கு அமைச்சர்களினதும் அமைச்சுக்கள் போக, வடக்கு மாகாண முதலமைச்சரின் கீழிருக்கின்ற அமைச்சுக்கள் தொடர்பிலும் ஊழல், மோசடிக் குற்றச் சாட்டுக்கள் முன்வைக்கப்பட்டன. எனினும், அவை தொடர்பில் எவ்விதமான விசாரணைகளும் மேற்கொள்ளப்படவில்லை. இத்தகைய நிலைமையின் மத்தியில் தற்போது வடக்கு மாகாணத்தில் நியமனம் பெற்றிருக்கின்ற கல்வி அமைச்சர் உள்ளிட்ட அமைச்சர்களுக்கு எதிராகவும் ஊழல், மோசடிக் குற்றச்சாட்டுகள் முன்வைக்கப்பட்டு வருகின்றன.

அதேபோன்று கடந்த காலத்தில் 'நெல்சிப்' உதவித் திட்டத்தில் யாழ். மாவட்ட உள்ளூராட்சி மன்றங்களில் இடம்பெற்றிருந்த மோசடிகள் தொடர்பில் இதுவரையில் உரிய விசாரணைகள் மேற்கொள்ளப்படவில்லை. இது தொடர்பில் வடக்கு மாகாண சபை விசாரணைகளை மேற்கொண்டதாகக் கூறப்பட்டிருந்த நிலையிலும், அது குறித்து எவ்விதமான தகவல்களும் இல்லாத நிலையில், அது குற்றவாளிகளைக் காப்பாற்றுகின்ற ஒரு தந்திரோபாயம் என்றே கருதப்பட வேண்டியுள்ளது. எனவே, எமது மக்களுக்கான நிதி - எமது மக்களின் நிதி - இவ்வாறு முறைகேடுகளுக்கு ஒரு சில நபர்களால் உட்படுத்தப்படுகின்ற நிலையில், அவை தொடர்பில் உரிய சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு, குற்றவாளிகள் இனங்காணப்பட்டு, தண்டிக்கப்பட வேண்டும் என்பதை மீண்டும் வலியுறுத்த விரும்புகின்றேன். நடந்து முடிந்தவை தொடர்பில் முறையான சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்படுவதுடன், அத்தகைய தவறுகள் நடக்காதிருப்பதற்கும் வழிவகைகளை மேற்கொள்ள வேண்டும்.

அத்துடன், செயற்றிறன் என்பது பொதுவாகவே எமது பகுதிகளில் மக்கள் பயன்பெற வேண்டிய அரச நிறுவனங்களில் குறைவாகவே காணப்படுகின்றது. இதற்குப் போதிய ஆளணிகள் இன்றிய குறைபாடுகளும் ஒரு காரணமாக இருக் கின்றது. மேலும், நிரப்பப்பட வேண்டிய ஆளணி வெற்றிடங் களுக்குத் தென் பகுதிகளைச் சார்ந்தவர்கள் நிரப்பப்பட்டு வருகின்ற நிலையில், மொழி மற்றும் சூழல் குறிப்பாக, பிரதேச பரிச்சயமற்ற காரணங்களாலும் அரச நிறுவனங்களின் பயன்பாடுகளைப் பெறுவதில் எமது மக்கள் பாரிய சிரமங் களுக்கு முகங்கொடுத்து வருகின்றனர். எனவே, இத்தகைய பாதகங்கள் இனங்காணப்பட்டு, அவற்றை அகற்றுவதன் ஊடாகவே எமது பகுதிகளில் அரச துறை சார்ந்த நிறுவனங் களால் போதிய பயன்களை எமது மக்களுக்கு வழங்க முடியும்.

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி நிறுவனங்களைப் பொறுத்தவரையில் ஏனைய மாகாண சபைகள் மற்றும் ஏனைய மாகாணங்களின் உள்ளூராட்சி மன்றங்களுடன் எமது பகுதி - குறிப்பாக வடக்கு மாகாணத்தின் மாகாண சபையையோ, அல்லது வடக்கு மாகாணத்தின் உள்ளூராட்சி சபைகளையோ அடைவு மட்டத்தில் ஒப்பிட்டுப் பார்க்க முடியாது. ஏனைய மாகாணங்களைப் பொறுத்தவரையில் மாகாண சபைகளும் உள்ளூராட்சி சபைகளும் மக்கள் நலன்சார்ந்து செயற்பட்டு வருகின்றபோதிலும், எமது பகுதியில் அது தொடர்ந்தும் மக்கள் நலன் சாராத செயற்பாடுகளிலேயே ஈடுபட்டு வருகின்றன. அதாவது, மக்களின் உணர்வுகளை அறிந்து செயற்பட்டு, மக்களின் பிரச்சினைகளைத் தீர்ப்பதற்குப் பதிலாக மக்களை மேலும், மேலும் உணர்வுபூர்வமாகத் தூண்டியும் சீண்டியுமே வருகின்றன. மறுபக்கத்தில் ஏனைய மாகாணங்களுக்கு மத்திய அரசின் நேரடிப் பங்களிப்புகள் கிடைக்கப் பெறுகின்றபோதும், வடக்கில் அந்த நிலை அரிதென்றே கூறவேண்டும். ஒன்று மத்திய அரசின் நேரடிப் பங்களிப்புகள் போதியளவு வருவ தில்லை. வந்தாலும், அங்கு அவற்றை மேற்கொள்ள விடுவ தில்லை என்ற நிலையே காணப்படுகின்றது.

எனவே, மக்களது நலன் சார்ந்த பணிகளை மேற் கொள்வதைப் புறக்கணித்து வருகின்ற விருப்பமின்மை, முயலாமை, இயலாமை கொண்டவர்களிடம் எமது பகுதியின் அரச நிறுவனங்கள் மாட்டிக்கொண்டு, செய்வதறியாத நிலைமை தொடர்கின்றபோது, எமது மக்களே மீள முடியாத வாழ்க்கைச் சுமைகளை அரவணைத்துக் கொண்டு வாழவேண்டிய நிலை ஏற்பட்டுள்ளதால், வடக்கு மாகாண சபையின் உத்தியோகபூர்வ காலம் முடிவடைந்தவுடன், எமது மக்களின் விடிவு கருதி வடக்கு மாகாண சபைக்கான தேர்தலை இந்த அரசு உடன் நடாத்த முன்வரவேண்டுமெனக் கேட்டுக் கொண்டு, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

நன்றி! அடுத்து, கௌரவ பந்துல லால் பண்டாரிகொட அவர்கள்!

[අ.භා.3.44]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් සභාව කල්තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධව කරුණු කීපයක් ඉදිරිපත් කරන්න මටත් අවස්ථාව ලැබීම ගැන සතුටට පත්වන අතර, ඒ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ වන විට මමත් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයකු ලෙස ක්‍රියා කරනවා. නවක මන්ත්‍රීවරයකු හැටියට මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අසුන් ගත්තාම, එහි සභාපති ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමා එම කාරක සභාව මෙහෙයවන ආකාරය පිළිබඳව ඇත්ත වශයෙන්ම මම එක්තරා විධියකින් පුදුමයට පත් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයෙන් පසුගිය කාල පරිච්ඡේදය තුළ අපේ රටේ රජයේ ආයතනවල ගිණුම් පරීක්ෂාවට ලක් වුණා නම්; විමර්ශනයකට ලක් වුණා නම්, අද අපි දකින බොහෝ දුර්වලතා, රාජ්‍ය සේවයේ ඇති බොහෝ දූෂණ, අක්‍රමිකතා අපට අවම කරගන්න නොවෙයි, අද තිබෙන තත්ත්වයෙන් සියයට 90කට වැඩි ප්‍රමාණයක් නැති කරගන්න තිබුණාය කියා මා විශ්වාස කරනවා.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු ලසන්ත අලගියවන්න මැතිතුමාගේ මෙහෙයවීමෙන් නිකුත් කරන ලද පොදු නිරීක්ෂණ, නිගමන සහ නිර්දේශ පිළිබඳව 2017 දෙසැම්බර් 08වන දා ඉදිරිපත් කළ වාර්තාවක් තිබෙනවා. මේ වාර්තාව කියවා බැලුවාම අපට පෙනෙනවා, රජයේ එක් එක් ආයතන පිළිබඳව යම් යම් නිගමන, නිරීක්ෂණ සහ නිර්දේශ එහි ඉදිරිපත් කර තිබෙන බව. ඒ බොහෝ නිරීක්ෂණ සහ නිර්දේශ දෙස බැලුවාම අපට පෙනී ගියා, ඇතැම් ආයතනවල අභ්‍යන්තර විගණනය සඳහා ප්‍රමාණවත් නිලධාරින් පිරිසක් නොමැතිකමින් සමහර විගණනයන් ප්‍රමාදවී ඇති බව. මම ඒ පිළිබඳව උදාහරණයක් කියන්නම්. මේ වන විට තැපැල් දෙපාර්තමේන්තුවේ වැඩ වර්ජනයකුත් තිබෙන නිසා මේ කාරණය ඉස්මතු කරන එක හොඳයි කියා මා කල්පනා කළා.

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 දෙසැම්බර් 08වන දා ඉදිරිපත් කළ වාර්තාවේ 11වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"2013 වසරේ දී අනාවරණය වූ, තැපැල් කාර්යාල 04ක සිදුව තිබූ රුපියල් 8,613,000/-ක වංචාවක් සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන කටයුතු සඳහා වසර 03 සිට වසර 13 දක්වා කාලයක ප්‍රමාදයක් සිදුවී තිබිණි.

තැපැල් කාර්යාල හා ඒ හා සම්බන්ධිත අංශවල සිදුව ඇති දූෂණ, වංචා හා අක්‍රමිකතා සම්බන්ධයෙන් සිදුවන විමර්ශන කාර්යාවලිය ඉතා මන්දගාමී බව අවධාරණය කළ කාරක සභාව, එම විමර්ශන හා පරීක්ෂණ කටයුතු කඩිනම් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. හට උපදෙස් දෙන ලදී. මෙම ප්‍රමාදයන්ට හේතුව විමර්ශන අංශයේ පවතින නිලධාරී හිඟය බවත්, දැනට එම අංශයේ සේවයේ යෙදී සිටිනුයේ නිලධාරීන් 16දෙනෙකු පමණක් බවත් අනාවරණය විය. 2016.12.31 දින වන විට විමර්ශන 2,711ක ප්‍රමාණයක් පවතින බව හෙළිදරව් වූ හෙයින්, ඒවා නිරාකරණය සඳහා රේඛීය අමාත්‍යාංශය මැදිහත්වී කටයුතු කළ යුතු බව කාරක සභාව විසින් අවධාරණය කරන ලදී."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර 3 සිට වසර 13ක් දක්වා කාලයක් මේ ප්‍රමාදය සිදු වෙන්න හේතු වී තිබෙන්නේ අභ්‍යන්තර විගණන නිලධාරින්ගේ හිඟකමයි. මම හිතන හැටියට අද අපේ රටේ සංවර්ධන නිලධාරින් හැටියට බඳවා ගත් උපාධිධාරින් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. මම ඒ අයට අගෞරව කරන්නට නොවෙයි මේවා කියන්නේ. ඒ අය සමහර වෙලාවට පාරට ඇවිල්ලා උද්ඝෝෂණය කරනවා, "අපට duty එකක් දෙන්න. රාජකාරියක් දෙන්න. අපට රාජකාරියක් නැහැ." කියලා. ඇයි, මේ රටේ සිටින බඳවා ගත් උපාධිධාරින්ගෙන් හෝ ඉදිරියේදී බඳවා ගන්නා පිරිසෙන් මේ සඳහා පුහුණු කරලා නිලධාරින් පත් කළ නොහැක්කේ?

මම අවුරුදු 23ක් පළාත් සභාව නියෝජනය කරලායි පාර්ලිමේන්තුවට ආවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පළාත් සභාවල ගිණුම් කාරක සභාවල මීට අවුරුදු 10කට 15කට කලින් ගිණුම් වාර්තා තමයි තවම පරීක්ෂා කරන්නේ. මේවා පරීක්ෂා කරලා යම් යම් නිරීක්ෂණ සහ නිර්දේශවලට යන විට ඒ ආයතනවල සිදු වන්නට ඕනෑ විනාශය, රටට සහ ජනතාවට සිදු විය යුතු අවාසිය සිදු වී හමාරයි. සමහර වෙලාවට මේවාට වග කිව යුතු නිලධාරින් ඒ ස්ථානවල නැහැ. සමහර කාරණා විභාග කරන විට වග කිව යුතු නිලධාරින් විශ්‍රාම ගිහිල්ලා, තවත් සමහර අය විශ්‍රාම ගිහින් මිය ගිහින්. ඒ වාගේම මේවාට වග කිව යුතු සමහර දේශපාලනඥයිනුත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට නිගණ්ඨයන්ගෙන් බණ අහන්නට සිද්ධ වෙලා තිබෙනවා. බුදු රජාණන් වහන්සේගේ කාලයේ ශ්වේතාම්බර සහ දිගම්බර කියලා නිගණ්ඨ නාථ පුත්‍රයන්ගේ ගෝලයෝ වර්ග දෙකක් හිටියා. කට්ටියක් සුදු රෙදි කඩක් පමණක් ඇඳගෙන හිටියා. ඒ අයට කිව්වා ශ්වේතාම්බර කියලා. තව කට්ටියක් නිර්වස්ත්‍රව, -ඇඟේ නූල් පොටක්වත් නැතිව- හිටියා. ඒ අයට කිව්වා දිගම්බර කියලා. ඒකාබද්ධ කල්ලියේ කට්ටියත් ඔය වාගේ කණ්ඩායම් දෙකකයි ඉන්නේ. එක කට්ටියක් ශ්වේතාම්බර, අනෙක් කට්ටිය දිගම්බර. ඒ අයගේ දූෂණ, වංචා, හොරකම් විභාගයට නොගැනීමේ, පරීක්ෂණයට භාජනය නොකිරීමේ, මේවාට නිසි දඬුවම් නොදීමේ හේතුව නිසායි අද අපට දිගම්බරයන්ගෙන් බණ අහන්නට වෙලා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වගකීම මමත් නියෝජනය කරන රජය සහමුලින්ම භාර ගන්නවා. ඒක තමයි වුණු බරපතළ ප්‍රශ්නය වන්නේ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව අද ක්‍රියාත්මක වන විධියට මීට පෙර ක්‍රියාත්මක වෙලා මේ නිරීක්ෂණ සහ නිර්දේශවලට යම්කිසි ක්‍රියාමාර්ගයක් ගත්තා නම්, අපේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා යෝජනා කරන්නා වාගේ අදාළ ආයතනවලින් මේවාට අවශ්‍ය කරන යම් පරීක්ෂණ සිදු කරලා දඬුවම් දිය යුතු අයට දඬුවම් දුන්නා නම් අද අපට සිද්ධ වෙලා තිබෙනවා වාගේ දිගම්බරයන්ගෙන් -නිර්වස්ත්‍රව ඉන්න අයගෙන්- බණ අහන්නට වුවමනාත් නැහැ. ඒ විතරක් නොවෙයි. මේ රටේ එදා හිටපු දේශපාලනඥයන්ටත්, නිලධාරින්ටත්, අද පත් වුණු අයටත්, අනාගතයේ පත් වන අයටත් ඒක හොඳ පූර්වාදර්ශයක් බවට පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්රීතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ, නිරීක්ෂණ ක්‍රියාත්මක කළ යුතු යැයි හැඟවෙන කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් වන වෙලාවේ මම යෝජනාවක් විධියට අදහසක් ඉදිරිපත් කරන්නට කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්රීතුමනි, මේ රටේ දේශපාලනඥයින්, මහජන නියෝජිතයින් පුහුණු කිරීමේ කුමන හෝ ආයතනයක් ආරම්භ කරන්නට අවශ්‍යයි. එවැනි යම් යම් ආයතන තිබෙනවා, ශ්‍රී ලංකා පදනම් ආයතනය වැනි ඒවා. නමුත්, ඒවා ප්රමාණවත් නැහැ. ප්‍රාදේශීය මට්ටමේ ඉඳලා එන දේපාලනඥයින්ට විද්‍යාත්මකව දැනුමක්, අවබෝධයක් දෙන්නට පුළුවන් නිසි ආයතනයක් අපේ රටේ නැහැ. මේ රටේ මහජන මුදල් හුඟාක් විනාශ වෙන්නට ඒක ප්රධාන හේතුවක් වෙනවා. සමහර අය ප්‍රාදේශීය සභාවලට පත් වෙනවා. ඒ අය මහජන නියෝජිතයෝ. හැබැයි, ප්රාදේශීය සභාවේ සභාපතිවරයාට ප්රාදේශීය සභා පනත අනුව විශාල බලයක් තිබෙනවා. අලුතෙන් පිහිටුවූ ප්රාදේශීය සභා පත් වෙන්නට කලින් මීට පෙර තිබුණු ප්‍රාදේශීය සභා සභාපතිවරයා තමයි චෙක් පත්වලට අත්සන් කළේ. දකුණු පළාතේ ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකුට එක අවස්ථාවක විමර්ශනයක් ආවා, ඔහුගේ නමටම චෙක් පතක් ලියාගෙන ලාච්චුවේ දාගෙන ඉඳලා. හරි දැනුමක් තිබුණා නම්, හරි අවබෝධයක් තිබුණා නම් මේ වාගේ දේවල් කරන්නේ නැහැනේ. මහජනයා ඡන්දය දීලා පත් වෙලා එන බව හැබැව. මේ රටේ මේ සා විශාල මුදල් කන්දරාවක් කාබාසිනියා වුණු එකේ තීන්දු - තීරණ ගන්නා මහජන නියෝජිතයෝ පුහුණු කරන්නට යම්කිසි පිරිවැයක් දැරුවාට පාඩුවක් නැහැ. අඩුම තරමින් ඒ අයට මේක පාඨමාලාවක් හැටියට ලබා දුන්නත් ඇති වරදක් නැහැ. ප්‍රාදේශීය සභාවලින් පටන් අරගෙන, පළාත් සභා, පාර්ලිමේන්තුව දක්වා වන සියලුම මන්ත්‍රීවරුන්ට යම්කිසි අවබෝධයක් දෙන්නට ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගෙන් තවත් තත්පර කිහිපයක් ඉල්ලනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

පළාත් සභාවේ ඉඳලා යම් යම් කාරණා දන්න කෙනෙකු හැටියට මට කියන්න ගොඩක් කාරණා තිබෙනවා. කාලය කෙටි නිසා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් එළියට එන සමහර කාරණා ගැන මට දැන් ප්‍රකාශ කරන්න අපහසුයි. දැන් බලන්න,

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව ගැන. අපි දන්නවා, 2012 වසරේ එහි සොරකමක් සිදු වුණු බව. සොරකම සිදු වුණාම ජාතික කෞතුකාගාරය භාණ්ඩවල ආරක්ෂාව සම්බන්ධයෙන් යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. හැබැයි, මොකක්ද වුණේ? අපේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශවල තිබෙනවා, "හොරකමෙන් වසර පහක් ගත වෙලා තිබුණත් නිසි පරිදි ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීමට මේ දක්වා කටයුතු කර නොමැත." කියලා. මේ කොතැනද? ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කියලා කියන්නේ අපි කවුරුත් හදවත වාගේ ආරක්ෂා කළ යුතු තැනක්, අපේ ඉතිහාසය පිළිබඳව සඳහන් තැනක්, අපේ මතු පරම්පරාවට අපේ ඉතිහාසය පිළිබඳව යම් පාඩමක් කියලා දෙන්න පුළුවන් තැනක්. අපි දන්නවා, 2012 වසරේ මෙතැන හොරකමක් වුණු බව. දැන් තත්ත්වය මම දන්නේ නැහැ. මේක, 2017 දෙසැම්බර් වාර්තාව. CCTV camera ටික සවි කර ගන්න අවුරුදු පහක් ගිහිල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නිසා මේ යෝජනාව වැදගත් කියලා මම කල්පනා කරනවා. මොකක් නිසාද? රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ඉදිරිපත් කරන නිරීක්ෂණ, නිර්දේශ ක්‍රියාත්මක කරන්න යාන්ත්‍රණයකුත් තිබිය යුතුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
ඒ සඳහා වහාම කටයුතු කළ යුතුයි කියලා මමත් මේ අදහසට එකඟ වෙනවා. මම මීට වඩා කාලය ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව අද යන මේ ගමන ඉස්සරහට ගිහිල්ලා මේ රටේ ජනතාවගේ මහජන මුදල්-දේපළ ආරක්ෂා කිරීම සඳහා හොඳ පවුරක් හැටියට ක්‍රියා කිරීමට ශක්තිය ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. Next, the Hon. Gnanamuthu Srineshan.

[பி.ப. 3.55]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இங்கு அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை தொடர்பான விவாதம் நடைபெற்றுக் கொண்டிருக்கின்றது. அரச நிறுவனங்களின் கணக்குகளை மேற்பார்வை செய்தல் தொடர்பான அறிக்கையில் பிரதான நிறுவனங்களும் துணை நிறுவனங்களும் இடம்பெற்றிருக்கின்றன. அமைச்சுக்கள், திணைக்களங்கள், மாவட்டச் செயலகங்கள், உள்ளூராட்சி நிறுவனங்களென்று மொத்தமாக 519 பிரதான நிறுவனங்கள் தொடர்பாகவும், மாகாண சபைகள், பிரதேசச் செயலகங்கள் மற்றும் அமைப்புக்களென்று 842 துணை நிறுவனங்கள் தொடர்பாகவும் குறித்த அறிக்கையில் குறிப்பிடப்பட்டிருக் கின்றது. அந்த வகையில், அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் விடயப் பரப்புக்குட்பட்டிருக்கின்ற நிறுவனங்களின் கணக்குகள் ஆய்வு செய்யப்பட்டு அறிக்கைப் படுத்தப்பட்டிருக்கின்றமை பற்றிய ஒரு முக்கியமான விடயம் இன்றைய விவாதத்தின் கருப்பொருளாக இருக்கின்றது.

காலைவேளைப் பத்திரிகைக் கண்ணோட்டத்தின்போது நான் ஒரு செய்தியைப் பார்த்தேன். அதாவது அரச நிதியில் நாற்பது சதவீதமானவை வீண் விரயம் செய்யப்படுகின்ற தென்ற ஒரு கருத்து அங்கே கூறப்பட்டிருந்தது. அப்படி யென்றால் அறுபது சதவீதமான நிதிதான் செலவு செய்யப்படுகின்றதென்று எங்களால் மறுதலையாக ஊகித்துக் கொள்ள முடியும். ஒரு ஜனநாயக நாட்டில் மக்களுக்காகப் பணியாற்றக்கூடிய திணைக்களங்களாக இருக்கலாம்; அமைச்சுக்களாக இருக்கலாம்; மாவட்டச் செயலகங்களாக இருக்கலாம்; பிரதேச செயலகங்களாக இருக்கலாம்; உள்ளூராட்சி நிறுவனங்களாக இருக்கலாம், இவை மக்களுக்காகச் சேவையாற்றுவதற்காக, நிதியினைக் கையாளுகின்ற அதிகாரங்களும் அவற்றுக்கு வழங்கப் பட்டிருக்கின்றன. இந்த நிலையில் நாற்பது சதவீதமான நிதி வீண் விரயம் செய்யப்படுகின்றது என்றால், இதை ஐம்பதுக்கு ஐம்பது என்று மட்டந்தட்டிப் பார்க்கின்றபோது மக்களுக்காகச் செலவுசெய்யவேண்டிய நிதியின் ஐம்பது சதவீதமான நிதி வீண் விரயம் செய்யப்படுகின்றதென்று குறிப்பிட முடியும். அழுத்தமாகச் சொல்வதாக இருந்தால் நாற்பது சதவீதமான நிதி வீண் விரயம் செய்யப்படுகின்றது.

இன்று சட்டபூர்வமான செயற்பாடுகளுக்கப்பால் சாதாரண நிகழ்வுகளாகப் பல விடயங்கள் நடைபெற்றுக் கொண்டிருக் கின்றன. அந்த வகையில் பொருட்களைக் கொள்வனவு செய்கின்றபோது தரகுப் பணம் பெற்றுக்கொள்ளல் என்ற விடயமானது சாதாரணதொரு கைங்கரியமாகக் கருதப் படுகின்றது. பொதுவாக சந்தையில் குறைந்த விலையில் கேள்வி மனுக்களைக் கோரி, குறைந்த விலையில் தரமான பொருட்களைக் கொள்வனவு செய்ய முடியுமென்கின்ற ஒரு நிலைப்பாடு காணப்பட்டாலும், அநேகமாக தரமற்ற பொருட்கள் கொள்வனவு செய்யப்படுவதும் உயர்ந்த விலையில் அதற்குரிய பற்றுச்சீட்டுக்கள் பெறப்படுவதுமான நிலைமையில், மொத்தத்தில் எங்களுடைய மக்களுக்காகச் செலவு செய்யப்படுகின்ற பணம் வீண் விரயம் செய்யப்படுகின்றது.

அரச நிறுவனங்களில் நேர்மையாகப் பணியாற்றுகின்ற அதிகாரிகள் மற்றும் அலுவலர்களை நாங்கள் என்றும் பாராட்டுகின்றோம். மனச்சாட்சிப்படியும், கடவுளுக்குப் பயந்தும் பணியாற்றுகின்ற அதிகாரிகள் மற்றும் அலுவலர்களை ஒருபோதும் குறைகூறுவதற்கில்லை. ஆனால், எமது நாட்டில் நிதி மோசடிகள், ஊழல்கள் அல்லது ஒழுங்கீனங்கள் அல்லது வீண் விரயங்கள் வாழையடி வாழையாக, சர்வசாதாரணமாக நிகழ்ந்து கொண்டிருக்கின்ற படியால் எமது நாடு அபிவிருத்தியடைந்து வருகின்ற நாடுகள் பட்டியலிலிருந்து விடுபட்டு அபிவிருத்தியடைந்த நாடுகள் பட்டியலுக்குள் முன்னேறிச் செல்ல முடியாத ஒரு துர்ப்பாக்கிய நிலைமையே காணப்படுகின்றது. அரச நிறுவனங்கள் நிதியினைச் சரியான முறையில் கையாண்டு அந்த நிதியினை மக்களின் வாழ்வாதாரத்துக்காக, அபிவிருத்திக்காகச் செலவு செய்ய வேண்டும். அதாவது, அந்த நிதி நூற்றுக்கு நூறு சதவீதம் முறையாகச் செலவு செய்யப்படுமாக இருந்தால் எமது நாட்டில் வறுமை ஏற்படுகின்ற நிலைமையோ அல்லது எமது நாடு அபிவிருத்தி அடைந்து வருகின்ற நாடுகள் என்ற பட்டியலுக்குள் தொடர்ந்து இடம்பெற்றுக் கொண்டிருக்கின்ற துர்ப்பாக்கியமான நிலைமையோ ஏற்படக்கூடிய வாய்ப்பு இல்லை. ஆனால், இன்று பொதுவாக அமைச்சு மட்டத்தில் இடம்பெறக்கூடிய வீண் விரயங்கள் அல்லது நிதித்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

துஷ்பிரயோகங்கள் உயர்ந்த மட்டத்தில் இருப்பதையும், மாவட்டச் செயலகங்கள், பிரதேசச் செலயகங்கள், உள்ளூராட்சி நிறுவனங்கள் என்று இறங்கு வரிசைப் படுத்திக்கொண்டு செல்கின்றபோது அவை அதற்கு அடுத்த கட்டத்தில் இருப்பதையும் காணக்கூடியதாக இருக்கின்றது. அந்த வகையில் இன்று "விரலுக்குத் தக்க வீக்கம்" என்று கூறுவதுபோன்று அந்தந்த நிறுவனங்களின் அதிகார வீச்சுக்களுக்கு - எல்லைகளுக்கு ஏற்ற விதத்தில் நிதி மோசடி அல்லது துஷ்பிரயோகம் அல்லது வீண் விரயம் அதிகரித்துக்கொண்டு செல்கின்றது.

மட்டக்களப்பு மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில், எனது மாவட்டத்தில் ஊழல், மோசடி, இலஞ்சம் முதலிய விடயங்கள் இடம்பெறக்கூடாது என்ற விடயத்தில் முன்மாதிரியாக நடந்து கொள்ள வேண்டுமென்ற அடிப்படையில் நான் மிகவும் கவனமாகச் செயற்பட்டு வருகின்றேன். கடந்த காலத்தில் எமது மாவட்டச் செயலகத்தில் சில தில்லுமுல்லுகள் இடம்பெற்றமை பற்றி எங்களால் அறியக்கூடியதாக இருந்தது. அதன் காரணமாக, அங்கிருக்கின்ற சில அதிகாரிகளை இடமாற்றம் செய்து, நேர்மையாக, உண்மையாகப் பணியாற்றக்கூடிய அதிகாரிகளை நியமிக்க வேண்டும் என்ற ஒரு கோரிக்கையை விடுத்திருந்தோம். பலத்த போராட்டத்தின் மத்தியில் அந்தக் கோரிக்கை நிறைவேற்றப்பட்டிருக்கின்றது.

மட்டக்களப்பிலுள்ள பிரதான பாலம் கல்லடிப் பாலமாகும். அதற்கு அண்மித்ததாகச் சிறுவர் பூங்காவொன்று அமைக்கப்பட்டிருக்கின்றது. அதற்குப் பக்கத்தில் மீனுருவச் சிற்பங்கள் அமைக்கப்பட்டிருக்கின்றன. சாதாரணமாக அதற்கு எவ்வளவு செலவு செய்யப்பட்டிருக்குமென அறிவதற்காக ஒரு மதிப்பீட்டினைச் செய்யுமாறு பொறியியலாளர் ஒருவரிடம் கேட்டிருந்தேன். அவரது கணிப்பின்படி அதற்குரிய செலவு 1 - 1.5 மில்லியனுக்கு உட்பட்டதாக இருக்கும் என்று குறிப்பிட்டார். ஆனால், அதற்கு 9.3 மில்லியன் - 93 இலட்சங்கள் செலவு ஏற்பட்டிருக்கின்றது. ஆகவே, அந்த மீனுருவச் சிற்பத்தினை வடித்தெடுக்கச் சாதாரண மதிப்பீட்டை விட 6 மடங்கு செலவு செய்யப்பட்டிருப்பதை அறியக் கூடியதாக இருந்தது. இவ்வாறு நிதி மோசடி செய்கின்றவர்கள், நிதித் துஷ்பிரயோகம் செய்கின்றவர்கள், பொதுமக்களுக்காகச் செலவு செய்ய வேண்டிய நிதியைத் தங்கள் சட்டைப் பைக்குள் போட்டுக்கொண்டு செல்கின்றவர்கள் இருக்கின்றார்கள். இப்படிப்பட்டவர்களில் சிலர் சில தந்திரோபாயங்களைக் கடைப்பிடிக்கிறார்கள். அதாவது, அநேகமாக அமைச்சர்கள் மற்றும் அதிகாரிகளோடு நல்லுறவைப் பேணுகின்றார்கள், அல்லது அவர்களின் மனம் குளிரக்கூடிய விதத்தில் மாலைகள் அணிவிக்கின்றமை போன்ற சில வரவேற்புச் செயற்பாடுகளில் ஈடுபடுகின்றார்கள். இவ்வாறு செய்து கொண்டுதான் இவர்கள் தங்களது தில்லுமுல்லுகளையும் மோசடித்தனமான செயல்களையும் மிகவும் சாதுரியமான முறையில் செய்து கொண்டிருக்கின்றார்கள். இப்படிப்பட்ட ஊழல்தாரிகள் யார்?

ஊழல், மோசடிகள் விடயத்தில் ஒரு வலைப்பின்னல் காணப்படுகின்றது. அந்த வலைப்பின்னலில், அரசியல் வாதிகளும் இருக்கின்றார்கள், நிர்வாகிகளும் இருக்கின் றார்கள். அவ்வாறே இப்படிப்பட்டவர்களைக் காப்பாற்றக் கூடிய ஊடகவியலாளர்களும் இருக்கிறார்கள். நான் எல்லா ஊடகவியலாளர்களையும் சொல்லவில்லை. நேர்மையாகவும் நடுநிலையாகவும் செயற்படக்கூடிய ஊடகவியலாளர்கள் இருக்கின்ற அதேவேளை, இந்தத் தவறானவர்களின், தில்லுமுல்லு செய்கின்றவர்களின் புகழ்பாடிக்கொண்டு, அவர்களுக்குச் சான்றிதழ் கொடுத்துக் கொண்டு அவர்களைப் பாதுகாக்கின்ற விதத்தில் செயற்படுகின்றவர்களும் இருக்கின் றார்கள். நமது நாடு ஒரு ஜனநாயக நாடு என்ற வகையில் ஊடகச் சுதந்திரம் இருக்க வேண்டும். ஊடகங்கள் பிழையானவர்களைச் சுட்டிக்காட்ட வேண்டும், மோசடிக்காரர் களைச் சுட்டிக்காட்ட வேண்டும், ஊழல்தாரிகளைச் சுட்டிக்காட்ட வேண்டும், மக்களை ஏமாற்றுகின்றவர்களைச் சுட்டிக்காட்ட வேண்டும். மாறாக, அவை அவ்வாறான செயற்பாடுகளில் ஈடுபடுகின்றவர்களுக்குப் பக்கபலமாக இருக்கின்றபோது ஊழல்தாரிகள் அல்லது நிதி மோசடி செய்கின்றவர்கள் மேலும் மேலும் வளர்ந்துகொண்டு வருவதற்குத்தான் வாய்ப்பிருக்கின்றது.

நாங்கள் நல்லாட்சி அரசினை ஏற்படுத்துவதில் பங்குதாரி களாக இருந்திருக்கின்றோம். ஆனால் இந்த நல்லாட்சியிலும் கூட அரச திணைக்களங்கள் அல்லது அமைச்சுகள் மற்றும் நிறுவனங்களில் இப்படியான தில்லுமுல்லுகள் நடைபெறுகின்றபோது அவற்றை எங்களால் ஜீரணிக்க முடியாதுள்ளது. அந்த அடிப்படையில், உண்மையில் இந்த அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கையில் நிதி விடயத்தில் வெளிப்படைத் தன்மை என்பது மிக முக்கியமான ஒன்றாகும். பொறுப்புக் கூறுதல், வெளிப்படைத் தன்மை என்பன ஜனநாயகத்தின் பக்க வேர்களாக இருக்கவேண்டும். அந்த அடிப்படையில் இந்த நிதி விடயத்தில் சரியான வெளிப்படைத் தன்மை காட்டப்பட வேண்டும். அதாவது, மக்களிடமிருந்து வரிப்பணங்கள் அறவிடப்படுகின்றன. இந்த அறவிடப்படுகின்ற வரிப்பணங்களுக்குப் பதிலாக அரசு மக்களுக்குச் சேவை செய்ய வேண்டும் என்று மக்கள் எதிர்பார்த்துக் கொண்டிருக்கின்றார்கள். மக்கள் இவ்வாறு எதிர்பார்த்துக் கொண்டிருக்கின்றபோது, மக்களுக்குச் சேரவேண்டிய அந்த நிதி, ஒரு கட்டுமானம் மூலமாகவோ, வீதிகளை அமைப்பதன் மூலமாகவோ அல்லது வடிகால்களைத் திருத்துவதன் மூலமாகவோ நூற்றுக்கு நூறு வீதம் செலவு செய்யப்படுமாக இருந்தால், உண்மையில் மக்களை அபிவிருத்தி என்கின்ற விடயத்தில் தங்குதடை யில்லாமல் முன்னோக்கிக் கொண்டு செல்வதற்குரிய வாய்ப்பிருக்கின்றது.

1948ஆம் ஆண்டில் நாங்கள் சுதந்திரம் பெற்றோம்; இப்போது 70 ஆண்டுகளைக் கடந்திருக்கின்றோம். இந்த வேளையில் எங்களுடைய உற்பத்தித் திறனைப்பற்றி நாங்கள் ஒரு தடவை அவதானிக்க வேண்டும். அதாவது, வெளியீடு களை உள்ளீடுகளால் பிரித்துப் பார்ப்பதன் மூலமாக இந்த உற்பத்தித் திறனைக் கணக்கிட முடியும். ஜப்பானின் உற்பத்தித் திறனைப் பார்க்கின்றபோது அது 60 ஆக இருக்கின்றது. ஆனால், இலங்கையைப் பொறுத்தமட்டில் உற்பத்தித் திறன் வீதம் 1.6 ஆகத்தான் காணப்படுகின்றது. அப்படியென்றால், ஜப்பானோடு ஒப்பிட்டுப் பார்க்கின்ற போது, எங்களுடைய உற்பத்தித் திறனின் அளவு மிக மிகக் குறைவான மட்டத்தில் காணப்படுகின்றது. உள்ளீடுகளுக்கு அதிக செலவு செய்து பெறப்படுகின்ற வெளியீடுகளினால் எங்களது உற்பத்தித் திறன் என்பது 1.6 ஆக இருக்க, இந்தியாவில் அது 14 ஆக இருக்க, ஜப்பானில் அது 60 ஆக இருக்கின்றது. எனவே, எங்களுடைய நிலைப்பாடு மிக மோசமான நிலையிலிருக்கின்றது. இந்தப் புள்ளிவிபரம் ஐந்து வருடங்களுக்கு முற்பட்டதாக இருக்கும் என நான் நினைக்கின்றேன். அண்மைய புள்ளிவிபரத்தைப் பார்க்க முடியவில்லை. அதனால் எமது உற்பத்தித்திறன் தற்போது அதிலிருந்து வளர்ந்திருக்கின்றதோ அல்லது அதே நிலையிலிருக்கின்றதோ என்பது எனக்குத் தெரியவில்லை;

அதனை இற்றைப்படுத்திக் கொள்ள முடியவில்லை. எனவே, இந்த அரசாங்கக் கணக்குகள் பற்றிய குழு மிகவும் வினைத் திறனாகச் செயற்பட வேண்டும். இது வினைத்திறனாகச் செயற்படுவதன் மூலமாக, சரியான முறையில் அந்தக் கணக்குகளைப் பரிசீலனை செய்வதற்கும் மதிப்பீடுகள் செய்வதற்கும் அறிக்கையிடுவதற்கும் உரிய நடவடிக்கை களைச் செய்வதன் மூலமாக முக்கியமாக இந்த ஊழல், மோசடிகளில் ஈடுபடுகின்றவர்கள், நிதியினைப் பிழையான முறையில் கையாள்கின்றவர்கள் போன்றவர்களுக்கு எதிராகக் கடுமையான நடவடிக்கைகளை எடுக்கவேண்டும். பொது நிதியினை மோசடிக்கு உட்படுத்துவதோ அல்லது தங்களு டைய இஷ்டப்படி பயன்படுத்துவதோ மிகப் பாரதூரமான ஒரு குற்றச் செயலாகும். எனவே, கடந்த காலமாக இருக்கலாம், தற்காலமாக இருக்கலாம், எக்காலமாக இருந்தாலும் யார் இந்த அரச நிதியினை, மக்களுக்குச் சேரவேண்டிய நிதியினை ஒரு மோசடித் தன்மையான முறையிலே கையாண்டார்களோ அல்லது கையாள்கின்றார்களோ, அவர்களுக்கெதிராகச் சரியான நடவடிக்கைகளை எடுக்கவேண்டும். அதற்கு இந்த அரசாங்கக் கணக்குகள் பற்றிய குறித்த பாராளுமன்றக் குழு மிகவும் பக்கபலமாக இருந்து செயற்பட வேண்டும் என்பது எங்களுடைய வேண்டுகோளாக அமைகின்றது.

குறிப்பாக, நாங்கள் அரச நிதி தொடர்பில் பார்க்கின்ற போது மேற்பார்வை, கணக்காய்வு, மதிப்பீடு, அவற்றை முறையாக அறிக்கையிடல் என்பன முக்கியமாக இருக்கின்ற அதேவேளையில், இந்த அறிக்கைகள் இடப்பட்டதன் பின்னர் யார் பக்கமாக விரல் நீட்டப்படுகின்றதோ, அவர்களுக் கெதிராக ஒரு சரியான, நியாயமான நடவடிக்கை எடுக்க வேண்டும். சிலவேளைகளில் ஆயிரம் ஆய்வுகள் செய்யப் பட்டாலும் அல்லது அறிக்கையிடப்பட்டாலும், அறிக்கையிடப் பட்டதன் பின்னர் அதனை அமுல்படுத்தல் அல்லது நடவடிக்கை எடுத்தல் என்பது மிக முக்கியமாக இருக்கின்றது என்று சொல்வார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, இன்னும் ஒரு நிமிடம் இருக்கின்றது.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

எனவே, இவ்வாறான செயற்பாடுகளைச் சரியாகச் செய்கின்றபோது, உண்மையில் எமது நாட்டில் ஒரு நல்லாட்சி நடைபெறுகின்றது, நல்ல நிர்வாகம் நடைபெறுகின்றது அல்லது நல்ல விதத்தில் மக்கள் பரிகரிக்கப்படுகின்றார்கள் என்ற உண்மையை நாங்கள் விளங்கிக் கொள்ளக்கூடியதாக இருக்கும்.

குறிப்பாக, இன்னுமொரு விடயத்தை நான் சொல்லியாக வேண்டும். அதாவது, எங்களுடைய நாட்டில் அன்றிலிருந்து இன்றுவரை மக்கள் எதிர்பார்க்கின்ற விடயங்கள், வறுமை யைத் தணிக்கவேண்டும், வாழ்வாதாரத்தைக் கட்டியெழுப்ப வேண்டும், அபிவிருத்தியைக் காணவேண்டும், ஒட்டு மொத்தத்தில் எமது நாடு ஓர் அபிவிருத்தியடைந்த நாடாகத் தலைநிமிர்ந்து நிற்கவேண்டும் என்பதாகும். ஆனால், அந்த எதிர்பார்ப்புக்களை சுதந்திரம் பெற்று 70 ஆண்டுகள் கழிந்தபோதும் எங்களால் அடையமுடியாமல் இருக்கின்றது. இதற்குக் குறுகிய அரசியல் இலாபம் தேடுகின்ற செயற் பாடுகள் அல்லது நிதியினைக் கையாள்கின்ற விடயத்தில் காணப்படுகின்ற மறைகணியமான செயற்பாடுகள் என்பன காரணமாக அமைகின்றன. எனவேதான் இந்த அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவானது விரல் நீட்டிக் காட்டுகின்ற அல்லது தொட்டுக் காட்டுகின்ற இந்த மோசடித்தனமான செயற்பாடுகள் இடம்பெறுகின்ற திணைக்களங்கள், அமைச் சுக்கள், உள்ளூராட்சி அதிகாரசபைகள், பிரதேச செயலகங்கள் எவையாக இருந்தாலும் அவற்றின்மீது உரிய நடவடிக்கை எடுத்து, இந்த மறைகணியமான செயற்பாடுகளைக் கட்டுப் படுத்த வேண்டுமென்று கூறி, எனது உரையினை நிறைவு செய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

நன்றி. The next speaker is the Hon. Eran Wickramaratne. You have ten minutes.

[අ.භා.4.10]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තැබීමේ යෝජනාව යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තා පහක් පිළිබඳව වාද විවාද කරන අවස්ථාව. මේ පාර්ලිමේන්තුවේ පැරණිම කාරක සභාව තමයි රාජ්‍ය ගිණුම් කාරක සභාව. මම හිතන විධියට රාජ්‍ය ගිණුම් කාරක සභාව ආරම්භ කරලා දැනට අවුරුදු 95ක් පමණ වෙනවා. නමුත් මේ අටවැනි පාර්ලිමේන්තුව තුළ තමයි, කෙටි කාලයක් තුළදී රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තාවන් හතරකුත්, අතුරු වාර්තාවකුත් ඉදිරිපත් කරන්න පුළුවන්වෙලා තිබෙන්නේ. මේ අවස්ථාවේ මා පළමුවෙන්ම අපේ රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සභාපති ගරු ලසන්ත අලගියවන්න ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මම හිතන විධියට එතුමාගේ මහ පෙන්වීම හේතුවෙන් පමණයි අපට මෙවැනි වාර්තා ගණනාවක් ශීඝ්‍රයෙන් ඉදිරිපත් කරන්න පුළුවන්වෙලා තිබෙන්නේ. එතුමාට සහාය දුන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට, නියෝජ්‍ය මහලේකම්තුමාට සහ සහකාර මහ ලේකම්වරුන්ට වාගේම රාජ්‍ය ගිණුම් කාරක සභා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයටත් අපේ ස්තුතිය ප්‍රකාශ කරනවා. එතුමන්ලාගේත්, විගණකාධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය සහ මහා භාණ්ඩාගාරයේ නිලධාරින්ගේත් සහාය නිසා තමයි අපට මේ දේ කරන්න පුළුවන්වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ හැන්සාඩ් සංස්කාරකවරිය වන අපේ රංජනී ජයමාන්න මෙනවිය අවුරුදු 35ක සේවයකින් පසුව අද දින විශ්‍රාම ලබනවා. ඇය ගැන සඳහනක් කරන්න අද මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

හුඟාක් වෙලාවට පාර්ලිමේන්තුවේ පෙනෙන්නේ අප වැනි මැති ඇමතිවරුන්. මොකද, වාද විවාද කරන නිසා. නමුත් අපේ කාර්ය භාරය හරිහැටි කරන්න අප පිටුපස සිට නිහඬව සේවය කරන විශාල සේවක පිරිසක් සිටිනවා. රංජනී ජයමාන්න මෙනවිය විශ්‍රාම ලබා ඉදිරි කටයුතු සාර්ථකව කර ගෙන යාම සඳහා අපි ඇයට ශාරීරික, මානසික, අධ්‍යාත්මික සුවය පතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තාවන් අතරින් මම අතිරේක වාර්තාව ගැන පමණක් වචනයක් කියන්න කැමැතියි. අපේ රටේ රාජ්‍ය ආදායමෙන් සියයට 85ක්ම

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ලැබෙන්නේ රේගුව හරහා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හරහා සහ සුරාබදු දෙපාර්තමේන්තුව හරහායි. ඒ නිසා රජයේ මුළු ආදායමෙන් සියයට 85කට වැඩි ප්‍රමාණයක් ලැබෙන මේ ආයතන තුන තොරතුරු තාක්ෂණය භාවිතය තුළින් කාර්යක්ෂම කරන්නේ; ඵලදායී කරන්නේ; දූෂණය අවම කරන්නේ කොහොමද කියන අරමුණින් තමයි මේ දෙපාර්තමේන්තු තුනට සම්බන්ධ ආයතනත් ගෙන්වලා රාජ්‍ය ගිණුම් කාරක සභාව විමර්ශනය කළේ. මෙහි නිර්දේශ කිහිපයක්ම තිබෙනවා. සමහර නිර්දේශ ක්‍රියාත්මකවෙලා තිබෙනවා. ඒ ගැන අපි අපේ සතුට ප්‍රකාශ කරන්න ඕනෑ. විශේෂයෙන්ම රේගුව විසින් ක්‍රියාත්මක කරන යම් කරුණු පද්ධති සැලකිල්ලට ගෙන තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේත් සිදු කරන යම් කිසි ක්‍රියාවලින් තිබෙනවා. ඒවා ගැන මතක් කරන අතර මම මේ ගරු සභාවට විශේෂයෙන්ම කිව යුත්තේ අඩු පාඩුව ගැනයි. අඩු පාඩුව මම කියන්නම්. මේ සියලුම ආයතන තොරතුරු සන්නිවේදන තාක්ෂණය මඟින් සම්බන්ධ කරලා, ඒ එක් එක් මෘදුකාංග භාවිතා වෙනවා. නමුත් ඒවා හරහා - RAMIS එක හරහා- ඒ සියල්ලක්ම එකමුතු කරන්න, එකතු කරන්න හැකි ක්‍රමවේදයකට යා යුතුයි. ඒක තවම අපි හිතපු විධියට සිදුවෙලා නැහැ.

මේ වාර්තාවේ සඳහන් වෙනවා, වසරක් තුළදී -2017 ඔක්තෝබර් මාසයේ 1වැනි දා වෙන කොට- නැවතත් ගිණුම් කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුයි කියලා. ඒ ප්‍රගතිය පිළිබඳව වාර්තාව ඉදිරිපත් වෙලා නැහැ. ඒ වාර්තාව වහාම ඉදිරිපත් කරන්න අවශ්‍යයි කියලා මම මේ අවස්ථාවේදී මතක් කරනවා. අපි දන්නවා, තොරතුරු තාක්ෂණය පාවිච්චි කළොත්, අපට ආදායම වැඩි කර ගන්න; දූෂණය අවම කරන්න පුළුවන් කියලා. ඒ තුළින් ගෞරවයෙන් වැඩ කරන රජයේ නිලධාරින්ගේ ගෞරවය අපට ආරක්ෂා කරන්න පුළුවන් වෙනවා. හොරකමට, වංචාවට ඉන්න ඒ සුළු පිරිස තමයි මේ දේවල් හුහක් වෙලාවට ප්‍රමාද කරන්නේ. නමුත් වැඩි පිරිසගේ ගෞරවය අපට රැක ගන්නට පුළුවන් වෙනවා.

ඊළඟට මුදල් අමාත්‍යාංශය පිළිබඳව විගණකාධිපතිතුමා ළඟදී කරපු ප්‍රකාශයක් ගැන මම වචනයක් කියන්න කැමැතියි. පළමුවෙන්ම මම කියන්න ඕනෑ, විගණකාධිපතිතුමා කරපු ප්‍රකාශය නිවැරැදි ප්‍රකාශයක් කියලා. නමුත් ඒ විගණකාධිපතිතුමාගේ නිවැරැදි ප්‍රකාශය අරගෙන මහ බැංකුවේ හිටපු අධිපතිතුමා මුදල් අමාත්‍යාංශය රජයේ මේ ණය ප්‍රමාණය සඟවනවා වාගේ අදහසක් මාධ්‍යයට ප්‍රකාශ කළා. ඇත්තටම මුදල් අමාත්‍යාංශයත් ඒ වාගේම මහ බැංකුවත් සඳහන් කරලා තිබෙනවා, "2017 අවසන් වෙන කොට ශ්‍රී ලංකා රජයේ මුළු ණය ප්‍රමාණය රුපියල් බිලියන 10,313යි; නැත්නම් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 77.6යි" කියලා. නමුත් විගණකාධිපති සඳහන් කර තිබෙනවා, "නැහැ, ඒ ප්‍රමාණය ඇත්තටම රුපියල් බිලියන දහදහස් හත්සියදෙකයි. දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතය සියයට අසූවයි දශම පහයි" කියලා. තව විධියකට කිව්වොත්, විගණකාධිපති සඳහන් කර තිබෙන්නේ රජයේ මුළු ණය ප්‍රමාණය රුපියල් බිලියන තුන්සිය අසූනවයකින් විතර අඩු බවයි. ඇත්තටම මෙතැන සිදුවෙලා තිබෙන්නේ මේකයි. පසුගිය වකවානුවේ -එදා රජය- හම්බන්තොට වරාය හඳනකොට ශ්‍රී ලංකා වරාය අධිකාරිය එක්ක ගිවිසුම් හතරක් අත්සන් කළා. අත්සක් කරලා, කැබිනට් මණ්ඩලයට දැන්වූවා, මේවා රජයේ ණය නොවෙයි, මේවා රජයේ ණයෙන් අයින් කරලා කෙළින්ම වරාය අධිකාරියට දාන්න කියලා. ඇත්තටම මේ ඉල්ලීම කළේ එදා හිටපු මුදල් ඇමතිතුමායි. එදා හිටපු මුදල් ඇමතිතුමා 2013 ජනවාරි මාසයේ 9 වැනි දා කැබිනට් මණ්ඩලයට සන්දේශයක් ඉදිරිපත් කළා. ඊට පස්සේ 2013 ජනවාරි මාසයේ 11 වැනි දා කැබිනට් තීරණයක් ආවා. ඒ කැබිනට් තීරණය ආවේ මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් පී.බී.ජයසුන්දර මැතිතුමාටයි. ඒ කැබිනට් සන්දේශය ඉදිරිපත් කළේ කවුද? ඉදිරිපත් කළේ එදා හිටපු මුදල් ඇමතිතුමායි. එදා හිටපු මුදල් ඇමතිතුමා තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා.

"හම්බන්තොට වරායේ සංවර්ධන ව්‍යාපෘතියේ පළමුවන හා දෙවන අදියර සඳහා චීන ආනයන අපනයන බැංකුවෙන් ලබා ගනු ලැබූ ණය අරමුදල් එම කොන්දේසි මත ණය සේවාකරණය කිරීමට ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට වගකීම පැවරීමටත් අමාත්‍ය මණ්ඩල අනුමතිය අපේක්ෂා කෙරේ" කියලා එතුමා කැබිනට් සන්දේශය ඉදිරිපත් කළා. ඒ සියලු විස්තර මා ළඟ තිබෙනවා. එදා කැබිනට් මණ්ඩලයෙන් ඒ තීරණය ගත්තාය කියලාත් තිබෙනවා. හම්බන්තොට වරාය ගොඩනැඟීමේදී වාගේම, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය හදන්න යනකොටත් තවත් ගිවිසුම් තුනක් හැදුවා. ඒ ගිවිසුම් හරහා රජයට තිබෙන ණය අයින් කරලා, ඒ ණය ලංකා විදුලිබල මණ්ඩලයටත් ඒ වාගේම Lanka Coal Company (Pvt) Limited එකටත් පවරා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා ඔබතුමාට නියමිත කාලය අවසානයි. කථාව කෙටි කළොත් හොඳයි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මා කතාව ඉක්මනින් අවසන් කරන්නම්.

එම සමාගමේ නම තමයි, Lanka Coal Company (Pvt) Limited. ඒ සමාගමට ඒ ණය පවරා තිබෙනවා. "මේක රජයේ ණයක් නොවෙයි. ඒ නිසා මේ ණය ඒ ආයතනයට පැවරිය යුතුයි" කිව්වා. ඒ වාගේම මත්තල ගුවන් තොටුපොළ හදනකොටත් 2010 ඔක්තෝබර් මාසයේ 11වන දා ඒ අය නැවතත් කැබිනට් මණ්ඩලයට යෝජනා කළා, මේ ණය රජයේ ණයෙන් අයින් කරලා ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමට පවරන්න කියලා. ඔක්තෝබර් මාසයේ 24වන දා ඒ සඳහා කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා ගත්තා. මා මෙහිදී කෙටියෙන් කියන්න හැදුවේ මේකයි. විගණකාධිපතිතුමා කියපු දේ හරි. නමුත් ඇත්තටම මේ දේ සිදු වුණේ 2010 සහ 2013දීයි. පසු ගිය රජය කාලයේ 2010 සහ 2013දී තමයි -මහින්ද රාජපක්ෂ මහතා මේ රටේ මුදල් අමාත්‍යතුමා වෙලා සිටින විට තමයි- කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගත්තේ, මේ ණය රජයේ ණයෙන් අයින් කරලා ඒ සමාගම්වලට පවරන්න. එදා ඉඳලා අද වන තෙක් මුදල් අමාත්‍යාංශය ඒ ආකාරයෙන්ම තමයි -ඒ අනුවම තමයි- ක්‍රියා කරලා තිබෙන්නේ. නමුත් ඒ ණය සඟවන්න මුදල් අමාත්‍යාංශය කිසිම ක්‍රියාවක යෙදුණේ නැහැ. එදා ඒ රජය ඒ ණය සඟවන්න තමයි ඒ ක්‍රියාව කළේ. එදා ඒ ණය සැඟෙව්වේ නැත්නම් රජය ගත් ණය ප්‍රකාශිත ණයට වඩා විශාලයි කියලා එදා හිටපු මුදල් ඇමතිතුමාට විතරක් නොවෙයි, මහ බැංකුවේ අධිපතිතුමාටත් මා මතක් කරන්න ඕනෑ. මොකද, අද සමහර අයට අමතක වීමේ රෝගයක් තිබෙන නිසා. මහ බැංකුවේ එදා හිටපු අධිපතිතුමා - අජිත් නිවාඩ් කබ්රාල් මහතා- මාධ්‍ය කැඳවා කියනවා, මේ ණය අද සැඟෙව්වා වාගේ කතාවක්. ඒ නිසා තමයි මා මේ විස්තර කැබිනට් එකේ notes සමඟ මේ සභාවට ඉදිරිපත් කළේ. මේ වාගේ හොර බොරු කරලා, වංචා කරලා, විශ්‍රාම ගිහිල්ලාත් තවත් වංචා කරන්න හදන අය ගැන රට දැන ගත යුතුය කියන එක මේ අවස්ථාවේදී කිව යුතුයි.

මට කාලය ලබා දීම ගැන ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය අමාත්‍යතුමා.

ඊට පෙර මූලාසනය සඳහා ගරු තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA) *took the Chair.*

[අ.භා. 4.22]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියට මා අද ඉතාම සතුටු වෙනවා, මේ පාර්ලිමේන්තුවට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා පහක් ඉදිරිපත් කිරීමට හැකි වීම පිළිබඳව සහ ඒ වාර්තා ගැන දවසක් පුරා පැවැත්වෙන මේ විවාදයේදී කතා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව මේ විවාදයේදී මේ දක්වා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂවල නියෝජිතයන් කතා කළා. මා ප්‍රථමයෙන්ම ඒ සෑම කෙනකුටම ස්තුතිවන්ත වනවා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සිය අදහස්, යෝජනා ඉතාම ඵලදායි ලෙස ඉදිරිපත් කිරීම පිළිබඳව.

ඒ වාගේම, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ක්‍රියාවලිය මේ ආකාරයෙන් සාර්ථකව කරගෙන යන්න අපට සහයෝගය ලබා දෙන, දුන් අය පිළිබඳව මා මුලින්ම සිහිපත් කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම, මේ පාර්ලිමේන්තුවට නායකත්වය ලබා දෙන ගරු කථානායකතුමාව මුලින්ම සිහිපත් කළයුතු වෙනවා. එතුමා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතු පිළිබඳව සෑම අවස්ථාවකම මඟපෙන්වමින් අවශ්‍ය ශක්තිය අපට ලබා දෙන අතර, අපේ කාරක සභාවේ මන්ත්‍රීවරුන්ට, නිලධාරින්ට, දේශීය හා විදේශීය පුහුණුවීම් සඳහා අවස්ථාව ලබා දෙමින්, විවිධ වැඩ මුළු සඳහාද අවස්ථාව ලබා දුන්නා. පක්ෂ නායක රැස්වීම් තුළ අවස්ථා ගණනාවකදීම කථා කර, මෙවැනි විවාදයක් ලබා ගැනීමට පවා නායකත්වයක් ලබා දුන්නේ ගරු කථානායකතුමායි. ඒ නිසා මේ අවස්ථාවේ දී අප එතුමාව කෘතවේදීව සිහිපත් කරන්නට ඕනෑ.

ඒ වාගේම මහ ලේකම්තුමා, අපේ කාරක සභා ලේකම් කාර්යාලයේ ලේකම්තුමා ඇතුළු සියලු දෙනාම මේ ගිණුම් කාරක සභාවේ ක්‍රියාවලීන් වෙනුවෙන් අපට දැවැන්ත ශක්තියක් ලබා දුන්නා. රාජ්‍ය ආයතන 837ක් සම්බන්ධයෙන් කටයුතු කිරීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ලෙහෙසි පහසු කාර්යක් නොවෙයි. ඒක සෑමදෙනාටම අවබෝධ වෙනවා ඇති. රාජ්‍ය ආයතන 837ක ගිණුම් ක්‍රියාවලිය පිළිබඳව කොපමණ වැඩ ප්‍රමාණයක් තිබෙනවාද යන්න අමුතුවෙන් සඳහන් කිරීමේ අවශ්‍යතාවක් නැහැ. ඒ වෙනුවෙන් විශාල කාර්ය මණ්ඩලයක් අපේ පාර්ලිමේන්තුවේ ලේකම් කාර්යාලය තුළ නැහැ. ලේකම්තුමියක්, සහකාර ප්‍රධාන නිලධාරිතුමෙක් සහ නිලධාරිතුමියක් සිටිනවා; පාර්ලිමේන්තු නිලධාරීන් හතරදෙනෙක් සිටිනවා; ලඝුලේඛිකාවන් දෙදෙනෙක් සිටිනවා; පාර්ලිමේන්තුවේ සේවා සහායකයින් තුන්දෙනෙක් සිටිනවා. මේ දොළොස්දෙනා, පාර්ලිමේන්තුවේ සිටින භාෂා පරිවර්තක, හැන්සාඩ් යන අනෙකුත් අංශවල සහයෝගය; දායකත්වය අරගෙන තමයි මෙවැනි දැවැන්ත කාර්ය භාරයක් මේ කාරක සභා ක්‍රියාවලිය තුළ ඉටු කරනු ලබන්නේ. මෙවැනි කාර්ය භාරයක් ඉටු කිරීමට අවශ්‍ය දායකත්වය, කැපවීම ලබා දීම පිළිබඳව එහි ලේකම්තුමිය ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට මම ස්තුතිය පළ කරන්නට ඕනෑ. ඒ වාගේම, අපේ මේ කටයුතු කර ගෙන යෑම සඳහා, අදාළ වැඩසටහන් සකස් කිරීම තුළින් පාර්ලිමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශයේ අධ්‍යක්ෂතුමා ඇතුළු එම කාර්ය මණ්ඩලය අපට විශාල ශක්තියක් ලබා දී තිබෙන අතර, ඒ සකස් කළ වැඩසටහන් අපේ වැඩ කටයුතුවලට විශාල රුකුලක් වෙලා තිබෙනවා.

මෙම කාරක සභාවේ උපදේශකයෙක් විධියට කටයුතු කළ, හිටපු අමාත්‍යාංශ ලේකම්වරයෙක් වන ලලිත් ආර් ද සිල්වා මහත්මයා ලබා දුන් ශක්තියත් මේ මොහොතේ අප කෘතවේදීව සිහිපත් කරන්නට ඕනෑ.

මේ ක්‍රියාවලියේ දී විගණකාධිපතිවරයා ඇතුළු විගණකාධිපති දෙපාර්තමේන්තුව අපට විශාල ශක්තියක් ලබා දෙනවා. අප විසින් කැඳවනු ලබන රැස්වීම්වලට වාර්තා ඉදිරිපත් කරමින්, විශාල කැපවීමකින් යුතුව විගණකාධිපතිතුමාගේ නායකත්වයෙන් ඒ ශක්තිය අපට ලබා දෙනවා. ඒ වාගේම, මා ඇතුළු අපේ කාරක සභාවේ මන්ත්‍රීවරුන් 25දෙනාට මේ කටයුතු නිදහසේ කර ගෙන යෑම සඳහා අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, කිසිදු අත පෙවීමකින්, කිසිදු බලපෑමකින් තොරව රජය විධියට ඒ අවශ්‍ය පූර්ණ නිදහස අපට ලබා දෙනවා. ඒ වාගේම කාරක සභාව කියන්නේ සභාපතිවරයා නොවෙයි. සභාපතිවරයාට තිබෙන කාර්ය භාරය හා වගකීම වන්නේ සෙසු සාමාජිකයන්ගේ අදහස් හා යෝජනා මත කටයුතු කිරීම. ඒ අනුව පාර්ලිමේන්තුව

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවල නියෝජිතයන් 26දෙනෙකු අපේ කාරක සභාව නියෝජනය කරනවා. සියලුම දේශපාලන පක්ෂවල නියෝජිතයන් තමන්ගේ දේශපාලන ප්‍රතිපත්ති, පක්ෂය එළියෙන් තියලා කාරක සභාවට ඇවිල්ලා සැබෑ මහජන නියෝජිතයකුගේ වගකීම කුමක්ද කියන එක අවබෝධ කරගෙන කණ්ඩායමක් විධියට කාරක සභාව තුළ කටයුතු කරන නිසා තමයි, ඒ අයගේ කැපවීම නිසා තමයි අපට මේ කටයුත්ත සාර්ථකව ඉටු කරගන්න පුළුවන්කම ලැබී තිබෙන්නේ කියන කාරණය මම ඉතාමත් සතුටින් සඳහන් කරනවා. එම නිසා ඒ සියලුදෙනාටම මේ අවස්ථාවේ දී සිහිපත් කළ යුතුයි. තනිවම වැඩක් කරන්න පුළුවන්කමක් නැහැ. බාහිර ආයතන ඇතුළු සෑම කෙනෙකුම ලබා දෙන වගකීම හා සහයෝගය තුළින් තමයි අපි මේ කාර්ය භාරයන් සියල්ලක්ම සාර්ථකව ඉටු කරනු ලබන්නේ. එම නිසා මේ කටයුතු වෙනුවෙන් අපට ලබා දෙන සහයෝගය පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියට මම ඒ සියලු දෙනාටම ස්තුතිය පළ කරන්නට ඕනෑ.

විශේෂයෙන්ම අපි මෙම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළින් කරන්නේ මොකක්ද? ඒ වාගේම කළ යුතු වන්නේ මොකක්ද? අපේ රටේ දෙකෝටියක් ජනතාව නියෝජනය කරන්න පාර්ලිමේන්තුවට 225දෙනෙක් තෝරා පත්කර එවනවා. අපව තෝරා පත්කර එවන්නේ ඇයි? ජනතාව තුළ විවිධ අරමුණු විශාල වශයෙන් තිබෙන්නට පුළුවන්. නමුත්, අපට පැවරී තිබෙන ප්‍රධාන වගකීම් කිහිපයක් තිබෙනවා. ඉන් පළමුවැනි වගකීම තමයි මේ රටේ නීති ප්‍රතිපත්ති සකස් කිරීම. ඊළඟ වගකීම තමයි අය වැය මඟින් ජනතාවගේ බදු මුදල්; රටේ මුදල් වෙන් කිරීම සහ අනුමත කිරීම. ඊළඟ කාර්ය භාරය තමයි, එසේ අනුමත කරනු ලබන මුදල් ජනතාවගේ මුදල් නිසා ඒවා හරි හැටි, ඵලදායී ලෙස සහ වග කීමකින් යුතුව වියදම් කරනවාද කියා සොයා බැලීම. එය පාර්ලිමේන්තුවේ එක් වගකීමක් බවට පත් වෙනවා. මෙම ප්‍රධාන අරමුණු තුන සඳහා තමයි ජනතාව අපව පාර්ලිමේන්තුවට එවන්නේ.

රටේ විවිධ මත තිබෙනවා. පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්න දවසකට මෙච්චර මුදලක් වියදම් කරනවා; අවුරුද්දකට මෙච්චර මුදලක් වියදම් කරනවා කියලා කියනවා. ඒ සෑම දෙයක්ම කරන්නේ මෙන්න මේ අරමුණු තුන, එම වගකීම් තුන අපෙන් ඉටුකර ගැනීම සඳහායි. ඒ අනුව පාර්ලිමේන්තුව අය වැය මඟින් වෙන් කරනු ලබන මුදල් නිසි පරිදි වියදම් කිරීමේ කාර්ය භාරය සිදු වුණාද කියන කාරණය පිළිබඳ සොයා බැලීමට පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරු 225ටම බැරි නිසා තමයි මේ මන්ත්‍රීවරු 225 නියෝජනය කරමින් 26දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් සකස් කරලා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පිහිටුවලා තිබෙන්නේ. තවත් මන්ත්‍රීවරු 26දෙනෙක් පත් කරලා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව පිහිටුවලා තිබෙනවා. මෑතකදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාවත් පිහිටුවලා තිබෙනවා. එතකොට අපි පාර්ලිමේන්තුවට පැමිණෙන්නේ ඇයි, අපි මේ කමිටුවලට පත් කරන්නේ ඇයි? අය වැයෙන් වෙන් කරන මුදල් නිසි පරිදි වියදම් කරනවාද කියන කාරණය පිළිබඳ සොයා බැලීමේ කාර්ය භාරය තමයි අපට පැවරී තිබෙන යුතුකම, වගකීම බවට පත් වෙලා තිබෙන්නේ. ඒ අනුව වර්තමානයේ අපේ රටේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට රාජ්‍ය ආයතන 837ක් අයත් වෙනවා. අපේ රටේ විශේෂිත වූ වියදම් ඒකක 19ක්, අමාත්‍යාංශ 51ක්, දෙපාර්තමේන්තු 92ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක්, පළාත් අරමුදල් 9ක්, පළාත් අමාත්‍යාංශ 45ක්, පළාත් සභා විශේෂ වියදම් ඒකක, දෙපාර්තමේන්තු 215ක්, පළාත් සභා අධිකාරි 46ක්, මහනගර සභා 23ක්, නගර සභා 41ක් සහ ප්‍රාදේශීය සභා 271ක් ආදී වශයෙන් එය සමන්විත වෙනවා. ඊට අමතරව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතන 427ක් අයත් වෙනවා. පාර්ලිමේන්තුව අය වැයෙන් වෙන් කරනු ලබන මුදල් මේ දෙපාර්තමේන්තු, ආයතන 837 වියදම් කරන ආකාරය පිළිබඳව සහ එම ආයතනවල කාර්ය සාධනය පිළිබඳව තමයි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විධියට අපි සොයා බැලිය යුතු වන්නේ. මෙය සොයා බැලිය යුත්තේ කෙසේද? මෙය සෑම වර්ෂයකම සොයා බැලිය යුතුයි.

පාර්ලිමේන්තුව සෑම වර්ෂයකම ඉදිරි වර්ෂය සඳහා අය වැය සම්මත කරනවා. අය වැය සම්මත කරලා මේ ආයතනවලට මුදල් ලබා දුන්නාට පසුව එම ආයතන අපේ රටේ තිබෙන නීති-රීති අනුව මුදල් වියදම් කළ යුතුයි. ඒ අනුව විගණකාධිපති දෙපාර්තමේන්තුව මේ පිළිබඳ සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කරනවා. පාර්ලිමේන්තුවට වාර්තා කරන දේ පිළිබඳව වැඩි දුරටත් සොයා බැලීම අප විසින් සිදුකළ යුතුයි. මේක වර්තමානයේ තිබෙන නීතියක් නොවෙයි. සෑම අවුරුද්දකම අය වැයෙන් සල්ලි වෙන් කරනවා. සෑම අවුරුද්දකම රජයෙන් මේ ආයතනවලට සල්ලි ලබා දෙනවා. එම ආයතන සල්ලි වියදම් කරනවා. විගණකාධිපතිවරයා සෑම අවුරුද්දකම ඊට පෙර අවුරුදුවල එම ආයතන සල්ලි වියදම් කළේ කොහොමද කියන එක පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුවට ලබා දෙනවා. ඒ අනුව අපි කාරක සභාව විධියට විගණකාධිපතිවරයා සහ අදාළ ආයතන කැඳවලා, ඉදිරිපත් කර තිබෙන කරුණු පිළිබඳ නැවත නිර්දේශයක් පාර්ලිමේන්තුවට ලබා දෙනවා. මෙම ක්‍රියාවලිය තමයි සිදු විය යුතුව තිබුණේ.

විශේෂයෙන්ම පළමුවැනි පාර්ලිමේන්තුවේ සිට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා පැවතුණා. එම පැවැති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවලිනුත් විශාල කාර්ය භාරයක් ඉටු වී තිබෙනවා. 1978 වර්ෂයේ සිට 1988 වර්ෂය තෙක් පාර්ලිමේන්තුවට වාර්තා 15ක් ඉදිරිපත් කරලා තිබෙනවා; ආයතන 198යි. 1988 සිට 1993 දක්වා වූ කාලය තුළ වාර්තා 11ක් ඉදිරිපත් කර තිබෙනවා; ආයතන 50යි. 1994 සිට 2010 වනතෙක් පාර්ලිමේන්තුවට කැඳවා තිබෙන්නේ ආයතන 3ක් වැනි සුළු ප්‍රමාණයක්. ඊළඟට, 2010 සිට 2015 වනතෙක් නැවත ආයතන 160ක් කැඳවා තිබෙනවා. මේ අනුව 1978 සිට මේ වනතෙක්ම ආයතන 425ක් පමණ තමයි පාර්ලිමේන්තුවට කැඳවන්න පුළුවන් වෙලා තිබෙන්නේ. වර්තමානයේදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සෑම වර්ෂයකම මේ ආයතන පිළිබඳව සොයා බැලිය යුතුයි; මේ සියලුම ආයතන පිළිබඳව සෑම වර්ෂයකම පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කළ යුතුයි. ඉතිහාසයේ තිබූ රජයේ මුදල් පිළිබඳ කාරක සභා තුළින් මෙම කාර්ය භාරය නිසි පරිදි ඉටු වෙලා තිබෙනවාද කියන කාරණය අපි සාකච්ඡා කර බැලුවා. ඒ ක්‍රියාවලිය නිසි පරිදි ඉටු වෙලා නැති බව කනගාටුවෙන් වුවත් අපි සඳහන් කරන්න ඕනෑ. එය පැවතුණු රජයේ මුදල් පිළිබඳ කාරක සභාවල අඩු පාඩුවක් නොවෙයි. අපි ඒ අයට දෝෂාරෝපණය කළ යුතු වන්නේ නැහැ. නමුත් සමස්ත පාර්ලිමේන්තුවම එම වගකීම ඉටු කර තිබුණේ නැහැය කියන කාරණය අපි නිහතමානීව පිළිගත යුතුව තිබෙනවා. වර්තමානයේ තිබෙන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව මේ අඩු පාඩුව පිළිගත්තා; අවබෝධ කර ගත්තා. එය අවබෝධ කරගෙන, ඒ සිදු වුණු ක්‍රියාවලිය පිළිබඳව අපි සොයා බැලුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එදා ඒ කැඳවන ලද ආයතනවල අවුරුදු 10කට 15කට පෙර වර්ෂවල ගිණුම් වාර්තා තමයි සලකා බලා තිබෙන්නේ. එහෙම කළාය කියා නිසි ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවන් වෙලා නැහැ. ඒ නිලධාරින් නැහැ; විශ්‍රාම ගිහින්. එම නිසා ඒ කැඳවන ලද ආයතන සම්බන්ධයෙනුත් විශේෂයෙන්ම නිසි ඵලදායකත්වයක් ලබාගැනීමට පුළුවන්කමක් ලැබී තිබුණේ නැහැ. ඒ වාර්තා පරිශීලනය කිරීමේදී අපට එය ඉතාම හොඳින් අවබෝධ වුණා. එම

නිසා එය නිවැරැදි කිරීමට අපි උත්සාහ කළා. 2016 සිට 2018 දක්වා අපි වාර්තා 6ක් ඉදිරිපත් කළා. අපි මේ වනවිට මෙම කාරක සභාවට ආයතන 125ක් කැඳවා තිබෙනවා. අපි 2016.09.22වන දා වාර්තාවක් ඉදිරිපත් කළා. 2017.06.23වන දා තවත් වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ වාගේම, තොරතුරු තාක්ෂණ පද්ධතිය හරහා ජාලගත වැඩසටහනක් අපි මේ වෙනුවෙන් ක්‍රියාත්මක කළා. මම ඒ පිළිබඳවත් පැහැදිලි කරන්නම්.

මේ ආයතන 832ම ආවරණය වන පරිදි ජාලගත වැඩසටහනක් ක්‍රියාත්මක කරලා, එම ආයතනවල තොරතුරු ලබාගෙන 2017.11.13වන දින අපි පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළා. ඉන් පසුව, 2017.12.08වන දා තවත් වාර්තාවක් ඉදිරිපත් කළා. ඊට අමතරව, ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් යුතුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුකාරක සභාවක් පිහිටෙව්වා. එම අනුකාරක සභාවට රජයේ ආයතන කැඳවලා, ආදායම් ලබන ආයතනවල එම ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ හැක්කේ කෙසේද කියා සාකච්ඡා කළා. ඒ අනුව එම ආයතන කලින් පාවිච්චි කර තිබෙන ක්‍රමවේද මොනවාද, තොරතුරු තාක්ෂණය භාවිත කර එම ආයතනවල ආදායම වැඩි කර ගන්නේ කොහොමද යනාදී කරුණු පිළිබඳව අධ්‍යයනයක් කරලා, මේ පාර්ලිමේන්තුවට පැහැදිලි වාර්තාවක් ඉදිරිපත් කරන්න අපේ කාරක සභාව කටයුතු කළා. ඒ වාගේම, මේ ආයතන 837ම පිළිබඳව -ඒවා එකින් එකට අරගෙන- 2016 වර්ෂයට අදාළ තවත් වාර්තාවක් අද දිනයේදී අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ අනුව මේ ආයතන අටසියතිස්හතේම 2015 වර්ෂයට අදාළ ගිණුම් පිළිබඳව වාර්තාවකුත්, 2016 වර්ෂයට අදාළ ගිණුම් පිළිබඳ වාර්තාවකුත් මේ වනවිට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අපි කටයුතු කර තිබෙනවා. මේක අනිවාර්යයෙන්ම සිදුවිය යුතු කරුණක්. මෙම කාරක සභාවට මේ ආයතන කැඳවා අපි කථා කරන්නේ අවුරුදු 10ක් 15ක් පැරණි දේවල් පිළිබඳව නොවෙයි. මෑත වර්ෂවල සිදුවුණු අඩු පාඩුකම් පිළිබඳව අපි ඔවුන් සමඟ කථා කළා. මේ ආයතන අටසිය ගණනම පාර්ලිමේන්තුවට කැඳවන්න අපිට පුළුවන්කමක් නැති නමුත් පාර්ලිමේන්තුවත්, මේ ආයතන 837ත්, විගණකාධිපතිවරයාත් සම්බන්ධ කර ගනිමින් ජාලගත තොරතුරු තාක්ෂණ පද්ධතියක් අපි හඳුන්වා දී තිබෙනවා. ඒ අනුව අපි වර්තමාන කාරක සභාවට මේ ආයතන වෙන් වෙන් වශයෙන් කැඳවනවා වාගේම, ජාලගත වැඩසටහන මඟින් පාර්ලිමේන්තුවත්, මේ ආයතන 837ත් අතර අද වනවිට සෘජු සම්බන්ධතාවකුත් ඇති කරගෙන තිබෙනවා. අද අපි බොහෝවිට මේ ආයතන සමඟ ගනුදෙනු කරන්නේ ලිපිවලින් නොවෙයි. අද අපි නවීන තාක්ෂණික වැඩසටහන් පාවිච්චි කරලා මේ ආයතන 837ත්, පාර්ලිමේන්තුවත් අතර ඉතාම සමීපව සම්බන්ධතාවක් ඇති කර ගැනීමම අපේ ඉදිරි කටයුතු සඳහා ඉතාම සුබවාදී ප්‍රවණතාවක් බව මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

මේ ආයතනවල විගණනය සහ කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා අපි ප්‍රශ්නාවලියක් සකස් කර තිබෙනවා. අපි මෙම ක්‍රියාවලිය තුළින් කරන්න බලාපොරොත්තු වුණේ මේකයි. විශේෂයෙන්ම අපිට ආයතන විශාල ප්‍රමාණයක් කැඳවන්න පුළුවන්කමක් නැති නිසා, අපි ප්‍රශ්නාවලි පහක් සකස් කළා. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට එක ප්‍රශ්නාවලියකුත්, සියලුම පළාත් සභා සහ පළාත් සභා අරමුදල්වලට එක ප්‍රශ්නාවලියකුත්, පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ ගිණුම් ඒකක සඳහා එක ප්‍රශ්නාවලියකුත්, පළාත් සභා ප්‍රඥප්ති සඳහා එක ප්‍රශ්නාවලියකුත්, සියලුම පළාත් පාලන ආයතන සඳහා එක ප්‍රශ්නාවලියකුත් යනාදී වශයෙන් ප්‍රශ්නාවලි පහක් අප සකස් කර තිබෙනවා. ඒ මඟින් අප එම ආයතනවල තොරතුරු ලබා ගන්නවා. විශේෂයෙන්ම එම ආයතනවල සැලසුම්කරණය, අභ්‍යන්තර පාලනය, මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය සම්පත් කළමනාකරණය, රාජ්‍ය ආදායම් කළමනාකරණය, වියදම් කළමනාකරණය, අනික් රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම්, ගිණුම් ඉදිරිපත් කිරීම, විගණනයට ප්‍රතිචාර දැක්වීම හා කාර්ය සාධනය පිළිබඳව එම ප්‍රශ්නාවලිය හරහා තොරතුරු ඇතුළත් කර ගනු ලබනවා. ඒ අනුව මේ ප්‍රශ්නාවලියට ඒ අදාළ ආයතනවලින් ලබාදෙන තොරතුරු, තොරතුරු පද්ධතිය හරහා අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ කරලා, විගණකාධිපතිවරයාට එව්වාට පසුව විගණකාධිපතිතුමාගේ නිලධාරියෙක් ඒ අදාළ අමාත්‍යාංශවලට ගිහින්, ආයතනවලට ගිහින් ඒ ලබා දී තිබෙන තොරතුරු නිවැරැදිද කියා බලා, විගණකාධිපතිවරයාගේ නිර්දේශ සමඟ තොරතුරු පද්ධතිය හරහාම එම තොරතුරු පාර්ලිමේන්තුවට එවනවා. එම තොරතුරු පාර්ලිමේන්තුවට ලැබුණාට පසුව තොරතුරු පද්ධතිය හරහාම මේ ආයතනවලට ලකුණු ලබා දෙනවා.

ආයතනවල වැරැදි, අඩු පාඩුකම් සිදුවුණාට පසුව කොපමණ පරීක්ෂණ පැවැත්වුවත්; පශ්චාත් පරීක්ෂණ පැවැත්වුවත් රටට අහිමි වුණු මුදල් නැවත ලබා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැය කියන කාරණය කාරක සභාව තුළ කටයුතු කරන විට අප දකින දෙයක්. කොපමණ පරීක්ෂණ පැවැත්වුවත් ඒ සිදුවුණු පාඩුව මකා ගන්න නැවත පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. එම නිසා කාරක සභාව විධියට අපි උත්සාහ කරන්නේ, මේ ආයතනවල සිදුවන අඩු පාඩුකම් නැති කර ගන්නයි; අවම කර ගන්නයි. ඒ නිසා පාර්ලිමේන්තුවත්, විගණකාධිපති දෙපාර්තමේන්තුවත්, ඒ ආයතනත් අතර දැඩි සම්බන්ධතාවක් තිබෙනවා නම්; අධීක්ෂණයක් තිබෙනවා නම්; සම්බන්ධීකරණයක් තිබෙනවා නම් එම ආයතනවල සිදුවන අඩු පාඩුකම් අවම වෙනවාය කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

කාරක සභාවට ආයතනයක් කැඳෙව්වාම ඒ ආයතනය කොපමණ උනන්දු වෙනවාද කියලා අපි දන්නවා. හැබැයි, බොහෝ ආයතනවලට ඒ උනන්දුව තිබෙන්නේ කාරක සභාවට ඇවිල්ලා පිළිතුරු දීලා යන්න විතරයි. කාරක සභාවට කැඳෙව්වාට පස්සේ ආයතන සූදානම් වෙනවා. එම නිසා අපි දැක්කා, මේ ආයතනයත්, පාර්ලිමේන්තුවත් අතර සෘජු සම්බන්ධතාවක අවශ්‍යතාවක් තිබෙන බව. එම නිසා තමයි මේ තොරතුරු පද්ධති වැඩසටහන අපි හඳුන්වා දීලා තිබෙන්නේ. 2015 අවුරුද්දේ අපි ඒ ආයතන ඇගැයීමකට ලක් කළා. හොඳම කාර්ය සාධනයක් තිබෙන, විගණනයක් ඉදිරිපත් කළ ආයතන ඇගැයීමකට ලක් කළා. ඒ අයට අපි පාර්ලිමේන්තුවේ ඇගැයීම් වැඩසටහනක් පැවැත්වුවා. ඒ තුළින් ඒ ආයතනවලට සහතික පත් ලබා දුන්නා. ඒ වාගේම 2015 අවුරුද්දේ හඳුන්වා දුන් තොරතුරු පද්ධති වැඩසටහනත් එක්ක සංසන්දනය කළාම, 2016 අවුරුද්දේම එම ආයතන කාර්ය සාධනය සහ ගිණුම් කටයුතු පැත්තෙන් විශාල ප්‍රගතියක් ලබාගෙන තිබෙනවාය කියන කාරණය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විධියට අපි ඉතාමත් සතුටින් සඳහන් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම 2015 අවුරුද්දේ මේ ආයතන 837න් ආයතන 122ක්ම ලකුණු 50ටත් වඩා අඩුවෙන් තමයි ලබාගෙන තිබුණේ. නමුත් 2016 ගිණුම් අනුව බැලුවාම ආයතන 100ක්ම ලකුණු 50කට වඩා වැඩියෙන් ලබා ගන්නා ආයතන බවට පත්වෙලා තිබෙන බව පෙනෙනවා. ඒ වාගේම 2016 අවුරුද්දේ ලකුණු 90ට වඩා වැඩියෙන් ලබාගත් ආයතන තිබුණේ ඉතාමත් සුළු ප්‍රමාණයක්. නමුත් 2016 වර්ෂය වන විට ඒ ආයතන විශාල ප්‍රගතියක් අත්පත් කරගෙන තිබෙනවා; වැඩි ආයතන ප්‍රමාණයක් වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන තිබෙනවා.

අද ඒ ආයතනවල විගණන කමිටු කැඳවනවා. ඒ වාගේම එම ආයතනවල අනිකුත් කටයුතු සම්බන්ධයෙන් අද යම් ප්‍රවණතාවක්

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

ඇති කරගෙන තිබෙනවා. ඒ වාගේම විගණනයට පිළිතුරු ලබාදීමේදී අද ඒ ආයතන ශුභවාදී තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. 2016 වර්ෂයට අදාළ සියලුම ආයතන ඇගැයීමකට ලක් කිරීමේ වැඩසටහනක් අපි මේ වර්ෂයේදීත් අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරනවා. මේ වැඩසටහන තුළින් අපේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතු ඉතාමත් කාර්යක්ෂම කර ගැනීමට අපට හැකියාව ලැබී තිබෙනවා. මෙය සමස්ත පාර්ලිමේන්තුවම ලද ජයග්‍රහණයක් විධියටයි අපි දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෑතකදී පාර්ලිමේන්තුවට හඳුන්වා දුන් ස්ථාවර නියෝග අනුව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මේ ආයතන සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වාර්තාව මුදල් අමාත්‍යාංශයටත්, අදාළ ආයතනවලටත් නොපමාව යැවිය යුතුව තිබෙනවා. මේ ඉදිරිපත් කරපු වාර්තා පාර්ලිමේන්තුව අදාළ ආයතනවලට යවන්න ඕනෑ. අදාළ ආයතනවලට මේ වාර්තාව යවනවාය කියන්නේ, මේ කාරක සභාවේදී අනාවරණය වුණු කරුණු ඇතුළත් වාර්තාව, නිර්දේශයන් යවන එකයි. ඊට පස්සේ මුදල් අමාත්‍යාංශයත්, අදාළ ආයතනයත් ඒ නිර්දේශ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන මාස දෙකක් ඇතුළත, එනම් සති 8ක් ගතවීමට පෙර පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයි. එතකොට කාරක සභාවට බලන්න පුළුවන්, මේ කාරක සභාවෙන් සොයාගත් කරුණු, අනාවරණය කරගත් කරුණු මේ ආයතන ක්‍රියාත්මක කරලාද, නැද්ද කියලා.

අපේ මන්ත්‍රීතුමන්ලාගේ අදහස් හා යෝජනාවලින් කියවුණා, මේ කාරක සභාව නිර්දේශ ඉදිරිපත් කරනවා පමණයි, පසු විපරමක් සිද්ධ වන්නේ නැහැයි කියලා; මේ තීන්දු තීරණ ක්‍රියාත්මක කරනවාද කියා සොයා බැලීමක් සිද්ධ වෙන්නේ නැහැ කියා. අපි අද පාර්ලිමේන්තු ස්ථාවර නියෝග මඟින් මේ වැඩසටහන තවත් ශක්තිමත් කර තිබෙනවා. මේ ගිණුම් ක්‍රියාවලිය- මුදල් නිසි පරිදි වියදම් කළාද කියා සොයා බැලීමේ ක්‍රියාවලිය- තවත් පියවරක් ඉදිරියට තබා මාස දෙකක් ඇතුළත නැවතත් ඒ ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු පාර්ලිමේන්තුවට වාර්තා කරන මට්ටමකට අද ඇවිත් තිබෙනවා. එම නිසා කාරක සභාව විධියට අපි නව ස්ථාවර නියෝගවලට අනුව ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න සූදානම් වෙලා තිබෙනවා. මේ වාර්තා සියල්ලක්ම අපි ඒ ආයතනවලට යොමු කරනවා. මේ සෑම ආයතනයක්ම මාස දෙකක් ඇතුළත ඒ ආයතන වෙත ලබා දුන් වග කීම් ඉටු කිරීම පිළිබඳව මෙම පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුව තිබෙනවා. ඒ අනුව මේ වැඩසටහන තව තවත් ශක්තිමත් කරන්න අපි අනිවාර්යයෙන්ම කටයුතු කරනවා. එසේ කටයුතු කළ යුතුයි. මේ සෑම දෙයකම අවසානය කුමක්ද? මේ රටේ ජනතාව අපව පාර්ලිමේන්තුවට එවන්නේ මෙන්න මේ කටයුතු ටික කරන්නයි. මේ රටේ නීති ටික හදලා, මුදල් ටික වෙන් කර, හරිහැටි ඒ මුදල් ටික වියදම් කළා ද කියා සොයා බලන්නයි. ඒ වග කීම අප මනාව අවබෝධ කර ගෙන තිබෙන නිසා තමයි අපේ කාලයෙන් වැඩි ප්‍රමාණයක් මේ වෙනුවෙන් මිඩංගු කරන්නේ. අපේ කාලය මිඩංගු කර, මා ඇතුළු අපේ කාරක සභාවේ මන්ත්‍රීවරුන් විසි හය දෙනා මේ පිළිබඳ ඉතාමත් හොඳ අවබෝධයකින් යුතුව මේ කටයුතු නිවැරදි කරන්න ක්‍රියා කරනවා. එම නිසා ඒ කාර්ය භාරය අප බොහොම පැහැදිලිව ඉටු කරනවාය කියන එක ඉතාමත් වගකීමකින් යුතුව කියන්නට ඕනෑ.

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත්, රජයේ ගිණුම් කාරක සභාවත් ඉතාමත් සුහද සම්බන්ධතාවයකින් යුතුව සමස්ත පාර්ලිමේන්තුවේ මූල්‍ය වග කීම් නිසි ලෙස අවබෝධ කර ගෙන කටයුතු කරනවා. එය එසේ අනිවාර්යයෙන්ම සිදු කළ යුතු කාර්යයක් හැටියටයි පෞද්ගලිකව මා ඇතුළු කාරක සභාවේ මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාම දකින්නේ. ඒ වාගේම මේ ඉදිරිපත් කරපු වාර්තාවල ඒ ඒ ආයතන සම්බන්ධව වෙන වෙනම නිරීක්ෂණ ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම ඒ ඉදිරිපත් කළ වාර්තාවල විශේෂ නිර්දේශයන් ඉදිරිපත් කර තිබෙනවා. එසේම පොදු නිරීක්ෂණයන් ද අපි ඉදිරිපත් කර තිබෙනවා. මේ පොදු නිරීක්ෂණයන් හා විශේෂ නිරීක්ෂණයන් අපි වෙනමම අරගෙන ඒ ආයතනවලට ලබා දුන් නියෝගවලට අමතරව පොදු නිරීක්ෂණයන් හා විශේෂ නිරීක්ෂණයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

අද විගණකාධිපති දෙපාර්තමේන්තුවත් මේ කටයුතු ශක්තිමත් කිරීම සඳහා දැවැන්ත කාර්ය භාරයක් ලබා දෙනවා. ඒ වාගේම පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතුවලට විගණන පනතකින් විශාල සහයෝගයක් ලැබෙනවා යයි කියන්නට ඕනෑ. එම නිසා අපි සියලු දෙනාම ඒකරාශී වී විගණන පනත් කෙටුම්පත කඩිනමින් සම්මත කර ගත යුතුයි. විගණන පනත් කෙටුම්පතට අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබුණා. එය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මේ සම්බන්ධයෙන් විවිධ ආයතනවල අදහස් හා යෝජනා ආවා. අද ඒ අදහස් හා යෝජනා අධ්‍යයනය කරමින් තිබෙනවා. එම නිසා මේ පාර්ලිමේන්තුව ගෙන යන මේ ක්‍රියාවලියට විගණකාධිපතිවරයා - විගණන කොමිෂන් සභාව ශක්තිමත් වීම විශාල රුකුලක්ය කියන එකත් අපි මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි හතරක කාලයක් තිබෙනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

විශේෂයෙන්ම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පිළිබඳව විවාද කරනු ලබන මේ අවස්ථාව, මා මේ කාරණයත් කියන්න උපයෝගි කර ගන්නවා. ජාතික විගණන පනත් කෙටුම්පතේ තිබෙන අඩුපාඩුකම් නිවැරැදි කරලා, කඩිනමින් එය සම්මත කර දීම අපේ යුතුකමක් හා වගකීමක් බව අපි අවබෝධ කර ගන්න ඕනෑ. අපි ඒ කාරණය කෙරෙහිත් අනිවාර්යයෙන්ම අපේ අවධානය යොමු කරන්න ඕනෑ. මේ ක්‍රියාවලිය තවත් ශක්තිමත් වීම සඳහා මේ කාරක සභාව විසින් ලබා දෙන නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරමක් කළ යුතුයි. එමෙන්ම මේවා සැබෑ ලෙස ක්‍රියාවට නැංවීම පිළිබඳව අපි දැනට වඩා, තවදුරටත් ශක්තිමත් විය යුතුයි. ස්ථාවර නියෝග හරහා යම් දින වකවානු, යම් සීමාවන් දාලා, මේ පාර්ලිමේන්තුවේ කටයුතු තවත් ශක්තිමත් කරන්න ක්‍රියා කරලා තිබෙනවා. හැබැයි, අපි මීටත් වඩා ඉදිරියට යා යුතුයි. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට නිලධාරීන් කැඳවලා, ඔවුන්ට දඬුවම් ලබා දිය යුතුයි කියන තැන මම පෞද්ගලිකව නැහැ. දඬුවම් ලබා දීලා පමණක් මේ සෑම දෙයක්ම නිවැරැදි කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. නමුත් අපි සෑම කෙනෙකුටම හිමිවෙලා තිබෙන වගකීම් හරිහැටි ඉටු කරනවා නම්, මේ සිදු වන අඩුපාඩුකම් අපට නිවැරදි කර ගන්න පුළුවන්කමක් ලැබෙනවා කියන එකයි පෞද්ගලිකව මගේ විශ්වාසය. එම නිසා දඬුවම් ලබා දීමට අපට ඒ බලතල අවශ්‍ය වන්නේ නැහැ. හැබැයි, මේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඒ ආයතන දක්වන ප්‍රතිචාර පිළිබඳව සොයා බලා, දැනට තිබෙනවාට වඩා දඬුවම් ලබා දීමටත් යන්නේ නැතිව, අතරමැදි තැනකට ඒමේ අවශ්‍යතාව අනිවාර්යයෙන්ම අපට තිබෙනවා. වර්තමානයේදී පමණක් නොවෙයි, නිදහසින් පස්සේ සෑම යුගයකදීම මේ රටේ රාජ්‍ය දේපළ, රාජ්‍ය මුදල් වංචාවන් සහ

අක්‍රමිකතාවන් සිදු වුණා කියන එක අපි පිළිගත යුතුයි. අද මේ තත්ත්වය නිසාම රටේ සමස්ත ජනතාව තුළ දේශපාලනඥයන් කෙරෙහි විශ්වාසයක් නැහැ. පිළිකුල් සහගත විධියට තමයි රටේ ජනතාව දේශපාලනඥයන් දිහා බලන්නේ; ඔවුන්ව දකින්නේ. ජනතාව එසේ බැලුවාය කියලා අපි ජනතාවට දෝෂාරෝපණය කළ යුතු වන්නේ නැහැ. ජනතාව සාධාරණයි. මේ තත්ත්වය නිවැරැදි වීමට නම් අපට පැවරී තිබෙන වගකීම අපි නිසි පරිදි ඉටු කරලා, මේ රටේ ජනතාව තුළ දේශපාලනඥයන් කෙරෙහි ඇති වැරැදි ආකල්ප නිවැරැදි කළ යුතුයි. එලෙස කටයුතු කිරීම තමයි අද රටක් විධියට අවශ්‍ය වන්නේ කියා මම පෞද්ගලිකව හිතනවා.

අද දිනය පුරා පාර්ලිමේන්තුවේ පැවැත්වෙන විවාදයේදී විවිධාකාරයෙන් අදහස් සහ යෝජනා ඉදිරිපත් කරපු, ඉදිරියේදී තවදුරටත් අදහස් ලබා දීමට සිටින සියලුම මැති-ඇමතිවරුන්ට, මන්ත්‍රීතුමියන්ලාට අපි මේ අවස්ථාවේදී ස්තුතිය පුද කරන අතර, මා ඇතුළු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අපේ සියලුම සාමාජිකයන්ගේ ස්තුතියත් සමස්ත පාර්ලිමේන්තුව වෙනුවෙන් මම මේ අවස්ථාවේදී පුද කරනවා. මේ රටේ ජනතාවගේ මුදල් උපරිම ආකාරයෙන් රටේ ඉදිරි අනාගතය සඳහා යොදා ගැනීමට අපි සියලුදෙනාම ඒක රාශී වෙලා, එකතුවෙලා කටයුතු කරමු කියන ආරාධනයත් කරමින් මම නිහඬ වනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා.5.03]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා පිළිබඳ විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලබා දීම ගැන මම පළමුවෙන්ම ඔබතුමියට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම අපේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා කථා කළාට පසුව මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැනත් මම ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම එතුමාගේ කථාවේදී සඳහන් කළා, දේශපාලනඥයන් ගැනත්, දඬුවම් දීම පිළිබඳවත් එතුමාගේ මතය. එතුමා කිව්ව විධියට අපිත් දන්නවා, දේශපාලනඥයන් ගැන සමාජයේ තිබෙන බැල්ම මොකක්ද කියන වගත්, දේශපාලනඥයන් පිළිබඳව සමාජයේ එහෙම හොඳ මතයක් නැහැයි කියලාත්. දේශපාලනඥයන් ගැන සමාජයේ තිබෙන්නේ ඉතා භයානක වැරදි මතයක්. දේශපාලනඥයාගේ හැම දෙයක් පිළිබඳවම ජනතාව බලන්න පුරුදු වෙලා තිබෙන්නේ වපර ඇසින් කිව්වොත් එය ඉතාම නිවැරදියි. මම හිතනවා, ඒක මේ සමාජ අර්බුදය තුළ ඇති වෙච්ච දෙයක් කියලා. පසුගිය කාලය තුළ සිදු වුණු යම් යම් දේශපාලන සිද්ධීන් නිසා පොදුවේ හැම දේශපාලනඥයා ගැනම ජනතාවට තිබෙන විශ්වාසය අද ඉතා අඩු මට්ටමකයි තිබෙන්නේ. අපි දන්නවා, දේශපාලනඥයන් වංචා හා දූෂණවලට සම්බන්ධ වුණාම ඒවා ඉතා ඉක්මනින් ප්‍රසිද්ධ වෙනවා; මාධ්‍ය ඒ ගැන කථා කරනවා; මාධ්‍ය තුළ ඒවා පළ වෙනවා; විරුද්ධ පක්ෂයේ ඉන්න උදවිය ඒවා ගැන කථා කරනවා කියලා. දේශපාලන නායකයන් විසින් මුදල් සම්බන්ධ වංචා හෝ එහෙමත් නැත්නම් නොයෙකුත් වංචාවලට, දූෂණවලට සම්බන්ධ වුණාම ඒවා හෙළිදරව් වීමේ ක්‍රම තිබෙනවා. එක්කෝ විරුද්ධ පක්ෂයේ සිටින මන්ත්‍රීවරු ඒවා හොයාගෙන ඇවිල්ලා මේ සභාවට ඉදිරිපත් කරනවා.

අපි දන්නවා, මේ රටේ රාජ්‍ය යන්ත්‍රණය ගැන. රාජ්‍ය නිලධාරින් යම් යම් දූෂණවලට සම්බන්ධ වුණාම, යම් යම් දේවල් සඳහා රජයේ මුදල් අවභාවිත කළාම, එහෙම නැත්නම් නොයෙකුත් වංචාවලට සම්බන්ධ වුණාම ඒවා හෙළිදරව් වීමේ සම්භාවිතාව ඉතාම අඩු මට්ටමකයි තිබෙන්නේ. අපි සියලුදෙනාම විශ්වාස කරනවා, පොදුවේ හැම රාජ්‍ය නිලධාරියෙක්ම එහෙම නොවෙයි කියා. නමුත් රාජ්‍ය නිලධාරින් විශාල පිරිසක් සහ සමහර ආයතන ප්‍රධානීන් යම් යම් දේවල් අයුතු ලෙස උපයා ගැනීම්, වංචා දූෂණවලට සම්බන්ධවීම් අපි සියලුදෙනාම දැකලා තිබෙනවා. මොන ආණ්ඩුව තිබුණත්, කොයි ආණ්ඩු කාලයෙත් ඒවා තිබිලා තිබෙනවා. ආණ්ඩු මාරු වුණා කියලා ඒවා වෙනස් වෙන්නේ නැහැ. සමහර රාජ්‍ය නිලධාරින් ඒ අයගේ වංචා, දූෂණ එක්කෝ ඒ එන ඇමතිතුමාව අල්ලා ගෙන යටපත් කර ගන්නවා; එහෙම නැත්නම් ඊළඟ ආණ්ඩුව ආවාම ඒ ආණ්ඩුවේ ඉන්න ඇමතිතුමා අල්ලාගෙන ඒවා යටපත් කර ගන්නවා. ඒ වාගේ සිද්ධීන් රාශියක් අපි දැකලා තිබෙනවා. නමුත් දැන් තියෙන දේ තමයි එහෙම සම්බන්ධ වෙන රාජ්‍ය නිලධාරින්ව පරීක්ෂාවට ලක් කිරීම හා ඔවුන් පිළිබඳව තීන්දු ගන්නා වූ යන්ත්‍රණය කුමක්ද කියන එක. පාර්ලිමේන්තුව තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත්, ඒ වාගේම කෝප් කමිටුවත් කියන කාරක සභාවන් දෙකක් තිබෙනවා. රාජ්‍ය නිලධාරින්ගේ ක්‍රියාදාමය පිළිබඳව පරීක්ෂාවට ලක් කරන්න පුළුවන් ආයතන දෙකක් හැටියට මේ ආයතන අපට හඳුන්වන්න පුළුවන්. මේ ආයතන දෙක තුළින් විශාල සේවයක් වෙන බව අපි දන්නවා.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව රාජ්‍ය ආයතනවල, දෙපාර්තමේන්තුවල ගනුදෙනු හා සියලු දේවල් පරීක්ෂාවට ලක්කරන්න පුළුවන් ආයතනයක් හැටියට තිබෙනවා. ඒ වාගේම තමයි විගණකාධිපතිතුමාගේ වාර්තාවත්. විගණකාධිපතිතුමාගේ වාර්තාව තුළින් විගණකාධිපතිතුමා ඉදිරිපත් කරන දේවල් ගැන බැලුවොත්, ඒ වාර්තාවත් මේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව කරන කාර්යන් හා සමාන කාර්යයක් තමයි කරන්නේ. නමුත් අපි දකින දේ තමයි බොහෝ දුරට අපේ රටේ දැන් මේ දේවල් වාර්තාවලට පමණයි සීමා වෙන්නේ කියන කාරණය. විගණකාධිපතිතුමාගේ වාර්තාව අරගෙන බැලුවොත්, ඒ වාර්තාව තුළ එතුමා හඳුනාගත් දේවල්, නිර්දේශ කරපු දේවල් විශාල වශයෙන් තිබෙනවා. මම දැක්කා, ඊයෙත් එතුමාගේ කථාවකදී විශාල වංචාවක් ගැන එතුමා සඳහන් කළා. නමුත් අවාසනාවකට, වෙලා තිබෙන දේ තමයි මේවා වාර්තාවන්වලට පමණක් සීමාවීමේ හැකියාවක් සහ ඒවාට සවන්දීමේ හැකියාවක් විතරක් තිබීම. ඊට එහා මේ කටයුත්ත යන්නේ නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ගත්තත්, ඒක හරියට දත් නැති කටක් වාගේයි. මොකද, හපන්න බැහැ; හැපුවාට අහුවෙන්නේ නැහැ. මෙහිදී අපට කථා කරන්න පුළුවන්; රාජ්‍ය නිලධාරින් ගෙනැල්ලා ප්‍රශ්න කරන්න පුළුවන්; නිර්දේශ දෙන්න පුළුවන්. ඒ නිසා අපට හොඳයි. ඒ දේවල් ගැන සාකච්ඡා කර කර අපට ඉන්න පුළුවන්. නමුත් එහි දෙන අවසාන තීන්දුව, ඒ දෙන නිර්දේශ ක්‍රියාත්මක කරන පුද්ගලයා ඒක ක්‍රියාත්මක නො කළාම අපි ගන්නා තීන්දුව මොකක්ද කියන එක ගැන ගැටලුවක් තිබෙනවා. ඒ අනුව බලනකොට, රජයේ නිලධාරින් සම්බන්ධ වංචා, දූෂණ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම පැත්තෙන් අපි ඉතාම අවම මට්ටමකයි ඉන්නේ; අපි ඉතාම ප්‍රාථමික මට්ටමකයි ඉන්නේ. යහපාලන ආණ්ඩුව බලයට පත් වුණාම අපි රටක් හැටියට මේ වංචා, දූෂණවලට විරුද්ධව විශාල හඬක් නැඟුවා. ඒ හඬ නැඟුවේ, දේශපාලනඥයින්ට විරුද්ධව විතරක් නොවෙයි. වංචා, දූෂණ නැති කරනවාය කියලා අපි කිව්වේ, දේශපාලනඥයින් විසින් කරන ලද වංචා, දූෂණ පිළිබඳව විතරක්

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

නොවෙයි. මේ රටේ රාජ්‍ය තන්ත්‍රය තුළ ඉන්න යම් යම් ප්‍රබල නිලධාරින් හවුල් වුණු වංචා, දූෂණ නැවැත්වීමේ ක්‍රියාදාමයත් අපේ ඒ සටන් පාඨය තුළ තිබෙනවා. නමුත් ඒ ගැන දක්වන අවධානය, ඒ සම්බන්ධයෙන් ගන්නා වූ තීන්දු-තීරණ, ඒ සම්බන්ධයෙන් ගන්නා වූ නීතිමය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් බැලුවාම ඉතාම අවම, ප්‍රාථමික මට්ටමකයි අපි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, යහපාලන රජය හැටියට අපි මේ වංචා, දූෂණ අවම කර ගැනීම සඳහා යම් යම් තීන්දු-තීරණ අරගෙන තිබෙනවා. ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීම, කෝප් වාර්තාව හරහා යම් යම් නීතිමය ක්‍රියාමාර්ගවලට යාම වාගේ සාධනීය තීන්දු අරගෙන තිබෙනවා. නමුත් සමස්තයක් වශයෙන් ගත්තාම මේ රටේ සිදු වන වංචා, දූෂණ අවම කර ගැනීමට ඒ සාධනීය තීන්දු විතරක් ප්‍රමාණවත් වෙනවා කියලා මා හිතන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා දේශපාලනඥයින්ගේ වංචා, දූෂණ අවම කරන්න, නැති කරන්න කථා කරනවා වාගේම, ඒවාට විරුද්ධව පෙනී සිටිනවා වාගේම- රාජ්‍ය යන්ත්‍රණය තුළත් විශාල ලෙස මේ රටේ ජනතාවගේ මුදල් අවභාවිතා කරනවා; දූෂණයට ලක් වෙනවා.- ඒවා නැති කිරීම සඳහා නීතිමය පැත්තෙන් මීට වඩා යම් විශාල යන්ත්‍රණයක් අපට අවශ්‍ය වෙනවා. ඒක මේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව තුළ අපට පෙනෙනවා. අපට තව හුඟක් ඉස්සරහට යන්න තිබෙනවා. අපි තවම ප්‍රාථමික අවධියේ ඉන්නේ. ඒ ප්‍රාථමික අවධියේ ඉඳන් ඉස්සරහට යන්න නම්, පාර්ලිමේන්තුව හැටියට අපි මීට වඩා නීති-රීති ගෙනැල්ලා, රාජ්‍ය යන්ත්‍රණය තුළත් සිදු වන වංචා දූෂණ අවම කර ගන්න පුළුවන් තීන්දු තීරණ ගත යුතුයි කියන එක තමයි මාගේ අදහස. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා.5.11]

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමියනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව පිළිබඳ විවාදය පැවැත්වෙන මේ මොහොතේ ඒ පිළිබඳව අදහස් කිහිපයක් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා විධියට ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා එම කාරක සභාවේ ව්‍යුහය, ඉලක්ක සහ ක්‍රියාවලිය පිළිබඳව පැහැදිලි විස්තර කිරීම් ගණනාවක් සිද්ධ කළා. කොහොම වුණත්, පාර්ලිමේන්තුව විමර්ශනය කරන ලද වාර්තාවල අන්තර්ගතය පිළිබඳව තමයි අද දවසේ කථා කරන්නේ.

රටේ මූල්‍ය පාලනය පිළිබඳව වගකීම තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. ඒ නිසා තමයි රටේ ඉදිරි සංවර්ධන සැලැස්ම පිළිබඳව ඉදිරිපත් කරන යෝජනා සහ ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අය වැය ලේඛනය මඟින් මුදල් ප්‍රතිපාදන වෙන් කරන්නේ. විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු යටතේ ඒ මුදල් ප්‍රතිපාදන වෙන් කළාට පසු ඒ අවුරුද්ද තුළ රටේ සංවර්ධනය වෙනුවෙන් විශාල කාර්ය භාරයක් කළ යුතුව තිබෙනවා. ඒ අනුව රාජ්‍ය දෙපාර්තමේන්තු, ආයතන සියල්ල සූදානම් වෙනවා, අය වැයෙන් වෙන් කළ මුදල්වලින් රජය බලාපොරොත්තු වුණු ඉලක්ක කරා යන්න. එහිදී සිද්ධ වන යම් යම් අක්‍රමිකතා, මූල්‍ය අවභාවිත වීම්, මූල්‍ය විනය පිළිබඳව විමර්ශනය කරන්නේ පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවයි. එක පැත්තකින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත්, අනෙක් පැත්තෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත් මූල්‍ය සහ රාජ්‍ය ආයතන පිළිබඳව විමර්ශනය කරනවා. අද රටේ හැම අංශයකම ලොකු කඩා වැටීමක් තිබෙනවා අපි දකිනවා. සමාජමය වශයෙන්, සංස්කෘතිකමය වශයෙන්, ආර්ථිකමය වශයෙන් වාගේම රාජ්‍ය ආයතන වශයෙනුත් ලොකු කඩා වැටීමක් දකින්න ලැබෙනවා. ඒ නිසා රටක් විධියට අපි කොහේටද යන්නේ කියන කාරණය පිළිබඳව කල්පනා කරලා මේවා සියල්ලම විධිමත් කරගත යුතු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රාජ්‍ය ආදායම සමන්විත වන්නේ බදු ආදායමින් සහ බදු නොවන ආදායම්වලිනුයි. මේ වන කොට ජනතාවගෙන් එකතු කරන බදු ආදායම වැඩි වෙලා තිබෙනවා. 2015දී ඇමෙරිකානු ඩොලර් බිලියන 9,973ක් වූ බදු ආදායම 2017 වන කොට 10,955 දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ බදු ආදායම වැඩි වෙන්නේ ජනතාවගේ ආදායම වැඩි වෙලා නොවෙයි. රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා බදු එකතු කරනවා. අද වන විට මිනිසුන්ට දරන්න සිද්ධ වෙලා තිබෙන බදු ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මේ බදු ආදායම තමයි රාජ්‍ය ආදායමේ කොටසක් විධියට පොදු සංවර්ධන කටයුතු සඳහා රාජ්‍ය ආයතනවලට, දෙපාර්තමේන්තුවලට වෙන් කරන්නේ රජයේ ඉලක්ක කරා යන්න. එහිදී මෙවැනි අක්‍රමිකතා, දූෂණ සිද්ධ වනවා නම් ජනතාවගේ දහඩිය, මහන්සිය, කඳුළු තමයි මේ අක්‍රමිකතාවලට, දූෂණවලට, වංචාවලට ගොදුරු වන්නේ. ඒ නිසා රජයේ ගිණුම් කාරක සභාවට මේවා පිළිබඳව විමර්ශනය කිරීමේ බලය පමණක් දීලා මදි. මේවා පිළිබඳව සොයා බලා මේවා නිවැරදි කර ගන්නටත්, ඒ පිළිබඳව යම් දඬුවම් ලබා දීමටත් අවකාශයක් සැලසෙන්න ඕනෑයි කියලා අපි විශ්වාස කරනවා.

පසුගිය අවුරුද්දේ විතරක් රාජ්‍ය ආයතනවලින් ලැබූ පාඩුව රුපියල් බිලියන 50ක් කියලා අපේ ගරු කථානායකතුමා පසුගිය දවස්වල "චෝටර්ස් එජ්" හි පැවැති රැස්වීමකදී ප්‍රකාශ කර තිබෙනවා. මේ රටේ සංවර්ධන කටයුතුවලට, රජය පවත්වා ගෙන යන්න විදේශ ණය ගන්න අවශ්‍ය නැහැ. මේ විනාශ වන එහෙම නැත්නම් පාඩු ලබන රුපියල් බිලියන 50 කළමනාකරණය කර ගත්තොත්, ණය නොවී මේ සංවර්ධන කටයුතු කරගෙන යන්න, ජනතාවගේ සුභසාධන කටයුතු කරගෙන යන්න, මේ රජය පවත්වා ගෙන යන්න පුළුවන්කම ලැබෙනවා. ඊළඟට, රාජ්‍ය ආයතනවලින් මේ විධියට පාඩු ලබනවා නම්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්ය භාරය තිබෙන්නේ කොතැනද කියන එක ගැනත් අපට සිතා බලන්න වෙනවා. මොකද, සම්මුති ආණ්ඩුවක් විධියට මේ ආණ්ඩුව බලයට පත් වුණේත්, යහ පාලනය ඇති කරනවා කියලායි. "යහ පාලනය" කියන්නේ යහපත් පාලනයක් කියන එකයි. රටේ විනයක් වාගේම මූල්‍ය විනයක් තිබෙන්නට ඕනෑ. හොරකම, දූෂණය, වංචාව රාජ්‍ය ආයතනවලින් විතරක් නොවෙයි, සමාජයෙනුත් තුරන් කරන්න ඕනෑ. හැබැයි, අද වන විට මේ හැම දෙයක්ම වැඩි වන පැත්තටයි කටයුතු සිද්ධවෙලා තිබෙන්නේ. එක පැත්තකින් රජයේ ණය වැඩි වෙනවා; ජනතාවට ගහන බදු ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා; ජීවන වියදම වැඩි වෙලා තිබෙනවා; වංචාව, දූෂණය, අක්‍රමිකතා -මේ සියල්ලත්- වැඩි වෙලා තිබෙනවා.

දූෂිත බැඳුම්කර ගනු දෙනුව පිළිබඳව අද දවසේත් කථා වුණා. මේ ගැන කථා වීම පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. මේ මහ බැංකු

බැඳුම්කර ගනු දෙනුව මේ රටේ සිදු වුණු භයානකම, දැවැන්තම, බරපතළම මූල්‍ය අපරාධයක් විධියට සලකන්න පුළුවන්. ශ්‍රී ලංකා මහ බැංකුව අයිති ආර්ථික කටයුතු අමාත්‍යාංශය එවකට තිබුණේත් අගමැතිතුමා යටතේයි. ඒ නිසා අගමැතිතුමාටත් ඒ චෝදනාවෙන් ගැලවෙන්න බැහැ. එතුමා චෝදනාවෙන් නිදහස් වෙලාත් නැහැ. පසුගිය දවස්වල එතුමාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ඉදිරිපත් වුණාම එතුමා ඒක ජයග්‍රහණය කළා. නමුත්, මහ බැංකු බැඳුම්කර වංචාවෙන් විශාල මූල්‍ය පාඩුවක්, විශාල හානියක් සිදු වුණා, රටේ පොලී අනුපාතය වැඩි වුණා, ඒ වංචාව අවුරුදු 30ක් වාගේ කාලයක් ආර්ථිකයට බලපානවා, එම නිසා මේ වංචාව ආර්ථිකයට දරා ගන්න බැරි තත්ත්වයක්ය කියන එක මේ වනකොට සමාජගත වෙලා තිබෙනවා. එම නිසා අද දින ඉදිරිපත් කර තිබෙන සභාව කල් තැබීමේ යෝජනාව සමඟ සම්බන්ධ කරලා හෝ ඒ ගැන කථා කිරීම වැදගත් වනවා. මොකද, මේ කාරණය ජනතාවට අමතක නැති නිසා.

රාජ්‍ය ආයතනයක මූල්‍ය වංචාවක් සිද්ධ වුණොත්, ව්‍යවස්ථාපිත ආයතනයක ඒ වාගේ අක්‍රමිකතාවක් සිද්ධ වුණොත් COPE එක තුළ හෝ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළ හෝ ඒ කරුණ සාකච්ඡාවට ගත්තාම එය හෙළිදරව් වෙනවා. හැබැයි, දූෂිත බැඳුම්කර ගනුදෙනුවෙන් දේශපාලනඥයන් මුදල් ලබා ගත්තාය කියන කාරණය අද මාධ්‍යයට හොඳ මාතෘකාවක් වෙලා තිබෙනවා. අද මාධ්‍ය තලු මර මරා ඒ කාරණය ගැන ප්‍රවෘත්ති සපයනවා. ඒ නිසා අද ඒ කාරණය ජනමාධ්‍ය තුළ විශේෂ අවධානයට යොමු වෙලා තිබෙනවා. මෙහිදී මුදල් ගත්තේ කවුද, නොගත්තේ කවුද කියන එක ජනතාවටත් ප්‍රශ්නයක්. මුදල් ගත්තාය කියලා හතරදෙනෙක්, පස්දෙනෙක් පිළිගෙනත් තිබෙනවා. හැබැයි, මේ කාරණය විගණනය වෙන්නේ නැහැයි කිව්වාට, ජනතා අධිකරණයේදී විගණනය වෙන්න පුළුවන්. ඒක ඊ ළඟ මැතිවරණයේදීත් වෙන්න පුළුවන්. කොයි මොහොතක හරි මේ කාරණය විගණනය වනවා. නමුත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා සඳහන් කළේ රජයේ මේ ආයතනවලින් රජයට සිද්ධ වුණු පාඩු, ඒ විනාශය නැවත අය කර ගන්න බැහැයි කියලායි. ඒ අක්‍රමිකතාවලින් පාඩුවක් සිද්ධ වුණා නම්, ඒක දරා ගන්න වනවා කියලා කිව්වා. නමුත් ඒක එහෙම වෙන්න බැහැ. මේ විධියට ගියොත් රජයක් පවත්වාගෙන යන්න හම්බ වන්නේ නැහැ. අනාගතයේ බලයට එන රජයකටවත් ඒ රජය පවත්වා ගෙන යන්න බැරිවනවා. එම නිසා මේ මුදල් අය කර ගන්න ක්‍රමයක් සකස් කරන්න ඕනෑ. ඉදිරියේදී මේ ප්‍රශ්නවලට තිරසාර කල් පවත්නා විසඳුම් ලබා දෙන්න ඕනෑ නම්, මේ මුදල් අය කර ගන්න ක්‍රමයක්, මේ අලාභ අය කර ගන්න ක්‍රමයක් සහ මේ වැරදිවලට දඬුවම් ලබා දෙන ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුයි. අපි ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

"තානාපති කාර්යාල නඩත්තුවට 2017දී රුපියල් බිලියන 8.3ක් වැය වෙලා තිබෙනවා. හැබැයි, ඒකෙන් කාර්යක්ෂම ප්‍රතිඵල ලැබිලා නැහැ" යි කියලා විගණකාධිපතිතුමා සඳහන් කළ කාරණයක් "අද" පත්තරයේ සිරස්තලය විධියට අද පළ කර තිබෙනවා. එහෙම කියන්නේ අපි නොවෙයි, රජයේ විගණකාධිපතිතුමා. ඒ කියන්නේ අපේ තානාපති සේවය අකාර්යක්ෂම වෙලා තිබෙනවාය කියන එකයි. ඒ සඳහා වෙන් කරන මුදල්වලින් කිසි ප්‍රයෝජනයක් ලැබිලා නැහැ. ලංකාවේ අය විදේශ රටවල පදිංචි වෙලා ඉන්නවා. එක්කෝ ඒ අයට සේවයක් වන්න ඕනෑ. එහෙම නැත්නම් රටේ කීර්තිය වෙනුවෙන්, සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් ඒ තානාපති සේවයෙන් ඵලදායී යමක් වෙලා නැහැයි කියලා විගණකාධිපතිතුමා කියනවා. රුපියල් බිලියන 8.3ක් කියන්නේ විශාල මුදලක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අය වැයෙන් රාජ්‍ය ආයතනවලට වෙන් කරන සියලු මුදල් වර්ෂය අවසාන වනකොට වියදම් කරන්නේ නැහැ. ඒකත් විගණනයට ලක් වෙන්න ඕනෑ දෙයක්. අය වැයකින් මුදල් වෙන් කරන්නේ රටේ සංවර්ධනය වෙනුවෙන්, ඒ ආයතනවල දියුණුව වෙනුවෙන්. අවසානයේ ඒ මුදල් ටික වැය වන්න ඕනෑ මහ ජනතාවගේ දියුණුවට. ඒ මුදල අවුරුද්ද අවසන් වනකොට වියදම් වුණේ නැත්නම් එතැනත් ගැටලුවක් තිබෙනවා. එහෙම කියන්නේ අපි නොවෙයි, විගණකාධිපතිතුමා. මම දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාවේදී මා තවත් කාරණයක් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරන්න කැමැතියි.

පාර්ලිමේන්තුවේ හැන්සාඩ් දෙපාර්තමේන්තුවේ සංස්කාරකතුමිය හැටියට කටයුතු කළ රංජනී ජයමාන්න මෙනෙවිය අවුරුදු 35ක සේවයකින් පසු අද දවසේ විශ්‍රාම යනවා. එතුමිය මේ පාර්ලිමේන්තුව වෙනුවෙන්, ඒ වාගේම හැන්සාඩ් සංස්කරණය වෙනුවෙන් විශාල කාර්යභාරයක් කළා. අද දින විශ්‍රාම යන එතුමියගේ විශ්‍රාම ජීවිතය නිරෝගිමත්, සැපවත් ජීවිතයක් බවට පත් වන්නට අපි සුබ පතනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වන අප සියලුදෙනාම මේ කාලය තුළ එතුමිය කරපු සේවය ඇගැයීමකට ලක් කරනවාය කියන කාරණයත් ඇයට ගෞරවයක් වශයෙන් මා මේ මොහොතේ සිහිපත් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මී ළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි, 15ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.22]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රටක මූල්‍ය බලය සහ මූල්‍ය වගකීම පැවරෙන්නේ පාර්ලිමේන්තුවට. ඒ කාරණය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම තේරුම් ගත් ජනතා විමුක්ති පෙරමුණේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කළ විගණන වාර්තා විවාදයට ගන්න කටයුතු කිරීම සඳහා ගෙන එන ලද සභාව කල් තැබීමේ යෝජනාව ඉතාම ප්‍රශංසනීයයි කියන එක මා මේ මොහොතේ සඳහන් කරන්න ඕනෑ. ආයතන 837ක් සම්බන්ධයෙන් විගණන වාර්තා 4ක් සහ අතුරු වාර්තාවක් ඉදිරිපත් කිරීමට සමත් වීම ප්‍රශංසනීය කටයුත්තක්ය කියලා අපි විශ්වාස කරනවා. මෙන්න මේ කාරණයේදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වර්තමාන සභාපතිවරයා සුවිශේෂී වග කීමක් ඉෂ්ට කරනු ලැබුවා. මෙහිදී එතුමාගේ මැදිහත්වීම ඉතාම ප්‍රශංසනීයයි.

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

ඒ වාගේම, විගණකාධිපතිතුමා, නියෝජ්‍ය විගණකාධිපතිවරුන් සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරින්ගේ මැදිහත්වීමත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිලධාරින් ඇතුළු කාර්ය මණ්ඩලයේත්, හැන්සාඩ් දෙපාර්තමේන්තුවේ සොයුරු සොයුරියන්ගේත් මැදිහත්වීමත් ඉතාම ප්‍රශංසනීයයි. මේ අයගේ සාමූහික වගකීමේ ප්‍රතිඵලයක් විධියට තමයි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා ඇතුළු අපි කාටත් පුළුවන් වුණේ මේ වාගේ විධිමත් වාර්තාවක් ඉදිරිපත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මම මේ මොහොතේ විශේෂ කරුණක් සඳහන් කරන්න කැමතියි. පාර්ලිමේන්තුවේ හැන්සාඩ් දෙපාර්තමේන්තුවට වසර 35ක් තිස්සේ ඉතාම විශිෂ්ට සේවයක් කරපු, හැන්සාඩ් සංස්කාරක රංජනී ජයමාන්න සොයුරිය අද විශ්‍රාම යනවා. මා ඇයගේ විශ්‍රාම දිවියට සුබ පතනවා. ඒ වාගේම, ඇයට සියවසක් ජීවත්වීමට හැකියාව ලැබේවායි කියලා ආශිර්වාද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වාර්තා සම්බන්ධයෙන් මුද්‍රිත මාධ්‍යවලට සහ විද්‍යුත් මාධ්‍යවලට විගණකාධිපතිතුමා විවෘත ප්‍රකාශයක් කරනු ලැබුවා, හිටපු ජනාධිපතිවරයාගේ ලේකම්වරයා විසින් මහජන මුදල් අවභාවිත කළ සිද්ධියක් සම්බන්ධයෙන්. ඔහු කිව්වා, ඒ වාගේ කටයුතුවලට මැදිහත් වූ අයට මේ විධියට දඬුවම් දුන්නොත් නිලධාරින් බහුතරයකට දඬුවම් විඳින්න සිද්ධ වෙනවා කියලා. එතුමා කොන්ද කෙළින් තියාගෙන, කිසිම බලපෑමකින් තොරව, ඍජුව මැදිහත්වෙලා ඒ ප්‍රකාශය කරනු ලැබුවා. මට මතකයි, ඒ ප්‍රකාශය කළාට පස්සේ මේ ඊනියා යහ පාලන ආණ්ඩුවේ ඇතැම් මැති ඇමතිවරු සහ සභානායකවරයා ඒ ප්‍රකාශය අභියෝගයට ලක් කළා, "එවැනි ප්‍රකාශයක් කරන්න ඔහුට කිසිම අයිතියක් නැහැ" කියලා. නමුත් විගණකාධිපතිවරයා මහජනතාවගෙන් පඩි ලබන කෙනකු විධියට කොන්ද කෙළින් තියාගෙන ඍජුව සිටියා මිස, මොනම ආකාරයකින්වත් එම අදහස -ප්‍රකාශය- ඉවත් කර ගැනීමට කටයුතු කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් නිරීක්ෂණය කරපු අවස්ථාවලදී අපි දැක්කා, රජයේ දෙපාර්තමේන්තුවල පුරප්පාඩු රාශියක් තිබෙන බව. ඒ නිසා අපි ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන්, අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් නිරන්තරයෙන්ම අසනු ලැබුවා, "මෙවැනි විගණන වාර්තා හැදීමේ දී යම් යම් අක්‍රමිකතා සිදු වෙන්නේ කාර්ය මණ්ඩලයේ - මානව සම්පතේ - යම් ආකාරයක අඩුවක් නිසා ද" කියලා. ඔවුන් කිව්වා, "ඒකත් යම් කිසි ආකාරයක ගැටලුවක් තමයි" කියලා. දළ වශයෙන් ගත්තාම අද වන විට උපාධිධාරින් 60,000කට වැඩි පිරිසක් විශ්ව විද්‍යාලවලින් පිටවෙලා ඉන්නවා. මේ ඊනියා යහ පාලන ආණ්ඩුවේ අගමැතිවරයා කිව්වා, රැකියා ලක්ෂ 10ක් සපයනවා කියලා. ඒ රැකියා ලක්ෂ 10 මෙම උපාධිධාරින්ට ලබා දීලා ඒ අයගෙන් අවශ්‍ය වැඩ කටයුතු කර ගන්නවා නම්, මේ දෙපාර්තමේන්තුවල තිබෙන විගණන ගැටලු යම්තාක් දුරකට අවම කර ගන්න පුළුවන්කම තිබෙනවාය කියලා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිව්වන වාර්තාවේ සඳහන් කරුණු කෙරෙහි මම ඔබතුමියගේ අවධානය යොමු කරවනවා. අපි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට 2014 මැයි 04 වන දා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය කැඳෙව්වා. විගණකාධිපතිතුමා නිරීක්ෂණය 107වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

මච් යාත්‍රා 02ක් මිලදී ගැනීම සඳහා 2007 වර්ෂයේ සිංගප්පූරු සමාගමක් සමඟ එළඹ තිබූ ගිවිසුමකට අනුව අත්තිකාරම් ගෙවා දින 280ක් තුළ කොන්ත්‍රාත්කරු විසින් යාත්‍රා නිෂ්පාදනය කර භාර දිය යුතු වූ අතර මේ සඳහා රු.148,8000,000/-ක මුදල් ප්‍රතිපාදන වෙන් කර 2015 දෙසැම්බර් වන විට රු.113,556,801/-ක් වැය කර තිබුණද, මච් යාත්‍රා මිලට ගෙන නොතිබීම.

මච් යාත්‍රා මිලදී ගැනීම "මහින්ද චින්තන" වැඩ සටහන යටතේ ඇතුළත් කර තිබූ වැඩ සටහනක් වන අතර, ඒ සඳහා කැබිනට් අනුමැතිය 2007 වසරේදී ලැබී තිබූ බවත්, ඒ අනුව මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ද ලැබී තිබුණු බවත්, ඒ සඳහා වූ ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 326ක් බවත්, එම ප්‍රතිපාදනවලින් මිලියන 113ක් වැය කර ඇතත්, මච් යාත්‍රා දෙක ලැබී නොමැති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. බැංකු ඇපකරයක් නොමැතිව අත්තිකාරම් මුදලක් ලෙස රුපියල් මිලියන 65ක් ගෙවා ඇති බව හෙළිදරව් වන බවත්, මෙම ගනුදෙනුවට අදාළ ටෙන්ඩර් පරිපාටිය වැනි තොරතුරු ඇතුළත් ලිපි ගොනු අස්ථානගත වී ඇති බවත් ප්‍ර.ග.නි පැවසීය."

චින්තන සභාපතිතුමන්ලාගේ කාලයේ ඉතාමත්ම ප්‍රශංසනීය ආකාරයෙන් ඒ විගණන කටයුතු සිද්ධ වෙලා තිබෙන බව අද අපට පෙනෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 109වැනි පිටුවේ මෙන්න මේ ආකාරයට සඳහන්ව තිබෙනවා:

"දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීම සඳහා වෙන් කළ මුදලින් ඊට අයත් නොවූ සී/ස සීනෝර් පදනමට අයත් මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගණය අලුත්වැඩියා කිරීමට වැය කළ රුපියල් මිලියන 106ක මුදල ආපසු අය කර ගැනීමට හෝ එහි ප්‍රතිලාභ ධීවරයන්ට ලැබෙන පරිදි යෝජනා ක්‍රමයක් සැකසීමටත්, ඒ පිළිබඳව කාරක සභාවට වාර්තා කිරීමටත් පූර්ව කාරක සභාවේ දී ප්‍ර.ග.නි වෙත උපදෙස් ලබා දී තිබූ අතර, ධීවරයන්ට ප්‍රතිලාභ ලැබෙන අන්දමේ සහනදායි මිලකට යාත්‍රා අලුත්වැඩියා කර ගැනීමේ යෝජනා ක්‍රමයක් සකස් කර නොතිබීම හා 2016 දෙසැම්බර් මස 31 දිනට එම බෝට්ටු අංගණය වෙනුවෙන් වැය කළ මුදල රුපියල් 225,000,000/-ක් වීම."

කල්පනා කරලා බලන්න. මෙන්න මෙහෙම තමයි චින්තන සභාපතිතුමන්ලාගේ කාලයේ විගණන කටයුතු සිද්ධ වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 110වැනි පිටුවේ මෙන්න මේ ආකාරයට සඳහන්ව තිබෙනවා:

"දික්ඕවිට ධීවර වරාය විවෘත කිරීමේ උත්සවයේ මුළු වියදම රුපියල් 26,889,165/-ක් වූ අතර, උත්සව ශාලාව ඉදිකිරීම් හා සැරසිලි කිරීම පෞද්ගලික ආයතනයකට පවරා තිබුණි. ඒ සඳහා අනුමත මුදල හා එකඟ වූ මුදල ඉක්මවා රුපියල් 1,898,950/-ක් ගෙවා තිබුණි. සමරු ඵලකය ඉදිකිරීම සඳහා සැපයුම්කරු රුපියල් 650,000/-ක වියදමක් දක්වා තිබූ අතර, ප්‍රසම්පාදන කමිටුව විසින් ඊට අමතර ගාස්තු ලෙස රුපියල් 350,000/-ක් එකතු කර රුපියල් ලක්ෂ 1,000,000/-ක් අනුමත කර ගෙවීම් කර තිබීම."

මෙන්න මේ ආකාරයෙන් තමයි පසුගිය කාලයේ කටයුතු සිද්ධ වෙලා තිබෙන්නේ. මේ මහජන මුදල්. මේ මහජන මුදල්වලට ආගිය අතක් නැහැ; අදටත් ඒ මුදල්වලට වෙච්ච දෙයක් නැහැ. මේවාට වග කිවයුතු නිලධාරින් සියලු දෙනාම නිවිහැනහිල්ලේ සුවසේ කාලය ගත කරනවා. ඒවාට එදා හිටපු දේශපාලනඥයන් වග කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 110වැනි පිටුවේ තවදුරටත් මෙන්න මේ ආකාරයට සඳහන්ව තිබෙනවා:

"2015 වර්ෂය අවසාන වන විට නිම කළ යුතුව තිබූ කයිකාවල නැංගුරම්පළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 84.84ක් වැය කර තිබුණි. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය නතර කර දමා තිබූ බව ද, ව්‍යාපෘතිය නතර කර තිබුණ ද, උපදේශන ගාස්තුවෙන් සියයට 62ක් එනම්, රුපියල් 4,379,531/-ක් උපදේශක ආයතනයකට ගෙවා තිබීම."

නමුත්, තවමත් දික්ඕවිට ධීවර වරාය කුමන ආකාරයකින්වත් ගල් කැල්ලක්වත් තියලා හදලා නැහැ. ඒ නිසා මේ වාගේ දැවැන්ත

මුදල් අවභාවිතාවන් තමයි පසුගිය කාලයේ සිද්ධ වෙලා තිබෙන්නේ. අපට ඒක නිරීක්ෂණය වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. 110වැනි පිටුවේ තවදුරටත් මේ ආකාරයට සඳහන්ව තිබෙනවා:

"පානදුර ධීවර වරායේ මෝයකට වැලි ඉවත් කිරීම සඳහා ධීවර වරාය නීතිගත සංස්ථාවට ලබා දී තිබූ රුපියල් මිලියන 20ක අත්තිකාරම වර්ෂ 10ක් තුළ අදාළ වැලි අලෙවියෙන් පියවිය යුතු වුවද, ඒනල් සටහන් මඟින් වැය ශීර්ෂයට හර කර පියවා තිබීම. මහා භාණ්ඩාගාර උපදෙස් මත එසේ කළ බව ප්‍ර.ග.නි./ග.නි. පැවසූ නමුත්, මහා භාණ්ඩාගාරයට කරුණු වැරදි ලෙස දැක්වීම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළේය."

කල්පනා කරලා බලන්න. කෝටි ගණනක් මුදල් වියදම් කරලා මෝය කට වැලි ඉවත් කරන්න සූදානම් වුණා. නමුත්, එක වැලි කැටයක්වත් ඉවත් කළේ නැහැ. වැලි ඉවත් කරන්න ගත්ත මුදල්වලට මොනවා වුණා ද කියලා අදටත් සොයා ගන්න නැහැ. වැලි ඉවත් කරන්න භාණ්ඩාගාරයෙන් ආපු මුදල් වියදම් කළා, වැලි විකුණලා ගත්තු සල්ලිවලට වුණු දෙයක් අද වෙනතුරුත් දැනගන්නට ලැබිලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්රීතුමියනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිව්වන වාර්තාවේ - 2017.01.24 සිට 2017.05.24 දක්වා - සමාජ සවිබලගැන්වීම් හා සමාජ සුභසාධන අමාත්‍යාංශය 2017 මාර්තු 07 වෙනි දා පරීක්ෂණයට කැඳවූ අවස්ථාවේ දී නිරීක්ෂණය වූ කරුණු මම ඔබතුමියගේ අවධානයට යොමු කරන්නම්. එම වාර්තාවේ 40වෙනි පිටුවේ 5වෙනි කාරණය ලෙස මෙසේ සඳහන් වෙනවා:

"2015 අයවැය යෝජනා යටතේ අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ලබා දෙන රු. 2000/= ක මාසික දීමනාවෙන් රු. 100 ක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුමකට බැර කර තිබුණද මෙම මුදල කිසිදු සුබසාධන කටයුත්තක් සඳහා යොදවා නොතිබුනි. 2016 දෙසැම්බර් 31 දින දක්වා ලැබුනු රු. 389,000,000 ක්ද ඉන් පසුව ලැබුණු රු. 54,445,900 ක්ද ලෙස මුළු එකතුව වූ රු. 443,445,900ක් නිශ්කාර්යව පැවතීම."

කල්පනා කරලා බලන්න. තවදුරටත් එහි මෙසේ සඳහන් වෙනවා:

"අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන මෙම අරමුදල පිහිටුවා ඇති බවත් වැඩිහිටි සුබසාධනය සඳහා භාර අරමුදලක් ලෙස ලියාපදිංචි කිරීමට අවශ්‍ය කෙටුම්පත් සකස් කර ඇති බවත් එමගින් එම අරමුණු වලට අනුව වියදම් කිරීමට බලාපොරොත්තු වන බවත් ප්ර.ග.නි. පැවසීය"

පල් පට්ට බොරු. තවමත් මේ සම්බන්ධයෙන් කිසිමාකාරයක සිදු වීමක් වෙලා නැහැ. මේ වැඩිහිටි ජනතාව මේ රටට සේවය කළ, ඉතාමත්ම විශිෂ්ට පුරවැසියන් කොටසක්. මේ මුදල කපා ගන්නේ නැතිව ඒ අයට ලබා දුන්නොත් ඒ මිනිසුන්ට මහත් සහනයක් ඇති වෙනවා. ඒ දේවත් එවකට සිටි ඇමතිවරයා විසින් කළේ නැහැ. එම නිසා මේවාට අනිවාර්යයෙන්ම දඬුවම් ලබා දිය යුතුයි කියන එකයි අපි විශ්වාස කරන්නේ. අපේ සභාපතිතුමා කිව්වා, දඬුවම් ලබා දීම සම්බන්ධයෙන් එතුමාගේ කැමැත්තක් නැහැයි කියලා. මම කියනවා ඒක වැරැදියි, ඒක එතුමාගේ අදහස වෙන්නට පුළුවන්. අඩුම තරමින් මේ අපරාධවලට යම්කිසි ආකාරයක හෝ දඬුවමක් ලබා දුන්නොත් මේ අපරාධ සියයට 100ක් නැති වුණත් අවම වශයෙන් යම් ප්රමාණයකින් අඩු වෙනවා කියන එක අපි විශ්වාස කරනවා. එම නිසා මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම දඬුවම් ලබා දිය යුතුයි කියලා අප විශ්වාස කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
අවසාන වශයෙන් ඔබතුමියගේ අවධානයට මා තව එක කාරණයක් යොමු කරවනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිව්වන වාර්තාවේ 69වෙනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

" නීත්‍යානුකූල බලතල නොමැතිව පළාත් ආණ්ඩුකාරවරයා විසින් උපදේශකවරුන් 7 දෙනෙකු පත්කර තිබීම.

ප්‍රධාන අමාත්‍යවරයාගේ ඉල්ලීම මත ආණ්ඩුකාරවරයා විසින් අදාළ පත්වීම් සිදුකර පරිශ්‍රමික හා දීමනා තීරණය කර ඇති අතර පළාත් සභාවලට උපදේශකවරුන් පත්කිරීම සඳහා

අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලැබී නොමැති බැවින් මෙම පත් කිරීම් නීත්‍යානුකූල නොවන බව ආණ්ඩුකාරවරයා සහ මහ ඇමතිවරයා වෙත ලිඛිතව දැන්වීමෙන් පසු 2016.12.08 දිනැති ලිපියක් මගින් උක්ත පත්වීම් අවලංගු කිරීමට කටයුතු කර ඇතත් 2016.12.18 දිනැති ලිපිය මගින් එම තනතුරු යළි බලාත්මක කිරීමට කටයුතු කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය....."

ඒ වාගේම තවදුරටත් මෙහෙම කියනවා;

"ආණ්ඩුකාරවරයා සමග සාකච්ඡා කර මේ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව 2017 අප්‍රේල් 10 දිනට පෙර කාරක සභාවට වාර්තා කරන ලෙස නියෝග කළේය."

නමුත් අද වෙනතුරුත් මේකට උත්තර ලැබිලා නැහැ. මේ මහ ඇමතිවරයා මහජන මුදල් මේ විධියට කොල්ල කෑවේ, පිල්ලි ගැහුවේ වරක් දෙවරක් නොවෙයි. ජනාධිපතිවරයාගේ පවා නියෝගවලට පටහැනිව කථා කරන මෙවැනි ජාති භ්‍රෂ්ටයන් අනිවාර්යයෙන්ම දඬුවමට ලක් කළ යුතුයි කියන එක අපි විශ්වාස කරනවා. එම නිසා මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කිරීමට අපි වැඩි වැඩියෙන් මැදිහත් වෙන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க)
(The Hon. A. A. Wijethunga)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***අනතුරුව ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்படி, மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

[අ.භා.5.36]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත්ම වැදගත් කාරණාවක් පිළිබඳවයි අද සාකච්ඡා වෙන්නේ. මේ කාරණය ගැන අද දින සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වසර 94ක ඉතිහාසයක් තුළ වඩාත්ම සක්‍රිය සේවයක් කළ අපේ ලසන්ත අලගියවන්න සභාපතිතුමා ප්‍රමුඛ ඒ කාරක සභාවේ සියලුම නිලධාරින්ට, සභික මන්ත්‍රීවරුන්ට අපි විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. මේ හැම දෙයක් ගැනම විශේෂ අවධානයක් යොමු කරලා, පළමු වරට මේ විධියට වාර්තා ගණනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව අපි ඒ සියලුදෙනාටම බෙහෙවින් ස්තුතිවන්ත විය යුතුයි. පසුගිය කාලපරිච්ඡේදය තුළ අපි මේ රටේ නීති, ප්‍රතිපත්ති රාශියක් සකස් කළා. මේ රටේ විනිවිදභාවය ඇති වෙන්න අවශ්‍ය කරන සියලුම කටයුතු කළා. මේ ආණ්ඩුව ආවාට පසුව අන්ධකාරයෙන් ආලෝකයට පැමිණෙන්නට අවශ්‍ය සියලුම කටයුතු අපි කළා. අන්ධකාරයේදී නොදැකපු බොහෝ භයානක දේවල්, අන්ධකාරයේ සිදුවුණු බොහෝ භයානක දේවල් ආලෝකය මතු වුණාට පස්සේ පෙනෙන්න පටන් ගත්තා. මේ අලුත් පරිවර්තනය නිසා ආලෝකයේදී පුංචි දෙයක් වුණත් දකින්න පටන් ගන්නකොට මේ සමාජය තුළ විශාල ආන්දෝලනයක් ඇති වුණා. මහා අන්ධකාරයේ කළ දැවැන්ත තක්කඩිකම්, හොරකම්, දූෂණ, මැරකම් ආදී සියල්ල අලෝකය ලැබුණාට පසුව කරන්න හදනකොට පුංචි දෙයක් හෝ දැක්කත් මහා ආන්දෝලනයක් ඇති වෙන්න පටන් ගත්තා. ඒ නිසා තමයි, අන්ධකාරයේ සිටි මහා චෞරයන් - හොරුන් - තක්කඩින් අද හරිම සුද්ධවන්තයන් වාගේ මේ විධියට චෝදනා කරන්නේ. අද කථිකයන් රාශියක් සුද්ධවන්තයෝ, සුද්ධෝදනලා වාගේ කථා කළ හැටි අපි දැක්කා.

මේ මාතෘකාව පිළිබඳව කථා කරනකොට මට මේ කාරණය කියන්න වෙනවා. ආයතනවලට ප්‍රශ්නාවලියක් යවන එකක් ගැන ලසන්ත අලගියවන්න මැතිතුමා ප්‍රකාශ කළා. ඒ පිළිබඳව මට පුංචි ගැටලුවක් මතු වුණා. ආයතනයක කාර්යක්ෂමතාව පිළිබඳව විමසලා ප්‍රශ්නාවලියක් යවනකොට, ඒ ප්‍රශ්නාවලියට උත්තර සපයන්නේත් ඒ ආයතනය විසිනුයි. ස්ථානීය පරීක්ෂණයක් කරන්න ගියාම, ඒ ස්ථානීය පරීක්ෂණයට සහාය දෙන්නේත් ඒ ආයතනය විසිනුයි. එතකොට, නඩුත් හාමුදුරුවන්ගේ; බඩුත් හාමුදුරුවන්ගේ; උත්තර දෙන්නේත් හාමුදුරුවෝ. හොරාගේ අම්මාගෙන් තමයි පේනය අහන්නේ. එම නිසා තොරතුරු ලබා ගැනීමේ මේ ක්‍රමවේදය සියයට 100ක්ම සාර්ථකද කියන ගැටලුව මට මතු වුණා. මේ හැම කටයුත්තක්ම කඩිනමින් කිරීම ඉතාම හොඳයි; මාස දෙකක්, තුනක් ඇතුළත කරනවා නම් හොඳයි. පසුගිය කාලයේ වාගේ අවුරුදු 10ක්, 15ක් කල් ගිය පරීක්ෂණ නැවත කරන්න යනකොට, ඒවායේ තිබෙන කාලීන වැදගත්කම කියන එක නැතිව යනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට හපන්න පුළුවන් වුණාට, දත් නැහැය කියා ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් බොහොම උජාරුවෙන් කියනවා මම අහගෙන හිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේට දැන ගන්නයි මේ කාරණය කියන්නේ. මේ කාලයේ නම්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට දත් නැහැ. හැබැයි, පසුගිය කාලයේ දත් නොවෙයි, තොල් තිබුණේත් නැහැ. සමහර වෙලාවට දිවක් තිබුණේත් නැහැ. එහෙම තිබුණු කාලයක් පසු කරගෙන තමයි අද මේ තත්ත්වයට ඇවිත් තිබෙන්නේ. අපි ඒ ගැන සන්තෝෂ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් හපන්න හෝ පුළුවන්කමක් තිබෙනවා. දත් ටික එන කල් ඉවසන්න. දැන් දත් එන්න පුපුරාගෙනයි එන්නේ. දත් ටික එනතුරු ඉවසන්න කියන එක මම මේ අවස්ථාවේදී කියනවා.

මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා අර හැම දාම පට්ටා ගහන බැඳුම්කරය පිළිබඳව පුදුමාකාර සුද්ධවන්තයෙක් විධියට බොහොම උජාරුවෙන් කථා කළ ආකාරය අපි දැක්කා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ -2011 වසරේ- රුපියල් මිලියන 112ක් වැය කර සුගතදාස ක්‍රීඩාංගණයේ ඉදිකළ ධාවන පථය මාස දෙකක් ඇතුළත විනාශ වීම පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිව්වන වාර්තාවේ 114වැනි පිටුවේ සඳහන් වී තිබෙනවා. රුපියල් මිලියන 112ක් වැය කරලා ක්‍රීඩාංගණයේ ඉදිකළ ධාවන පථය මාස දෙකක් ඇතුළත ධාවනයට නුසුදුසු එකක් බවට පත් වුණු එක පිළිබඳව විමර්ශනය කළ වාර්තාව තිබෙනවා. "සීමාසහිත ගහකොළ එන්ටප්‍රයිසස්" කියන ආයතනයෙන් තමයි මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ කාලයේ ඒ ඉදිකිරීම් කර තිබෙන්නේ. මේ "ගහකොළ එන්ටප්‍රයිසස්" කියන නම හදිසියේ හදා ගත් නමක්ද, පාරේ එන ගමන් හදිසියේ මතක් වූ නමක්ද කියා අපි දන්නේ නැහැ. රුපියල් මිලියන 112ක් වැය කරලා තමයි ඒ ඉදිකිරීම් කටයුත්ත කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් කියන්න ඕනෑ කරුණක් තිබෙනවා. අද දවසේ පාර්ලිමේන්තුවට එනකොට පැය එකහමාරක්, දෙකක් පමණ අපට මහ පාරේ රස්තියාදු වෙන්න සිද්ධ වුණා. සරසවි ශිෂ්‍යයන් මහ සොහොන් බලකාය වාගේ කටයුතු කරමින්, තමන්ට ලැබී තිබෙන අයිතීන් උල්ලංඝනය කරමින් සාමාන්‍ය ජනතාවට, පාසල් ශිෂ්‍යයන්ට, අසරණ රෝගින්ට සාමාන්‍ය පාරවල, මහා මාර්ගවල යන්න තිබෙන අවස්ථාව අද උල්ලංඝනය කරනවා. ඒ ගැන කියන්න ඔබතුමා මට විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට මෙය කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක එදා

කළා නම් මොකද වෙන්නේ? මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව තිබෙන කොට අධ්‍යාපනය වෙනුවෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කරන්නය කියා සරසවි ශිෂ්‍යයන් උද්ඝෝෂණය කරද්දී, ගම්පහ ප්‍රදේශයේදී සරසවි ශිෂ්‍යයන් දෙදෙනකු මැරුණා. මේ උද්ඝෝෂණය එදා කළා නම් එහෙම තත්ත්වයක් තමයි ඇති වන්න ඉඩ තිබුණේ. ඒ එක්කම, මම තවත් කාරණයක් කියන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගලගොඩඅත්තේ ඥානසාර හාමුදුරුවන්ගේ සිද්ධිය සම්බන්ධයෙනුත් අපි මේ දවස්වල බැණුම් අහනවා. ගලගොඩඅත්තේ ඥානසාර ස්වාමීන් වහන්සේ පිළිබඳ නඩුව ඇහුවේ සිරිකොත පක්ෂ මූලස්ථානයේද කියා මා අහන්න කැමැතියි. එහෙ නොවෙයි ඒ නඩුව ඇහුවේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රටේ අධිකරණ ක්‍රියාදාමය තුළ, අධිකරණයක් ඉදිරියේ තමයි නඩුව ඇහුවේ. හැබැයි එක්තරා අවස්ථාවක "දෙරණ" නාලිකාවේ අංශක 360 දේශපාලන වැඩසටහනේදී ගලගොඩඅත්තේ හාමුදුරුවන් වහන්සේම පිළිගත්තා, බීමත්ව රිය පැදවීමද ඇතුළුව වැරදි 11ක් සමඟ පොලීසියට හසු වූ බව. උන් වහන්සේ බොහොම බය පක්ෂපාතව තමන්ගේ වැරැද්ද පිළිගත්තා මට මතකයි.

පසුගිය ආණ්ඩුව කාලයේ මොරටුවේ හිටපු නියෝජ්‍ය නගරාධිපති ස්වාමීන් වහන්සේලා දෙදෙනකු ඝාතනය කළා. සරත් ෆොන්සේකා මැතිතුමා අත් අඩංගුවට ගත් වෙලාවේ එතුමා නිදහස් කරන්නය කියා මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ කියද්දී මොකද වුණේ? මාදුළුවාවේ සෝභිත ස්වාමීන් වහන්සේ එළියට බහිද්දිම ආපු ලොරියකින් උන් වහන්සේ හප්පා දැම්මා. ඒ කාලයේ සිටි පාලකයෝ ඊට පසුව තර්ජනය කළා, "අධිෂ්ඨාන පූජාව පැවැත්වුවොත් මල්වතු පාර්ශ්වය දෙකට කඩනවා" කියා. ඒ වාගේම, ඒ කාලයේ දළදා මාලිගාව ඉස්සරහා race පැවැත්වූවා. මා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, ගලගොඩඅත්තේ ඥානසාර හාමුදුරුවන්ගේ නඩුව ඇහුවේ සිරිකොත පක්ෂ මූලස්ථානයේ නොවන බව. උත්තරීතර අධිකරණය තුළ තමයි ඒ නඩුව ඇහුවේ. එය පක්ෂයකින් කළ දෙයක් නොවෙයි. එය මහා සංඝ රත්නයට එරෙහිව අප කරන දෙයකුත් නොවෙයි. මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ වාහනය එළියට දමනකොට ලොරිවලින් හප්පපු ආණ්ඩු තමයි පසුගිය කාලයේ තිබුණේ. මොරටුවේ හිටපු නියෝජ්‍ය නගරාධිපති හාමුදුරුවරුන් දෙදෙනකු මරපු අවස්ථාවක් තිබුණා; කැපූ කෙටූ අවස්ථා, කඩුවලින් කෙටූ අවස්ථා තිබුණා. දැන් දෙබිඩි ප්‍රතිපත්තියකුයි ඒ අය අනුගමනය කරන්නේ. පසුගිය කාලයේ මිනිසුන් අමු අමුවේ මරා දැමුවා. මේ වෙලාවේ පැත්තක සිටින පක්ෂයකට මේ විධියට චෝදනා කරන දෙබිඩි ප්‍රතිපත්තිය ගැනත් අපේ විරෝධතාව පළ කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.46]

**ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment)
ඔබතුමාට බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා ගැන කථා කරන අවස්ථාවේදී වචන කීපයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. කාලය බොහොම අඩුවෙන් තිබෙන නිසා මා කෙලින්ම point එකට එන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විගණකාධිපති ගාමිණී විජේසිංහ මහත්මයාගේ ප්‍රකාශය ළඟදී මාධ්‍ය හරහා ඉතාම ප්‍රසිද්ධියට පත් වුණා. ඒ වාගේම එය ආන්දෝලනාත්මක විධියට ජනතාව අතර හුවමාරු වෙමින් පවතිනවා. ගරු විගණකාධිපතිතුමාගේ ප්‍රකාශයේ සඳහන්ව තිබෙන්නේ කොහොමද? එතුමාගේ ප්‍රකාශයේ සඳහන්ව තිබෙන්නේ, "බැඳුම්කර සිද්ධිය වාගේ ඕනෑ තරම් වංචා පසුගිය යුගයේ වෙලා තිබෙනවා. උදාහරණයක් වශයෙන්, ගල් අඟුරු වංචාව, හාල් ගෙනාපු case එක...." ආදි වශයෙනුයි. එහෙමයි එතුමා කියන්නේ. එතැන ගණන බිලියන 15ක්. තවත් තිබෙනවා පසුගිය කාලයේ වූ දේවල්. ඒවායින් එකක් තමයි, hedging ගිවිසුම හරහා වූ අලාභය. Entrust ගනුදෙනුව හරහා රත්වත්තේ සොහොයුරෙක් රුපියල් බිලියන 10ක පමණ වංචාවකට හසු වෙලා තිබෙනවා. ෂැන්ග්‍රි-ලා ගිවිසුම, වෙනත් නොයෙකුත් කුමන්ත්‍රණ, අපේ රට විකිණීම හරහා කොමිස් මුදල් ගැනීම, ක්‍රිෂ් වංචාව ආදි දේවල් ද සිදුව තිබෙනවා.

මේවා සියල්ලම හැංගිලා පවතින තත්ත්වයක් තමයි තිබෙන්නේ. පසු ගිය කාලයේ මේවා සියල්ලම හැංගිලා තිබෙද්දී, යහපාලන ආණ්ඩුව පත් වුණාට පස්සේ මේ හොරු එක දිගට අහුවෙන්න පටන් ගත්තා. "හොරු ඇල්ලුවාද? හොරු ඇල්ලුවාද?" කියලා සියලු දෙනා සමච්චල් කරද්දී මේ තරම්වත් - මෙපමණකින්වත් - හොරු අල්ලපු ආණ්ඩුවක් ඉතිහාසයේ තිබුණාද කියලා, "හොරු ඇල්ලුවාද?" කියලා සමච්චල් කරන පාර්ශ්වයෙන් මම අහන්න කැමැතියි. මේ සම්බන්ධයෙන් මම අභියෝග කරනවා. මම ඕනෑම විවාදයකට එන්නම්. ඒ කාලයේ එහෙම හොරු ඇල්ලුවේ නැහැ. එහෙම හොරු ඇල්ලුවා නම්, ඇල්ලුවේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයා විතරයි. එතුමා තමයි වෝල්ටර් තල්ගොඩපිටිය කියන වාර්තාව හරහා කැබිනට් ඇමතිවරු අට දෙනෙක් ගෙදර යැව්වේ. මොන්තැකුලම, වී.සී. පෙරේරා, මරික්කාර් වැනි අය ගෙදර යැව්වේ එතුමායි. හොරු අල්ලන එක කොච්චර බෙල්ල ගහලා යන වැඩක් ද කිව්වොත් තමන්ගේම ආණ්ඩුවේ හොරු අල්ලන්න ගිහිල්ලා ඇත්තටම එතුමාගේ ජීවිතයෙන් පවා වන්දි ගෙවන්න සිද්ධ වුණා. ඒ වාගේම ආණ්ඩුවක් තමයි මේ ආණ්ඩුවත්. මම එක්සත් ජාතික පාක්ෂිකයකු වුණත් කියන්න ඕනෑ, ඊට පසුව ආපු ප්‍රේමදාස මහත්මයාගේ යුගයේ හොරු ඇල්ලුවා කියලා අපට ආරංචියක් ආවේ නැහැ. ඊට පසුව ආපු ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිනියගේ යුගයේ හොරු ඇල්ලුවා කියලා ආරංචියක් අපට ආවේ නැහැ. මට මතකයි එක හොරෙක් අල්ලපු සිද්ධිය. ඒ අනුලා විද්‍යාලයේ විදුහල්පතිනිය. ඒ කියන්නේ හාල්මැස්සෙක් ඇල්ලුවේ. තෝරු, මෝරු ඇල්ලුවේ නැහැ. අනුලා විද්‍යාලයේ විදුහල්පතිනිය කළ වංචාව මොකක්ද? දරුවන් දෙදෙනකු පාසලට ඇතුළත් කරවා

[ගරු රන්ජන් රාමනායක මහතා]

ගැනීම සඳහා ඒ මව්පියන්ගෙන් පීරිසි කුට්ටමක් අල්ලසක් වශයෙන් ගැනීම. අන්න එහෙමයි වුණේ. ඊට පස්සේ මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලයේ හොරු අල්ලනවා කියලා අපි අහලාවත්, දැකලාවත් තිබුණේ නැහැ. එතුමා කිව්වා, "අපේ හාමුදුරුවනේ, මා ළඟ "ෆයිල්" තිබෙනවා. මම කවදාවත් අපේ ආණ්ඩුවේ ජඩකම්, බලුකම්, කුපාඩිකම් කරපු අයගේ ෆයිල් එළියට දමන්නේ නැහැ. ඒක විශාල වරදක්." කියලා. එතුමාගේ හඬින්ම කියපු, එතුමාගේ රූපයත් ඇතුළත් වීඩියෝ එකක් තිබෙනවා. මම ඒක සභාගත කරන්නම්.

මෙන්න මෙහෙමයි, පසු ගිය ආණ්ඩු හොරුන් ආරක්ෂා කළේ. ඒක තමයි සිද්ධ වුණේ. එතුමා එසේ කිව්වා වාගේම හිටපු අග විනිසුරුවරයෙක් වන සරත් එන්. සිල්වා මහත්තයා කිව්වා, "මම හිරගෙදර යවන්න ඕනෑ කෙනාව රජ ගෙදර යැව්ව. මට සමාවෙන්න." කියලා. ඒ වාගේම එතුමා කිව්වා, "ඒ කාලයේ මහින්ද රාජපක්ෂ මහත්මයාව හිරගෙදර යැව්වා නම්, මේ රට විශාල අගාධයකින් බේරා ගන්න තිබුණා." කියලා. එහෙම කිව්වේ සරත් එන්. සිල්වා හිටපු අග විනිසුරුවරයා. හොරුන් ආරක්ෂා කළ යුග ගණනාවක් තමයි අපි පසු කරගෙන ආවේ.

ඊට පස්සේ 2015 ජනවාරි 08 වැනිදා යහපාලන ආණ්ඩුව බලයට ආවා. අමුතුම සංස්කෘතියක්, අමුතුම දේශපාලනයක්. ගරු ජනාධිපතිතුමා තමන්ගේ ලේකම්වරු දෙදෙනෙක් ඇල්ලුවා. කවුද, මහානාම සහ දිසානායක. අල්ලස ගත්තේ කොහේදිද, ටාජ් හෝටලයේ car park එකේදී. රුපියල් කෝටි දෙකක් ගැන ගැන ඉන්නකොට අහු වුණා. අන්න හොරු අල්ලපු විධිය. මේකම තමයි විගණකාධිපතිතුමාත් කියන්නේ. විගණකාධිපති ගාමිණී විජේසිංහ මහත්තයා කියන කථාව මොකක්ද? සිල් රෙදි බෙදීම හරහා රුපියල් කෝටි 60ක වංචාවකට ලලිත් වීරතුංග වාගේ ලේකම්තුමන්ලා අහුවෙලා තිබෙනවා. එතුමන්ලා කියනවා, ඒක වංචාවක් නොවෙයි කියලා. නමුත් අපේ මැතිවරණ කොමසාරිස්තුමා කියනවා, "ඒ සිල් රෙදි ආවරණය කළ කවරයේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ රූපය ගහලා තිබුණා. ඒක පැහැදිලිවම මැතිවරණ අල්ලසක්." කියලා. රුපියල් කෝටි 60ක්. මෙහෙම හොරු ඇල්ලුවාම මොකද වෙන්නේ? එහෙම හොරු ඇල්ලුවාම අපේ සමහර ස්වාමීන් වහන්සේලා පිණ්ඩපාතයේ යනවා, හොරුන් වෙනුවෙන් වන්දිය ගෙවන්න. ඉතින් කොහොමද අපි හොරු අල්ලන්නේ? හොරු උසාවියෙන් එළියට එනකොට පිරිත් නූල් බඳිනවා, ඒ අයට ශක්තියක් දෙනවා, වන්දි ගෙවන්න පිණ්ඩපාතේ යනවා. මේ වාගේ දේවල් තමයි අද අපට අහන්න ලැබෙන්නේ.

විගණකාධිපති ගාමිණී විජේසිංහ මහත්තයා තවත් කථාවක් කියනවා. බැරි වෙලාවත් රජයේ සේවකයන් මෙවැනි දූෂණවලට සහයෝගය දීලා, ඒ අය අධිකරණයට ගෙනැල්ලා දඬුවම් නොදුන්නොත්, මේ විධියට උසාවි එන්න, නීතිය ඉදිරියට එන්න, හිරේ යන්න ඉන්න තවත් බොහෝ රජයේ සේවකයන්ට සැනසීමක් ලැබෙනවා. ඒ කියන්නේ ඒ ගොල්ලන්ව අල්ලන්නේ නැහැ. මේ දෙදෙනා බේරුණොත් ඒ ගොල්ලෝ අහනවා, "ඇයි, ඒ ගොල්ලෝ විතරක් බේරන්නේ, අපිව බේරන්නේ නැද්ද" කියලා. ඉතින්, මේ වගේ තත්ත්වයක් තමයි අද තිබෙන්නේ. ඒ නිසා පොදු විපක්ෂයේ, ඔය කියන පොහොට්ටුවේ හෝ ඕනෑම පාර්ශ්වයකට මම අභියෝග කරනවා. පුළුවන් නම් තමුන්නාන්සේලා හිතට එකඟව කියන්න. මම කියන්නේ නැහැ, මේක සර්ව සම්පූර්ණයෙන්ම හොරු අල්ලපු ආණ්ඩුවක් කියලා. නමුත්, මේ තරමින්වත් හොරු අල්ලන ආණ්ඩුවක් ඉතිහාසයේ තිබුණා නම් එය නමින් කියන්න කියලා මම ඔබතුමන්ලාට අභියෝග කරනවා.

පසු ගිය දිනවල බැඳුම්කර වංචාව ගැන ලොකුවට කථා වුණා. ගාමිණී විජේසිංහ මහත්මයා කියනවා, බැඳුම්කර වංචාව වගේ දෙගුණයක්, තුන්ගුණයක් විශාල බැඳුම්කර වංචා මීට ඉස්සර සිදුවී තිබෙනවා කියලා. නමුත්, අපි හොරකම් අල්ලන්න පටන් ගත්තේ අපේම බැඳුම්කර වංචාවෙන්. මෙම බැඳුම්කර වංචාවට COPE එකේ අයගේ නම් කියැවුණා. ඒ වාගේම තවත් අයගේ නම් කියැවුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම අද මගේ දිවුරුම් ප්‍රකාශය ගෙනාවා. ඒ දිවුරුම් ප්‍රකාශය මම **සභාගත*** කරනවා.

මෙම දිවුරුම් ප්‍රකාශය මම කථානායකතුමාටත් යවලා තිබෙනවා. මෙම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් වී තිබෙන කරුණු මම බොහොම පැහැදිලිව කියන්නම්:

> "වර්තමානයේ සාකච්ඡාවට බඳුන් වී ඇති ශ්‍රී ලංකා මහබැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන් හෝ ඊට අනුබද්ධ වෙනත් ආයතනයකින් හෝ එහි කොටස්කාර වෙනත් ආයතනයකින් හෝ එහි හිමිකාර අර්ජුන ඇලෝසියස් යන අයගෙන් හෝ ඔහුගේ නියෝජිතයෙකුගෙන් හෝ කිසිදු මුදලක්, දේපළක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ..."

සෘජුව හෝ වක්‍රාකාරව,- ඒ කියන්නේ, සමහර අය driversලා මාර්ගයෙන් ගන්නවානේ. තවත් සමහර අය වෙක්පත පිටුපස තමන්ගේ security officerට කියලා අත්සන් කරලා ඔහු මාර්ගයෙන් මාරු කරගන්නවා. තවත් අය තමන්ගේ ඥාතීන් මාර්ගයෙන් අරගෙන තිබෙනවා. තවත් අය යම් පදනමක් හරහා අරගෙන තිබෙනවා. තවත් අය වාහන හරහා අරගෙන තිබෙනවා. සමහර අය හෝටල් හරහා අරගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් සමහර අය රුසියානු පෙම්වතියන් හරහා අරගෙන තිබෙනවා. ඒ වගේ එක එක විධියට අල්ලස් ලබාගෙන තිබෙනවා. මම ඒවා සියල්ලම ප්‍රතික්ෂේප කළා. මම රුසියානු පෙම්වතියන් හරහා අරගෙනත් නැහැ, මම ඒ පුද්ගලයාගෙන් කිසිම විධියකට මුදල් අරගෙන නැහැ කියලා දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරනවා. මේක පොදු විපක්ෂයේ අය පටන් ගත්ත හොඳ point එකක්, හොඳ රැල්ලක්, හොඳ trend එකක්. ඒ අයත් දිවුරුම් ප්‍රකාශ ලබා දෙන්න ඕනෑ කියලා මම පෙරළා ඔවුන්ට අභියෝග කරනවා. මේක යෝජනා කරපු ගම්මන්පිල මහත්මයා බ්‍රයන් ෂැඩික්ගෙන් මුදල් ගත්තේ නැහැ, රුපියල් කෝටි 7ක් හොරකම් කළේ නැහැ කියලා දිවුරුම් ප්‍රකාශයක් දෙනවා නම් මම ගරු කරනවා. ඒ වාගේම ක්‍රිෂ් ගනුදෙනුව සම්බන්ධ වංචාවෙන්,- අද නාමල් මහත්මයාගේ නඩුව කථා කරද්දී මම දැක්කා, නාමල් මහත්මයාගේ පෙම්වතියගේ දරුවාට ඩෙංගු හැදිලා - පෙම්වතියටත් නොවෙයි, පෙම්වතියගේ දරුවාට ඩෙංගු හැදිලා.- කියලා නඩුව මාස ගණනක් කල් ගිහිල්ලා තිබෙනවා.

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க)
(The Hon. A. A. Wijethunga)
පෙම්වතියට දරුවෙක් ඉන්නවාද?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
දරුවෝ ඉන්න පෙම්වතියන් ඉන්න පුළුවන්නේ, නේද? පෙම්වතියට දරුවෙක් හම්බවෙලා නඩුව කල් ගියා. පසු ගිය දින ටිකේ අපි ඒ හොරු අල්ලාගෙන නීතිය ඉදිරියට ගියා. අනේ!

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

****  පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
**  Placed in the Library.*

4දෙනෙක් ගෝඨාභය මහත්මයා දැක්කාම දුවනවා. දුවනවා කියලා පාර්ලිමේන්තුව ඇතුළේදී කියන්න පුළුවන්. නැත්නම් මට මේ කථාවටත් නඩුවක් වැටෙනවා. මම මේ කරන්නේ ජනතාවගේ ප්‍රකාශ. මේවා මගේ ප්‍රකාශ නොවෙයි. ජනතාව වෙනුවෙන් කථා කරලා තමයි අද මට Supreme Court එකේ නඩුවක් වැටිලා තිබෙන්නේ. ඒ අය කියනවා, "රන්ජන් රාමනායක බැලූ බැල්මට උසාවියට අපහාසයක් කරලා තිබෙනවා." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් නීතිඥයෙක්. බැලූ බැල්මටනේ ඒ විධියට පෙනිලා තිබෙන්නේ. හරියට බලන්නේ නැත්තේ ඇයි කියලා දන්නේ නැහැ නේද? ඒ කියන්නේ, බැලූ බැල්මට තමයි මාව වරදකරුවෙක් විධියට පෙනිලා තිබෙන්නේ. හරියට බැලුවා නම් හොඳ නැද්ද? හොඳට බැලුවා නම් තේරෙයි, රන්ජන් රාමනායක කියන දේවල් සියයට 100ක්ම ඇත්තයි කියලා.

ලංකාවේ අහිංසක, දුප්පත්, පීඩිත පන්තියේ මිනිහාව හිර කරන්න තමයි නීතිය සහ එම ආයතන තිබෙන්නේ. අඹ ගෙඩි 6ක් ගත් අහිංසක අම්මා කෙනෙක් රිමාන්ඩ් කරනවා. උසාවියේදී ඇනුමක් ඇරියොත් මාස 8ක් හිරේට දමනවා. පොල් ගෙඩි 6ක් හොරකම් කළාම, ඒකට ලොකු දඬුවමක් දෙනවා. කොස් ගෙඩියක් බාගත්තොත් ලොකු දඬුවමක් දෙනවා. නමුත්, මහා පරිමාණයේ ලෝක හොරු අහු වුණාම, පූර්වාපේක්ෂී ඇප -anticipatory bail- ලැබෙනවා. ඒ කියන්නේ . අත් අඩංගුවට ගැනීමට නොහැකි වන ලෙස තාප්පයක්, වාරණයක් දමා ගන්නවා. ඊටපසුව එහි සිටින විනිසුරුවරු එක එක්කෙනා ඉල්ලා අස් වෙනවා. නිකම්ම නොවෙයි අස් වෙන්නේ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාව කිසිම හේතුවකින් අත් අඩංගුවට නොගන්නා ලෙස ලිඛිතව විධානයක් දෙමිනුයි අස් වෙන්නේ. ජනතාව අපට කියනවා, "හොරු අල්ලන්න" කියලා. මෙවැනි තත්ත්වයක් යටතේ කොහොමද හොරු අල්ලන්නේ? මේක ආණ්ඩුවේ වරදක්ද? මේ යහ පාලනය - Good Governance- තමන්ගේ ලේකම්ලාත් ඇල්ලුව ආණ්ඩුවක් කියලා මම කියනවා. කොටින්ම කිව්වොත්, තමන්ව ජනාධිපති ධුරයට පත් කළ අගමැතිතුමාව පවා මේ ජනාධිපතිතුමා කොමිසමට ගෙන්නුවා. අපේ හිටපු මුදල් ඇමතිවරයා වන රවි කරුණානායක මහත්මයා -පසුව විදේශ කටයුතු ඇමතිතුමා- තනතුර නැති වෙලා, අද සාමාන්‍ය මන්ත්‍රීවරයෙක් හැටියට පිටුපස ආසනයක සිටිනවා. තව බොහෝ අයට මෙවැනි දේවල් අහිමි වුණා. ලංකාවේ ජනතාවට "යහ පාලනය" - "Good Governance"- කියන එක ඔරොත්තු දෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩෙස්මන්ඩ් මොරිස්ගේ "මනුසත් උයන" - "The Human Zoo"- සහ "නිරුවත් වානරයා" වැනි නවකතාවල කියනවා වාගේ, civilize වුණු ජනතාවක් නොවෙයි, අපට පාලනය කරන්න සිදු වෙලා තිබෙන්නේ. මේ uncivilized society එකක්. තවම නිවැරදි විධියට පරිණාමය නොවුණු ජනතාවකුයි අපට පාලනය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ පරිණාමය නොවූ ජනතාව හොරුන්ට කැමැතියි. අපේ ජානවලමයි හොරකම තිබෙන්නේ. පන්සලකට ගියාම, පන්සලේ තිබෙන සෙරෙප්පු කුට්ටම පවා උස්සන ජනතාවක් ලංකාවේ ඉන්නේ. පන්සලට ගිහිල්ලා එන කොට, එතැන තිබෙන සෙරෙප්පු කුට්ටමකට වැඩේ දීලා. ඒ වාගේම උදේට පිං කැටේට සල්ලි දමනවා; රෑට බීලා ඇවිල්ලා පිං පෙට්ටිය කඩනවා. මෙවැනි ජනතාවක් තමයි මේ රජයට පාලනය කරන්න සිදු වෙලා තිබෙන්නේ.

මංකොල්ලකරුවන් පිරිසක් මංකොල්ලයක් කරන්න ඉස්සරවෙලා කතරගම ගිහිල්ලා, "කතරගම දෙවියනේ, මංකොල්ලය හොඳට කරගන්න අපට පිහිට වෙන්න" කියලා භාරයක් වුණු අවස්ථාවක් පසුගිය කාලයේ මම දැක්කා. කොහොමද වැඩේ? මංකොල්ලකාරයෝ කට්ටිය යනවා. දේවාලයට ගිහිල්ලා පූජාවක් පවත්වා භාරයක් වෙනවා, "අපි කරන්න යන මේ robbery එක hundred per cent successful වෙන්න" කියලා. Robbery එක කරලා ඉවර වෙලා නැවත කතරගම යනවා. ගිහිල්ලා, "කතරගම දෙවියනේ, ස්තුතියි. මංකොල්ලය ඉතාම හොඳට වුණා. අපි අහු වුණේ නැහැ. මෙන්න ඔබතුමාගේ ගතමන්ට් එක; මෙන්න ඔබතුමාගේ share එක" කියලා භාරයෙන් නිදහස් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුල සිටම හොරකම් කරන මෙවැනි ජනතාවක් තමයි අපට පාලනය කරන්න සිදු වෙලා තිබෙන්නේ.

මම පාසල් ගිය කාලයේ සිට සෑම දිනකම මා අතින් වුණු වැරදි පවා ස්වයං විවේචනය කළා. තමන්ගේ වත්තේ කොපමණ පොල් ගස් තිබුණත්, කුරුම්බා තිබුණත්, එහා ගෙදර වත්තේ කුරුම්බා කඩලා ඒ අයිතිකාරයා දුවගෙන එන කොට, ඒ පුද්ගලයාට කුණුහරුපයක් කියලා දුවන්න ඉස්කෝලේ ළමයින් කැමැතියි. ඒක මේ ගරු සභාවේ සිටින සැමදෙනාම පිළිගන්නා දෙයක්. ඒක නේ තත්ත්වය. ඒ නිසා මම හිතනවා, මේ ජනතාව එදා ඉඳලාම හොරකමට ජානගතව සිටින කණ්ඩායමක් කියලා. මම කියන මේ කාරණය නිසා ඡන්ද නැති වෙයි. නමුත්, ඇත්ත කථාව මේක තමයි. එහෙම නැත්නම්, ලංකාවේ හොරු මෙච්චර ඉහළ තැනට යන්නේ නැහැ.

බැසිල් රාජපක්ෂ මහත්මයා නොම්මර එකේ සොර දෙටුවෙක් කියලා මේ මුළු ලංකාවම දන්නවා; එතුමාත් දන්නවා; සියලුදෙනාම දන්නවා. එතුමාගේ මල්වානේ මාළිගාව ඉස්සරහින් ජනතාව ගිහිල්ලා අනික් පැත්තට ඡන්දය දමනවා. නිකම් හිතන්න, මේ ජනතාව කොහොමද වෙනස් කරන්නේ කියලා.

ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමනි, පසුගිය කාලයේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ සහ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ order එක හරහා කටයුතු කර වැලිවේරියේ තුන්දෙනෙකුට වෙඩි තබා මැරුවා. ඒ කියන්නේ, වතුර ඉල්ලපු අයට මේ අය වෙඩි තියලා මැරුවා. ඒ bulletsවලින් හැදුණු හිල් පල්ලිවල තවම තිබෙනවා. ඒ සිද්ධිය වැලිවේරියේ ජනතාව ඇස් දෙකට දැක්කා. ඒ අය ඒක හොඳටම දන්නවා. නමුත්, ඡන්ද ප්‍රතිඵල කොහොමද? වෙඩි තියපු එකා දිනුම්. වෙඩි තියපු එකාට චෝදනා කරපු අය පැරදුම්. ඉතින්, මේ ජනතාව කොහොමද හදන්නේ? අපේ රටේ ජනතාව තරම් ඉක්මනින් අතීතය අමතක වෙන ජනතාවක් ලෝකයේ කොහේවත් නැහැ කියා මම හිතනවා. "මොනවා හෝ වුණාම සුමාන දෙකයි ඒක මතකයේ තිබෙන්නේ" කියලා ප්‍රභාකරන් පවා කියලා තිබුණා. ඒක තමයි ඇත්ත තත්ත්වය. මෙපමණ හොරු අල්ලාගෙන එද්දීත් ජනතාව කටයුතු කරන ආකාරය බැලුවාම ඒක පෙනෙනවා.

අද FCID, CID, Bribery Commission එක බලන්න; අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දැන් සිටින අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩ කරන විධිය බලන්න. පසුගිය කාලයේ බාලපටබැඳි මහත්මයා එතුමා වාගේ චෝදනා ඉදිරිපත් කරන්න උත්සුක වුණාද, උනන්දු වුණාද? නැහැ නේ. බාලපටබැඳි මහත්මයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සිටිද්දී රෝහිත අබේගුණවර්ධන මහත්මයාට case එකක් ආවා. ඒ මොකක්ද? අයුතු වත්කම් උපයාගැනීම ගැන ඒ මහත්මයාට statement එකක් දෙන්න බැරි වුණා කියලා. මට මතක විධියට ගණන භාරකෝටි හැටපන්ලක්ෂයක්. එතුමා දුන්න excuse එක මොකක්ද? නඩුවට එද්දී නයෙක් ගැහුවාලු. ඔන්න ඔහොමයි බේරුණේ. ඒ නිසා මම මේ කථාව අහගෙන ඉන්න ජනතාවගෙන් නැවත ඉල්ලීමක් කරනවා. වැරදි, අඩු පාඩු ඇති. ලෝකයේ කවදාවත් හොරු නැතිව යන්නේ නැහැ. අපට ඕනෑ හොරු අල්ලන ආණ්ඩුවක්. හොරු අදත් ඉන්නවා; හෙටත් ඉන්නවා; අනිද්දාත් ඉන්නවා; ඉන්අනිද්දාත් ඉන්නවා. කවදාවත් හොරකම නවතින්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා එන්නේ නැහැ කියලා එතුමාගේ වේලාවත් කියලා එවලා තිබුණා. එතුමා එන්නේ නැහැ කියලා තිබුණා. හොරු ගැන කථා කරද්දී ඔබතුමන්ලාත් විරුද්ධයි වාගේ. කාලය අඩුවෙන් දෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, එම කාලය ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා විසින් නවක මන්ත්‍රී ගරු (ආචාර්ය) එස් එම්. මොහමඩ් ඉස්මයිල් මැතිතුමාට ලබා දී තිබෙනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු (ආචාර්ය) එස් එම්. මොහමඩ් ඉස්මයිල් මැතිතුමා මට කථා කරලා කිව්වා -

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
මම විනාඩි 2ක් දෙන්නම්.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමාගේ විනාඩි 20ක්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට එතුමාගෙන් දෙන්නේ විනාඩි දෙකයි. එතුමාට තිබෙන්නේ විනාඩි 7යි.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අනේ මැතිතුමා, ඔබතුමාගේ -

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මම මගේ වේලාවෙන් විනාඩි 5ක් දෙන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි 5ක් දෙන්නලු. එතකොට මට තව විනාඩි 7ක් තිබෙනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
බොහොම ස්තුතියි. මම ඔබ දෙපලටම ගරු කරනවා. හොරු අල්ලන්නට කරන සටනට ඔබතුමන්ලා ලබා දෙන ආශීර්වාදයට සහ encouragement එකට බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දුන් දිවුරුම් ප්‍රකාශයෙන් රන්ජන් රාමනායක කෙළින්ම කියනවා, "මම සෘජුව හෝ වක්‍රාකාර මේ මුදල් ලබා ගත්තේ නැහැ" කියලා. හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මහත්මයා "සුනාමි ආධාරවලින් මිලියන 82ක් තමන්ගේ සොහොයුරියගේ ගිණුමට දමා ගත්තේ නැහැ " කියලා දිවුරුම් ප්‍රකාශයක් මා වාගේම නිර්භීතව ලබා දෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම එතුමා චීන ව්‍යාපෘති හරහා මුදල් ලබා ගත්තේ නැහැ කියලා, එතුමාට තිබෙන තවත් චෝදනා හරහා සල්ලි ලබා ගත්තේ නැහැ කියලා එතුමාගෙන් දිවුරුම් ප්‍රකාශයක් බලාපොරොත්තු වෙනවා. මොකද, එතුමා වරක් ප්‍රකාශ කළා, "එතුමා ඩොලර් එකක් හරි හොරකම් කරලා තිබෙනවා කියලා ඔප්පු වුණොත් ප්‍රසිද්ධියේ බෙල්ල කපා ගන්නවා" කියලා. එතුමා එහෙම කියලා තිබුණා. නමුත් එතුමාගේ පුත්තු ටිකගෙන් මේ සේරම අහු වෙලා ඉවරයි. කොටින්ම කිව්වොත් යෝෂිත කියන පුත්‍ර රත්නය තමන්ට සහ තමන්ගේ ආච්චිට -ඩේසි ආච්චිට- තිබෙන ඉඩම් 15 ගැන කියන්න අද අපොහොසත් වෙලා තිබෙනවා. චිච් බේබි, ඒ කියන්නේ පොඩිම දරුවා, පොඩිම තරුණයා, චීනය හරහා රොකට්ටුවක් අභ්‍යාවකාශගත කරන්නට කීයක් ලබා ගත්තාද කියන එක පිළිබඳව තවම ලංකාවේ ජනතාවට උත්තර දීලා නැහැ. CSN එක හරහා ඩොලර් මිලියන 159ක් අපට අල්ලා ගන්නට පුළුවන් වුණා. එහෙම අල්ලා ගන්නට පුළුවන් වුණත් ඒ අය කිව්වා, "මේ බඩු තිබෙනවා, මේවා කාගේද කියලා දන්නේ නැහැ." කියලා. CSN එකේ Working Director කෙනෙක් නැහැ; අයිතිකරුවෙක් නැහැ. නමුත් සන්නාම තානාපති -Brand Ambassador- හැටියට යෝෂිත මහත්මයා අත්සන් කරලා තිබෙනවා. ඉතින්, ලංකාවේ බහුතර ජනතාව මේවා ගැන දැන දැන තව තවත් මේ හොරුන්ට ආවඩන එක, 'ජයවේවා!' කියමින් හොරුන් පස්සේ කැගහගෙන යන එක ගැන විශාල දුකක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දෙයම ඇන්ගෝලාවටත් වුණා. ඇන්ගෝලාව කියලා රටක් තිබෙනවා. ඒ රටේ ජනාධිපති වශයෙන් හිටියේ සැන්ටොස් කියලා කෙනෙක්. ඇන්ගෝලාවේත් ලංකාවේ වාගේම අවුරුදු 30ක යුද්ධයක් තිබුණා. මේ යුද්ධය අවසන් වෙලා ඇන්ගෝලාව නට්ටම් වෙලා සතයක්වත් නැතිව ඉද්දී, චීන ආයෝජකයෝ සල්ලි අරගෙන ඇන්ගෝලාවට ආවා, ලංකාවට ආවා වාගේම. චීන ආයෝජකයෝ සල්ලි අරගෙන එද්දී සැන්ටොස් මහත්මයා කිව්වා, " අවුරුදු 30ක් යුද්ධ කරලා අපි නට්ටම් වෙලා ඉන්නේ. අපේ අතේ සත පහක්වත් නැහැ. අපට මෙහෙම වියදම් කරන්න සල්ලි නැහැ" කියලා. මම චීනයට විරුද්ධම නැහැ. නමුත් මැරෙන්න ඉස්සෙල්ලා මම මේ කථාව කියන්නම ඕනෑ. මේක තමයි තිත්ත ඇත්ත. කවුරුත් කථා නොකරන චීන ආක්‍රමණය. චීන ආයෝජකයෝ ඇන්ගෝලාවේ ජනාධිපති සැන්ටොස් මහතාට කිව්වා, "අපි අධිවේගී මාර්ග - highways - ටික හදලා දෙන්නම්" කියලා. එතකොට සැන්ටොස් මහත්මයා කිව්වා, "අනේ එහෙම කළොත් අපි කොහොමද ගෙවන්නේ?" කියලා. එවිට චීන ආයෝජකයෝ කිව්වා, "අපි ඔයාට මේකෙන් කොමිස් දෙනවා." කියලා. වැඩේ okay වුණා. සැන්ටොස් මහත්මයාගේ පුත්තු ඇතුළු පවුලේ අය රජපක්ෂ පවුල වාගේම ඉතා පොහොසත් වුණා. මම අසත්‍යක් නොවෙයි කියන්නේ. මේ ගැන පසුගිය ටිකේ මාධ්‍ය හරහා ප්‍රචාරය වුණා. මැලේසියාවේ හිටපු ජනාධිපතිතුමා "සිරස" රූපවාහිනි නාළිකාවට ඇවිල්ලා live කිව්වා, චීනය එක උණ්ඩයක් පාවිච්චි කරන්නේ නැතුව රටවල් ආක්‍රමණය කරන්නේ කොහොමද කියලා. එක උණ්ඩයක් පාවිච්චි නොකර රටවල් ආක්‍රමණය කරන විධිය අද චීනය සේද මාවත දිගේ ලස්සනට කරගෙන යනවා. ඉන්දියන් සාගරයේ තිබෙන හොඳම තැන වන අපේ හම්බන්තොට වරාය සතු කර ගන්න චීනයට ලොකු වුවමනාවක් තිබුණා. මහින්ද මහත්තයා ඒකට අහු වුණා. මහින්ද මහත්මයා ගැන මගේ වෛරයක් නැහැ. මේ රටේ පැවැති යුද්ධය අවසන් කරන්නට

එතුමා විශාල දායකත්වයක් ලබා දුන්නා. එතුමාට වාගේම ආරක්ෂක ලේකම්තුමාට, අපේ ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහත්මයාට සහ දිවි පූජා කළ රණ විරුවන් 26,000ට අපේ ගෞරවය තිබෙනවා. නමුත්, ඊට වඩා ලොකුයි අපේ රට. සමාව දෙන්න බැරි වරද තමයි, චීනයට අපේ රට විකුණපු එක. පළමුවත් මව්බිම,දෙවනුවත් මව්බිම, තුන්වෙනුවත් මව්බිම කියලා පපුවට අතින් ගහ ගත්ත, පොළව ඉඹපු ඒ දේශ ප්‍රේමියා තරම් ලංකාව චීනයට වික්ක දේශ ප්‍රේමියෙක් නැහැ කියන එක මම පැහැදිලිව කියනවා. ෂැන්ග්‍රි-ලා හෝටලය හදන්න එම ඉඩම දුන්නේ කීයටද? අනේ, අක්කර ගානක් සින්නක්කර දුන්නා. විදෙස් ආයෝජකයන්ට සින්නක්කරව ඉඩම් දීලා, ආරක්ෂක අමාත්‍යාංශයේ ගොඩනැඟිලි සංකීර්ණය අන්න පැලවත්තේ හදනවා. ඒකේ වැඩ තවම ඉවර නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය අවසානයි.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න තව පොඩි වෙලාවක් දෙන්න.

මෙවැනි තත්ත්වයන් නිසා මම නැවත නැවත ඉල්ලා සිටිනවා, විගණකාධිපතිතුමා වැනි නිර්භීත රජයේ නිලධාරින් එම තනතුරුවලට පත් කරන්න කියලා. එවැනි නිලධාරින් පත් වුණොත් රටේ දූෂණ අවම කර ගන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නම් කියන්න එපාය කියලාත් මට කියා තිබෙනවා. නමුත්, මම මේ අවස්ථාවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අපේ කොමසාරිස්තුමා ඇතුළු දප්පුල ද ලිවේරා, කෝදාගොඩ, ශානි අබේසේකර, රවී සෙනෙවිරත්න, රවී විද්‍යාලංකාර, ධම්මික ප්‍රියන්ත වැනි නිලධාරින්ට ස්තුතිවන්ත වනවා. මේ සියලු දෙනා පරිණාමය නොවූ ජනතාවක් ඉන්න රටේ එල්ල වන සියලු දුක් ගැහැට විඳගෙන, සමච්චලයට ලක් වෙමින්, නින්දා අපහාස විඳ ගනිමින් investigations හරියට කරගෙන යනවා. මම මේ අවස්ථාවේ ගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු මේ රජයෙන් ඉල්ලා සිටිනවා, එතුමන්ලා පසුගිය ටිකේ හැසිරුණා වාගේ මේ කිසිම පරීක්ෂණයකට - investigation එකකට - ඇඟිලි නොගහ ඉන්න කියලා. තමුන්ගේ ලේකම් වුණත් කමක් නැහැ, සල්ලි අරගෙන තිබෙනවා නම් ඒ අයව හිරේ දාන්න අද පෙලඹිලා ඉන්න එක ගැන මම සන්තෝෂ වනවා. ගාමිණී විජේසිංහ මහත්මයා කිව්වා වාගේ, ඇති වෙන්න දූෂණ සහ වංචා තිබෙද්දී මේක විතරක් අල්ලාගෙන දඟලන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, COPE එකට භාර දෙන්න මම ලිපියක් ගෙනාවා. මම එම ලිපිය **සභාගත*** කරනවා.

COPE එකේ සාමාජිකයින් හැටියට පත් කරන්නන්ගේ පැටිකිරිය බලලා පත් කරන්න කියා මා කියන්න ඕනෑ. උසාවිය කියනවා වාගේ බැලූ බැල්මට, දූෂණ සම්බන්ධයෙන් චෝදනා තිබෙන අයව කරුණාකරලා COPE ඒකේ සාමාජිකයින් හැටියට වාඩි කරන්න එපා. මොකද, COPE එකට එන කණ්ඩායම් හිනා වෙනවා, "හොරු අල්ලන්න පත් කරලා තිබෙන්නේ ඊටත් වඩා හොරු කණ්ඩායමක්" කියලා. එම නිසා මම ගරු කථානායකතුමාගෙනුත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගෙනුත්, ඒ වාගේම පක්ෂවල නායකයින්ගෙනුත් ඉල්ලා සිටිනවා, කවදාකවත් හොරුන්ව COPE එකේ සාමාජිකයෝ හැටියට පත් කර එවන්න එපා කියලා. කාලය ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා. ස්තුතියි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5යි.

[අ.භා. 6.12]

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ශ්‍රී ලංකා සිනමාවේ වාගේම අපේ පාර්ලිමේන්තුවෙත් අපට හීරෝ කෙනෙක් ඉන්නවා. ඒ තමයි, අපේ රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා. එතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිය පළ කරනවා. එතුමාගේ වැදගත් කථාවට මට වෙන් වූ කාලයෙනුත් විනාඩි දෙකක් ලබා දුන්නා. මම මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැතියි, එතුමාගේ කථාවේ ගොඩාක් දුරට සඳහන් වුණේ මේ පාර්ලිමේන්තුවේ තිබෙන COPE එක හා COPA එක ගැනයි කියන කාරණයත්. මම හොඳටම දන්නවා අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව හැටියට ජනතා විමුක්ති පෙරමුණෙන් ඉදිරිපත් කළ මෙම යෝජනාවේ සඳහන් වන්නේ Committee on Public Accounts - COPA - එකේ වාර්තාව ගැනයි කියන කාරණය. ඒ ගැන අදහස් දක්වන විවාදයක් තමයි මේ සිදු කරන්නේ. මේ විවාදයේදී ගොඩාක් මන්ත්‍රීවරුන් COPE එක ගැනත් කථා කළා.

අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට මේ පාර්ලිමේන්තුවේ ගොඩාක් කමිටුවලට සහභාගි වෙනවා. Sectoral Oversight Committees තිබෙනවා, Standing Committees තිබෙනවා, Select Committees තිබෙනවා. නමුත් ඒ විවිධ කමිටුවලින් ගොඩාක් ප්‍රසිද්ධ වෙලා තිබෙන්නේ COPE එක සහ COPA එකයි. ඒකට හේතුව මොකක්ද? ගරු රන්ජන් රාමනායක මැතිතුමා කළ කථාවෙන්ම ඒ ගැන විමසා බලමුකෝ. එතුමා සිදු කළ කථාවේ අන්තර්ගතය තුළ ගොඩාක් වෙලාවට සඳහන් වුණේ postmortems ගැනයි. අපි කරන්නේ කළ වැරදි සොයාගෙන postmortems කරන එක විතරයි. ඒ ගැන තමයි අපි ගොඩාක් දුරට බලන්නේ. නමුත් එතැනින් ඉහළට ගිහිල්ලා COPA එක තවදුරටත් ශක්තිමත් කරන්න පුළුවන් කොහොමද කියන කාරණය ගැන COPA එකේ සභාපතිතුමා ලෙස කටයුතු කළ ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා කළ කථාවෙන් එතුමා නිවැරදිව පැහැදිලි කළා. මම ඒක අගය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලිපියක් සභාගත කරමින් මම මගේ වෙලාව ඉතුරු කර ගන්නවා. අද දින "Daily News" පුවත් පතේ මගේ interview එකක් පළ කරලා තිබෙනවා. ඒකත් එක්කම අපේ ගරු කබීර් හෂීම් ඇමතිතුමාගේ ලිපියකුත් මේකට එකතු කරලා, එකම ලිපියක් හැටියට මෙහි වාර්තා කරලා තිබෙනවා. මම මේ අවස්ථාවේදී මේ ගැනත් සඳහන් කරමින් කියන්නේ අපේ වගකීම වෙලා තිබෙන්නේ මේ postmortems විතරක් කරමින්, වැරදි සොයා දඬුවම් දෙන එක විතරක් නොවෙයි

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

කියන එකයි. මේ රටට වග කියන, අපිට ඡන්දය දුන් ජනතාවට වග කියන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි කොහොමද මෙවැනි වැරදි නැති කරන්නේ? අපි කොහොමද, සැලැස්මක් හදන්නේ? මම අද දින "Daily News" පුවත් පතේ සඳහන් කර තිබෙන වාර්තාවෙන් සුළු ප්‍රමාණයක් පමණක් උපුටා දක්වන්නම්.

> " 'This is the issue that we have now: all the development proposals are political proposals',..... "

Then, it goes on to report further what I said, I quote:

> " 'The government's needs become the State's needs, which means the party's needs, which means political needs',...... "

> " 'That's how it gets deviated from the State to the party. So all the people's money goes to political purposes.' "

අපේ ගරු රන්ජන් රාමනායක මැතිතුමා එතුමාගේ කථාවේදී හොඳින්ම සඳහන් කළා වාගේ, එක එක රජය ඒ ගොල්ලන්ගේ කාලයේ ඉදිරිපත් කළ proposals ඒ ගොල්ලන්ගේ පක්ෂයේ, නැත්නම් පවුලේ, එහෙමත් නැත්නම් ඒ ගොල්ලන්ගේ ප්‍රදේශයේ දියුණුව සඳහා හදා ගත්තා මිසක්, State එකට, අපේ රටට හරි යන විධියට හදලා නැහැ. ඒ නිසා පාර්ලිමේන්තුවේ ස්වේච්ඡා කණ්ඩායමක් හැටියට ඇගයීම් පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදයක් හදා ගන්න අපි යෝජනා කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ගරු නියෝජ්‍ය කථානායකතුමා වන ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මැතිතුමාගේ නායකත්වයෙන්, ඇගයීම් පිළිබඳව ගෝලීය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදයේ සභාපතිතුමා වන අපේ ගරු කබීර් හෂීම් ඇමතිතුමාගේ නායකත්වයෙන් ඇගයීම් සම්බන්ධව ප්‍රතිපත්තියක් මේ රටට හඳුන්වා දීමට අපි ඉදිරිපත් වෙලා ඉන්නවා. ළඟදීම මේ පාර්ලිමේන්තුවට එම යෝජනාව ගෙනෙනවා. ඒ ගැන තමයි මෙම ලිපියේ සඳහන් වෙලා තිබෙන්නේ. අපි global conference එකක් ලබන සැප්තැම්බර් මාසය තුළදී ලංකාවේ පවත්වන්නටත් සූදානම්. "මන්ත්‍රීවරුන්ගෙන් වන වැරදි අඩු කරන්න ඕනෑ, මේ වාගේ දේවල් සිද්ධ නොවෙන්න ඕනෑ" කියන බලාපොරොත්තුව තිබෙන අපේ ගරු රන්ජන් රාමනායක වැනි මැතිතුමන්ලා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් මේ අවස්ථාවේදී මම ඉල්ලීමක් කරනවා, ඇගයීම් සම්බන්ධව අපි ගෙනෙන්න බලාපොරොත්තු වෙන එම ප්‍රතිපත්තියට සහයෝගය දෙන්න කියලා. විය යුත්තේ ඇස්තමේන්තුවේ සිට ඇගයීමට -estimation to evaluation - மதிப்பீட்டிலிருந்து மதிப்பாய்விற்குச் சென்று எங்களது வேலைத் திட்டங்களை முன்னெடுக்க வேண்டும். මම 2018.06.19වන දින "Daily News" පුවත් පතේ සඳහන් වාර්තාව **සභාගත*** කරනවා. බොහොම ස්තුතියි.

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[பி.ப. 6.17]

**ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சீ.மு. முகம்மட் இஸ்மாயில்)
(The Hon. (Dr.) S. M.Mohamed Ismail)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

அமர்வுக்குத் தலைமைதாங்கிக் கொண்டிருக்கும் கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களே, அரசாங்கக் கணக்குகள் பற்றிய பாராளுமன்றக் குழுவின் அறிக்கைகள் தொடர்பான இந்த விவாத நேரத்தில் எனது கன்னி உரையை ஆற்றுவ தற்கும், நான் சத்தியப் பிரமாணம் செய்த நாளில் என்மீது இங்கு முன்வைக்கப்பட்ட சில குற்றச்சாட்டுக்களுக்கு எனது பதில்களை வழங்குமுகமாகவும் எனக்கு நேரம் ஒதுக்கித் தந்தமைக்கு கௌரவ சபாநாயகர் அவர்களுக்கு முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

என்னுடைய அரசியல் பிரவேசத்தின் ஊடாக, தேசியப் பட்டியலின்மூலம் இந்தப் பாராளுமன்றக் கதிரையை அலங்கரிப்பதற்காக வேண்டி, என்னுடைய கட்சியின் தலைவர் கௌரவ றிஸாட் பதியுதீன் அவர்களின் பரிந்துரையில், அதேபோன்று ஐக்கிய தேசியக் கட்சியின் தலைவர் கௌரவ பிரதம மந்திரி அவர்களின் சிபாரிசின்பேரில் இந்தப் பாராளுமன்ற அங்கத்துவம் எனக்குக் கிடைக்கப் பெற்றுள்ளது. அதற்காக அவர்களுக்கும் அதேபோன்று எனக்காக வாக்களித்த அம்பாறை மாவட்ட மக்களுக்கும் என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று எமது நாட்டில் யுத்தம் முடிவடைந்து, அபிவிருத்தியை நோக்கிப் பல்வேறுபட்ட திட்டங்கள் முன்னெடுக்கப்பட்டு வருகின்ற இவ்வேளையில், பொருளா தாரம், அதேபோன்று உரிமைகள் சார்ந்த பல்வேறு வகைப்பட்ட பிரச்சினைகளுக்கு மக்கள் முகங்கொடுக்க வேண்டியிருப்பது என்னைப் பொறுத்தவரையில் வேதனை யளிக்கின்றது. 1960களில் ஆசியாவில் அதியுச்ச இடத்தி லிருந்த ஒரு நாடாக இலங்கையைப் பார்த்தார்கள். ஆனால், இன்று இந்த நாடு பொருளாதார ரீதியாக மிகவும் பின்தங்கியதன் காரணமாகவும் அதேபோன்று, இனங்களுக் கிடையேயான விரிசல்களின் காரணமாகவும் இந்த நாட்டின் அபிவிருத்தியும் எதிர்காலமும் கேள்விக்குறியாக இருந்து கொண்டிருக்கின்றது. ஆகவே, இன்று நாங்கள் எங்களிடையே இருக்கின்ற சில வேற்றுமைகளைக் களைந்து, இந்த நாட்டின் வளர்ச்சிக்காக வேண்டியும் இந்த நாட்டின் எதிர்காலச் சந்ததியினருக்காக வேண்டியும் பல்வேறுபட்ட முன்னெடுப் புக்களைச் செய்யவேண்டிய ஒரு காலகட்டத்தில் வாழ்ந்து கொண்டிருக்கின்றோம். ஆகவே, இந்த நாட்டில் இருக்கின்ற பிரச்சினைகளுக்குச் சரியான தீர்வுகளைக் கண்டு, இந்த நாட்டைப் பொருளாதார ரீதியாகப் பலமிக்க ஒரு நாடாக மாற்றுவதற்கு இந்த நாட்டு மக்கள் அனைவரும் ஒரு தாய் மக்கள் போன்று வாழவேண்டிய ஒரு சூழ்நிலை ஏற்படுத்தப்பட வேண்டும். அதற்காகப் பங்களிப்புச் செய்வதற்கும் இந்தச் சபையின்மூலம் குரல்கொடுப்பதற்கும் வாய்ப்புத் தந்தமைக்கு மீண்டுமொரு முறை சம்பந்தப்பட்டவர்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அரசியல் உரிமை பற்றியும் ஏனைய உரிமைகள் பற்றியும் பேசப்படுகின்ற இந்தக் காலகட்டத்தில், உரிமைகள் பகிர்ந் தளிக்கப்படவேண்டும், அதேபோன்று மக்கள் அனைவரும் ஒற்றுமையோடு வாழ்கின்ற சூழ்நிலை ஏற்படுத்தப்பட வேண்டும் என்ற எதிர்பார்ப்பு மக்களிடம் இருந்துகொண்டிருக் கின்றது. அந்த அடிப்படையில் அவர்களுடைய எதிர்பார்ப்பை

நாங்கள் இந்த உயர் சபையினூடாக முடியுமான வரை நிறைவேற்றுவோமேயானால், அது இன்று இந்த நாட்டிலுள்ள மக்களுக்கு மாத்திரமல்லாமல், இந்த நாட்டை வளப் படுத்தக்கூடிய எதிர்காலச் சந்ததியினருக்கும் ஒரு வாய்ப்பாக அமையும் என்ற ஒரு நம்பிக்கை எனக்கிருக்கின்றது. எனவே, இந்தப் பாராளுமன்றத்தில் பல்வேறுபட்ட பேதங்களைப் பற்றி பேசிக்கொண்டு காலத்தை வீணடிக்காமல், எவ்வாறு இந்த நாட்டை எதிர்காலத்தில் அபிவிருத்தியடையச் செய்யலாம் என்று சிந்தித்துச் செயற்பட வேண்டிய கடமைப்பாடு இச் சபையிலுள்ள அனைவருக்கும் இருக்கின்றது.

எமது நாட்டிலுள்ள 80 வீதத்துக்கும் அதிகமான சனத் தொகையினர், இந்த நாட்டின் முதுகெலும்பான விவசாயத் துறையிலும் மீன்பிடித் துறையிலும் பங்களிப்புச் செய்து கொண்டிருக்கிறார்கள். ஆனால், இந்த நாட்டில் அவர்களு டைய வாழ்வை வளப்படுத்தக்கூடிய சரியானதொரு திட்டம் இல்லாத நிலைமையை நாங்கள் காண்கின்றோம். அன்று பொருளாதார ரீதியாக எங்களைவிட மிகவும் பின்தங்கிய நிலையில் இருந்த எமது அயல் நாடுகள், குறிப்பாக ஆசியாவிலுள்ள பங்களாதேஷ், நேபாளம், பூட்டான், ஆப்கானிஸ்தான், பாகிஸ்தான், இந்தியா போன்ற 'சார்க்' நாடுகளும் அதேபோன்று தூரகிழக்கு நாடுகளான வியட்நாம், லாவோஸ், தாய்லாந்து போன்ற நாடுகளும் இன்று பொருளாதார ரீதியாக விருத்தியடைந்து வருகின்றன. ஆகவே, நாங்களும் இந்த நாடுகளைப்போன்று எங்களுக்குள் இருக்கின்ற பேதங்களை மறந்து, எங்களுடைய எதிர்கால வேலைத் திட்டங்களைச் சரியான முறையில் வகுத்து, எமது நாட்டின் பொருளாதார முன்னேற்றத்தில் கவனம் செலுத்தி னால், எமது நாடும் சுபிட்சமுள்ள ஒரு நாடாக மாறும்.

இன்று அநேகமான நாடுகளில் அரசாங்கம் சில கைத்தொழில்களுக்கு முன்னுரிமை கொடுத்து, "கிராமத்துக்கு ஒரு கைத்தொழில் அல்லது கிராமத்துக்கு ஒரு வேலைத்திட்டம்" என்ற அடிப்படையில் முடியுமான அளவு பங்களிப்புச் செய்து, மக்களது பொருளாதாரத்தை வளப்படுத்தி வருகின்றது. தாய்லாந்தைப் பொறுத்தவரையில், அங்கு அரசாங்கம் ஒரு கிராமத்துக்கு அல்லது ஒரு பிரதேசத்துக்கு ஒரு பொருளாதார வேலைத்திட்டம் அல்லது ஒரு கைத்தொழில் திட்டம் என்ற அடிப்படையில், அங்கிருக்கின்ற மக்கள் அனைவருக்கும் முடியுமான உதவிகளைச் செய்து வருகின்றது. அதேநேரம் அங்கு என்னென்ன விடயங்களில் பிரச்சினைகள் இருக் கின்றதோ - கம்பனிகளைப் பதிவுசெய்வதாக இருந்தாலும் சரி அல்லது ஏனைய தொழில் துறைகளை ஒருங்கிணைப்பதாக இருந்தாலும் சரி - அவை அனைத்தையும் அரச பொறிமுறை யினூடாக இலகுபடுத்திக் கொடுத்து, உள்நாட்டு முதலீட்டாளர் களை மாத்திரமல்லாமல், வெளிநாட்டு முதலீட்டாளர்களையும் அங்கு வரவழைத்து, நாட்டினை அபிவிருத்தி செய்துகொண்டு போவதை எங்களால் பார்க்கக்கூடியதாக இருக்கின்றது. நாங்களும் அந்த அடிப்படையில் எங்களுடைய பொருளா தாரத்தை வளர்ச்சியடையச் செய்ய வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் இருக்கிறது.

**ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சீ.மு. முகம்மட் இஸ்மாயில்)
(The Hon. (Dr.) S. M.Mohamed Ismail)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்னு மொரு விடயத்தையும் இவ்விடத்தில் நான் குறிப்பிடவேண்டும். அதாவது, நான் பாராளுமன்ற உறுப்பினராகச் உறுதிப் பிரமாணம் செய்த நாளன்று உரையாற்றிய உயர் கல்வி அமைச்சர் கௌரவ விஜயதாச ராஜபக்ஷ அவர்கள், நான் பல்கலைக்கழகத்தில் உபவேந்தராக இருந்த காலத்தில் எனது வீட்டின் தண்ணீர்க் கட்டணம், மற்றும் மின்சாரக் கட்டணம் செலுத்தப்பட்ட விடயம் சம்பந்தமாகக் குறிப்பிட்டிருந்தார். அரசாங்கத்தினால் உபவேந்தருக்குப் பல்வேறுபட்ட சலுகைகள் சட்டரீதியாக வழங்கப்பட்டு வருகின்றன. அதுமாத்திரமல்லாமல், பல்கலைக்கழக மூதவையினூடாகவும் சலுகைகள் வழங்கப்படுகின்றன. ஆகவே, பல்கலைக்கழகத்தி லிருக்கின்ற எல்லா மட்டத்தினரின் அனுமதியோடுதான் எனக்குக் குறித்த சலுகைகள் வழங்கப்பட்டன. அதற்கான ஆவணங்கள் என்னிடம் இருக்கின்றன. தேவையேற்படின் அவற்றை கௌரவ சபாநாயகர் அவர்களிடம் சமர்ப்பிப் பதற்கும் நான் தயாராக இருக்கின்றேன்.

அதேநேரம் நான் கடமைபுரிந்த தென்கிழக்குப் பல்கலைக் கழகத்தில் பாலியல் இலஞ்சம் பெறப்படுவதாகவும் கூறப் பட்டிருக்கின்றது. இதனால் இன்று அங்கிருக்கின்ற பெண்கள், ஆண்கள் அனைவரும் பல்வேறுபட்ட மன உளைச்சலுக்கு உட்பட்டிருக்கின்றார்கள். பல்கலைக்கழகம் என்பது ஒரு நாட்டின் சொத்து; அது கல்வியின் முதுசமாகப் பார்க்கப் படுகின்றது. எது என்னவாக இருந்தாலும், இவ்வாறான ஒரு சபையில், அது பற்றிய உண்மையை நிரூபித்ததன் பின்னர் அது சம்பந்தமாகப் பேசுவதுதான் சிறப்பானதாக இருக்கும் என்பது என்னுடைய தாழ்மையான வேண்டுகோள் என்பதைத் தெரிவித்து, எனக்குப் பேச வாய்ப்பளித்தமைக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

[අ.භා.6.27]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අටවන පාර්ලිමේන්තුවේ පළමුවන සැසි වාරය තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද සියලුම වාර්තාවලින් සමන්විත වුණු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කළ අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් වන කල් තැබීමේ විවාදයට සියලුදෙනාම සහභාගි වුණු වෙලාවක, මටත් ඒ පිළිබඳව වචන ස්වල්පයක් මේ ගරු සභාව හමුවේ ඉදිරිපත් කරන්න ලැබීම ගැන මා සතුටු වනවා. ඒ එක්කම ඉතාමත් පළපුරුදු, දක්ෂ අමාත්‍යවරයකු වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති හැටියට කටයුතු කළ ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා ඇතුළු එහි සාමාජික මන්ත්‍රීවරුන් සියලුදෙනාටම මගේ ස්තුතිය පුද කරන්නට ඕනෑ.

අපි දන්නවා, විශේෂයෙන්ම රාජ්‍යයක් හැටියට මූල්‍ය විනිවිදභාවය පිළිබඳව ඉතා පැහැදිලි චිත්‍රයක් අපට ලබා ගන්නට පුළුවන් වන්නේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළින් කියලා. මොකද, මේ රටේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල, ඒ වාගේම හැම ආයතනයක්ම විවිධාකාරයෙන් මුදල් වැය කිරීම් පිළිබඳව, ප්‍රධාන ගණන් දීමේ නිලධාරි හැටියට විගණකාධිපතිවරයාට වාර්ෂිකව ගිණුම් ලබා දීමට එම ආයතන බැඳී සිටිනවා. නමුත් මා පළාත් සභාවේ රාජ්‍ය

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

ගිණුම් කාරක සභාවේ සභාපති හැටියට කටයුතු කළ කාලයේදී මා දැක්කා, මා කලින් සඳහන් කළ ආයතනවල රාජ්‍ය සේවාව තුළින් අපි බලාපොරොත්තු වන විනිවිදභාවය බොහෝ විට දකින්න පුළුවන්කමක් නැහැයි කියලා. බොහෝ අවස්ථාවලදී ඒ සියල්ල අපෙන් ගිලිහී ගිහින් තිබෙනවා. ඒ නිසා ඕනෑම කෙනකුට, අමාත්‍යවරයකුට, ලේකම්වරයකුට, ඒ වාගේම විවිධ රාජ්‍ය ආයතනවල නිලධාරින්ට මුදල් පරිපාලනය පිළිබඳව, එහෙම නැත්නම් මුදල් පිළිබඳව විනිවිදභාවය දකින්නට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ නිසා රාජ්‍ය ආයතන, කලින් කථා කළ මා මිත්‍ර ගරු රන්ජන් රාමනායක -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
හැරෙන්නවත් බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක තමයි. ඔබතුමාට යම් අසාධාරණයක් වුණා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඒක ඉතා අසාධාරණයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා තමයි වග කියන්න ඕනෑ.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා දන්නවා, මට හැම දාම අන්තිම කථාවයි දෙන්නේ කියලා. හැබැයි ඒ කථාව කරනකොට මට ලබා දී තිබෙන විනාඩි ගණනත් නැති වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අනිවාර්යයෙන්ම.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මට තව විනාඩියක කාලයක් දෙන්න. අවසර ගන්නකොටම කාලය අවසන් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තව විනාඩියක් කථා කරන්න පුළුවන්.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු ලසන්ත අලගියවන්න මැතිතුමනි, මට මුලින්ම කැමැත්තක් තිබුණා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට එන්න. නමුත් පළාත් සභාවේ රාජ්‍ය ගිණුම් කරක සභාවේ සභාපතිවරයා වශයෙන් මා අවුරුදු 5ක් කටයුතු කර තිබුණත් මට ඒ අවස්ථාව ලැබුණේ නැහැ. නමුත් ඒ අවස්ථාවන් තුළින් මේ රටේ යම් වෙනසක් ඇති කරන්න පුළුවන් දෙයක් අපි දැක්කා. ඕනෑම ආයතනයක විගණන වාර්තාව බැලුවාට පස්සේ, ඒ ආයතනයේ සේවාව පිළිබඳව චිත්‍රයක් මවා ගන්නට පුළුවන්. ආයතන ප්‍රධානියකු වැඩ භාර ගන්නකොට ඔහුගේ මේසයට ඉස්සෙල්ලාම එන්න ඕනෑ, විගණන වාර්තාවයි. අද මේ රටේ එවැනි තත්ත්වයක් දකින්නට නැහැ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළින් යම් යම් නිර්දේශයන් කරනවා නම්, ඒවා පිළිබඳව අමාත්‍යවරුන් වාගේම ඒ ආයතන ක්‍රියාත්මක වෙන්නට ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මැතිතුමාගේ නඩු තීන්දුව පිළිබඳව අපේ විගණකාධිපති ගාමිණී විජේසිංහ මහතා කියා තිබුණු ප්‍රකාශයක් අද පුවත් පත්වල තිබෙනවා මා දැක්කා. මේ කරපු දේවල්වලට ලැබුණු දඬුවම එක්ක බැලුවොත්, මේ රටේ රාජ්‍ය සේවයේ සියයට 50ක් හිරේ දමන්න ඕනෑය කියලා ඔහු ප්‍රකාශ කර තිබුණා. විගණකාධිපතිතුමාගේ පිළිතුර තුළින්ම පෙනෙනවා, රටේ තත්ත්වය මොකක්ද කියලා. මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 6.30 වුයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2018 ජුනි මස 20 වන බදාදා පූ. භා. 1.00 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளு மன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், 2018 யூன் 20, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 6.30 p.m.,* MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 1.00 p.m. on Wednesday, 20th June, 2018.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.